37 වන කාණ්ඩය
4 වන කලාපය

EVELYN RUTNAM LIBRARY
JAFFNA
152
28/11

සඳුද
1985 නොවැම්බර් 18

# පාර්ලිමේන්තු විවාද

## (හැන්සාඩ්)

## නිල වාර්තාව

(අශෝධිත පිටපත)

## අන්තර්ගත ප්‍රධාන කරුණු

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

විසර්ජන පනත් කෙටුම්පත, 1986 [තුන්වන වෙන් කළ දිනය] :

දෙවන වර කියවීම – විවාදය කල් තබන ලදි

කල් තැබීමේ යෝජනාව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 37
இல. 4

திங்கட்கிழமை
18 நொவம்பர் 1985

# பாராளுமன்ற விவாதங்கள்

*(ஹன்சாட்)*

*அதிகார அறிக்கை*

*(பிழை திருத்தப்படாதது)*

*பிரதான உள்ளடக்கம்*

விஞக்களுக்கு வாய்மூல விடைகள்
ஒதுக்கீட்டுச் சட்டமூலம், 1986 [ஒதுக்கப்பட்ட மூன்றும் நாள்] :
இரண்டாம் மதிப்பு — விவாதம் ஒத்திவைக்கப்பட்டது.
ஒத்திவைப்புப் பிரேரணை

---

**Volume 37**
**No. 4**

**Monday**
**18th November 1985**

# PARLIAMENTARY DEBATES

**(HANSARD)**

## OFFICIAL REPORT

**(Uncorrected)**

## PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS
APPROPRIATION BILL, 1986 [Third allotted day] :
Second Reading – Debate adjourned
ADJOURNMENT MOTION

2 – A 087154 – 3,065 (85/11)

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
# PARLIAMENT

**1985 නොවැම්බර් 18 වන සඳුදා**
**திங்கட்கிழமை, 18 நொவம்பர் 1985**
*Monday, 18th November 1985*

---

*පූ. භා. 9 ට පාර්ලිමේන්තුව රැස් විය. කථානායකතුමා [ඊ. එල්. සේනානායක මහතා] මූලාසනාරූඪ විය.*

*பாராளுமன்றம் மு. ப. 9 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [திரு. ஈ. எல். சேனநாயக்க] தலைமை வகித்தார்கள்.*

*The Parliament met at 9 a.m.* MR. SPEAKER (MR. E. L. SENANAYAKE) *in the Chair.*

---

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
### சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

(1) Annual Report and Accounts of the Sri Lanka State Plantations Corporation for 1982

(2) Annual Report of the Janatha Estates Development Board for 1983 – (*Mr. M. Vincent Perera on behalf of Prime Minister, Minister of Local Government, Housing & Construction, Minister of Highways and Minister of Emergency Civil Administration*).

Supplementary Estimate No. 25 of 1985.– (*Mr. S. S. Abeysundera, Acting Minister of Agriculture Development & Research*).

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*

*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*

*Ordered to lie upon the Table.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
### வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### කලුතර පොලිස් අභ්‍යාස පාඨශාලාව : ඊශ්‍රායල් ජාතික උපදේශකවරුන්/ගුරුහරුකම් දෙන්නන්

### பொலிஸ் பயிற்சிப் பாடசாலை, களுத்துறை : இஸ்ரேலியப் போதனாசிரியர்/ஆலோசகர்

### POLICE TRAINING SCHOOL, KALUTARA :ISRAELI INSTRUCTORS/ADVISORS

470/85

1. **එම්. හලීම් ඉෂාක් මහතා** (මැද කොළඹ තුන්වන)
**(ஜனாப் எம். ஹலீம் இஷாக் — கொழும்பு மத்தி மூன்றும் அங்கத்தவர்)**
**(Mr. M. Haleem Ishak – Third Colombo Central)**

ජාතික ආරක්ෂක ඇමතිතුමා සහ නියෝජ්‍ය රාජ්‍ය ආරක්ෂක ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය :

(අ) පහත සඳහන් විස්තර එතුමා ප්‍රකාශ කරන්නේද ? එනම්—
  (i) කලුතර පොලිස් අභ්‍යාස පාඨශාලාවට අනුයුක්තව සිටින ඊශ්‍රායෙල් ජාතික උපදේශකවරුන් හෝ ගුරුහරුකම් දෙන්නන් සංඛ්‍යාව ;
  (ii) ඔවුන් පැමිණි දිනය ;
  (iii) ඔවුන් නතරව සිටින කාලය ;
  (iv) ඔවුන්ගේ වැටුප් හා එම වැටුප් ගෙවනු ලබන්නේ කුමකින්ද යන වග.

(ආ) ප්‍රකාශ නොකරන්නේ නම් ඒ මන්ද ?

தேசியப் பாதுகாப்பு அமைச்சரும் பிரதிப் பாதுகாப்பு அமைச்சருமான வரைக் கேட்ட வினா :

(அ) (i) களுத்துறையிலுள்ள பொலிஸ் பயிற்சிப் பாடசாலையில் பணிபுரியும் இஸ்ரேலியப் போதனாசிரியர்கள் அல்லது ஆலோசகர்களின் தொகையையும் ;
  (ii) இவர்கள் வந்த தேதியையும் ;
  (iii) இவர்கள் எவ்வளவு காலம் இங்கிருப்பார்கள் என்பதையும் ;
  (vi) இவர்களின் சம்பளத்தையும் எந்த வளத்திலிருந்து அது செலுத்தப்படுகின்றதென்பதையும்,

அவர் கூறுவாரா ?

(ஆ) இன்றேல், ஏன் ?

asked the Minister of National Security and Deputy Minister of Defence :

(*a*) Will he state –
  (i) the number of Israeli instructors or advisors attached to Police Training School at Kalutara ;
  (ii) the date of their arrival ;
  (iii) their period of stay ;
  (iv) their salaries and source of payment ;

(*b*) If not, why ?

**එම්. වින්සන්ට් පෙරේරා මහතා (පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා ඇමතිතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(திரு. எம். வின்சன்ற் பெரேரா — பாராளுமன்ற அலுவல்கள், விளையாட்டுத்துறை அமைச்சரும் பிரதம அரசாங்கக் கொறடாவும்)
**(Mr. M. Vincent Perera – Minister of Parliamentary Affairs & Sports and Chief Government Whip)**

I answer on behalf of the Minister of National Security and Deputy Minister of Defence,

(*a*) (i) None.
  (ii) to (iv) Do not arise.

(*b*) Does not arise.

**එම්. හලීම් ඉෂාක් මහතා**
(ஜனாப் எம். ஹலீம் இஷாக்)
**(Mr. M. Haleem Ishak)**

Will the Hon. Minister kindly tell me whether any of these Israelis are in any other departments or in any other Service units advising the Government ?

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
(திரு. எம். வின்சன்ற் பெரேரா)
**(Mr. M. Vincent Perera)**

That is a new question. In this question you are only referring to the Police. I will bring this to the notice of the Deputy Minister of Defence.

### ඊශ්‍රායලයෙන් ආනයනය/අපනයනය කළ භාණ්ඩ

### இறக்குமதி, ஏற்றுமதி — இஸ்ரேல்

### IMPORTS AND EXPORTS FROM AND TO ISRAEL

471/85

2. **එම්. හලීම් ඉෂාක් මහතා**
(ஜனாப் எம். ஹலீம் இஷாக்)
**(Mr. M. Haleem Ishak)**

වෙළඳ හා නාවික කටයුතු ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය :

(අ) පහත සඳහන් විස්තර එතුමා ප්‍රකාශ කරන්නේද ? එනම්—
  (i) 1984 වර්ෂයේදී ඊශ්‍රායලයෙන් ආනයනය කරනු ලැබූ භාණ්ඩවල වර්ග සහ ප්‍රමාණය ;

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. හලීම් ඉෂාක් මහතා]

(ii) 1984 වර්ෂයේදී ඊශ්‍රායලයට අපනයනය කරනු ලැබූ භාණ්ඩවල වර්ග සහ ප්‍රමාණය ;

(iii) ඊශ්‍රායලය සමග ආනයන සහ අපනයන කටයුතුවල නියුක්තව සිටින රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ සංවිධානවල නම්.

(ආ) ප්‍රකාශ නොකරන්නේ නම් ඒ මන්ද ?

**வர்த்தக, கப்பற்றுறை அமைச்சரைக் கேட்ட வினா :**

**(அ) (i) 1984 ஆம் ஆண்டில் இஸ்ரேலில் இருந்து இறக்குமதியான பொருள்களின் அளவையும் வகைகளையும் ;**

**(ii) 1984 ஆம் ஆண்டில் இஸ்ரேலுக்கு ஏற்றுமதியான பொருள்களின் அளவையும் வகைகளையும் ;**

**(iii) இஸ்ரேலுடன் இறக்குமதி, ஏற்றுமதி வர்த்தகத்தில் ஈடுபட்டுள்ள இலங்கையிலுள்ள அரசாங்கத்துக்குச் சொந்தமான நிறுவனங்களினதும், தனியார் நிறுவனங்களினதும் பெயரையும்,**

**அவர் கூறுவாரா ?**

**(ஆ) இன்றேல், ஏன் ?**

asked the Minister of Trade and Shipping :

(*a*) Will he state –

(i) the quantum and varieties of items imported from Israel during the year 1984 ;

(ii) the quantum and varieties of items exported to Israel during the year 1984 ;

(iii) the names of Government owned and private organisations in Sri Lanka engaged in import and export business with Israel ?

(*b*) If not, why ?

**මහේන්ද්‍ර විජේරත්න මහතා (නියෝජ්‍ය වෙළඳ හා නාවික කටයුතු ඇමතිතුමා)**
**(திரு. மகேந்திர விஜேரத்ன — வர்த்தக, கப்பற்றுறைப் பிரதி அமைச்சர்)**
**(Mr. Mahendra Wijeratne – Deputy Minister of Trade and Shipping)**

(*a*) (i) According to the Sri Lanka Customs records, imports from Israel into Sri Lanka during the year 1984 are as follows :

| *Description* | *Unit* | *Volume* | *Value Rs.* |
|---|---|---|---|
| 1. Polyvenyl Chloride in other Primary forms | Kg. | 50 | 2,602 |
| 2. Transmission, Conveyor elevator belts of vulcanized rubber | – | – | 4,837 |
| 3. Tyre-cord fabric | – | – | 1,233 |
| 4. Parts for making and breaking electric circuits-Diodes, transistors, photo-cells, Electrical goods | No | 53,100 | 69,036 |
| 5. Gramophone records (other recorded media) | No | 1,000 | 4,232 |
| 6. Postal Imports | – | – | 200 |
| Total | | | 82,140 |

(ii) According to the Sri Lanka Customs Records, Exports to Israel from Sri Lanka during the year 1984 are as follows :

| *Description* | *Unit* | *Volume* | *Value Rs.* |
|---|---|---|---|
| 1. Desiccated Coconuts | Kg. | 34,500 | 1,240,474 |
| 2. Tea (Packets, Bags and bulk) | Kg. | | 17,203,261 |
| 3. Water, Ice & Snow | Lt. | 3 | 631 |

**එම්. හලීම් ඉෂාක් මහතා**
**(ஜனாப் எம். ஹலீம் இஷாக்)**
**(Mr. M. Haleem Ishak)**

Ice & Snow ?

**මහේන්ද්‍ර විජේරත්න මහතා**
**(திரு. மகேந்திர விஜேரத்ன)**
**(Mr. Mahendra Wijeratne)**

That is for water and not for ice and snow. We do not export them, I believe.

| | | | |
|---|---|---|---|
| 4. Articles of materials of condensation, polycondensation, Re-generated Cellulose, Natural Resins modified by Fusion, other High Polymers | – | | 445,378 |
| 5. Standard Lamps, Table Lamps and other Lighting fittings of wood etc. | Kg. | 10 | 600 |
| 6. Printed books, booklets, brochures, pamplets, leaflets, printed pictures and photographs. | – | – | 1,425 |

**කථානායකතුමා**
**(சபாநாயகர் அவர்கள்)**
**(Mr. Speaker)**

As it is a long Answer you can table it.

**මහේන්ද්‍ර විජේරත්න මහතා**
**(திரு. மகேந்திர விஜேரத்ன)**
**(Mr. Mahendra Wijeratne)**

Sir, the hon. Member wants all these details.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

You can table the Answer.

එම්. හලීම් ඉෂාක් මහතා
(ஜனாப் எம். ஹலீம் இஷாக்)
(Mr. M. Haleem Ishak)

I think the hon. Deputy Minister has finished reading about half the Answer. Kindly allow him to read the whole of it. Sir.

මහේන්ද්‍ර විජේරත්න මහතා
(திரு. மகேந்திர விஜேரத்ன)
(Mr. Mahendra Wijeratne)

Only two more items, Sir.

| | | | |
|---|---|---|---|
| 7. Bristle fibre not twisted | Kg. | 2,000 | 28,087 |
| 8. Tableware & articles used for domestic or toilet purposes | Kg. | 30 | 800 |
| Chairs | No | 27 | 4,400 |
| | Total | | 18,925,096 |

(iii) No.

(*b*) the Sri Lanka Customs does not publish any information classified on the basis of exporting/importing organizations/agencies.

එම්. හලීම් ඉෂාක් මහතා
(ஜனாப் எம். ஹலீம் இஷாக்)
(Mr. M. Haleem Ishak)

Could the hon. Deputy Minister tell us the present balance of trade between Israel and Sri Lanka ?

මහේන්ද්‍ර විජේරත්න මහතා
(திரு. மகேந்திர விஜேரத்ன)
(Mr. Mahendra Wijeratne)

I will reply the question raised by the hon. Member later on, Sir.

## එස්. අලහකෝන් මහතා : තැන්පතුවල මුදල් ආපසු ගෙවීම
## திரு. எஸ். அழகக்கோன் : வைப்புப்பணத்தை வழங்கல்
## MR. S. ALAHAKOON : REFUND OF DEPOSIT

474/85

3. ආචාර්ය ඩබ්ලිව්. දහනායක මහතා (ගාල්ල)
(கலாநிதி டபிள்யு. தஹநாயக்க — காலி)
(Dr. W. Dahanayake – Galle)

නියෝජ්‍ය විදුලිබල හා බලශක්ති ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය :

(අ) 1984 ජූනි 10 වැනිද සිට 17 වැනිද දක්වා තාවකාලික සැපයුමක් මත විදුලිබලය ලබාගැනීම සඳහා ගාල්ලේ අම්බලන්වත්තේ වෙලඟතුඩුව වත්තේ පදිංචි සෙනෙවිරත්න අලහකෝන් මහතා විසින් තැන්පත් කරන ලද රු. 200 මුදල සහ තැන්පතුවල වෙනත් මුදල් ඔහුට ආපසු ගෙවීමට එතුමා ක්‍රියා කරන්නේද ?

(ආ) එසේ නොකරන්නේ නම්, ඒ මන්ද ?

மின்சக்தி, எரிபொருட் பிரதி அமைச்சரைக் கேட்ட வினா :

(அ) வெலங்கத்துடுவேவத்தை, அம்புலன்வத்தை, காலி, எனும் முகவரியைச் சேர்ந்த திரு. செனெவிரத்ன அழகக்கோன் என்பவருக்கு, 1984 ஜூன், 10 முதல் 17 வரை தற்காலிக மின் இணைப்புக்கென வைப்புச் செய்யப்பட்ட 200 ரூபாயும் வைப்பிலிருந்து வேறு ஏதும் தொகையும் மீள வழங்கப்படுவதற்கு அவர் ஆவன செய்வாரா ?

(ஆ) இன்றேல், ஏன் ?

asked the Deputy Minister of Power and Energy :

(*a*) Will he see that Mr. Seneviratne Alahakoon, of Welangathuduwewatte, Ambalanwatta, Galle, is refunded the deposit of Rs. 200 and any sum from the deposit for the supply of electricity or temporary connection from June 10th to 17th, 1984 ?

(*b*) If not, why ?

පී. දයාරත්න මහතා (අම්පාර දිසා ඇමතිතුමා සහ නියෝජ්‍ය විදුලිබල හා බලශක්ති ඇමතිතුමා)
(திரு. பீ. தயாரத்ன — அம்பாறை மாவட்ட அமைச்சரும் மின்சக்தி, எரிபொருள் பிரதி அமைச்சரும்)
(Mr. P. Dayaratne – District Minister, Amparai and Deputy Minister of Power and Energy)

(*a*) Mr. Seneviratne Alahakoon of Welangathuduwewatte, Ambalanwatta, Galle, who had made a deposit of Rs. 200 for a temporary supply of electricity from 10th to 17th June 1984 was refunded a balance of Rs. 100.25 out of the deposit after recovering Rs. 99.75 for the electricity supply, by Money Order No. 438330 dated 08.08.1985 sent to him under registered cover bearing No. 598 of 12.08.1985.

(*b*) Does not arise.

## කේ. කේ. විල්සන් මහතා : වැන්දඹු විශ්‍රාම වැටුප් සහ අනෙකුත් ගෙවීම්
## திரு. கே. கே. வில்சன் : விதவை ஓய்வூதியம் ஆதியன
## MR. K. K. WILSON : WIDOW'S PENSION & OTHER DUES

475/85

4. ආචාර්ය ඩබ්ලිව්. දහනායක මහතා
(கலாநிதி டபிள்யு. தஹநாயக்க)
(Dr. W. Dahanayake)

වනිතා කටයුතු හා ශික්ෂණ රෝහල් ඇමතිතුමියගෙන් ඇසූ ප්‍රශ්නය :

(අ) ගාල්ලේ මහ මෝදර ආරෝග්‍යශාලාවේ මුරකරුව සිටි කේ. කේ. විල්සන් මහතා 1984 මැයි 24 වැනිද මියගිය නමුත් ඔහුගේ වැන්දඹුව වන වංචාවල කදුරුදූවේ වෙලර් සාප්පුව බාරේ ලිපිනයේ පදිංචි කරුණාවති සමරවික්‍රම මහත්මියට—

(i) මරණ පාරිතෝෂිකය ;

(ii) අන්තිම මාසයේ වැටුප ;

(iii) අර්ථසාධක අරමුදල් ;

(iv) වැන්දඹු විශ්‍රාම වැටුප් ;

හෝ වෙනත් කිසිම මුදලක් අවශ්‍ය සියලුම ලියකියවිලි ඉදිරිපත් කර තිබියදීත් තවම ගෙවා නොමැති බැව් එතුමිය දන්නේද ?

(ආ) මේ සියලුම මුදල් වහාම ගෙවීමට එතුමිය ක්‍රියා කරන්නේද ?

(ඇ) නොකරන්නේ නම් ඒ මන්ද ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය ඩබ්ලිව්. දහනායක මහතා]

மாதர் அலுவல்கள், போதனு வைத்தியசாலைகள் அமைச்சரைக் கேட்ட வினு :

(அ) காலி, மகாமோதற பொது வைத்தியசாலையில் காவலாளியா யிருந்த திரு. கே. கே. வில்சன் என்பவர் 1984, மே 24 ஆந் தேதி மரணமடைந்தாரென்பதையும் இவரது விதவையும், மே/பா தையற் கடை, கடுலுதூவ, வஞ்சாவெல, எனும் முகவரியைச் சேர்ந்தவருமான திருமதி கருணவதி சமர விக்ரம என்பவர் தேவையான ஆவணங்கள் அனைத்தையும் அனுப்பியுள்ளபோதிலும் ;

(i) மரணப் பணிக்கொடை ;

(ii) இறுதி மாதச் சம்பளம் ;

(iii) சேமலாபநிதி ;

(iv) விதவைகள் ஒய்வூதியம் என்பவை வழங்கப்படவில்லை என்பதை அவர் அறிவாரா ?

(ஆ) இவருக்குச் சேரவேண்டிய சகல வருமதிகளையும் உடனே வழங்குவதற்கு அவர் நடவடிக்கை எடுப்பாரா ?

(இ) இன்றேல், ஏன் ?

asked the Minister of Women's Affairs and Teaching Hospitals :

(*a*) Is she aware that Mr. K. K. Wilson watcher, General Hospiral, Mahamodera, Galle, died on 24th May, 1984, but his widow Mrs. Karunawathie Samarawickrema, c/o Tailor Shop, Kaduruduwa, Wanchawela, has not yet received :-

(i) the death gratuity,
(ii) salary for the last month,
(iii) Provident Fund,
(iv) widow's pension, or any other due payments, although all necessary documents have been forwarded ?

(*b*) Will she take steps to pay all dues at once ?

(*c*) If not, why ?

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
**(Mr. M. Vincent Perera)**

On behalf of the Minister of Women's Affairs and Teaching Hospitals, as this is a long Answer may I table it ?

**කථානායකතුමා**
**(சபாநாயகர் அவர்கள்)**
**(Mr. Speaker)**

If it is a long Answer the Hon. Minister may table it.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක මහතා**
**(கலாநிதி டபிள்யு. தஹநாயக்க)**
**(Dr. W. Dahanayake)**

I want to know whether these amounts have been paid to the widow ?

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
**(Mr. M. Vincent Perera)**

Then I will have to read the whole thing.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක මහතා**
**(கலாநிதி டபிள்யு. தஹநாயக்க)**
**(Dr. W. Dahanayake)**

Are you paying the widow ?

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
**(Mr. M. Vincent Perera)**

I will give you the reply.

(*a*) On inquiry it was revealed that there is a dispute regarding the legal heirs of the late Mr. K. K. Wilson, who was an ordinary labourer attached to the General Hospital, Galle. This has to be decided by the Director of Pensions and his decision is awaited.

(i) The death gratuity will be paid as soon as the above decision is known.

(ii) The salary for the last month of service will also be paid as soon as the above decision is known.

(iii) As the late Mr. Wilson was a permanent and pensionable employee throughout his service, the payment of Provident Fund does not arise.

(iv) Papers have been sent to the Secretary and Accountant of the W. & O.P. Fund on 15.10.85 for the payment of the W. & O.P. Award and his decision will depend on the decision of the Director of Pensions.

(*b*) Action will be taken to pay all the dues as soon as the above decision is known.

(*c*) Does not arise.

## එස්. එස්. එච්. සේනාරත්න මහතා : මාරක අනතුර

## திரு. எஸ். எஸ். எச். சேனரத்ன : விபத்து மரணம்

## MR. S.S.H.SENARATNE : FATAL ACCIDENT

477/85

6. **ආචාර්ය ඩබ්ලිව්. දහනායක මහතා**
**(கலாநிதி டபிள்யு. தஹநாயக்க)**
**(Dr. W. Dahanayake)**

ජාතික ආරක්ෂක ඇමතිතුමා සහ නියෝජ්‍ය රාජ්‍ය ආරක්ෂක ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය :

(අ) ගාල්ලේ, වක්වැල්ල පාරේ, 1985 මාර්තු 16 වැනිද සිදුවූ මෝටර් සයිකල් අනතුරක හේතුවෙන් ගාල්ලේ වක්වැල්ල පාරේ, 271/2 හි එස්. එස්. එච්. සේනාරත්න (73) මහතාගේ මරණය සිදුවූ බව එතුමා දන්නේද ?

(ආ) මෝටර් සයිකල්කරුට විරුද්ධව නඩු පවරා නැත්තේ මන්ද ?

(ඇ) මෝටර් සයිකල්කරුට විරුද්ධව නඩු පැවරීමට පොලීසියට නියෝග කොට, වැන්දඹුව වන එච්. ඒ. හින්නි හාමිනේ මහත්මියට නිසි වන්දි ලබා දීමටද එතුමා පියවර ගන්නේද ?

(ඈ) එසේ නොකරන්නේ නම්, ඒ මන්ද ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தேசியப் பாதுகாப்பு அமைச்சரும், பிரதிப் பாதுகாப்பு அமைச்சருமான வரைக் கேட்ட வினா :

(அ) 271/2, வக்வெல்ல ரோட், காலி, எனும் முகவரியைச் சேர்ந்த திரு. எஸ். எஸ். எச். சேனரத்ன (73), என்பவர் 1985, மார்ச் 16 ஆந் தேதி காலி, வக்வெல்ல ரோட்டில் இடம்பெற்ற மோட்டார் சைக்கிள் விபத்தின் விளைவாக மரணமடைந்தார் என்பதை அவர் அறிவாரா ?

(ஆ) மோட்டார் சைக்கிள் சாரதிக்கெதிராக ஏன் வழக்குத் தொடரப் படவில்லை ?

(இ) மோட்டார் சைக்கிள் சாரதிக்கெதிராக வழக்குத் தொடரும்படி பொலிசாருக்கு அவர் கட்டளையிடுவதுடன் காலஞ்சென்றவரது விதவையான திருமதி எச். ஏ. ஹின்னிஹாமினே என்பவருக்கு உரிய நட்டஈடு வழங்குவதற்கான நடவடிக்கைகளையும் அவர் எடுப்பாரா ?

(ஈ) இன்றேல், ஏன் ?

asked the Minister of National Security and Deputy Minister of Defence :

(*a*) Is he aware that Mr. S. S. H. Senaratna, (73), of 271/21, Wakwella Rd., Galle, met with his death as a result of a motor cycle accident on 16th March, 1985, on Wakwella Rd., Galle ?

(*b*) Why has the motor cyclist not been charged ?

(*c*) Will he order the Police to file action against the motor cyclist, and also will he take steps to grant the widow, Mrs. H. A. Hinnihamine, due compensation ?

(*d*) If not, why ?

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
**(Mr. M. Vincent Perera)**

I answer on behalf of the Hon. Minister of National Security and Deputy Minister of Defence.

(*a*) Yes.

(*b*) The Attorney-General's sanction is awaited to file plaint. Files relating to fatal accidents have to be referred to the Attorney-General in the first instance.

(*c*) Police will take necessary action on receipt of the Attorney-General's advice. The question of compensation is a civil matter. Compensation will have to be claimed in a civil action.

(*d*) Does not arise.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක මහතා**
**(கலாநிதி டபிள்யு. தஹநாயக்க)**
**(Dr. W. Dahanayake)**

Will the Hon. Minister make some sort of arrangement to see that reports and advice of the Attorney-General's Department are received within a reasonable period of time ? Now they are being delayed unduly.

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
**(Mr. M. Vincent Perera)**

I will bring that to the notice of the Hon. Minister.

## ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 29 වගන්තිය යටතේවූ දැන්වීම

### காசீச 29 ஆம் பிரிவின்கீழ் அறிவித்தல்கள்

## NOTICES UNDER SECTION 29 OF THE LAND REFORM ACT

558/85

7. **ලක්ෂ්මන් ජයකොඩි මහතා** (අත්තනගල්ල)
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி — அத்தனகல்ல)
**(Mr. Lakshman Jayakody – Attanagalla)**

අග්‍රාමාත්‍ය සහ පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් ඇමතිතුමා සහ මහාමාර්ග කටයුතු ඇමතිතුමා සහ හදිසි අවස්ථා මහජන පරිපාලන ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය :

(අ) 1981 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත 1971 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 29 වගන්තිය යටතේ වූ දැන්වීම් 1984 වර්ෂයේදී සහ 1985 සැප්තැම්බර් මස 15 දින දක්වා ශ්‍රී ලංකාවේ සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ පුවත්පත්වල පළවූ බව එතුමා දන්නේද ?

(ආ) එසේ නම්, එම පුවත්පත්වල නම් සහ අයිතිකරුවන්ද ඒ දැන්වීම් සඳහා ගෙවන ලද මුදල වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නේද ?

பிரதம அமைச்சரும், உள்ளூராட்சி, வீடமைப்பு, நிர்மாண அமைச்சரும், பெருவீதிகள் அமைச்சரும், அவசரகால சிவில் நிர்வாக அமைச்சருமான வரைக் கேட்ட வினா :

(அ) 1981 ஆம் ஆண்டின் 39 ஆம் இலக்கக் காணிச் சீர்திருத்த (விசேட ஏற்பாடுகள்) சட்டத்தினால் திருத்தப்பட்ட 1971 ஆம் ஆண்டின் 1 ஆம் இலக்கக் காணிச் சீர்திருத்தச் சட்டத்தின் 29 ஆம் பிரிவின் கீழான அறிவித்தல்கள் 1984 ஆம் ஆண்டிலும், 1985, செப்ரெம்பர் 15 ஆந் தேதி வரையும் இலங்கையிலுள்ள சிங்கள, தமிழ், ஆங்கிலச் செய்திப் பத்திரிகைகளில் வெளியிடப் பட்டன என்பதை அவர் அறிவாரா ?

(ஆ) ஆமெனில், இச்செய்திப் பத்திரிகைகளின் பெயர்களையும், இதன் உரிமையாளர்களையும், இவ்வறிவித்தல்களுக்காகச் செலுத்தப் பட்ட பணத்தையும் வெவ்வேறாக அவர் குறிப்பிடுவாரா ?

asked the Prime Minister, Minister of Local Government, Housing and Construction Minister of Highways and Minister of Emergency Civil Administration :

(*a*) Is he aware hat notices under Section 29 of the Land Reform Act, No. 1 of 1971 as amended by Land Reform (Special Provisions) Act, No.39 of 1981 were published in the Sinhala, English and Tamil newspapers of Sri Lanka in 1984 and upto 15th September, 1985 ?

(*b*) If so, will he state separately the names and owners of those newspapers and the amount paid for those notices ?

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
**(Mr. M. Vincent Perera)**

On behalf of the Prime Minister, Minister of Local Government, Housing and Construction, Minister of Highways and Minister for Emergency Civil Administration, as this is a long Answer may I table it ?

**කථානායකතුමා**
**(சபாநாயகர் அவர்கள்)**
**(Mr. Speaker)**

The Answer may be tabled.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

* සභාමේසය මත තබන ලද පිළිතුර :
சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :
*Answer tabled :*

(*a*) Yes.

(*b*) The names and addresses of those newspapers and the amount paid for those notices are as follows :

(1) *Names and Addresses of Newspapers :*

*Independent Newspapers, Colombo*
The Sun
Davasa
Dinapathi

*Associated Newspapers of Ceylon Ltd., Colombo*
The Daily News
Dinamina
Thinakaran

*U.N.P. Publication, Pita Kotte*
Siyarata

*Upali Newspapers Limited, Colombo*
The Island

(2) Payments made to the respective newspapers during 1984 and upto September, 1985 are as follows :–

| *Names and address of Newspapers* | *1984 Rs.* | *1985 Rs.* |
|---|---|---|
| *Indipendent Newspapers, Colombo.* | | |
| Sun | 63,345.00 | 57,195.00 |
| Dawasa | 69,802.50 | 57,605.00 |
| Dinapathi | 26,475.00 | 25,987.50 |
| *Associated Newspapers of Ceylon Ltd., Colombo* | | |
| Daily News | 89,540.00 | 80,437.50 |
| Dinamina | 85,628,25 | 68,103.00 |
| Thinakaran | 26,764.00 | 24,640.00 |
| *U.N.P. Publication, Pita Kotte* | | |
| Siyarata | 14,850.00 | 19,225.00 |
| *UpaliNewspapersLtd.,Colombo* | | |
| TheIsland | — | 30,510.00 |

එම්. ඒ. සිරිසේන මහතා : සේ. අ. අ.
திரு. எம். ஏ. சிறிசேன : அசேஊசேநி
MR. M. A. SIRISENA : P.S.P.F.

476/85

5. ලක්ෂ්මන් ජයකොඩි මහතා—(රිචඩ් පතිරණ මහතා—අක්මීමන—වෙනුවට)

(திரு. லக்ஷ்மன் ஜயக்கொடி — திரு. றிச்சட் பத்திரன —அக்மீமன — சார்பாக)

(Mr. Lakshman Jayakody on behalf of Mr. Richard Pathirana–Akmeemana)

කෘෂිකාර්මික සංවර්ධනය හා පර්යේෂණ ඇමතිතුමා සහ ආහාර හා සමූපකාර ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය :

(අ) ලබුදූව රජයේ ගොවිපලේ කම්කරු ඇම්. ඒ. සිරිසේන මහතා තම රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ලබගැනීම සඳහා 1981.09.29 දින අදාල ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති බව එතුමා දන්නේද ?

(ආ) මෙතෙක් එම මුදල් සිරිසේන මහතාට ලබාදී නොමැති නිසා වහාම මුදල් ගෙවීමට එතුමා නියෝග කරන්නේද ?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද ?

விவசாய அபிவிருத்தி, ஆராய்ச்சி அமைச்சரும், உணவு, கூட்டுறவு அமைச்சருமானவரைக் கேட்ட வினா :

(அ) லபுதூவ அரசாங்கப் பண்ணையின் தொழிலாளியான திரு. எம். ஏ. சிறிசேன என்பவர் தமது அரசாங்க சேவை ஊழியர் சேமலாப நிதியைப் பெற்றுக்கொள்வதற்கு 29.9.1981 ஆம் தேதி சம்பந்தப்பட்ட விண்ணப்பப் பத்திரத்தைச் சமர்ப்பித்திருப்பதை அவர் அறிவாரா ?

(ஆ) இதுவரை இப்பணத்தை திரு. சிறிசேன பெற்றுக்கொள்ளவில்லையாகையால் உடனே பணத்தை வழங்க அவர் கட்டளையிடுவாரா ?

(இ) இன்றேல், ஏன் ?

asked the Minister of Agricultural Development and Research and Minister of Food and Co-operatives :

(*a*) Is he aware that Mr. M. A. Sirisena, labourer on the Labuduwa State Farm has submitted on 29.09.1981 the relevant application forms to obtain his Public Service Provident Fund ?

(*b*) As Mr.Sirisena has not been granted that money so far, will he order that the money be paid immediately ?

(*c*) If, not, why ?

එස්. එස්. අබේසුන්දර මහතා (වැඩබලන කෘෂිකාර්මික සංවර්ධන හා පර්යේෂණ ඇමතිතුමා)

(திரு. எஸ். எஸ். அபேசுந்தர — பதில் கமத்தொழில் அபிவிருத்தி, ஆராய்ச்சி அமைச்சர்)

(Mr. S. S. Abeysundera–Acting Minister of Agricultural Development & Research)

(*a*) Yes.

(*b*) The money will be paid when the Provident Fund award is sanctioned by the Secretary/Public Service Provident Fund.

(*c*) Does not arise.

## පණත් කෙටුම්පත් පිළිගැන්වීම
### சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### විත්‍රපට කලාකරුවන් හා විත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික විත්‍රපට සංස්ථා භාරය පනත් කෙටුම්පත

### திரைப்படக் கலைஞர்களுக்கும் தொழில்நுட்பவியலாளர்களுக்குமான தேசிய திரைப்படக் கூட்டுத்தாபன நம்பிக்கைப் பொறுப்புச் சட்டமூலம்

### NATIONAL FILM CORPORATION TRUST FOR FILM ARTISTES AND TECHNICIANS BILL

"To provide for the Establishment of a Trust called the National Film Corporation Trust for Film Artistes and Technicians ; to specify its objects and powers and to provide for matters connected therewith or incidental thereto."

*පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍යතුමා, පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් ඇමතිතුමා, මහාමාර්ග ඇමතිතුමා සහ හදිසි අවස්ථා මහජන පරිපාලන ඇමතිතුමා වෙනුවට එම්. වින්සන්ට් පෙරේරා මහතා විසිනි. 1985 නොවැම්බර් 26 වන අඟහරුවාද දෙවන වර කියවිය යුතුයයිද, එය මුද්‍රණය කළ යුතුයයිද නියෝග කරන ලදී.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

*பிரதம அமைச்சரும் உள்ளூராட்சி, வீடமைப்பு, நிர்மாண, அமைச்சரும் நெடுஞ் சாலைகள் அமைச்சரும் அவசரகால சிவில் நிர்வாக அமைச்சருமானவர் சார்பில் திரு. எம். வின்சன்ற் பெரேரா அவர்களால் சமர்ப்பிக்கப்பட்டது. 1985, நொவம்பர் 26 செவ்வாய்க்கிழமை இரண்டாம் முறையாக மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப் பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by Mr. M. Vincent Perera on behalf of the Prime Minister, Minister of Local Government, Housing and Construction, Minister of Highways and Minister of Emergency Civil Administration to be read a Second time upon Tuesday, 26th November 1985, and to be printed.*

## පාර්ලිමේන්තුවේ කටයුතු
### பாராளுமன்ற அலுவல்
## BUSINESS OF THE PARLIAMENT

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
**(Mr. M. Vincent Perera)**

I move,

"That the proceedings on Item 13 of Public Business appearing on the Paper be exempted at this day's sitting from the provisions of Standing Order No. 23."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## විසර්ජන පනත් කෙටුම්පත, 1986
### ஒதுக்கீட்டுச் சட்டமூலம், 1986
## APPROPRIATION BILL, 1986

*කල් තබන ලද විවාදය තව දුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී. ඊට අදාළ ප්‍රශ්නය [නොවැම්බර් 13.]*

*"පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය "—[ආර්. ජේ. ජී. ද මැල් මහතා]*

*ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.*

*ஒத்திப்போடப்பட்ட விவாதம் மீளத் தொடங்குதற்கான கட்டளை வாசிக்கப்பட்டது. வினா —[நொவம்பர் 13]*

*"சட்டமூலம் இப்பொழுது இரண்டாம் முறை மதிப்பிடப்படுமாக" [திரு. ஆர். ஜே. ஜீ. த மெல்]*

*வினா, மீண்டும் எடுத்தியம்பப்பட்டது.*

*Order read for resuming Adjourned Debate on Question*–[13th November]

"That the Bill be now read a Second time".–[MR. R. J. G. de Mel]

*Question again proposed.*

පූ. භා. 9.13

**ගාමිණී අතුකෝරල මහතා (නියෝජ්‍ය යොවන කටයුතු හා රැකිරක්ෂා ඇමතිතුමා)**
**(திரு. காமினி அத்துக்கோறல — இளைஞர் அலுவல்கள், தொழில் வாய்ப்புப் பிரதி அமைச்சர்)**
**(Mr. Gamini Atukorale – Deputy Minister of Youth Affairs & Employment)**

ගරු කථානායකතුමනි, පසුගිය සිකුරාද මෙම සභාව කල් තබන අවස්ථාවේදී මා ප්‍රකාශ කරමින් සිටියේ අපේ ගරු මුදල් ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන ලද මෙම නව වන අයවැය යෝජනා ගැන මොන ආකාරයට අප කල්පනා කරන බැලිය යුතුද යන කාරණය පිළිබඳවයි. මෙම අයවැය යෝජනා සම්බන්ධයෙන් ආර්ථික වශයෙන් මෙන්ම සංඛ්‍යාත්මක වශයෙනුත්, දීර්ඝ ලෙස විස්තර කරන්නට මා බලාපොරොත්තු වෙන්නේ නැහැ. ඇත්තෙන්ම මෙම අයවැය යෝජනා ඉදිරිපත් කරන මේ අවස්ථාවේදී රටේ වර්තමාන වාතාවරණය කෙසේද, 1977 සිට වර්ෂයක් පාසා එකිනෙකට සම්බන්ධකර ඇති යෝජනා මගින් ලැබුණු ප්‍රතිඵල මොනවාද ? මොන විධියේ වෙනස්කම් රටේ ඇති වී තිබෙනවාද, ඒ වාගේම වර්තමානයේ ඉදිරිපත් කර ඇති අයවැය යෝජනාවලින් මොන විධියේ ප්‍රයෝජන අපේ රටේ ජනතාවට අත්වෙයිද කියන කාරණා ගැන අප කල්පනා කර බලන්නට ඕනෑ.

ගරු කථානායකතුමනි, අපේ රජයේ නව වන අයවැය යෝජනා ඉදිපත් කරන මේ අවස්ථාවේදී රටේ වර්තමාන තත්ත්වය මොකක්ද ? අපේ ගරු මුදල් ඇමතිතුමා මේ ගරු සභාවේදී එද ප්‍රකාශ කළා, යුද්ධමය අයවැය ලේඛනයක් තමන් ඉදිරිපත් කර ඇති බව. ඒ කියන්නේ 1978 දී ආරක්ෂා කටයුතු සඳහා රුපියල් දස ලක්ෂ 560ක් පමණ වෙන් කර තිබුණු අතර මේ අවුරුද්ද වන විට ඒ මුදල රුපියල් දස ලක්ෂ 6,196 දක්වා වැඩි කරන්නට සිදු වී ඇති බව පෙනී යනවා. මේ අතර පසුගිය දින කීපය තුළ දී ත්‍රස්තවාදී ව්‍යාපාරය නිසා දිනපතාම වාගේ නොයෙකුත් ඛේදවාචක ගැන අපට අසන්නට ලැබෙනවා. පසුගිය සිකුරාද මේ ගරු සභාව රැස්වී තිබුණු අවස්ථාවේදී මෙන්ම ඊට පසුවදත්, මේ රටේ සාමය හා එක්සත් භාවය ආරක්ෂා කිරීම සඳහා ක්‍රියා කරන හමුදාවල මෙන්ම පොලීසියේ නිලධාරී මහතුන් කීප දෙනෙක්ම ත්‍රස්තවාදී අතවරවලට ගොදුරු වී අප අතරින් වෙන් වී ගියා. එවැනි වකවානුවකදීයි මෙම අයවැය යෝජනා ඉදිරිපත් කර තිබෙන්නේ. මෙම ත්‍රස්තවාදීන් කොයි තරම් භයානක පිරිසක්ද කියනවා නම්, අපේ රටේ අග්‍රවිනිශ්චයකාරතුමාටත්, නීතිපතිතුමාටත් තර්ජනාත්මක ලිපි එවා ඇති බවට ප්‍රවෘත්තියක් ඉරිද එක්තරා ප්‍රවෘත්ති පත්‍රයක පළ වී තිබුණා. අන්න ඒ වාගේ තත්ත්වයක් පවතින අවස්ථාවක, රටේ ආරක්ෂක කටයුතුවලට විශාල මුදලක් වෙන් කර, දැනට එල්ල වී ඇති එම තත්ත්වයට මුහුණ දී කෙසේ හෝ ඒ තත්ත්වයෙන් රට ගලවා ගැනීම මේ රටේ ජනතාවගේත්, විශේෂයෙන්ම අපේ ගරු මුදල් ඇමතිතුමාගේත් බලාපොරොත්තුව බව ප්‍රකාශ කරන්නට කැමතියි.

ගරු කථානායකතුමනි, සංඛ්‍යාලේඛන ගෙන බැලුවොත් පසුගිය අවුරුදු දෙක තුළදී ආරක්ෂක කටයුතු සඳහා විශාල මුදලක් වෙන් කරන්නට සිදු වුණු බව අපට පෙනී යනවා. 1978 දී ආරක්ෂක කටයුතු සඳහා වෙන් කරනු ලැබුවේ රුපියල් දස ලක්ෂ 560ක පමණ මුදලක් බව මම කලිනුත් කිව්වා. නමුත් මේ වන විට එම රුපියල් දස ලක්ෂ දහස් ගණනකින් වැඩි කරන්නට සිද්ධ වුණා. ඇත්තෙන්ම මේ රටේ ජනතාවගේ මෙන්ම, අනාගත පරම්පරා වගේත් සුභ සාධනය සඳහා යොදවන්නට ඇති විශාල මුදල් සම්භාරයක් දැන් රටේ ආරක්ෂාව සඳහා යොදවන්නට සිදු වී තිබෙනවා. විශේෂයෙන්ම 1983 දී රටේ ඇති වුණු ඒ කනගාටුදායක සිද්ධීන් ගැන අපේ අවධානය යොමු කරන විට, එම සිද්ධීන්වලින් පසු පුනරුත්ථාපන කටයුතුවලට සෑහෙන මුදලක් වැය කරන්නට සිදු වුණාය, ඒ වාගේම මේ රටට විවිධ මාර්ගවලින් ලැබෙන්නට තිබුණු ආදායම නොලැබී ගියාය කියන කාරණාත් අප මතක් කරන්නට ඕනෑ. නමුත් මේ වාගේ තත්ත්වයක් තිබුණාය කියා මේ රටේ ප්‍රාදේශීය සංවර්ධනය සඳහා වෙන්කර තිබෙන මුදල් ගරු මුදල් ඇමතිතුමා කපා හැරියේ නැහැ. එහෙම නැත්නම් ඒ සඳහා මුදල් ලබා නොදී සිටියේ නැහැ. 1978 සිට මැතිවරණ කොට්ඨාශයකට රුපියල් ලක්ෂ 25 බැගින් ලබා දෙන්නට පටන් ගත් බව අපි දන්නවා. ඊට පසුව ඒ මුදල ලක්ෂ 52 දක්වා වැඩි කළා. ඒ අනුව විමධ්‍යගත අයවැයෙන් සහ වෙනත් මුදල් ප්‍රතිපාදනවලින් එක් මැතිවරණ කොට්ඨාශයකට ලක්ෂ 52ක පමණ මුදලක් ලැබෙනවා. පසුගිය අවුරුදු අට තුළ මන්ත්‍රීවරුන් හැටියට දිවයිනේ සෑම මැතිවරණ කොට්ඨාශයක් පාසාම විශාල ප්‍රගතියක්, විශාල සංවර්ධනයක් ඇති කරන්නට අපට අවකාශ ලැබුණේ ඒ නිසාය කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්නට ඕනෑ.

අද අධ්‍යාපන ක්ෂේත්‍රය ගැන කල්පනා කර බලන්න. අද මේ රටේ සිටින කුඩා දරුවන් තමයි හෙට මේ රටේ සමාජයේ අනාගත වගකීම භාර ගන්නට සිටින්නේ. ඒ උදවිය අනාගතයේ වගකීම භාර ගැනීමට හැකි, වගකිවයුතු පුද්ගලයන් බවට පත් කරන්නේ අධ්‍යාපනය තුළිනුයි. වර්තමාන රජය බලයට ආවාට පසුව අධ්‍යාපන ක්ෂේත්‍රයේ වෙනස්වීම් රාශියක් සිදු වී තිබෙනවා. ගරු ජනාධිපතිතුමාගේ අදහසක් පරිදි පාසල් සිසුන්ට නොමිලයේ පොත්පත් ලබා දුන්නා. එපමණක් නොවෙයි, පාඨශාලාවලට අවශ්‍ය ගොඩනැගිලි සහ අනිකුත් අවශ්‍යතාවන් ලබා දුන්නා. උපකරණ ලබා දුන්නා. ඒ හැරුණු විට අද තුන්වන ලෝකයේ අනිකුත් රටවල් සමඟ සංසන්දනය කරන්නට පුළුවන් අන්දමේ නවීන තාක්ෂණය තුළින් මේ රටේ අධ්‍යාපනික කටයුතු පුළුවන් තරම් දියුණු මට්ටමකට ගෙන ඒමට මේ රජය කටයුතු කර තිබෙනවා. විශේෂයෙන් ආරක්ෂක කටයුතුවලට හැරුණුකොට ඉතාමත් විශාල මුදල් ප්‍රමාණයක් අධ්‍යාපනය සඳහා වෙන් කර තිබෙන බව මේ අයවැය යෝජනා දෙස බැලුවාම අපට පෙනෙනවා.

ඒ වාගේම ඊට අමතරව එදිනෙද ජන ජීවිතයට අවශ්‍ය වන විදුලිබල යෝජනාක්‍රම වැනි අනිකුත් අවශ්‍යතාවන් පසුගිය අවුරුදු කීපය තුළදී සෑහෙන්න ලබා දී තිබෙනවා. රත්නපුර දිස්ත්‍රික්කයේ ගම්බද ඉතාම දුෂ්කර ප්‍රදේශවලින් සමන්විත මැතිවරණ කොට්ඨාශයකුයි මා නියෝජනය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගාමිණී අතුකෝරල මහතා]

කරන්නේ. අවුරුදු ගණනාවක් තිස්සේ ඒ ප්‍රදේශයට නොලැබුණු පහසුකම් ඒ ප්‍රදේශයේ ජනතාවට ලබා දීමට අපට හැකි වුණේ ගරු මුදල් ඇමතිතුමා පසුගිය අවුරුදු කීපය තුළ ඉදිරිපත් කළ අයවැය යෝජනාවල ප්‍රතිඵලයක් හැටියට බව මම මේ අවස්ථාවේදී මතක් කරන්නට ඕනෑ. මැතිවරණ කොට්ඨාශ මට්ටමින් බැලුවොත් අවුරුදු ගණනාවක් තිස්සේ මේ රටේ කිසිම රජයකින් නොකෙරුණු අන්දමේ අති විශාල වැඩ කටයුතු රාශියක් 1977 සිට මේ දක්වා කෙරී තිබෙන බව ජනතාවගෙන් තේරී පත් වුණු නියෝජිතයෙක් හැටියට නොබියව මට ප්‍රකාශ කරන්නට පුළුවන්.

එපමණක් නොවෙයි, ගරු කථානායකතුමනි, අද මේ රටේ ජනතාවගෙන් සියයට 21 ක් පමණ ජීවත් වන්නේ නාගරික ප්‍රදේශවලයි. උදාහරණයක් හැටියට අපි කොළඹ ප්‍රදේශය අරගෙන බලමු. කොළඹ ප්‍රදේශයේ දියුණුව මීට පෙර සීමා වී තිබුණේ එක්තරා සීමිත ප්‍රදේශයකට පමණයි. නමුත් අද කොළඹ සහ ඒ අවට ප්‍රදේශ ඉතාමත් ශීඝ්‍රයෙන් සංවර්ධනය කෙරීගෙන යනවා. විශේෂයෙන් ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ අවට ප්‍රදේශය ගැන කල්පනා කර බලන්න. එද මෙහි සමහර පළාත් අපේ ගම්බද ප්‍රදේශවල තත්ත්වයටයි තිබුණේ. නමුත් අද එම පළාත් සෑහෙන දුරට සංවර්ධනය වී තිබෙනවා. එද මේ ප්‍රදේශයේ ගම්බද ජනතාව පර්ච් එකක් රුපියල් සියයට, දෙසියයට, තුන්සියයට විකුණූ ඉඩම් අද රුපියල් 7,500, රුපියල් 8,000, රුපියල් 8,500 වැනි ගණන්වලට විකුණන්නට අවස්ථාව ලැබී තිබෙන්නේ මේ රජය කොළඹ සහ තදාසන්න ප්‍රදේශවල කරගෙන ගිය සංවර්ධන වැඩ කටයුතු නිසයි. මේ ප්‍රදේශ සංවර්ධනය කරන විට ඒවාට අවශ්‍ය මූලික අවශ්‍යතාවන් රාශියක් තිබෙනවා. මහා මාර්ග, විදුලි බලය සහ අනිකුත් පහසුකම් රාශියක් අවශ්‍යයි. ඒ පහසුකම් මේ රජය ලබා දී තිබෙනවා. එපමණක් නොවෙයි, අද කොළඹ ප්‍රදේශයේ විදුලි සංදේශ පද්ධතිය සම්පූර්ණයෙන්ම නවීකරණය වෙමින් පවතිනවා. විදුලිබල පද්ධතිය නවීකරණය කරගෙන යනවා. එපමණක් නොවෙයි. ජලාපවහන අංශ පවා සම්පූර්ණයෙන්ම නවීකරණය කරගෙන යන බව අපට හොඳට පෙනෙනවා. එහෙම නම් මේ කටයුතු සඳහා සෑහෙන මුදල් ප්‍රමාණයක් මේ රජයේ ගරු මුදල් ඇමතිතුමා ලබා දී තිබෙනවාය කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්නට ඕනෑ.

අද කල්පනා කර බලන්න, ජල හිඟයෙන් නොයෙකුත් කරදර තිබෙන ගම්බද පළාත්වලටත් ජලය ලබා දී තිබෙනවා. 1985 වසර තුළ මා හිතන්නේ රත්නපුර දිස්ත්‍රික්කයට නළ ළිං හාර සියයකට, පන් සියයකට අධික ප්‍රමාණයක් දී තිබෙනවා. මෙතන රත්නපුර ගරු දිසා ඇමතිතුමා ඉන්නවා. එතුමාත් ඒ ගැන සාක්ෂි දරනවා ඇති. මේ සෑම එකකින්ම ප්‍රයෝජනය ලැබෙන්නේ මේ රටේ ජනතාවටයි. ජනතාවට එහෙම ප්‍රයෝජනයක් ලැබෙනවා නම් මේ අයවැය යෝජනා තුළින් මුදල් නිසියාකාරව යොදවා එහි ප්‍රතිඵලය මේ රටේ ජනතාවට ලබා දී තිබෙනවාය කියන එක මම මතක් කරන්න ඕනෑ.

නිවාස ගැන කියනවා නම් මම කියන්නට ඕනෑ 1977 දී නිවාස ලක්ෂයක් හදනවා කියා අපේ ගරු අගමැතිතුමා ප්‍රකාශ කළ බව. එද එතුමා එහෙම ප්‍රකාශ කරන කොට විරුද්ධ පාර්ශ්වය කථා කළේ මොන ආකාරයෙන්දැයි කියන්න මම බලාපොරොත්තු වෙන්නේ නැහැ. 1977 දී විරුද්ධ පාර්ශ්වය එසේ කීම ගැන මම පුදුම වෙන්නේ නැහැ. අපේ ගරු මුදල් ඇමතිතුමා මේ රටේ මුදල් අමාත්‍යාංශය භාර ගන්න කොට මේ රට ආර්ථික වශයෙන් ප්‍රපාතයකට වැටී තිබුණා පමණක් නොවෙයි බංකොලොත් භාවය ලබපු මුදල් තත්ත්වයකුයි තිබුණේ. අද ක්‍රම ක්‍රමයෙන් එය දියුණු කරගෙන ඇවිත් තිබෙනවා. 1977 දී නිවාස ලක්ෂයක් හදනවා කීවාම තමුන්නාන්සේලා එද අපට උසුලු විසුලු කළා ; අපේ ගරු අග්‍රාමාත්‍යතුමා ගැන නොයෙකුත් ප්‍රකාශ කළා. නමුත් නිවාස ලක්ෂයෙන් නැවතුනේ නැහැ. එක්ලක්ෂ පනස්තුන් දහසක් හැදුවා. අද ඊටත් වඩා සාර්ථක ක්‍රමයක් ආරම්භ කර තිබෙනවා. නිවාස දශ ලක්ෂයේ වැඩ පිළිවෙළ යටතේ මම කියන්න ඕනෑ අපගේ ගම්බද ප්‍රදේශවලට අද සෑහෙන විධියේ වාසියක් ලැබී තිබෙන බව. තමන්ගේ පුද්ගලික සහ ආර්ථික ප්‍රශ්න නිසා එද අළුතෙන් නිවසක් තනා ගන්න, තිබෙන නිවස වැඩි දියුණු කරගන්න බැරිව විශාල පිරිසක් ජීවත් වුණා. ඒ ගොල්ලන්ට ඉතාමත් සුළු ප්‍රමාණයක් මුදල් අවශ්‍ය වී තිබුණේ. අද ඒ උදවියට මේ නිවාස දශ ලක්ෂයේ වැඩ සටහන තුළින් තමන්ගේ නිවාස ප්‍රතිසංස්කරණය කර ගන්නට අවස්ථාවක් තිබෙනවා පමණක් නොවෙයි, ඒ උදවියටම කියා හොඳ නිවසක ජීවත්වීමේ වාසනාව ඒ උදවියට ලබා දී තිබෙන බව තමුන්නාන්සේට මතක් කරන්න ඕනෑ.

1977 ට ප්‍රථම මේ රටේ—මේ දිවයිනේ—දිස්ත්‍රික්කවල ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන සැලැස්මක් කවදාවත් ක්‍රියාත්මක වුණේ නැහැ. දැන් මේ මොහොත වන විට දිස්ත්‍රික්ක දොළහක එය ක්‍රියාත්මක වෙනවා. තවත් දිස්ත්‍රික්ක තුනක් ඒ සඳහා තෝරා ගෙන තිබෙනවා. තවත් දිස්ත්‍රික්ක තුනක සමීක්ෂණ පවත්වා ඒවායේත් මෙම සැලැස්ම ක්‍රියාත්මක කළ හැකිය කියා ප්‍රකාශ කර තිතබෙනවා. එහෙම නම් මේ රටේ දිස්ත්‍රික්ක විසිපහෙන් දිස්ත්‍රික් දහ අටකම මේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන යෝජනා ක්‍රමය තුළින් දැනුත්, ඉදිරි අනාගතයේදීත් සෙත සැලසෙනවාය කියන එක අපි ප්‍රකාශ කරන්න ඕනෑ. රත්නපුර දිස්ත්‍රික්කයට නෙදර්ලන්ත රටෙන් ග්‍රාමීය ඒකාබද්ධ සංවර්ධන යෝජනා ක්‍රමයක් ලබාදීම ගැන විශේෂයෙන් අපේ ගරු මුදල් ඇමතිතුමාට රත්නපුර දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක් හැටියට මගේ ප්‍රශංසාව පළ කරන්න ඕනෑ. අපේ මැතිවරණ කොට්ඨාශ භූමි ප්‍රමාණයෙන් ඉතාමත් විශාල මැතිවරණ කොට්ඨාශ බව තමුන්නාන්සේ දන්නවා. ඒවායේ සංවර්ධනය සඳහා අපට දැන් ලැබෙන ලක්ෂ පනස් දෙකෙන් සංවර්ධනය කරගෙන යන කොට, තවත් සංවර්ධන කළයුතු වැඩ කොටස් රාශියක් ඉතුරු වෙනවා. අපට ඒ වැඩ කොටස් මේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන යෝජනා ක්‍රමය තුළින් ක්‍රියාත්මක කරන්න අවස්ථාව ලැබී තිබෙනවා. එහෙම නම් මීට ප්‍රථම කවදාවත් නොලැබුණු මුදල් ප්‍රමාණයක් අද ගම්බද පළාත් සංවර්ධනය කිරීම සඳහා ලැබී තිබෙනවා. විශේෂයෙන්ම අපට එසේ කළ හැකි වූයේ 1978 සිට මේ දක්වා ඉදිරිපත් කළ අයවැය යෝජනා සහ අපේ මුදල් ප්‍රතිපත්තිය නිසාය කියන එක මම මේ අවස්ථාවේ දී මතක් කරනවා.

ගරු කථානායකතුමනි, ඊළඟට අප කල්පනා කර බලන්න ඕනෑ ඕනෑම සමාජයක ජීවනාලිය හැටියට හඳුන්වන්න පුළුවන් තරුණ කොටස් ගැන. 1977 දී ගරු මුදල් ඇමතිතුමා මුදල් අමාත්‍යාංශය භාර ගන්න අවස්ථාවේදී මේ රටේ තිබුණේ සම්පූර්ණයෙන්ම වැසී ගිය ආර්ථික ක්‍රමයක් බව අප දන්නවා. එතුමා විවෘත ආර්ථික ක්‍රමයක් ඇති කිරීමෙන් මේ රටේ තරුණ තරුණියන්ගේ රැකියා ප්‍රශ්නය විසඳීමට වැඩ පිළිවෙලවල් කීපයක්ම ගත්තා. විවෘත ආර්ථිකයක් තිබෙන කොට හුවමාරුව වැඩි වෙනවා. එතකොට කටයුතු අධික වන නිසා රැකියා අවස්ථා වැඩි වෙනවා. උදාහරණයක් වශයෙන් විදේශීය ආයෝජන උපදේශක කමිටුව මගින් අනුමත කර තිබෙන කර්මාන්ත සංඛ්‍යාව ගැන අපි කල්පනා කර බලමු. 1978 සිට මේ වන විට ඒ කර්මාන්ත—ව්‍යාපෘති—හාරසිය හතළිස් හතරක් අනුමත කර, එයින් දෙසිය හැත්තෑපහක් ආරම්භ කර 40,725 කට පමණ රැකියාවල් ලබා දී තිබෙනවා.

නිදහස් වෙළඳ කලාපය ගැන කථා කරන කොට අපට කියන්න පුළුවන් මේ දක්වා 1985 සැප්තැම්බර් මාසය වන තෙක් 35,190 කට රස්සාවල් ලැබී තිබෙනවාය කියා. 1985 සැප්තැම්බර් සිට මේ දක්වා තවත් ව්‍යාපෘති 11 පමණ අනුමත කර තිබෙනවා. ඒකෙනුත් නව රක්ෂා 4,446ක් පමණ ලැබේවිය කියා අපිට දැන ගන්නට ලැබී තිබෙනවා. ඒවගේම අර මම කලින් කී විදේශීය උපදේශක කමිටුවෙන් තවත් රැකියා 13 දහසක් අලුත් ව්‍යාපෘති නිසා ලැබෙනවා. එවිට එයින් තරුණ තරුණියන් එක් ලක්ෂ පහළොස් දහසකට පමණ කෙළින්ම රක්ෂා ලැබෙන විට ඒ උදවියගෙන් යැපෙන්නන් විශාල සංඛ්‍යාවකට සහන සැලසෙනවා. ඒ වගේම එයින් ලැබෙන අතුරු රැකියා අවස්ථාවනුත් වැඩි වෙනවා. එසේනම් එයින් නිසි පල ප්‍රයෝජන ලබා තිබෙනවා.

ගරු කථානායකතුමනි, එතුමා ඒ ගැන එපමණක් නොවෙයි, කල්පනා කළේ. තවත් අංශයකින් කල්පනා කර තිබෙනවා. මේ රටේ දේශීය ආයෝජන උපදේශක කමිටුව මගින් ව්‍යාපෘති 6,653ක් පමණ අනුමත කර තිබෙනවා. මේවගේ කර්මාන්ත ඇති කරන්නට, ඇති කරන්නට මේවා සඳහා පුළුල් විධියට අවශ්‍යතා සපයන්නට සිද්ධ වෙනවා. අපි දන්නවා, මේ නවීන කර්මාන්ත ශාලා ඇති කරන්නට විදුලි බලය අවශ්‍ය වෙන බව. ඒ විදුලි බලය ලබා ගන්නට වුවමනා කරන විදුලි බලාගාර සහ බහු කාර්ය ජලාශ දැනට මහවැලි කඩිනම් ව්‍යාපාරය යටතේ ඇති කර තිබෙනවා. මේ කටයුතු සඳහා මුදල් සෑහෙන ප්‍රමාණයක් ලබා දෙන්නට පුළුවන් වී තිබෙන්නේ එතුමාගේ මේ මුදල් ප්‍රතිපත්ති නිසයි.

ඊළඟට, අපේ වරායවල්, අපේ ගුවන් තොටුපලවල් සංවර්ධනය කරන්නට අවශ්‍ය වෙනවා. මේවා සංවර්ධනය කරන්නට සෑහෙන මුදල් ප්‍රමාණයක් අවශ්‍ය වෙනවා. එසේම ඒ සඳහා අවශ්‍ය මුදල් ලබා දී තිබෙනවා. මේ අන්දමටයි, එතුමා කටයුතු කර ගෙන යන්නේ. ඒවාගේම එතුමා ප්‍රකාශ කර තිබෙනවා, ලබන වර්ෂයේ සමනල වැව යෝජනා ක්‍රමය සම්පූර්ණයෙන්ම ආරම්භ කරනවාය කියා. විශේෂයෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක් හැටියට මම එතුමාට ස්තුතිවන්ත වෙනවා, මේ සමනල වැව යෝජනා ක්‍රමය ආරම්භ කිරීම ගැන.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු කථානායකතුමනි, ඊළඟට අපි කල්පනා කර බලමු. මේ රටේ කෘෂිකර්මාන්තයට විශේෂයෙන්, තේ, පොල්, රබර්වලට පසුගිය අවුරුදු කීපය තුළ මොන විධියේ සහන සැලසුනාද, ඒවායින් මොන විධියේ ප්‍රතිඵලයක් ලැබුනාද කියා. 1977 වර්ෂයේ සිට එතුමා අවුරුද්දෙන් අවුරුද්ද තේ, රබර් සහ පොල් නැවත වගා කිරීමේ සහනාධාර වැඩි කළා. ඒවාගේම ඒවාට අවශ්‍ය ඇබෑර්තු පිරවීමට අවශ්‍ය සහනාධාර ක්‍රමයෙන් වැඩි කළා. ඒ නිසා අපිට පුළුවන් වුණා 1982 - 83 වර්ෂය වන විට විශේෂයෙන් කුඩා වතු අංශයේදී නිෂ්පාදනය වැඩි කරන්නට. ඒ නිෂ්පාදනයත් වැඩි වුණු නිසා 1983 - 84 වර්ෂය වන විට තේ මිල වැඩිවීමෙන් නිසි ප්‍රයෝජන ගන්නට මේ රටේ කුඩා වතු හිමියන්ට අවස්ථාවක් ලැබුණාය කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරනවා. එතුමා කුඩා වතු ගැන පමණක් නොවෙයි, කටයුතු කර තිබෙන්නේ. 1972 වර්ෂයේදී මේ රටේ කෘෂිකර්මාන්තයට සැහෙන පහරක් වැදුනා. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම තුළින් රජයට පවරා ගත් විශාල වතුවල අවුරුදු ගණනක් තිස්සේ කිසි නඩත්තුවක් කෙරුණේ නැහැ. ඒ වතු හිමියන් දූනගෙන හිටියා, එවකට තිබුණු රජය මේ වතු රජය සතු කරාවිය කියා. එම නිසා ඔවුන් එම ඉඩම් දියුණු කිරීම සම්පූර්ණයෙන්ම නවත්වා තිබුණා. එම නිසා මේ ඒ අවුරුදු කීපය තුළ එම වතු වැඩි දියුණු නොකළ නිසා එම වැවිලි එන්ට එන්ටම පිරිහෙන්ට පටන් ගත්තා. එම නිසා විශේෂයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවටත් ජනතා වතු සංවර්ධන මණ්ඩලයටත් අයිති එම වතු සංවර්ධනය කරන්නට එතුමා මැදි කාලීන ආයෝජන වැඩ පිළිවෙළ – මීඩියම් ටර්ම් ඉන්වෙස්ට්මන්ට් ප්‍රෝග්‍රෑම් – ඇති කර, දස ලක්ෂ පන්දහසකට අධික මුදලක් එමගින් ඒ වතු අංශයට ලබා දී තිබෙනවා. ඒ විධියට වතු දියුණු කර වතුවල නිෂ්පාදනය වැඩි කරන්නට වැඩි කරන්නට ඒවායේ සේවය කරන සංඛ්‍යාවත් වැඩි වෙනවා. එවිට රක්ෂා ලබා ගන්නා සංඛ්‍යාවත් වැඩි වෙනවා. එය අපේ රටට වූ විශාල සෙතක් හැටියට හඳුන්වන්න පුළුවන්.

එතුමාගේ අයවැය කථාවේදී කියන්නට යෙදුණා, මෙවැනි ක්‍රමයක් රාජ්‍ය අංශයට පමණක් නොවෙයි, පෞද්ගලික අංශයටත් ඇති කරනවාය කියා. ඒ ගැන මම සන්තෝෂ වෙනවා. මම එතුමාට විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා, එවැනි ක්‍රමයක් පෞද්ගලික අංශයටත් ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම ගැන. අපට බොහෝ අවස්ථාවලදී විරුද්ධ පාර්ශ්වයෙන් අහන්නට ලැබෙන දෙයක් තමයි, රජයේ සේවකයන්ගේ පඩි වැඩි කිරීම ගැන. සමහරවිට මේ අයවැයෙන් තවත් පඩි වැඩි කළා නම් ඒකටත් විරුද්ධ පාර්ශ්වය මොකක් හරි කියාවි. අපි මොනවා කළත් විරුද්ධ පාර්ශ්වය සෑහීමට පත් කරන්නට බැහැ. පඩි වැඩි කිරීම අවශ්‍ය බව අපි දන්නවා. ඒ වුවත් අපි කල්පනා කර බලන්නට ඕනෑ, මේ රටේ තිබෙන තත්ත්වය ගැන. ඒ නිසා තමයි, ගරු මුදල් ඇමතිතුමා හැම අයවැය අවස්ථාවකදීම රජයේ සේවකයන්ට පඩි වැඩිවීමක් ලබා දුන්නේ.

එපමණක් නොවෙයි, අපේ රටේ ගුරුවරුන් ගැන අපි කල්පනා කර බලමු. මේ රටේ අනාගත පරම්පරාව හැඩගස්වන්න ඉන්න ගුරුවරුන් වෙනුවෙන් – මම හිතන්නෙ මේ රටේ ගුරුවරුන් එක් ලක්ෂ හතළිස් පන් දහසක් පමණ ඉන්නවා – කිසිම රජයක් කිසිම කාලයක නොකළ සැලකීමක් මේ රජය විසින් කර තිබෙනවා. ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ නිර්දේශයක් මත ගුරුවරුන්ගේ පඩි වැඩි කිරීම සඳහා ගරු මුදල් ඇමතිතුමා විසින් මුදල් ලබා දුන්නා. මම හිතන හැටියට ඒ සඳහා රුපියල් දස ලක්ෂ 350ක් පමණ වැය වුණා. අපි දන්නවා සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු කියන පංච මහා බලවේගය උපයෝගී කරගෙන 1956 දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මේ රටේ බලයට පත් වුණ බව. නමුත් ඊට පසුව ඒ උදවියට ඒ ආණ්ඩුව සැලකුවේ නැහැ. ඇත්තවශයෙන්ම ගුරුවරුන්ට මේ පඩි වැඩි වීම කරන්න තිබුණේ මීට වඩා හුඟක් කලිනුයි. නමුත් අපේ රජය විසින් ඒ සඳහා කොමිටියක් පත් කර ඒ කොමිටි නිර්දේශවලටත් වඩා පඩි වැඩිවීමක් ලබා දී තිබෙනවා. ඒ ගැන විශේෂයෙන්ම අපේ ස්තුතිය ප්‍රකාශ කරන්න ඕනෑ.

ඊළඟට අනික් අංශ ගැන අපි කල්පනා කර බලමු. 1977 වන විට තේ වත්තක වැඩ කරන කම්කරු මහත්මයෙකුට දිනකට ලැබුණේ රුපියල් 7ක පමණ වැටුපකුයි. නමුත් අද ඒ කම්කරු මහත්මයෙක් දිනකට රුපියල් 20කට අධික වැටුපක් ලබනවා. කෘෂිකාර්මික අංශයේ පමණක් නොව අනිකුත් කටයුතුවලත් නියැලී සිටින කම්කරු ජනතාවගේත් පඩි විශාල වශයෙන් වැඩි කර තිබෙනවා. එහෙම නම් මේ අවුරුදු කීපය තුළ ඒ සියලුම උදවියට සහන ලබා දී තිබෙනවා. නමුත් අපි ප්‍රකාශ කරන්න කැමතියි නැවතත් අවස්ථාවක් ලැබුණොත් මේ සියලු දෙනාටම වැටුප් වර්ධක ලබා දිය යුතුය කියා. මම මේ අවස්ථාවේදී ගරු මුදල් ඇමතිතුමාගෙන් එක් ඉල්ලීමක් කරන්න කැමතියි. අපි වැටුප් වර්ධක ලබා දෙන අවස්ථාවේදී [බාධා කිරීමක්] ඒක නමුන්නාන්සේ ප්‍රකාශ කරන්න.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

සියයට දෙකක් කපන්න යනවයි කියනවා. ඒක ඇත්තද ? [බාධා කිරීමක්]

**ආර්. ජේ. ජී. ද මැල් මහතා**
**(திரு. ஆர். ஜே. ஜீ. த மெல்)**
**(Mr. R. J. G. de Mel)**

ඒක පත්තරෙන් අහන්න. ඒ ගොල්ල කපන්න ඇති. ඒ ගොල්ලන්ගෙන් අහන්න.

**ගාමිණී අතුකෝරල මහතා**
**(திரு. காமினி அத்துக்கோறல)**
**(Mr. Gamini Atukorale)**

ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේදී මම විශේෂයෙන්ම මතක් කරන්න කැමතියි, අපි වැටුප් වැඩි කරන අවස්ථාවලදී එක එක සේවකයන් දිහා, එහෙම නැත්නම් එක එක සේවක කොටස් දිහා බලා වැටුප් වර්ධක ලබා දෙන්නෙ නැතිව සමස්තයක් හැටියට සලකා සෑම කොටසකගේම පඩියේ මට්ටම අනුව වැටුප් වර්ධකයන් ලබා දිය යුතු බව. අද හැම අංශයකටම වැටුප් වර්ධක ගැන කථා කරන්න පුළුවන්. වැටුප් වැඩියෙන් ඉල්ලන්න පුළුවන්. නමුත් මේ රටට හුඟක් ප්‍රයෝජන ලබාදෙන එහෙත් හුඟක් අය විසින් අමතක කර තිබෙන කොටසක් මේ රටේ ඉන්නවා. ඒ අයට වැටුප් වැඩියෙන් දෙන්නය කියා ඉල්ලන්න බැහැ. ඒ උදවියට වෘත්තීය සමිති අයිතිවාසිකම් නැහැ. ඒ වෙන කවුරුවත් නොවෙයි. මේ මුළු මහත් රටටම, ජාතියටම, කන්න දෙන ගොවි ජනතාවය කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. නමුත් අපේ ගරු මුදල් ඇමතිතුමා විශේෂයෙන්ම ඒ ගොවි ජනතාව ගැන කල්පනා කර තිබෙනවා. එතුමා වී බුසලේ මිල අද රුපියල් හැත්තෑවක් දක්වා වැඩි කිරීමෙන් ගොවි ජනතාවට විශාල සහයෝගයක් වරප්‍රසාදයක් ලබා දී තිබෙන බව මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

විරුද්ධ පක්ෂයේ සමහර උදවිය අද කියනවා, අපි ගොවි ජනතාවට ලබා දී තිබෙන විශ්‍රාම වැටුප් ක්‍රමය ඇස්බැන්දුමක්ය කියල. නමුත් සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු කියන පංච මහා බලවේගය උපයෝගී කරගෙන බලයට පත් වුණ ඒ උදවියට එහෙම විශ්‍රාම වැටුපක් ගැන අදහසක්වත් ආවේ නැති එක ගැන අපි කනගාටු වෙනවා. මේ ක්‍රමය අළුතින් පටන් ගත් දෙයක් බව අපි දන්නවා. අළුතින් ආරම්භ කළ දෙයක්. ඒ නිසා සුළු සුළු අඩුපාඩුකම් තිබෙන්න පුළුවන්. නමුත් මෙය ක්‍රියාත්මක කරගෙන යන විට ඉදිරියේදී මෙහි සම්පූර්ණ ඵල ප්‍රයෝජන ඒ ගොවි ජනතාවට ලබා දෙන්නට අපට පුළුවන් වේවි. 1977 වන විට ගොවි ජනතාවට අවශ්‍ය උපකරණ තිබුණේ නැහැ. ගොවි ජනතාවට අවශ්‍ය පොහොර තිබුණේ නැහැ. අනික් අවශ්‍යතාවයන් ලබා ගන්න ක්‍රමයක් තිබුණේ නැහැ. එපමණක් නොවෙයි, ඔවුන්ගේ නිෂ්පාදන පවා වෙළඳ පොළට ගෙන ගොස් අලෙවි කර ගන්නට–

**කථානායකතුමා**
**(சபாநாயகர் அவர்கள்)**
**(Mr. Speaker)**

Order, please ! hon. Member you have spoken for half an hour. I have a very long list of-speakers and I have to be fair by all the MPs.

**ගාමිණී අතුකෝරල මහතා**
**(திரு. காமினி அத்துக்கோறல)**
**(Mr. Gamini Atukorale)**

I will wind up in ten minutes, Sir.

**කථානායකතුමා**
**(சபாநாயகர் அவர்கள்)**
**(Mr. Speaker)**

No. You have spoken for more than half an hour. I have a very long list of speakers. Please wind up as soon possible.

**ගාමිණී අතුකෝරල මහතා**
**(திரு. காமினி அத்துக்கோறல)**
**(Mr. Gamini Atukorale)**

ගරු කථානායකතුමනි, කථා කරන්න කරුණු රාශියක් තිබුණත් මම තව වැඩි වේලාවක් කථා කරන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. මම කියමින් සිටියේ ගොවි ජනතාවගේ විශ්‍රාම වැටුප් ක්‍රමය ගැනයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගාමිණි අතුකෝරල මහතා]

ඊළඟට තව කරුණු දෙක තුනක් ගැන පමණක් ඇමතිතුමාට මතක් කිරීමෙන් පසුව මගේ කථාව අවසන් කරනවා. විශේෂයෙන්ම තේවලට අද ඉතාම පහළ මිලක් ලැබෙන අවස්ථාවක ගරු මුදල් ඇමතිතුමා විසින් අපනයන බද්ද රුපියල් දෙකක් අඩු කිරීමෙන් මම හිතන්නෙ අමු තේ දළු කිලෝවකට ශත 35ක 40ක පමණ මිලක් වැඩියෙන් ලබා ගන්නට අමු දළු නිෂ්පාදකයාට එහෙම නැත්නම් කුඩා තේ වතු හිමියන්ට අවස්ථාව ලැබෙනවා. අපි ඒ ගැන හුඟක් සන්තෝෂ වෙනවා. අපි කවුරුත් දන්නවා, කුඩා තේ වතු හිමියන්ට සැහෙන විධියේ සහන රාශියක් පසුගිය අවුරුදු කීපය ඇතුළත එතුමා ලබා දී තිබෙන බව.

අවසාන වශයෙන් මම මෙවර අය වැය දෙස බලා හුඟාක් සන්තෝෂ වුණ තවත් එක් වැදගත් කාරණයක් ගැන කියා මගේ කථාව අවසන් කරන්න බලාපොරොත්තු වෙනවා. එතුමාගේ අය වැය කථාවේ අවසාන කොටසේදී එතුමා ප්‍රකාශ කලා, කළු ගඟ යෝජනා ක්‍රමයත් ආරම්භ කරන්න තිබෙනවාය කියා. ඇත්ත වශයෙන්ම මම ඒ ගැන අතිශයින්ම සන්තෝෂයට පත් වෙනවා. ඒ මොකද නිවිතිගල මැතිවරණ කොට්ඨාශයේ මන්ත්‍රීවරයා හැටියට මට කියන්න සිද්ධ වෙනවා, කළු ගඟ පිටාර ගැලීම නිසා වැඩියෙන් අලාභහානි සිද්ධ වන මැතිවරණ කොට්ඨාශය නිවිතිගල මැතිවරණ කොට්ඨාශය බව.

නිවිතිගල මැතිවරණ කොට්ඨාශයට පමණක් නොවෙයි, රත්නපුර දිස්ත්‍රික්කයේ රත්නපුර, කලවාන, පැල්මඩුල්ල, ඇහැලියගොඩ ආදී මැතිවරණ කොට්ඨාශවලත් ඒ වාගේම කළුතර දිස්ත්‍රික්කයේ අපේ ගරු මුදල් ඇමතිතුමා නියෝජනය කරන බුලත්සිංහල මැතිවරණ කොට්ඨාශය ඇතුළු අනික් මැතිවරණ කොට්ඨාශවලටත් මෙම කළු ගඟ පිටාර ගැලීම බලපාන අතර 1977 සිට මේ දක්වා 55ක වාර ගණනකදී ඒ මහජනතාව ගංවතුර තර්ජනයට ලක් වී තිබෙනවා. ඒ සඳහා ඒ උදවියට විශාල වශයෙන් සහනාධාර දීමට ආණ්ඩුවට සිදු වන අතර අනික් පැත්තෙන් ඒ උදවියට නිශ්චිත තත්ත්වයක් ඇතිව තමන්ගේ එදිනෙද පැවැත්ම කරගෙන යන්නට බැරි වී තිබෙනවා. ඒ වාගේම ගංවතුරේ සැරකම නිසා ඒ ප්‍රදේශවල ජීවත් වන ජනතාවට ස්ථිරසාර ගේ දොර සාදගන්නට අවස්ථාව නොලැබී තිබෙනවා. හැම අවුරුද්දකම තමන්ගේ ගේ දෙර කැඩී යන තර්ජනයට ඔවුන් මුහුණ දී සිටිනවා.

The enabling Act provides the Hon. Minister with the opportunity of giving specific or general directions to the corporation. There is provision for the appointment of stututory auditors in addition to the appointment of the Auditor-General. The Hon. Minister can appoint any auditor to audit the accounts of the corporation at any time on the subject with which that corporation deals. He has the full power to call for audit reports, to examine them and take corrective measures. This is in addition to the annual audit done by the Auditor-General. Then there is the Finance Act which lays down that each corporation shall prepare its annual budget and that their capital budget should be approved by the Minister in charge, and also the Minister of Finance and the Minister of Plan Implementation.

Then we have the appropriation of surpluses, the imposition of levies on corporations, the preparation of corporate plans and borrowing powers. All these regulations are available and the Hon. Minister has the opportunity of controlling this.

In the second line of control, there is in the Treasury in the Ministry of Finance the Public Enterprises Division which comprises management experts who have the opportunity of looking into the performance of these corporations.

In the third line of supervision and control there is the cabinet of Ministers to whom some of these financial matters are referred; for instance, in the case of tenders, supplementary estimates, loans etc. There is also control exercised by the Ministeries and the Minister in charge in the selection of personnel. Before any manager to an upper grade is recruited, the approval of the relevant Minister is necessary. There are various other methods and controls which are created internally by the Ministry. The supervisory machinery and controls are available but the question is whether these measures, laws and procedures have been made use of.

We next come to the Parliament which is composed of the elected representatives of the people. Parliament also exercises supervisory controls and I will list some of them. The first, regarding public corporations, is the Committee on Public Enterprises, which tables its reports from time to time. I will deal with them later on in the course of my speech. Then, there are Annual Reports of Corporations which are tabled in this House. There are also the Consultative Committees where matters pertaining to corporations are discussed. There are also the audit report, debates on Supplementary Estimates, there is Question Time and the Budget Debate itself. All these opportunities are available for the Government and the Opposition to debate. But the question is whether the responsibility of the Opposition has been adequately discharged. It is their business to see that the moneys voted by Parliament are properly channelled for the appropriate purposes and whether a proper evaluation has been done. Unfortunately, even the Opposition has failed to discharge its duties in regard to these matters.

Since the inception of the Committee on Public Enterprises in 1979, it has tabled a series of reports in Parliament. I have a series of reports with me, a big bundle. I have 8 to 10 reports with me. In certain reports, we have dealt with 70 to 80 corporations. We have evaluated their performance, gone into their annual audit reports and made certain observations and recommendations. I am sorry to state that – many Members of this Committee and I have also complained – no consideration has been given to these reports which have been tabled. It is just a case of our preparing bundles of these reports which no one has probably mase use of.

I am confident, Sir, that some of the waste and mismanagement that is being complained of could be avoided. There are still a number of corporations that could be corrected. I have had the opportunity of going into one of these corporations in great depth. I find that a closer study of these institutions could lead to the possibility of reviving them instead of privatizing them or closing them down.

Sir, in considering the question of effective management, effeciency and effectiveness, I would like deeper aspects – the minute or procedural aspects. I like now to place a few recommendations. I am not going into the particularly to underline a few recommendations.

One, I say, is the question of selecting chairmen and boards of directors, more especially the top management, the chairmen. I think we should seriously consider adopting the Indian system where the chairmen of Public corporations are selected and appointed on the recommendation of a bureau. They have a list of people who have consented and applied to be chairmen of corporations. They are tested. Once they are found to be suitable they are kept on a list. As and when vacancies occur in the respective corporations, a recommendation is made by the bureau through the supervising Minister that there is a person of this calibre who is suitable and that the Minister may consider him. We should have a list of such able, capable and qualified people who could be put into these responsible posts. That is one of the recommendations I feel that the Government should seriously consider if they want to ensure the continuity of the public corporate sector.

The next is the question of a corporate plan. Whatever the corporation may be, whether it be economic, welfare, infrastructure or development, it has to achieve certain goals. In achieving them it has to operate with an increased degree of complexity. The

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජේ. ඊ. ඊ. අමරතුංග මහතා]

preparation of a corporate plan, if I may say so, is part of a systematic effort to manage the public enterprise in the future, for it enables the management to anticipate changes and benefit from it. It increases the performance of the public enterprise in the short, medium and long term by a better use of existing resources. An orderly and responsive growth is ensured, and the public enterprise is not analysed by the external environmental sources. This type of planning gives it the ability to look into the future and if necessary to take remedial measures.

I must also comment with regard to the Auditor-General's Department. Today the audit of most corporations is done by private auditors. As the Auditor-General's Department is handicapped. It does not have a sufficient number of officers to go and audit the accounts of each and every corporation. There should be a resident audit of Government in every corporation. The corporations that have a resident audit, you would see, are better managed. They are more efficient and effective than the others. I have had the experience sometimes of seeing that when they are audited by private auditors it is not so effective. I strongly recommend that the Auditor-General's Department be strengthened, that more personnel be recruited and trained in the fields of auditing public corporations, so as to ensure that the culprits and wrong-doers are brought to book before long and remedial measures taken before the damage is done.

There is another matter, the question of penlties for the managers for the crmies that are committed, which are referred to as "economic crimes". I will read out a passage from one of the Reports of the COPE submitted to Parliament pertaining to that matter and as to how it should operate :

> "If a management decision has been taken because of a wrong judgment it is excusable since it is a part of the business process, but at times without number this Committee has come across decisions taken by managers of public corporations either through sheer carelessness, indifference or false calculations. Such decisions are in the nature of economic crimes. For managers are trustees of the people and those culpable should be penalized. The Westminster tradition is to extract political accountablility from the Ministers for such failures. Our Committees suggested that the process of judicial review provided in the French tradition be adopted for the managers of corporations. In the discussions the Committee of Public Enterprises had in France the Committee has noted the efficacious manner in which the *court de comtes* the budget court undertakes this responsibility and that the Committee has strongly recommended this model. If decision makers in the local government system are subject to penalties there is no reason why managers of public corporations too should not be penalized finally."

Sir, lastly I would like to make one more recommendation, which is a matter of public importance, and that is pertaining to the holiday structure in Sri Lanka. As regards the manufacturing corporations, we find that the number of working days that are available is insufficient. I think Sri Lanka is one of those countries in South East Asia which enjoy the largest number of public holidays. How can a country develop economically if for the greater part of the year the people are holidaying ? Therefore the Government will have to seriously look into the matter of holidays and provide for more working days. Today even Saturday is not a working day, and in addition to that when a public holiday falls in between two working days Government servants or corporation employees apply for another day's leave and enjoy as much as four to five days' holidays. How can an industrial venture run like this ? How can you achieve the necessary production ? This is one reason why we find that industrial and trading corporations have found it difficult to live up to their objectives and their profitability targets. Therefore serious consideration should be given to this matter. If I remember right on the statistics available it is Bangladesh and Sri Lanka that have the largest number of holidays. We have to examine the holiday structure in other countries. We will have to make a close study and see how the public sector and the corporation sector could be provided with more working days than at present.

පූ. භා. 10.50

**ජබීර් ඒ. කාදර් මහතා (නියෝජ්‍ය ග්‍රාම සංවර්ධන ඇමතිතුමා)**
**(ஜனாப் ஜாபிர் ஏ. காதர் — கிராம அபிவிருத்திப் பிரதி அமைச்சர்)**
**(Mr. Jabir A. Cader – Deputy Minister of Rural Development)**

Mr. Deputy Speaker, thank you for allowing me to speak on this important Budget. Once again, we must congratulate the Hon. Minister of Finance for presenting the Budget for so many years despite the tremendous odds against him such as defence expenditure and fall in tea and coconut prices and prices of non-traditional items. The people expected that the burden would fall on them due to the massive Rs. 30 billion deficit. Instead the Hon. Finance Minister's ability, experience and sound financial policies have helped him to give relief to the people. We expected a devastating cyclone but that has been avoided and all are thankful for the relief.

What is very clear is that the Government's liberalization and open economy policy has saved the country from what would have been a calamity. We have seen how State control over industries and enterprises has resulted in huge losses to the country. If I may repeat an often quoted statement, it is the business of the Government to govern but it is not the business of the Government to do business. It has been a failure in many countries, and even the UK is contemplating very seriously a change to privatization from State enterprise. While countries like the UK are converting many State enterprises into private companies, we also have the example of non-capitalist countries experimenting with privatization and relaxing the very rigid rules to enable private business. Even

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

China is now permitting a Free Trade Zone. Similarly, farmers are allowed to farm their own plots and sell their produce. Even in socialist countries one hears criticism about the State ventures not functioning as they should.

Of course, some areas of the economy must be left to the State. Joint ventures between State and private sector should also operate. But certain areas of the economy must be left to the private sector.

The two periods, 1970 to 1977 under the previous Government and 1977 to date under the present Government, give a study in contrast for any economist. What was the development under the seven-year term of the previous Government ? Even without expenditure on development, there were restrictions, controls, rationing and so on under the previous Government. There was no development. Compare and contrast the development work done since – the Mahaweli Scheme, the number of dams, the increase in electricity generation, the number of houses built, the expansion of the telephone system. Despite the massive expenditure on development projects there have been no controls or restrictions.

It is true that the cost of living has gone up, but salaries have been increased several times.

Then take the expansion in the educational system, the higher education opportunities, with the Mahapola Scholarship Scheme and free books being given to children, all of which are beneficial to the poor people. These are all verifiable facts.

The Government is now introducing a pension scheme for farmers. It is a practical method of helping the farmers.

Therefore, it is obvious that the economy of the country, which was on the verge of collapse in 1977, has been revived and revitalized by this Government, in which the Hon. Minister of Finance has played a large part.

It is very tragic, Sir, that when the economy is restored the country should be faced with a grave crisis which is curbing development. Because of this a massive sum has now to be allotted for defence. This vast amount would otherwise have been available for development. Money must be spent on defence. The crisis we are faced with is one that affects the very existence of Sri Lanka as a Untiary State. All over the world Sri Lanka was known as a peaceful country where communal and religious amity prevailed. Sri Lanka was held up as an example. It is sad to think that when Sri Lanka was saved from the shambles that would result from the closed-door and restrictive policies of the previous Government, this grave ethnic situation should arise. Development is affected not only to the extent of Rs. 6 billion that has been allocated for defence, the ethnic disturbances have had a serious effect on the other sectors of the economy too. While it is now the intention to close down or privatize corporations and boards which are a heavy drain on government finances, care should also be exercised to ensure that this does not result in large scale unemployment. Where a corporation should be run at a profit but does not do so due to obvious mismanagement, it should be further investigated by competent accountants and business management experts. Otherwise it will be like throwing the baby with the bath water ! For example, Sir, if you take the Associated Newspapers, it is also a government concern, but it is run efficiently showing profits every year. Therefore, I do not see why other Government institutions should not follow that example.

A very important matter pertaining to the ethnic question is that at present all students are segregated in various schools and that itself creates an ethnic problem from grass-rot levels. Instead of that, Sir, I would wish that the Government seriously considers teching all three languages, Sinhala, Tamil and English, in all schools without segregation for the future good of our country. Language is one of the reasons that have led to the present situation.

If equality of opportunity is the policy of the Government, then this equality must prevail in all areas. In employment, for example, the Job Bank Scheme enabled Members of Parliament to ensure that jobs were fairly and evenly distributed among their constituents. I am of course referring to the unskilled jobs where educational and technical qualifications are not required. Prior to the Job Bank Scheme those in control of government departments, boards and corporations were able to fill all the vacancies as they liked. The so-called Employment Exchange was a farce ! The Job Bank Scheme improved matters. Still it is necessary to ensure that in the filling of vacancies those from the areas are given preference. In fact, this is the policy adopted all over the world. When persons from the area are given employment there is considerable saving in transport costs. Transport is also a heavy drain on government funds. The railway fares have been increased and regular commuters who travel daily for employment are those who will be mostly affected. As far as possible it should be ensured that in the filling of vacancies at least 25 per cent should be filled from the electorate where the government departments or corporations are located.

While all effort must be made to stop waste and corruption in all govermnent departments and corporations, there is also a good deal of waste in other areas which require to be seriously looked into. Ours is an agricultural country and the economy has to be agriculture-based for a long time to come. The price of rice, for example, could be much lower if waste is

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජබ්බර් ඒ. කාදර් මහතා]

eliminated. It has been estimated that there is a loss of Rs. 900 million on rice annually due to the wastage between harvesting and consumption. This figure has being worked out by the Agrarian Research and Training Institute. Similarly, there are many other areas in the agricultural sector where this aspect has not been adequately considered.

In conclusion, Sir, I would also like to point out that while the government is concentrating all its efforts on fighting terrorism, it appears that crime and thuggery are on the increase. A serious situation can develop if immediate action is not taken. There are more instances of intimidation, thuggery, violence and crime now than before. Finally, Sir, I would like to point out to the Hon. finance Minister that the reduction of the qualifiying payment to one and a half lakhs investment from five lakhs is going to create less capital for the future development of various businesses which are approved businesses requiring financial assistance. I wish, Sir, that he looks into the matter and increases the amount at least to three lakhs.

Thank you, Sir.

පූ. භා. 11.4

**පී. එස්. එල්. ගලප්පත්ති මහතා (දෙවිනුවර)**
**(திரு. பீ. எஸ். எல். கலப்பத்தி — தெவிநுவர)**
**(Mr. P. S. L. Galappatthy – Devinuwara)**

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කලින් දෙවිනුවර පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා වශයෙන් සිටි ගරු මුදල් ඇමතිතුමා නව වැනි වරටත් සිය අයවැය ලේඛණය ඉදිරිපත් කිරීම ගැන දෙවිනුවර ආසනයේ ජනතාව වෙනුවෙන් දෙවිනුවර මන්ත්‍රීවරයා වශයෙන් මම එතුමාට ගෞරව පූර්වක ස්තුතිය මේ අවස්ථාවේදී පුද කරනවා.

විශේෂයෙන්ම මේ සම්බන්ධයෙන් පූර්ණ ගෞරවය හිමි විය යුත්තේ, අපේ ශ්‍රීමත් ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන උතුමාණන් වහන්සේට බව මම සන්තෝෂයෙන් සඳහන් කළ යුතුව තිබෙනවා. එතුමා දුර දක්නා නුවණින් තීක්ෂණ බුද්ධියෙන් යුතුව ක්‍රියා කොට, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සිටි රොනී ද මැල් මහතා 1975 අවුරුද්දේදී එක්සත් ජාතික පක්ෂයට බඳවා ගෙන, 1977 මහ මැතිවරණයේදී දෙවිනුවර ආසනයේ එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයා වශයෙන් ඉදිරිපත් කලා. ඒ අවස්ථාවේදී දෙවිනුවර හිටපු පලාත් පාලන සභාපතිවරයෙකු වශයෙන් සහ දෙවිනුවර ජන්දදායකයකු වශයෙන් මට දිය හැකිව තිබූ උපරිම සහයෝගය එතුමාට දී, 1977 මහ මැතිවරණයෙන් එතුමාට විශිෂ්ඨ ජයග්‍රහණයක් ලබා දුන්නා. ඉන්පසුව ශ්‍රීමත් ජනාධිපතිතුමා එතුමාට මුදල් ඇමතිකම පිරිනැමුවා. අපි ඉතාමත් සන්තෝෂ විය යුතුයි, එතුමා ඉතා නිහතමානී, අවංක, කාර්යශූර පුද්ගලයෙක් වශයෙන් තමන්ගේ රාජකාරිය ඉටු කිරීම ගැන.

හාල් පොලු, මිරිස් පොලු ආදී මෙකී නොකී පොලු තිබුණු, හත් අවුරුද්දක් තිස්සේ පරිහානිය කරා ගමන් කරමින් තිබුණු ශ්‍රී ලංකාවක් තමයි, ඒ වකවානුවේ තිබුණේ. එතුමා මුදල් ඇමති ධූරය බාර ගන්න විට එතුමාට ලැබුණේ හිස් භාණ්ඩාගාරයක්. එමනිසා ශ්‍රීමත් ජනාධිපතිතුමාගේ සහ කැබිනට් මණ්ඩලයේ උපදෙස් පරිදි එතුමා ලෝකයේ නොයෙක් රටවලට ගොස් ආධාර සහ ණය වශයෙන් මුදල් ලබාගෙන, ශ්‍රී ලංකා වාසී පොදු මහජනතාවගේ අභිවෘද්ධිය සඳහා යෝධ සංවර්ධන ව්‍යාපාර රාශියක් ආරම්භ කලා. අවුරුදු තිහකින්වත් වැඩ නිම කරන්නට බැරි මහවැලි යෝජනා ක්‍රමය ආදී ව්‍යාපාර අවුරුදු පහ හයකින් අවසන් කිරීම සඳහා සැලසුම් කලා. ඒ ගැන වැඩි විස්තර කතා කරමින් මේ ගරු සභාවේ කාලය නාස්ති කරන්න මම කැමති නැහැ.

අපේ පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් හැම කෙනෙක්ම වාගේ මේ අයවැය ලේඛණය සම්බන්ධයෙන් ප්‍රසංශා මුඛයෙන් කතා කල බව මම දන්නවා. අට වැනි වරත් පසුගිය අවුරුද්දේ හොඳ අයවැය ලේඛණයක් ගරු මුදල් ඇමතිතුමා ඉදිරිපත් කලා. නව වැනි වතාවටත් මෙවර අයවැය යෝජනා ඉදිරිපත් කර ඇති මේ අවස්ථාවේදී ත්‍රස්තවාදී කරදර වලින් වූ විපත් වෙනුවෙන් සහ ආරක්ෂා කටයුතු සඳහා විශාල ධන සම්භාරයක්ද වැය කරන්න සිදු වී තිබෙන බව අපි දන්නවා. එහෙත් මහජනතාවට තිබෙන ආදරය නිසා තීක්ෂණ බුද්ධියෙන් යුතුව ක්‍රියා කර, ඒ තරම් අසහනකාරී තත්ත්වයකට ජනතාව පත් නොවන අන්දමේ අයවැය ලේඛණයක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ නිසා එතුමාට සහ කැබිනට් මණ්ඩලයට අපි සන්තුටන්න විය යුතුයි. මම කවදාවත් හිතුවේ නැහැ, මේ තරම් අසහනකාරී තත්ත්වයක් යටතේ මෙවැනි සහනාදායී අයවැය යෝජනා මේ ගරු සභාවට ඉදිරිපත් කරන්න පුළුවන් වේවිය කියා.

සමහරු මොනවා කීවත් අපේ ගම්බද පලාත්වලට ගිහින් අහන්න බලන්න, මේ අයවැය ගැන. අපේ ගැමියන් මේ අයවැයට චෝදනා කරන්නේ නැහැ. නමුත් විරුද්ධ පාර්ශවයේ උදවිය දේශපාලන වාසි ලබා ගැනීම සඳහා යම් යම් දේවල් ප්‍රකාශ කරනවා. පෙරේද ගරු සිරිමා බණ්ඩාරනායක මැතිනිය මගේ ආසනයටත් ගිහින් අනාථයන්ට සහනාධාර — හාල් ආදී දේවල් — බෙද දුන් බව මම දන්නවා. ඒ ගැන මම බොහොම සන්තෝෂ වෙනවා. මටත් කීවා නම් මමත් එනවා. මේ රටේ ජනතාවගේ අභිවෘද්ධිය සඳහා සේවය කිරීමට ඇපකැප වී තිබෙන මේ රජය විසින් මේ රටේ ආර්ථිකය සකස් කිරීම තුළින්, විධිමත් සැලැසුම් ක්‍රමයක් මගින් ජනතාවගේ යහපත සඳහා වැඩ කරගෙන යනවාය කියන එක මේ රටේ බහුතර ජනතාව අවිවාදයෙන් පිළිගන්නවා.

ඊට උදාහරණයක් වශයෙන් මේ අවස්ථාවේදී එක් දෙයක් පෙන්වා දෙන්න කැමතියි. 1971-77 කාලය තුළ අප උපයන ආදායමින් අපට බදු නිදහස ලැබුණේ, එක් පුද්ගලයෙක් වෙනුවෙන් වර්ෂයකට රු. 3,600ක් සඳහා පමණයි. ළමයින් හතර දෙනෙක් හිටියා නම් ඒ වෙනුවෙන් තවත් රු. 1,200ක නිදහසක් ලැබුණා. ඒ දෙකම එකතු කළත් බදු නිදහස ලැබුණේ වර්ෂයකට රු. 4,800ක් සඳහා පමණයි. නමුත් මේ රජය බලයට පත් වුණාට පසුව ගරු මුදල් ඇමතිතුමාගේ නිර්දේශය අනුව කැබිනට් මණ්ඩලය තීරණය කලා, ඒ බදු නිදහස් සීමාව රු. 10,000 ; 12,000 ; 15,000 ; 18,000 ; 24,000 ආදී වශයෙන් අවුරුදුපතා ඉහල දමන්න. මෙවර අයවැය යෝජනා මගින් ගරු මුදල් ඇමතිතුමා ඒ බදු නිදහස් සීමාව වර්ෂයකට රු. 27,000 දක්වා ඉහල දමා තිබෙනවා. එතුමා එසේ කර තිබෙන්නේ නිදහස් ආර්ථිකයක් පිළිබඳ සංකල්පය මත බව අපි දන්නවා ; ලංකාවාසී හැම දෙනෙක්ම එය අවිවාදයෙන් පිළිගන්නවා.

ආර්ථික නිදහසය කියන්නේ මොකක්ද? තමා උපයන දේ මගින් තමා සිතන-පතන දේ කරන අතර, තමා උපයන සල්ලි නිදහසේ පාවිච්චි කරන අතර කීයක් හෝ ඉතුරු කරගෙන තම දූ දරුවන්ගේ අනාගත අභිවෘද්ධිය සැලසීමයි. එය කරන්න පුළුවන් වුණේ මේ රජය බලයට පත් වීමෙන් පසුව බව මේ රටේ බහුතර ජනතාව අවිවාදයෙන් පිළිගන්නවා.

ඒ අතර මේ අවස්ථාවේදී මා සිහිපත් කරන්න ඕනෑ, ආර්ථිකය නිදහස් කිරීම සඳහා ගරු මුදල් ඇමතිතුමා විසින් ගනු ලැබූ තවත් පියවරක් පිළිබඳවත්. බැංකු ව්‍යාපාරය විමධ්‍යගත කිරීම තුළින් මේ රටේ ජනතාවට විශාල සේවයක් සිදු වුණු බව අපි දන්නවා. මගේ මතකයේ හැටියට වර්තමාන මුදල් ඇමතිතුමා 1977 දී ඒ තනතුරට පත් වීමට ප්‍රථම අපේ රටේ බැංකු ශාඛා තිබුණේ විශාල නගරවල පමණයි. සාමාන්‍යයෙන් බැංකු ශාඛා 100—150 වඩා මුළු රටේම තිබුණේ නැහැ. මෙතුමා අයවැය කථාවේදී සඳහන් කලා, දුගී—දුප්පත් ජනතාවට සේවය කිරීමේ අභිලාෂයෙන් බැංකු විමධ්‍යගත කලාය කියා. ඒ විධියට එතුමා මහජන බැංකු ශාඛා හයසිය ගණනකුත්, ලංකා බැංකු ශාඛා තුන්සිය ගණනකුත් විවෘත කලා පමණක් නොව ජාතික ඉතිරි කිරීමේ බැංකු ශාඛා, ග්‍රාමීය, සංවර්ධන බැංකු ශාඛා, වෙනත් වාණිජ බැංකු ශාඛා සහ විදේශීය බැංකු ශාඛා පවා අලුතින් විවෘත කරවා බැංකු විමධ්‍යගත කිරීම තුළින් මේ රටේ දුගී-දුප්පත් ජනතාවට සෙත සැලසීම සඳහා කටයුතු කල බව අපේ ගැමි ජනතාව අවිවාදයෙන් පිළිගන්නවා.

නමුත්නාන්සේලාගේ ගමට, එහෙම නැත්නම් අල්ලපු ගමට ගිහින් සොයා බලන්න, කුඹුරු ගොවිතැන් කරන ගොවියා අතීතයේදී ණය ගත්තේ කොහොමද කියා. එද ණය ගත්තේ අල්ලපු ගෙදර ධනවතාගෙනුයි. කුඹුරු වැපිරීම සඳහා ඒ විධියට වී බුසලක් ණයට ගත්තා නම් මාස හතරකින් තවත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වී බුසල් භාගයක්-හමාරක් පොලිය වශයෙනුත් ගෙවීමට ඔහුට සිදු වුණා. ගරු මුදල් ඇමතිතුමාගේ මේ යෝජනා ක්‍රමය තුළින් ඒ අයට දැන් සහනයක් ඇති වී තිබෙනවා. වී බුසලේ සාමාන්‍ය ගණන රුපියල් පනහයයි අපි කියමු. බැංකුව සියයට 12 පොලියට ණය දෙනවා. ඒ අනුව අවුරුද්දකට රුපියල් පනහකට ගෙවන්න වෙන්නේ රුපියල් හයයි. එතකොට මාස හතරකදී වී බුසලේ මුදල වෙනුවෙන් ගොවියාට ගෙවන්න වෙන්නේ රුපියල් හතරක පොලියක් පමණයි. නමුත් මම මුලින් කී විධියට වී බුසල් බාගයකට රුපියල් විසි පහක් ගෙවන්න ගොවියාට සිදු වෙනවා. අන්න ඒ අසාධාරණය නැති කිරීම ගැන මේ රජයටත් ගරු මුදල් ඇමතිතුමාටත් ජනතා උපහාරය පිරිනැමෙන බව මේ අවස්ථාවේදී ගෞරවයෙන් මතක් කරන්න ඕනෑ.

එපමණක් නොවෙයි. ගමේ ගිනි පොලී කාරයා රුපියල් සියයක් ගොවියාට පොලියට දුන්නා නම් ඒකෙන් රුපියල් දහයක් පළමුවැනි මාසයේ පොලිය වශයෙන් අරගෙන ගොවියාට දෙන්නේ රුපියල් අනූවයි. ඒ ගණන අනුව මාසයෙන් මාසයට ඔහු පොලිය ගන්නවා. ඒ පොලී ප්‍රමාණය අනුව රුපියල් සියයකට අවුරුද්දකට රුපියල් එකසිය හතළිහක් පමණ ගෙවන්න සිදු වෙනවා. මේ ගිනි පොලී තත්ත්වයෙන් ගොවි ජනතාව මුදාගෙන ඔවුන්ගේ අභිවෘද්ධිය සැලසූ අපේ ගරු මුදල් ඇමතිතුමාට අපේ ගෞරව පූර්වක ස්තුතිය මේ අවස්ථාවේදී පිරිනමනවා.

ඇමතිව සිටින තාක් කල් පක්ෂයේ සිටින තාක් කල් අවංකව අපක්ෂපාතිව හෘදය සාක්ෂියට එකඟව තමා කලින් සිටි ආසනයේ සියලු යුතුකම් පවා පැහැර හරින්නේ නැතිව ඉටු කරන ගරු මුදල් ඇමතිතුමා ඒ සේවය නිසා ලබා ඇති ගෞරවයත් මේ නවවැනි අය වැය ලේඛනය ඉදිරිපත් කිරීමෙන් ලබා ඇති ගෞරවයත් මේ නම වැනි අයවැය ලේඛනය ඉදිරිපත් කිරීමෙන් ලබා ඇති ගෞරවයත් එතුමා සිටි ආසනය දැන් නියෝජනය කරන මන්ත්‍රීවරයා වශයෙන් මා ඉතාම ආඩම්බරයෙන් සිහිපත් කරනවා. එතුමාගේ ඒ සේවය අග්‍රස්ථානයෙහි ලා සලකන පුද්ගලයෙක්, මම.

ඊළඟට මා තවත් විශේෂ කරුණක් මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. මම කලින් කිව්වා වාගේ දැන් මේ මුදල් විමධ්‍යගත කර ගොවියාට සහන සලසා තිබෙනවා. ගමේ හැම කෙනෙකුටම සහන සලසා තිබෙනවා. රටේ හැම කෙනෙකුටම බැංකු මාර්ගයෙන් මුදල් ලබා ගන්නට පුළුවන්කම තිබෙනවා. සාමාන්‍ය ගොවියාට සියයට 12 පොලියට ණය දෙනවා. ඉතා සුළු පොලියක් අය කරන්නේ. මුදල් ඉතිරි වීම නිසා ඒ අයගේ ආර්ථික තත්ත්වය දියුණු වෙනවා. එතකොට මේ රජය ජනාදරයට පත් වෙනවා. අන්න ඒ නිසා තමයි, විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන් මොනවා හරි බොරුවක් කියාගෙන කෑ ගගහන්නේ.

මම දැන් මේ සම්බන්ධයෙන් හොඳ පැත්ත ප්‍රකාශ කළා. මම ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රී කෙනෙක් වුණත් මෙහි තවත් පැත්තක් කියන්න ඕනෑ. මම ආර්ථික විශේෂඥයෙක් නොවෙයි. කෙසේ වෙතත් මම හොඳ ව්‍යාපාරිකයෙක්. ඒ නිසා ගරු මුදල් ඇමතිතුමාගේත් කැබිනට් මණ්ඩලයෙත් අවධානයට යොමු කිරීම සඳහා එක්තරා වැදගත් කාරණයක් ඉදිරිපත් කරන්න කැමතියි. මෙය ඔබතුමාගේ කාරුණික අවධානයට යොමු කර යම් කිසි සහනයක් සැලසිය හැකි නම් එසේ කරන ලෙස ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. දැනට වාණිජ බැංකුවලින් සියයට 12 පොලියට ණය දෙන්නේ ගොවියාට පමණයි. නමුත් ව්‍යාපාරිකයාට දෙන ණය සඳහා සියයට 23, 24, 25 ආදී වශයෙන් පොලිය අය කරන ගමන්ම ව්‍යාපාරික පිරිවැටුම් බද්ද සඳහා වන සියයට 5ත් ව්‍යාපාරිකයන්ගෙන්ම අය කිරීම නිසා නිදහස් ආර්ථිකය මගින් ඇති වුණු ස්වයං රැකියා ක්‍රමය එක්තරා තත්ත්වයකින් ඇණහිට තිබෙන බව මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. ඒ නිසා වාණිජ බැංකුවල මේ පොලී අනුපාතය හැකි තරම් අඩු කරන ලෙස ඒවාට උපදෙස් දෙන්න පුළුවන් නම් එසේ කරන ලෙස මම ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මේකෙන් කිසිම අවාසියක් වෙන්නේ නැහැ. අර්ථ ශාස්ත්‍රය අනුව බැලුවත් සියයට 25 පොලියට දහ දෙනෙකුට ණය ලබා දී ගන්නා පොලියට වඩා විශාල ප්‍රමාණයක් අඩු පොලියට සිය දෙනකුට දී ලබා ගන්න පුළුවන් වෙනවා. ඒ අනුව දහස් ගණනක වැඩිපුර ආදායමක් ලබා ගන්න පුළුවන් වන බව මම මතක් කරන්න කැමතියි. එසේ කළොත් මේ ආර්ථික දුෂ්කරතාවන්ගෙන් මේ උද්ධමනයෙන් නැගී සිටීමට ජනතාවට හැකියාවක් ලැබෙන බව මම සන්තෝෂයෙන් මතක් කරනවා.

හැම කෙනෙක්ම කැමතියි, ව්‍යාපාරයක් කර දියුණු වෙන්න. එසේ දියුණු වීම සඳහා ආධාර දීමට කිසිම කෙනෙක් නැති දුගී දුප්පත් ජනතාවක් සිටිනවා. කඩල කාරයාගේ පටන් මහා ධනපතියා දක්වා හැම කෙනෙක්ම ව්‍යාපාර කරන්නේ බැංකුවලින් ණය ලබාගෙනයි. ඔවුන්ගේ ව්‍යාපාරවල ආදායම් තත්ත්වයන් නැති වෙනවා නම් ඔවුන් ව්‍යාපාර කිරීමට කැමති වන්නේ නැහැ. එතකොට ආර්ථිකය බහිනවා. නමුන්නාන්සේගේ නිදහස් ආර්ථිකය දැන් මේ තරම් දුරට සකස් කර තිබෙන නිසා මේ කාරණය ගැන සලකා බලන ලෙස මම නමුන්නාන්සේගෙන් සාදරයෙන් හා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගරු මුදල් ඇමතිතුමාට සහ කැබිනට් මණ්ඩලයට තවත් මල් පොකුරු රාශියක් ලැබෙන කරුණු තිබෙනවා. එනම්, අවුරුදු 237 ක් වහල්භාවයේ ඉදල, 1984 දී මේ රටට පිටරටින් හාල් ඇටයක්වත් නොගෙනෙන්න තරම් රටේ ස්වයංපෝෂිත තත්ත්වයක් ඇති කිරීමයි. ඒ සම්බන්ධයෙන් මේ රජයට ගොවි ජනතාවගේ උපරිම උපහාරය හිමිවිය යුතු බව මා මේ අවස්ථාවේදී සන්තෝෂයෙන් මතක් කරන්න ඕනෑ. එසේ තිබියදීත් ඔබතුමා ගොවි ජනතාවගේ අභිවෘද්ධිය සඳහා රුපියල් 62ට තිබුණු වී බුසල රුපියල් 70 දක්වා වැඩි කළා. කව්පි කිලෝව රු. 5 සිට 8 දක්වාත්, මුං ඇට කිලෝව රු. 7.50 සිට රු. 10 දක්වාත් එපමණක් නොවෙයි අනිකුත් ධාන්‍ය වර්ග කීපයකත් සහතික මිල වැඩි කළා. ඒ සම්බන්ධයෙනුත් ගොවි ජනතාවගේ උපහාරය ඔබතුමාට පිරිනැමෙනවා. මෙවැනි ගරුත්වයක් ඔබතුමාට හිමිවන මේ අවස්ථාවේදී මා එකක් මතක් කරන්න කැමතියි. එනම් වී අලෙවි මණ්ඩලය රුපියල් 70ට මිලදී ගන්නේ කන්නයක් ඇතුළත පමණයි. එනම් මාර්තු, අප්‍රේල් මැයි යන මාස තුන ඇතුළත නෙළන වී අස්වැන්න ලබා ගන්නවා. එම කන්නයේ වී අස්වැන්නවලිනුත් සියයට දහයයි වී අලෙවි මණ්ඩලයට ලැබෙන්නේ. මේ කන්නවලින් ලබා ගන්නා වී තමයි වී අලෙවි මණ්ඩලය ගබඩා කර තබා ගන්නේ. වී අලෙවි මණ්ඩලය රුපියල් 70ට වී බුසලක් ගන්න විට ඊට සතයක්වත් අඩුවෙන් වී මිලදී ගැනීමට ව්‍යාපාරිකයින්ට පුළුවන් කමක් නැහැ. ඒ සම්බන්ධයෙන් ජනතාව සෑහීමට පත් වෙනවා. ඒ නිසයි වී අලෙවි මණ්ඩලය ව්‍යාප්ත වී තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් රට සංවර්ධනය කරා පැමිණ ඇතත්, මේ ගරු සභාවේදී ප්‍රකාශ වුණා යම් රාජ්‍ය සංස්ථාවක් අඩපණ තත්ත්වයෙන් තිබෙනවා නම් ගරු මුදල් ඇමතිතුමා ඒවා වසා දමන්න සූදානම් වෙනවාය කියා. එසේ කළ යුතු නැහැ. මේ සම්බන්ධයෙන් වත්තල ගරු මන්ත්‍රීතුමා (ජේ. ඒ. ඊ. අමරතුංග මහතා) දුන් උපදෙස් පරිදිම මමත් ඉල්ලා සිටිනවා ඒවා වහන්න එපාය කියා. මෙම සංස්ථාවලට කාර්යක්ෂම පුද්ගලයින් පත් කළොත් ඒවා ක්‍රමානුකූලව යථා තත්ත්වයට පත්කර ගන්න පුළුවන්ය කියා අපට විශ්වාසයක් තිබෙනවා. ආත්ම විශ්වාසයක් තිබෙනවා නම් කරන්න බැරි දෙයක් ජනතාවට නැති බව මා මේ අවස්ථාවේදී මේ ගරු සභාවට මතක් කරනවා. බොරුකාරයින්ගේ රැවටීම් නිසා තමයි මේ ඔක්කොම සිදු වෙන්නේ. බොරුකාරයෝ, කඩාකප්පල්කාරයො ඉන්නතාක් කල් අපට කිසි වැඩක් කරන්න බැරි බව මා මේ සභාවට අවධාරණයෙන් මතක් කරනවා.

ඒ එක්කම ගරු නියෝජ්‍ය කථානායකතුමනි මා මේ අවස්ථාවේදී විශේෂයෙන් ගරු සභාවට මතක් කරන්න ඕනෑ.–

දිනේෂ් ගුණවර්ධන මහතා (මහරගම)
(திரு. தினேஷ் குணவர்த்தன — மஹறகம)
**(Mr. Dinesh Gunawardene – Maharagama)**
ධීවර සංස්ථාව ගැනත් කියන්න.

**පී. එස්. එල්. ගලප්පත්ති මහතා**
**(திரு. பீ. எஸ். எல். கலப்பத்தி)**
**(Mr. P. S. L. Galappatthy)**
මම කියන්නම්. මම ඒ මාතෘකාවට එන්න තමයි මේ හදන්නේ. නමුන්නාන්සේ පොඩ්ඩක් ඉන්න. ඒ ගරුත්වය දෙනවා. ඒ මාතෘකාවට අන්තිමට එනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පත්‍ර මාර්ගයෙන් දැක්කා අඩපන වී තිබුණු, පාඩු ලබන සංස්ථා කිහිපයක් වසන තත්ත්වයට පත් කර තිබෙන බව. නමුත් වී අලෙවි මණ්ඩලය පවත්වාගෙන යා යුතුයි කියා කැබිනට් ලේකම්වරුන්ගේ කාරක සභාව තීරණය කර තිබුණා. මා මේ අවස්ථාවේදී එය පිළිගන්නවා. ඊට හේතුව., කන්නයකින් මාස දෙකක කාලයක් තුළ එනම් අප්‍රේල්, මැයි යන මාසවල තමයි වී නිෂ්පාදනයෙන් සියයට දහයක් පමණ වී අලෙවි මණ්ඩලයට ලැබෙන්නේ. ඒ වාගේම අනික් කන්නයේ එනම් අගෝස්තු,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. එස්. එල්. ගලප්පත්ති මහතා]

සැප්තැම්බර් යන මාසවලයි වී අලෙවි මණ්ඩලයට වැඩිපුර වී ලැබෙන්නේ. අපි ස්වයංපෝෂිත වුණා නම් රටේ නිෂ්පාදනයවෙන සියළුම වී සහතික මිලට වී අලෙවි මණ්ඩලයට ලැබෙනව. නමුත් වී අලෙවි මණ්ඩලයට ලැබෙන්නේ සියයට දහයක් පමණයි. අනෙක් සියළුම වී එනම් නිෂ්පාදනයෙන් සියයට අනූවක් පමණ වන වී ප්‍රමාණය ලබා ගන්නේ පෞද්ගලික අංශයයි. අනෙක් මාසවලදී, එනම් නොවැම්බර්, දෙසැම්බර්, ජනවාරි මාසවලදී වී අලෙවි මණ්ඩලයේ මිල ගණන්වලට ජනතාව හාල් ලබා ගැනීමට කැමති වෙන්නේ නැතිව බවත්, ඒ කාලවලදී ඊට වඩා අඩු මිලකට වෙළඳපොළින් හාල් ලබා ගත හැකි බවත් ව්‍යාපාරික දැනුමක් ඇති පුද්ගලයෙක් වශයෙන් මා මේ අවස්ථාවේදී ගරු සභාවට මතක් කරන්න කැමතියි. එම නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වීවලින් රට ස්වයංපෝෂිත වන මෙවැනි අවස්ථාවකදී පවා මේ සම්බන්ධයෙන් ක්‍රමවත් සැලැස්මක් ඇති නොකළොත් අනාගතයේදී වී අලෙවි මණ්ඩලයෙනුත් විශාල පාඩුවක් ලබන්න සිදුවෙන බව කණගාටුවෙන් වුවත් ප්‍රකාශ කරන්න සිදු වෙනවා. එස් පාඩු ලබන්න සිදුවෙන්නේ ඇයි ? වී අලෙවි මණ්ඩලය ලබා ගන්නා වී ටික හාල් වෙන්නේ නැත්නම් අලෙවි වෙන්නේ නැත්නම් ඒවා අවුරුදු ගණනක් එක්රොක් කරගෙන තියාගෙන ඉඳල, එය දිරාපත්වූවාට පසුව මුහුදට හරි කොහාට හරි විසි කරන්න සිදු වෙනවා. එමනිසා මා මේ ගරු සභාවේදී මුදල් ඇමතිතුමා ප්‍රධාන මැතිඇමතිවරුන්ගෙන් ඉල්ලා සිටින්නේ වී අලෙවි මණ්ඩලය පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය කටයුතු කරන්නය කියායි. වී අලෙවි මණ්ඩලයට වී ලබා ගන්නේ ආහාර අමාත්‍යාංශයෙන්. මේක දෙපාර්තමේන්තු දෙකක් මඟින් කරලා හැමදම කැඳ හැළියක් කර ගන්නට වුවමනා නැහැ. ලංකාවට අත්‍යාවශ්‍ය ආහාර තොග රැස් කර ගන්නේ ආහාර දෙපාර්තමේන්තුව නම්, ඇයි මේ වී අලෙවි මණ්ඩලය ආහාර දෙපාර්තමේන්තුවට පවරා ගන්න බැරි ? මේක වැදගත් ප්‍රශ්නයක්. එහෙම කළදට තමයි මේක ක්‍රමවත් වෙන්නෙ කියන එක මම මේ අවස්ථාවේදී මේ ගරු සභාවට මතක් කර දෙන්න ඕනෑ.

**ආර්. ජේ. ජී. ද මැල් මහතා**
**(திரு. ஆர். ஜே. ஜீ. த மெல்)**
**(Mr. R. J. G. de Mel)**

ඒ ප්‍රශ්නයට මම ඇහුවා දැන් අවුරුදු හතරකට පහකට පමණ ඉස්සර.

**පී. එස්. එල්. ගලප්පත්ති මහතා**
**(திரு. பீ. எஸ். எல். கலப்பத்தி)**
**(Mr. P. S. L. Galappatthy)**

තවත් වරක් මතක් කරන්න ඕනෑ, එහෙම නැත්නම් කවදාහරි ඒකෙනුත් කෝටි ගණන් පාඩුය කියා වහන්න සිද්ධ වෙනවා. ව්‍යාපාරික දැනුමක් ඇති පුද්ගලයෙක් වශයෙන් මම මේ කියන්නෙ. අපි විරුද්ධ නැහැ. අත්‍යාවශ්‍ය ආහාර ගබඩා කර ගැනීමේ වගකීම, ඒවා වීවලින් හෝ සහල්වලින් හෝ තබාගැනීමේ වගකීම, ආහාර අමාත්‍යාංශය සතුව තිබෙන දෙයක්. ඒ යුතුකම නිසි පිළිවෙළට ඉටු කරන්න ඒ මඟින් පුළුවන් වෙනවා. එවිට ප්‍රශ්නය නිරාකරණය වෙනවා.

**ආර්. ජේ. ජී. ද මැල් මහතා**
**(திரு. ஆர். ஜே. ஜீ. த மெல்)**
**(Mr. R. J. G. de Mel)**

දැන් අමාත්‍යාංශ දෙකම එක ඇමතිවරයකු යටතේ තිබෙන නිසා ප්‍රශ්නයක් නැහැ.

**පී. එස්. එල්. ගලප්පත්ති මහතා**
**(திரு. பீ. எஸ். எல். கலப்பத்தி)**
**(Mr. P. S. L. Galappatthy)**

ඒක තමයි මම කිව්වෙ, දිගටම එහෙම ගෙන යන්න කියලා. එතකොට ප්‍රශ්නය ඉවරයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තවත් එකක් තිබෙනවා. ගරු කථානායකතුමා මෙතැන සිටියා නම් කියන්න පුළුවන්. රටේ නිදහස් ආර්ථිකයක් තිබෙනවා නම් ව්‍යාපාරිකයාත් මේ රටේ ජාතික වස්තුවක්. ඒ ජාතික වස්තුව ආරක්ෂා කරන්න ඕනෑ. ගරු කෘෂිකර්ම ඇමතිතුමා වශයෙන් අපේ ගරු කථානායකතුමා සිටි කාලයේ, මේ ආණ්ඩුව බලයට පත්වුණු හැටියෙ, ලංකාවේ තිබුණේ වී මෝල් හත්සිය ගණනයි. ඒ කාලයේ වී කෙටුවේ ආහාර දෙපාර්තමේන්තුව සහල් සලාකය සඳහායි. එදා කෘෂිකර්ම ඇමතිතුමා දේශනා පැවැත්තුවා, "වී මෝල් ගහන්න, ගහන්න" කියලා. මා හිතන්නෙ ගරු මුදල් ඇමතිතුමාත් කිව්වා. මිනිස්සු බැංකුවලින් ණයත් අරගෙන වී මෝල් ගැහුවා. අන්තිමට නිදහස් ආර්ථිකය නිසා මොකක්ද වුණේ ? මම හිතන්නේ ඒ වී මෝල් වලින් දහස් ගණනක් දැන් නිකම් නිරපරාදේ නාස්ති වන තත්ත්වයකට පත් වී තිබෙනවා. දැන් මේ රට වී යෙන් ස්වයංපෝෂිත වුණාට පස්සෙ මේ වී මොල් ටික ක්‍රමවත් කර ගත්තොත් හොඳයි. ඒකත් සැලකිල්ලට ගන්න කියා මතක් කරන්න කැමතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේකට කරන්න තිබෙන එකම දේ–

**ආර්. ජේ. ජී. ද මැල් මහතා**
**(திரு. ஆர். ஜே. ஜீ. த மெல்)**
**(Mr. R. J. G. de Mel)**

හාල් පිටි නිපදවන්න ඕනෑ, මේ රටේ.

**පී. එස්. එල්. ගලප්පත්ති මහතා**
**(திரு. பீ. எஸ். எல். கலப்பத்தி)**
**(Mr. P. S. L. Galappatthy)**

මොකක් හරි ක්‍රමයක් සැලසුම් කරන්න ඕනෑ. දැන් සිටම ක්‍රමවත් සැලැස්මක් ඇතිකරන්න ඕනෑ, ගරු මුදල් ඇමතිතුමනි. එහෙම නැතිනම් කවදාවත් ඒක වෙන්නෙ නැහැ.

මම මේක කියන්නට හේතුව මොකක්ද ? දැන් මම මන්ත්‍රීවරයෙක් නිසා කරන්න දෙයක් නැහැ. නැත්නම්, මම හොඳ වී මොල් කාරයෙක්, ධීවර ව්‍යාපාරිකයෙක්. මම දන්නවා ටික දවසකට පෙර මාස දෙක-තුනක් කැකුළෙත් කොටන්න කියා මොල්වලට වී දීලා එක වරටම ඒක නතර කළ බව. තත්ත්වය බාල නිසාද නැත්නම් වෙන මොකක්වත් නිසාදැයි මම දන්නෙ නැහැ. මට දැනගන්න ලැබී තිබෙනවා—ඇත්තද දන්නෙ නැහැ—පිටරටින් ගෙනා හාල් ටොන් ලක්ෂයේ කැකුළු හාලුත් තිබෙනවා කියා. ඒ අතර, වී අලෙවි මණ්ඩලයේ වී කිලෝ ලක්ෂ ගණනක් තිබෙනවා කොටන්න කෙනෙක් නැතිව. මේ දවස්වල හාල් ගණන් නිසා සමහරවිට කොටලා වැඩි මිලට විකුණයි. නැත්නම් මේ වී ටික පල් වෙනවා. ඒ තත්ත්වය ඇති නොවෙන්නයි මම තමුන්නාන්සේලාට මේ උපදේශය දෙන්නෙ. කරුණාකර මේ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙස ඉල්ලනවා.

මට අවස්ථාව දෙන්නට ඕනෑ ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අවුරුද්දකට එක සැරයයි අපි කතා කරන්නෙ. නැත්නම් අපි ගමට ගියාට පස්සෙ අපෙන් අහනවා "ගොළුවොද" කියා.

**නියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
**(Mr. Deputy Speaker)**

මගේ කිසිම අදහසක් නැහැ, ගරු මන්ත්‍රීතුමාගෙ කතාව නවත්වන්න.

**පී. එස්. එල්. ගලප්පත්ති මහතා**
**(திரு. பீ. எஸ். எல். கலப்பத்தி)**
**(Mr. P. S. L. Galappatthy)**

අවුරුද්දකට වරයි මෙවැනි අවස්ථාවක් අපට ලැබෙන්නෙ.

**ආර්. පී. විජේසිරි මහතා (කුණ්ඩසාලේ)**
**(திரு. ஆர். பீ. விஜேசிறி — குண்டசாலை)**
**(Mr. R. P. Wijesiri – Kundasale)**

වී අලෙවි මණ්ඩලය ආහාර අමාත්‍යාංශයට ගන්නවා නම් ධීවර සංස්ථාවත් ඒකට ගන්න වෙනවා.

**පී. එස්. එල්. ගලප්පත්ති මහතා**
**(திரு. பீ. எஸ். எல். கலப்பத்தி)**
**(Mr. P. S. L. Galappatthy)**

මම ඒකටත් එනවා, මම ඒකත් හොඳට කියා දෙන්නම්.

දැන් ගරු මුදල් ඇමතිතුමා ප්‍රකාශ කළා හාලින් රට ස්වයංපෝෂිත වුනාට පසුව "තිරිඟු පිටි කෑමෙන් වැඩක් නැහැ ; අපි හාල් පිටිම කමු" කියා. ඇත්ත වශයෙන්ම ඒ මොකක් හරි ක්‍රමයක් සැලසුම් කර මේ ව්‍යාපාරිකයින් හරිගැස්සුවාට පසුව කිසිම කරදරයක් වෙන්නෙ නැහැ, රජයට කෝටි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගණනක් සල්ලි වැය කරන්න වෙන්නෙත් නැහැ. ඒ ව්‍යාපාරිකයින්ට ජීවත් වෙන්න පරිසරය හරිගස්සා දුන්නාට පස්සෙ මේ ව්‍යාපාරය ස්වයංපෝෂිත වෙන බවට මම මේ අවස්ථාවේදී මේ ගරු සභාවට සහතික වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට ඊළඟට එන්නට තිබෙන්නේ අනික් පැත්තට, හාල්වලින් මාලු පැත්තට.

**ආර්. ජේ. ජී. ද මැල් මහතා**
**(திரு. ஆர். ஜே. ஜீ. த மெல்)**
**(Mr. R. J. G. de Mel)**
පිට රටින් එන පිටි අඩු මිලට දුන්නොත් කවුරුවත් හාල් පිටි කන්නෙ නැහැ. ඒකයි ප්‍රශ්නය.

**පී. එස්. එල්. ගලප්පත්ති මහතා**
**(திரு. பீ. எஸ். எல். கலப்பத்தி)**
**(Mr. P. S. L. Galappatthy)**
ඊළඟට ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ අවස්ථාවේදී මේ ගරු සභාවේදී මහරගම ගරු මන්ත්‍රීතුමාගේ (දිනේෂ් ගුණවර්ධන මහතා) පියාණන් වූ පිලිප් ගුණවර්ධන මැතිතුමාට ධීවර ජනතාවගේ ගෞරව පූර්වක උපහාරය මම පුදන්න ඕනෑ. ඒ ඇයි ? එතුමා තමයි මම හිතන හැටියට ධීවර සංස්ථාවේ නිර්මාතෘවරයා. එතුමා තමයි, මෝදර ශ්‍රී ලංකා ධීවර සමුපකාර සමිතිය අරගෙන ධීවර සංස්ථාව පිහිටෙව්වේ. ඒ කාලයේ මමත් හොඳ ව්‍යාපාරිකයෙක්. එතුමා මෙය පිහිටෙව්වේ එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවට බැදිලයි කියන එකයි මගේ මතකය. මගේ මතකය අනුවයි, මම මේ කියන්නේ.

ඒ කාලයේ ලංකාවේ විශාල ධීවර ව්‍යාපාරිකයෙක් වශයෙන් මම උතුරේ හිටියා. ධීවර සංස්ථාව පිහිටුවීමට පනත සකස් කර අපට සාකච්ඡාවකට ආරාධනා කලා. ධීවර සංස්ථාවේ ප්‍රථම සභාපති වශයෙන් පත් වුණේ සෑම් සිල්වා මහතායි. එතුමා හොඳ උගත් මහත්මයෙක්. මමත් නියෝජිතයෙක් වශයෙන් ඒ අවස්ථාවේ එහි ගියා. අපේ රාජ්‍ය පරිපාලන නියෝජ්‍ය ඇමතිතුමාගේ ඥාතියෙක් වන ෂර්ලි කොරයා මැතිතුමාත් සමඟයි මම ගියේ. ඒ අවස්ථාවේ කථාවට ඉදිරිපත් වුණේ මමයි. ඒ අවස්ථාවේ සෑම් සිල්වා මහත්මයාට පිලිප් ගුණවර්ධන මැතිතුමා නියම කලා, මේ ගැන පහද දෙන්නය කියා. එතුමා සභාවේදී කිව්වා "නියෝජිත මහත්වරුනි, තමුන්නාන්සේලාට මතක්කරන්නේ මෙයයි. මට රජයෙන් නීතිගත සංස්ථාවක් පවරා දී තිබෙනවා. මේ නීතිගත සංස්ථාව ක්‍රියාත්මක කිරීමට පෙර තමුන්නාන්සේලාගේ සහයෝගයයි, මම බලාපොරොත්තු වන්නේ. ඒ නිසා කරුණාකර එය දෙන්නට ඕනෑ " කියා. ඒ අවස්ථාවේ මම ඇසුවා මේ සංස්ථාවේ මූලික සැලැස්ම මොකක්ද කියා. එවිට කිව්වා "ලංකාවේ නිෂ්පාදනය කරන සියලුම මසුන් මෝදරට ගෙනැවිත් මෝදරින් තමයි තොග බෙද හරින්නේ " කියා. පලමු සැලැස්මේ එහෙම තිබුණා.

මමත් කට තිබෙන තරුණයෙක් නිසා මම ගරු ඇමතිතුමාට කිව්වා " අපි කවදවත් ඕක නම් කරන්න දෙන්නේ නැහැ. ඕක සැලැස්ම නොවෙයි. මේ හදන්නේ තමුන්නාන්සේ නොමඟ යවන්නටයි. තමුන්නාන්සේ බලාපොරොත්තු වන ප්‍රගතිය කරා යන්නේ කවදද එදට ඔක්කොම මෙතැනට ගෙනැවිත් තමුන්නාන්සේට බාර දෙන්නම්. මෙතැනින් බෙද හරිමු. " කියා. එහෙම නම් කරන්න ඕනෑ මොකක්දැයි ඊට පසු ඇසුවා. ඒ අවස්ථාවේ මම කිව්වා, " දැනට ධීවරයින්ගෙන් හා ධීවර ව්‍යාපාරිකයින්ගෙන් ලැබෙන මසුන් ප්‍රමාණය ලබා ගෙන පෞද්ගලික අංශයටත් යවන්නට ඉඩ දෙන්න. එසේ කර දෙගොල්ලම මධ්‍යස්ථව මේ ව්‍යාපාරය කරමු " කියා. ඊට පසුව දෙගොල්ලම සෑහීමකට පත්වී එසේ කලා.

ඇත්ත වශයෙන්ම ගරු පිලිප් ගුණවර්ධන ඇමතිතුමාගේ සඳදරණීය නාමය ධීවර ජනතාව තුළ පවතින්නට ඕනෑ. සියයට සියයක්ම ඒ කාර්යය නිසා තමයි, පොල්අතු වහලයක් යට සිටි ධීවර ජනතාවට උළු වහලක් යට ජීවත් වෙන්නට පුළුවන් වුණේ. ඇයි ඒ ? ඔක්කොම මාළු එන්නේ කොළඹටයි. කොළඹට පැමිණි විට ඒවා ගන්නේ තැරැව්වකාරයෝ. මාළු වැඩිවූ දවස්වල මිල බහිනවා. මාළු ටිකක් ලැබුණොත් තමයි, මිල වැඩි වෙන්නේ. ඒ නිසා ධීවරයා හැමදම කාලකන්නි තත්ත්වයේම පසු වුණා. මේ ධීවර සංස්ථාව පිහිටෙව්වාට පසුව පුළුවන්කම ලැබුණා, යම්කිසි සාධාරණ මිලකට තමන්ගේ මාළු ටික අලෙවි කර ගන්නට. සංස්ථාවට ගෙනා විට මෙන්න මේ මිලට ගන්නවා යයි මිලකුත් නියම කලා. සාධාරණ මිලක් ලැබුණා. සියයට 50ක 60ක පමණ ප්‍රමාණයක් ධීවර සංස්ථාව ගෙන්වා ගත්තා. ඒ අනුව ශාන්ත ජෝන්ස් වෙළඳපොළේත් ධීවරයින්ට ගෙවන ගණන ඉහළ ගියා. ඒ අනුව තමයි, මේ ධීවර සංස්ථාව ක්‍රම ක්‍රමයෙන් ආර්ථික දරිද්‍රතාවයෙන් පෙළෙමින් සිටි ධීවර ජනතාව නැගිට්ටෙව්වේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මුදල් ඇමතිතුමනි, එවැනි තත්ත්වයක් ඇති ධීවර සංස්ථාව වසා දැම්මොත් ධීවර ජනතාවට මොකක්ද සිදු වෙන්නේ ? මම දැන් ධීවර ජනතාව ගැන මතක් කරන්නම්. තමුන්නාන්සේ මුදල් ඇමති කළෙත් සියයට 35 ක් පමණවූ දෙවිනුවර ආසනයේ ධීවර ජනතාවයි. දෙවිනුවර ආසනයේ ධීවර ජනතාව තමයි, ලංකාවේ සෑම තැනකටම ගොස් ජාතික හැක්කුමක් ඇතිව විරෝදර සිංහලයින් වශයෙන් ආත්මගෞරවය ඇතිව ජීවත්වන පිරිස. ඒ පිරිස, ධීවර ජනතාව ආරක්ෂා කිරීම අපේ පරම යුතුකමක්ව තිබෙනවා. දැන් මොකක්ද සිදු වී තිබෙන්නේ ? මේ කරදරකාරී තත්ත්වය නිසා ඔවුන්ට සංක්‍රමණය වන්නට බැහැ. ඒ නිසා ඔවුන් දෙවුන්දර සිට මීගමුව දක්වා එක්රොක් වී සිටිනවා. දහස් ගණනක් ධීවර යාත්‍රා එකට ගැටිලා. මේ ඊයේ පෙරේද හැමූ සුළි සුළඟ නිසා ධීවර යාත්‍රා දහස් ගණනකට හානි සිදු වුණා. ධීවරයින් ජීවිතය පරදුවට තබා තමයි, ජනතාවට අවශ්‍ය ආහාරය ලබා දෙන්නේ. අවුරුද්දකට ධීවර ජනතාව සිය ගණනක් මුහුදුබත් වෙනවා. පුවත්පත් මගින් කියවා තමුන්නාන්සේලාත් එය දන්නවා ඇති. ඒ විධියටයි ජනතාවට මේ ආහාර සපයන්නේ. ඒ නිසා එය සැපයීමට ඔවුන්ට දිය යුතු උපරිම සහයෝගය දීම ගරු මුදල් ඇමතිතුමාගේ සහ මුළු කැබිනට් මණ්ඩලයේම පරම යුතුකම බව මම මේ අවස්ථාවේදී මතක් කරනවා. එහෙනම් මේ අවස්ථාවේදී මේ ගැන කරන්නට ඕනෑ මොනවාද ? අපේ ගරු මුදල් ඇමතිතුමා වී වලට දෙන සහතික මිල රු. 70 දක්වා වැඩි කලා. අනිකුත් භෝග සඳහාත් සහතික මිල වැඩි කලා. දැන් පවතින ආර්ථිකයේ හැටියට එතුමාට කරන්නට වෙනත් දෙයක් නැහැ.

එහෙම නම් මෙම ධීවර ජනතාවට සහන සැලැසීමට ගන්නට ඕනෑ කරන පියවර මොනවාද ? ව්‍යාපාරිකයකු වශයෙන් කටයුතු කරන මම ඉදිරිපත් කරන මේ යෝජනා ටික ක්‍රියාත්මක කරන්නට පුළුවන් නම්, ධීවර ජනතාවගේ ආදරය සදහටම අපේ ගරු මුදල් ඇමතිතුමාට ලැබෙන බව මා සන්තෝෂයෙන් මතක් කරනවා. ඇත්තෙන්ම මේ යෝජනා ටික ක්‍රියාත්මක කලොත් එයම ප්‍රමාණවත් වෙයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා නියෝජනය කරන දෙවිනුවර ආසනය එතුමා අවුරුදු දහ හතක පමණ කාලයක් නියෝජනය කලා. අවුරුදු තුනක කාලයක් මේ ආසනය නියෝජනය කරන මා ඊට කලින් අවුරුදු හතක පමණ කාලයක් තුළ දෙවිනුවර ගම්කාර්ය සභාපතිවරයකු වශයෙන් කටයුතු කලා. මෙහිදී එතුමාගෙන් මා ඉල්ලන පළමුවන දෙය මෙයයි. දැනට මෙම කොට්ඨාශය තුළ, මාළදිවයිනෙන් ගෙන්වන උම්බලකඩවලට දෙවැනි නොවන අන්දමේ උම්බලකඩ නිපදවනවා. දැන් අපේ රට උම්බලකඩවලින් ස්වයම්පෝෂණය වෙන්නට ආසන්නයි. මෙම තත්ත්වය තහවුරු කර ගැනීම සඳහාත්, ධීවර ජනතාවගේ ආර්ථික තත්ත්වය නංවාලීම සඳහාත්, පිටරටින් උම්බලකඩ ගෙන්වීමේ පාලනයක් ඇති කරන ලෙස ධීවර අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේදී මම යෝජනා කලා. විවෘත ආර්ථික ක්‍රමයක් පවතින නිසා, පිටරටින් උම්බලකඩ ගෙන්වන්නට එපා යයි මම කියන්නේ නැහැ. එසේ ගෙන්වනු ලබන උම්බලකඩවල තීරුබද්ද සියයට සියයකින් වැඩි කරන ලෙසටයි ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටින්නේ. මෙම බදු අය කිරීම වහාම කරන්න ඕනෑ.

මා එතුමාට ඉදිරිපත් කරන දෙවන යෝජනාව මේකයි. මම කලින් කිව්වා වාගේ කල්පිටිය සිට අලිගහකැලේ දක්වාත්, සලාවතුරේ, සවුත්බාර්, අලිවංගුව, තලේමන්නාරම, කංකසන්තුරේ, මයිලඩි, ඌරනි, පොඩින්ටපේද්‍රු, වැල්වෙටිතුරේ, වේපාරපුටි, මුලතිව්, නයාරු, කෝකිලායි මේ ආදී ප්‍රදේශවලට සංක්‍රමණය වෙමිනුයි, අපේ ධීවර ජනතාව රටට අවශ්‍ය ප්‍රෝටීන් පදර්ථය ලබා දුන්නේ. එසේ සංක්‍රමණය වෙමින් ඒ ජනතාව ධන සම්භාරයක් උපයා ගත්තා. නමුත් දැන් ඒ ජනතාවට එම ප්‍රදේශවලට යන්නට විධියක් නැති නිසා ජීවත් වෙන්නට ක්‍රමයක් නැහැ. ත්‍රස්තවාදීන්ගේ ප්‍රහාර නිසා ආපසු ගම්වලට පැමිණි මේ මිනිසුන්ට මාස දෙකක සහනාධාර දෙනවා. මේ සහනාධාර ලැබීම පමණක් ප්‍රමාණවත් වෙන්නේ නැහැ. එම නිසා ඒ ජනතාව වෙනුවෙන් එක් ඉල්ලීමක් කරන්න කැමතියි. [බාධාකිරීමක්] දැන් මයිලඩිවලට අවුරුදු දෙකකකින් විතර ගියේ නැහැ. තියෙන ඔක්කොම තැන් දැන් වහලා. මගේ සහෝදර දෙමළ ජනතාව මට දන්වනතුරු එන්නට එපායයි කියා තිබෙනවා. එම නිසා එන්නට යයි කියා දන්වනතුරු එහි යන්නේ නැහැ. ආත්ම ගෞරවය ඇතුව කටයුතු කිරීමට පුළුවන් වනතුරු යන්නේ නැහැ. [බාධාකිරීමක්] මම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. එස්. එල්. ගලප්පත්ති මහතා]
විශ්වාස කරනවා, ගියොත් හානියක් කරන එකක් නැහැ, ඒ ජනතාව මාව ආදරයෙන් පිළිගන්නා බව. අන්තිමට මුලතිව් ගියේ 1984 ජනවාරි මාසයේදීයි. ඊට පස්සේ ගියේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා කියා ගෙන ආවේ ඒ ජනතාවට සහන සැලසිය යුතු අන්දම ගැනයි. මෙහිදී මම ගරු මුදල් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ පිටරටින් ගෙන්වන කරවලවලට තීරු බද්ද සියයට පණහකින් වැඩි කරන හැටියටයි. එහෙම වැඩි කළාම දැනට අපේ ධීවර ජනතාව නිෂ්පාදනය කරන කරවල සාධාරණ මිලකට, වැඩිපුර මුදලකට විකුණාගන්නට පුළුවන්කම ලැබුණොත් එයින් ඒ ජනතාවගේ ජීවන තත්ත්වය ශක්තිමත් කරන්නට පුළුවන් වන බව මා විශ්වාස කරනවා.

**ආර්. ජේ. ජී. ද මැල් මහතා**
**(திரு. ஆர். ஜே. ஜீ. த மெல்)**
**(Mr. R. J. G. de Mel)**

අපි මේ ගැන අහන්නට ඕනෑ විරුද්ධ පාර්ශ්වයෙන්. අපේ මහරගම මන්ත්‍රීතුමා (දිනේෂ් ගුණවර්ධන මහතා) ඒකට කැමතිද කියා අහන්න ඕනෑ.

**පී. එස්. එල්. ගලප්පත්ති මහතා**
**(திரு. பீ. எஸ். எல். கலப்பத்தி)**
**(Mr. P. S. L. Galappatthy)**

කවදවත් අකැමැති වෙන්නේ නැහැ. මේ වර්ග දෙකම නොකැවට මැරෙන්නේ නැහැ. සල්ලි ඇති කෙනෙකුට වැඩි මිලක් ගෙවා කන්නට සැලැස්සුවාට කමක් නැහැ. මම එහෙම කියන්නේ මොකද ? ඇත්තවශයෙන්ම අපේ ගරු මුදල් ඇමතිතුමා ඉදිරිපත් කළ අයවැය යෝජනාවලින් ආර්ථික තත්ත්වයෙන් පීඩා විඳින ධීවර ජනතාවට සහනයක් සැලසෙනවාද ? හාල් සේරුවේ මිල වැඩි වුණොත් පහර වදින්නේ කාටද ? අද ආර්ථික දුෂ්කරතාවලින් වැඩිපුරම පෙළෙන්නේ ධීවර ජනතාව බව කියන්නට ඕනෑ. මන්ද ? හාල් සේරුවේ මිල වැඩි වුණාම පහර වදින්නේ කාටද ? ධීවර ජනතාවටයි. ඔවුන්ට ඇත්තේ යම්තම් ජීවත්වන්නට තරම් වන තමන්ගේ ගේ පැල විතරයි. මිරිස් ගහක්වත් වවා ගන්නට ඉඩම් කැබැල්ලක් නැහැ. පොල් ගෙඩියක් කඩා ගන්නට ගහක් නැහැ. මේ හැම දෙයක්ම සල්ලි දී ගන්නට ඕනෑ. මේ තත්ත්වයෙන් යම්තමින් හෝ මුදා ගන්නටයි මා මෙම ඉල්ලීම කරන්නේ.

ධීවර ජනතාවගේ ආදයම් තත්ත්වය කොහොමද ? දැන් වොත් නුන හමාරේ ධීවර යාත්‍රා තිබුණත් ඒවායින් ලැබෙන ආදයම ඉතාමත්ම සීමාසහිතයි. කුඩා යාත්‍රා ඇති අයට මොන අන්දමකින්වත් ජීවත් වන්නට තරම් ආදයමක් ලැබෙන්නේ නැහැ. මේ හැම ප්‍රශ්නයක්ම නිසා ඒ ධීවර ජනතාවට ධීවර යාත්‍රා සඳහා තමන් ලබා ගත් ණය ආපසු ගෙවන්නට පුළුවන්කමක් නැහැ. එමනිසා, ත්‍රස්තවාදී කටයුතු අවසන් වනතුරුවත්, ඒ අය ලබාගත් ණය වෙනුවෙන් පොලී අය කරන්නට එපාය, එය භාණ්ඩාගාරයෙන් ලබා දෙන්නටය කියා අපේ ඇමතිතුමාගෙන් බොහොම කරුණාවෙන් ඉල්ලා සිටිනවා. මම ඉදිරිපත් කළ මේ කාරණා තුනට ගරු මුදල් ඇමතිතුමාගේ සානුකම්පිත සැලකිල්ල යොමු කරන ලෙස නැවත වරක් ඉතා ආදරයෙන් ඉල්ලා සිටිනවා.

මේ අතර ධීවර සංස්ථාව වහන්නට එපාය කියන ඉල්ලීමත් කරන්න කැමතියි. මම මේ සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු වශයෙන් සේවය කළා. ඒ කාලයේ ධීවර සංස්ථාව සතුව ශීතාගාර පහක් – හයක් තිබුණා. දැන් ඒවා ක්‍රියාත්මක නොවන බව දැනගන්නට ලැබී තිබෙනවා. සමහරවිට ඒවා ඉතා පැරණි ඒවා නිසා වෙන්නට පුළුවනි. කෙසේ වුණත් මෙම සංස්ථාව වසා දමන්නට ගරු ධීවර ඇමතිතුමාගේ කැමැත්තක් තිබුණත්, ධීවර ජනතාව වෙනුවෙන් මම නම් අකමැතියි, එම සංස්ථාව වසා දමනවාට. මේ ශීතාගාර යථා තත්ත්වයට පමුණුවන්නට පියවර ගන්න ඕනෑ. එසේ ඉල්ලා සිටින්නේ ඇයි ? අර වී නිෂ්පාදනය කරන කාලයේ වාගේ, අස්වැන්න කපා පාගා ගන්නා කාලයේ වාගේ, අවුරුද්දේ ජූනි, ජූලි සහ අගෝස්තු යන මාසවලදී තමයි දකුණු පළාතේ මාළු අහුවෙන්නේ. ඉස්සර වාරකන් කාලය වශයෙන් සැලකූ කාලයෙයි දැන් ධීවරයන්ට මාළු අසුවන්නේ. මාළු අසුවෙන කාලයේදී සමහරවිට වර්ෂාව නිසා ඒවා කරවල කරගන්න, උම්බලකඩ කරගන්න බැරි වෙනවා. ඒවා කුණු වෙනවා. ඒ නිසා ඒවා කොළඹට ගෙනෙනවා. ඒවා කොළඹට ගෙනාවාට පසුව කොළඹ මාළු තොග වැඩිවීම නිසා යම් යම් තැරැව්කරුවන් ඒවා අඩු මිලට ගන්නවා. ඒවා අඩු මිලට අරගෙන ගබඩා කර වැඩි මිලට විකුණනවා. මේ නිසා ධීවරයාට කවදවත් සාධාරණ තත්ත්වයක් ලැබෙන්නේ නැහැ. එමනිසා ගරු මුදල් ඇමතිතුමනි, තමුන්නාන්සේගේ සානුකම්පික අවධානය මේ කෙරෙහි යොමු කරන ලෙස ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමාට මට මීට වැඩිය කාලයක් නොදෙන බවක් පෙනෙන්නට තිබෙන නිසා තමුන්නාන්සේ දුන් සහයෝගයට ස්තුති කරමින්, මේ ගරු සභාවටත් ස්තුති කරමින් මගේ වචන ස්වල්පය මෙතෙකින් සමාප්ත කරනවා.

පූ. භා. 11.40

**පී. බී. කවිරත්න මහතා (නියෝජ්‍ය පුද්ගලික බස් ප්‍රවාහන ඇමතිතුමා)**
**(திரு. பீ. பி. கவிரத்ன — தனியார் பஸ் போக்குவரத்துப் பிரதி அமைச்சர்)**
**(Mr. P. B. Kaviratne – Deputy Minister for Private Omnibus Transport)**

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ මිත්‍ර දෙවිනුවර ගරු මහජන මන්ත්‍රීතුමාගේ ඉතාමත්ම ප්‍රායෝගික අර්ථවත් කථාවෙන් පසුව ගරු මුදල් ඇමතිතුමාගේ නම වැති අයවැය ලේඛනය පිළිබඳව වචන ස්වල්පයක් කථා කරන්නට ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. මේ රට ගැන, මේ රටේ ජනතාව ගැන, මේ රටේ ජනතාවගේ දේශපාලන හා ආර්ථික සිතුවිලි ගෙන යා යුතු ක්‍රියා මාර්ගය ගැන මුල පටන්ම නිවැරදි දේශපාලන අවබෝධයක් ලබාගෙන තිබුණු ගරු මුදල් ඇමතිතුමා ඒ අවබෝධය ප්‍රායෝගිකව ප්‍රයෝජනයට අරගෙන ඉතාමත්ම සාර්ථක අයවැය ලේඛණයක් සකස් කිරීම ගැන ආණ්ඩුවේ මන්ත්‍රීවරයෙක් වශයෙන් මම ආඩම්බර වන අතර ඒ ගැන ප්‍රථම කොට මගේ ගෞරව පූර්වක ස්තුතිය එතුමාට පුද කරන්නට කැමතියි.

අද රටේ තිබෙන ආර්ථික අපහසුකම් දෙස බලනවිට, රටේ තිබෙන දුක්මුසු වාතාවරණය දෙස බලනවිට විරුද්ධ පාර්ශ්වය මොන ආකාරයේ විවේචනයක් එල්ල කළත් ජනතාවත් බේරා ගෙන, රටේ ආර්ථික කළමනාකාරීත්වයත් ආරක්ෂා කර ගෙන මීට වඩා හොඳ අයවැය ලේඛණයක් ඉදිරිපත් කරන්නට පුළුවන්ද කියන ප්‍රශ්නයට හෘදය සාක්ෂියට එකඟව පිළිතුරු දෙන ලෙස මම විරුද්ධ පාර්ශ්වයෙන් ඉල්ලා සිටින්න කැමතියි. ජනතාවට සියලු සැප සම්පත් ලබා දෙන්නට, බදු බර අඩු කරන්නට, ජීවන වියදම අඩු කරන්නට මෙවර අයවැය ලේඛණයෙන් සියයට සියයක්ම කටයුතු කර තිබෙනවාය කියා මම කියන්නේ නැහැ. අද තිබෙන වාතාවරණයේ හැටියට එහෙම කටයුතු කරන්න බැහැ. ගරු මුදල් ඇමතිතුමා මේ අයවැය ලේඛනය මේ ආකාරයට සකස් කලේ පුළුවන් තරම් උත්සාහ අරගෙනයි කියා මම හිතනවා. පසුගිය අවුරුදු කීපය තුළ රටේ ඇති වුණු කෘෂිකර්ම ක්ෂේත්‍රයේ දියුණුවත්, කර්මාන්ත ක්ෂේත්‍රයෙන්—විශේෂයෙන් ඇඟලුම් කර්මාන්තය වැනි කර්මාන්තවලින් – ලැබුණු ආර්ථික පිටිවහලත් මේ අයවැය ලේඛණය සකස් කිරීමට එතුමාට තරමක් දුරට පහසුවක් වුණාය, එතුමා එය ප්‍රයෝජනයට ගත්තාය, එතුමාට එය ප්‍රයෝජනවත් වුණාය කියා මම කල්පනා කරනවා. රටේ ආර්ථික තත්ත්වය මේ අංශ දෙකින් තරමක් දුරට හෝ දියුණුවට පත් කරන්නට රජයේ ආර්ථික ප්‍රතිපත්තිය, රජයේ ආර්ථික සැලසුම් ප්‍රයෝජනවත් වුණාය කියන එකයි මගේ පෞද්ගලික කල්පනාව.

එම නිසා විරුද්ධ පාර්ශ්වය අද රටේ තිබෙන විවෘත ආර්ථික ක්‍රමය වැරදිය කියා මොන ආකාරයට විවේචනය කළත් ලැබී තිබෙන ප්‍රතිඵල උඩ, ආර්ථික ශක්තියේ වර්ධනය දෙස බලන විට අපට ඒ පියවරෙන් පිටුපස්සට යන්න හේතුවක් නැති බව මට මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්නට වෙනවා. විවෘත ආර්ථිකය උඩ රටේ ආර්ථික තත්ත්වයේත්, සමාජ තත්ත්වයේත් යම් යම් වැරදි තත්ත්වයන් ද ඇති වී තිබෙන බව මම පිළිගන්නවා. මෙය පාලනය කිරීම අවශ්‍යයි. විවෘත ආර්ථිකය තද නීතිරීති වලින් හෝ පාලනය කර ඇති වන වැරදි නැති කර ගැනීමට කටයුතු කරනවා මිස මහජනතාවගේ මුදල් සංසරණය වන ආකාරයට සකස් වී තිබෙන ආර්ථික රටාවක් නැවතත් බැඳ තබා පෝලිම් ඇති කර, පෝලිම් වැඩි කර රට ආර්ථික වශයෙන් අමාරුවට පත් කිරීම අපට අපහසුයි. එමනිසා ආර්ථික වශයෙන් අප කල්පනා කළොත් තවදුරටත් විවෘත ආර්ථිකය කෙරෙහිම විශ්වාසයක් තබාගෙන ඉදිරියට යන්න අපට සිද්ධ වේවි යයි මම කල්පනා කරනවා. මේ ආරථික තත්ත්වය ගැන ගරු මුදල් ඇමතිතුමාට ඉතා වැදගත් අදහසක් කල්පනා වී තිබෙනවා. එතුමාගේ අය්වැය කථාවේදී එතුමා මේ විධියට සඳහන් කළා :

"මේ කාලය තුළ බාහිර වශයෙන් සහ අභ්‍යන්තර වශයෙන් පැන නැඟුන නොයෙකුත් තර්ජන වලට ඔරොත්තු දෙන්නට තරම්, නොනැමෙන්නට තරම් අපේ ආර්ථිකයට ශක්තියක් ඇතිවුනේ අපේ නිවැරදි ආර්ථික ප්‍රතිපත්ති නිසයි. ශ්‍රී ලංකාවේ මෑත

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඉතිහාසයේ කිසිදාක නොවුන තරම් ප්‍රබල තර්ජනයකට මුහුණ දෙන්නට අපට ලඟදී සිදුවුනා. අපේ ඒකීයභාවයටත්, අඛණ්ඩතාවයටත් නිදහසටත් අති විශාල තර්ජනයක් එල්ල වුනා. අපේ ජන ජීවිතයේත් සමාජයේත් සෑම අංශයකටම එය බලවත් තර්ජනයක් වුනා."

එහෙම කියලා එතුම කල්පනා කරනවා, ඒ තර්ජන, ඒ අපහසුකම් කොච්චර තිබුණත් ආර්ථික තත්ත්වය ආරක්ෂා කරගන්නට පුළුවන් වුණේ, මේ ආකාරයට රටේ මුදල් තත්ත්වය පරිපාලනය කරගන්නට පුළුවන් වුණේ මුදල් පිළිබඳ නිවැරදි කළමනාකාරීත්වය නිසාය කියා. අප ඊට එකඟ වෙනවා.

එතුමා හැම අයවැය ලේඛනයකදීම රටේ හැම කෙනෙකුටම අවවාදයක් කලා මුදල් පිළිබඳ තත්ත්වය පරිපාලනය කරගෙන වැඩ කටයුතු කරන්න කියා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතැනදී ප්‍රශ්නයක් මතු කරන්න කැමතියි. මේ නිවැරදි කළමනාකාරීත්වයත්, මුදල් පරිපාලනයත් ආරක්ෂා කරන්න එතුමා බලාපොරොත්තු වෙන්නේ කොහොමද ? එතුමා ඇමති මණ්ඩලයෙන් ඉල්ලීමක් කරනවා, ඇමතිවරුන් තමන්ගේ වියහියදම් පිළිබඳව කල්පනාකාරී විය යුතුය කියා. එතුමාගේ අයවැය කථාවේදී එතුමා මෙසේ සඳහන් කලා :

" වියදම් දරන සියලුම අමාත්‍යාංශ විසින් පුනරාවර්තන සම්මතවලින් අඩු තරමින් සියයට පහක්වත් ඉතිරි කළයුතු බවට රජය දැන් තීරණයක් ගෙන තිබෙනවා. අතිකාල ගෙවීම්, ප්‍රවාහන, ඉන්ධන ආදී අංශවල පිරිමැසීම මගින් මෙය සාර්ථක කර ගන්නට බලාපොරොත්තු වෙනවා."

මෙන්න මේකයි ගරු මුදල් ඇමතිතුමාගේ පරමාර්ථය, බලාපොරොත්තුව. අද අපට ප්‍රශ්නයක් වී තිබෙනවා මේ තත්ත්වයට රට පත් කරන්න සියයට සියයක්ම පුළුවන් වී තිබෙනවාද කියා. මේ රටේ දූෂණය සහ නාස්තිය හුඟක් දුරට පවතිනවාය කියා මම පෞද්ගලිකව කල්පනා කරනවා. එමනිසා ගරු මුදල් ඇමතිතුමා ඇත්ත වශයෙන්ම කොපමණ මුදල්—විදේශාධාර—ලබාගෙන ආවත් ඒ මුදල් නිසි ලෙස ප්‍රයෝජනයට ගැනෙනවාද කියන එක පිළිබඳව මීට වඩා දැඩි අවධානයකින් ක්‍රියා කරන්න සිද්ධ වෙනවා. නාස්තිය සහ දූෂණය නිසා තමයි, අයථා පාලනය නිසා තමයි අද සංස්ථා කිහිපයක්ම වසා දමන ලෙස අතිගරු ජනාධිපතිතුමාට නිර්දේශ කර තිබෙන්නේ. විරුද්ධ පාර්ශ්වය අහනවා, මේ සංස්ථා වසා දැම්මාම රැකියාවන් නැති වෙනවා නේද කියා. අපි පිළිගන්නවා රැකියාවන් නැති වන බව. ඒ උදවියට අපහසුකම් වැඩි වන බවත් පිළිගන්නවා. වැටුපක් ලබාගත් කෙනෙක්, දීර්ඝ කාලයක්—අවුරුදු 10 ක් 15 ක්—ඒ වැටුපට අනුකූලව තමන්ගේ ජීවිතය සකස් කර ගන්නවා. රැකියාව නැති වී ඒ වැටුප නැති වුණාට පසු ඒ පුද්ගලයාත්, ඔහුගේ පවුලත් ආර්ථික අමාරුකම්වලට මුහුණපාන බව අප දන්නවා. නමුත් හැමදම මේවාගේ සුදු අලින් ජීවත් කරවන්න ජනතාවගේ මුදල් පාවිච්චි කරන්න රජයකට පුළුවන්ද කියා අපට ප්‍රශ්න කරන්න සිද්ධ වෙනවා. එතකොට විරුද්ධ පාර්ශ්වය කියයි, " තමුන්නාන්සේලාගේ කාලයේ තමයි මෙහෙම සංස්ථා පාඩුවට ගියේ, මෙහෙම සංස්ථා දූෂණය වුණේ, මෙහෙම සංස්ථාවල අයථා පාලනය ඇති වුණේ " කියා. අපේ කාලයේ එහෙම අයථා පාලනයක් ඇති වුණේ නැහැ කියනවා. මම කැමති නැහ, අනවශ්‍ය විවේචන කරන්න කිසිම පක්ෂයකට හෝ කිසිම රජයකට විරුද්ධව. නමුත් යම් යම් වකවානුවලදී සමහර පුද්ගලයින් සංස්ථාවල සභාපතිධුර, වෙනත් වෙනත් ක්‍රියාකාරී අධ්‍යක්ෂ තනතුරු ආදිය දරමින් මුදල්, වාහන, ඉන්ධන මොන ආකාරයෙන් පාලනය කලාද කියන එක තමුන්නාන්සේලා දන්නවා. එමනිසා ගරු මුදල් ඇමතිතුමාගෙන් මම එක කාරණයක් ගෞරවයෙන් ඉල්ලා සිටින්නට කැමතියි. අමාරුකම් මැද්දේ ඔබතුමා ආරක්ෂා කරන්න යන ආර්ථික තත්ත්වය ආරක්ෂා කරගෙන මේ රටේ ජනතාවගේ ජීවිත සුරක්ෂිත කරන්නට නම් මේ නාස්තීන් පිළිබඳව මේ දූෂණයන් පිළිබඳව මීට වඩා දැඩි ලෙස උනන්දු වන්නට කල්පනා කරන මෙන් මම ඉල්ලා සිටිනවා. මට කල්පනා වෙන විධියට නම් මේ හුඟක් දේවලට මුල මේ රටේ පක්ෂ දේශපාලනය තුළින් ඇති කළ විෂමාචාරයි. මට කල්පනා කරන්නට සිද්ධ වෙනවා එහෙම. පක්ෂ දේශපාලනය ගැන මගේ නම් පුද්ගලිකව එතරම්ම එකඟත්වයක් නැහැ. හැබැයි, ජනතාවගේ ඡන්දය—මහජන ඡන්දය—කියන එක අවශ්‍යයි. ඒක වැදගත්. අතිගරු ජනාධිපතිතුමා ප්‍රකාශ කරන්නා වාගේ දෙවියන් විසින් ජනාතවට දීලා තිබෙන උරුමයක්, මහජන ඡන්දය.

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
**(Mr. Dinesh Gunawardene)**
දෙවියෝ ඒක කොල්ල කාලා.

**පී. බී. කවිරත්න මහතා**
**(திரு. பீ. பி. கவிரத்ன)**
**(Mr. P. B. Kaviratne)**
දෙවියෝ කොල්ල කාලා නැහැ. මම කියන්නම්. තමුන්නාන්සේ හරි සිල්ලර කථාවක් ඔය කරන්න එන්නේ. ඒකයි මම දැන් කියන්න එන්නේ, පක්ෂ දේශපාලනය තමයි, සත්‍යයෙන් තමුන්නාන්සේගේත් අපේත් ඇස් වැහුවේ කියලා. රටක නායකයෙකු පරිපාලනයක් ගෙන යන කොට ඔහුට තමන්ගේ ශක්තිය පාවිච්චි කරලා, පැනනගින වාතාවරණයට භය වන්නේ නැතිව වැඩ කිරීමට අවශ්‍යතාවයක් තිබිය යුතු නැහැ කියලා තමුන්නාන්සේ කියනවාද ?

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
**(Mr. Dinesh Gunawardene)**
පක්ෂය විසුරුවන්න.

**පී. බී. කවිරත්න මහතා**
**(திரு. பீ. பி. கவிரத்ன)**
**(Mr. P. B. Kaviratne)**
කියන්න බැහැ. ඔබතුමාගේ පියාණන් ඇමතිකම් දරනකොට ඒ ආකල්පය තුළ ජීවත් වෙමින් තමන්ගේ අමාත්‍යාංශය ක්‍රියාත්මක කරවූ බව එතුමාව ළඟින් ඇසුරු කළ එතුමාගේ හිතවතෙක් වශයෙන් මම තමුන්නාන්සේට මතක් කර දෙන්නට කැමතියි. පිලිප් ගුණවර්ධන මැතිතුමා පටු කල්පනාවලට ආවේ නැහැ. නැමුණේත් නැහැ. එක් එක්කෙනා කියන සියලුදෙයට ඇහුම්කන් දෙන්නට ලැහැස්ති වුණේත් නැහැ. අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බද්දක් වගේ උරුමයක් වගේ පාවිච්චි කරන විවිධ සේවා සමුපකාර සමිති පනත හැදුවේ එතුමායි. කුඹුරු පනත හැදුවේ එතුමායි. ඒවායේ වැරදි අද පේන්නට පුළුවන්. නමුත් එක ක්‍රියාමාර්ගයකදීවත් අනවශ්‍ය විධියට කිසිවෙකුට හිස නමන්නේ නැතිව ස්වකීය කල්පනාවන් තුළ ජීවත් වෙමින් වැඩ කරපු නිසා තමයි, අද පවා එතුමාට යම්කිසි ප්‍රශංසාවක් ලබන්නට පුළුවන් වෙලා තිබෙන්නේ. [බාධා කිරීම්] එතුමා ගෙදර ගිය බව ඇත්ත. මේක මගේ පුද්ගලික කල්පනාවක්. මහරගම ගරු මන්ත්‍රීතුමා කිව්වා, දෙවියන් විසින් ජනතාවගේ උරුමය උදුරා ගත්තාය කියලා. [බාධා කිරීම්] ඇත්ත. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගෙදර ඇරියා, එතුමා. [බාධා කිරීම්] නියෝජ්‍ය පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා ඇමතිතුමා කියන්වා කුස්සියෙන් කියලා. මම හිතනවා කුස්සියෙන් විතරක් නොවෙයි කියලා. ඒ පක්ෂය තුළ යම් යම් ප්‍රබල පුද්ගලයන් හිටියා. ඒ පුද්ගලයින් තමයි, රටේ ඉතිහාසය වෙනස් කළේ, කුස්සියට ඇහුම්කම් දීල. එහෙම නැත්නම් අද අපි කථා කරන මේ මොහොත වන විට මේ රට වෙන ඉතිහාසයක් ඇති රටක්ය කියලා මට කල්පනා වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහරගම ගරු මන්ත්‍රීතුමා හා විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරු කියනවා මන්ත්‍රීවරුන්ගෙන් ලියුම් ලබාගත්ත එක වැරදියි කියලා. වැරදි නැහැ. පරිපාලනයක් තිබිය යුතුයි. නියම නායකයෙකුට නිදහසේ ක්‍රියා කරන්න අවස්ථාවක් තිබිය යුතුයි. මන්ත්‍රීවරයා නිවැරදිව කටයුතු කරනවා නම් මොන ලියුම් තිබුණත් භය වෙන්නේ මොකටද ? [බාධා කිරීම්]

**ආර්. පී. විජේසිරි මහතා**
**(திரு. ஆர். பீ. விஜேசிறி)**
**(Mr. R. P. Wijesiri)**
දින් ලියුම් නැතිව ඒ කට්ටිය අස් කරලා.

**පී. බී. කවිරත්න මහතා**
**(திரு. பீ. பி. கவிரத்ன)**
**(Mr. P. B. Kaviratne)**
තමුන්නාන්සේට නියම උත්තරය කුණ්ඩසාලේ ගරු මන්ත්‍රීතුමා දෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කියාගෙන ආවේ වැදගත් කාරණයක්. ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය ඊයේ පෙරේද කොළඹ රැස්වීමක් පවත්වා ප්‍රකාශ කර තිබෙනවා, මෙම අයවැය ලේඛනයෙන් රටට කිසිම ප්‍රයෝජනයක් වෙන්නෙ නැහැ කියලා. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවට, ජනාධිපතිතුමාට ජනවාර්ගික ප්‍රශ්නය විසඳන්නට බැරි යයි කියා එතුමිය කියලා තිබෙනවා. මට තේරුම් ගන්න බැහැ, එතුමිය කොහොමද විසඳන්නෙ කියල. මේ අද ඉන්න ප්‍රවීන දේශපලනඥයන් අතුරින්,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඒ. බී. කවිරත්න මහතා]

උගතුන් අතුරින්, කල්පනාවත් තියුණු බුද්ධියත් තිබෙන දේශපාලනඥයන් අතුරින්—ලෝකයේම දේශපාලනඥයන් අතුරින් වුණත්— ප්‍රමුඛස්ථානයට පත්වන ජනාධිපතිතුමාට මේ ප්‍රශ්නයට විසඳුමක් ඉදිරිපත් කරන්නට බැරි නම් එහෙම පලපුරුද්දක් නැති මේ උදවියට ඒ වගේ බැරෑරුම් ප්‍රශ්නයකට මුහුණ දෙන්න පුළුවන්ද කියා මම මහරගම ගරු මන්ත්‍රීතුමාගෙන් (දිනේෂ් ගුණවර්ධන මහතා) අහන්න කැමතියි. මට නම් කල්පනා කරන්න අමාරුයි. නමුත්තාත්සේ බද්දේගම ගරු මන්ත්‍රීතුමාට (අමරසිරි දොඩන්ගොඩ මහතා) අත දික්කරන්න එපා. එතුමාට ඕවාට උත්තර දෙන්නත් අමාරුයි. එතුමා නිදහස් මත දරණ මන්ත්‍රීවරයෙක් බව මම දන්නවා. නමුත් පක්ෂ දේශපාලනය තුළ යම් යම් තහංචි තිබෙනව, උත්තර දෙන්න අමාරුයි. මම ඒකයි කියන්නේ, ගරු මුදල් ඇමතිතුමා කොයි තරම් ප්‍රවේශමෙන් අයවැය ලේඛනය සකස් කර ඉදිරිපත් කළත් එහි හොඳ දකින්න නමුත්තාත්සේලාට බැහැ කියල. හේතුව පක්ෂ දේශපාලනයයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සියලුම දේශපාලන පක්ෂවලට මේ තත්ත්වයට මුහුණ දෙන්න වෙයි.

මෙම අයවැය ලේඛනය පිළියෙල කිරීමේදී එතුමාට තිබුණ විශාල අපහසුව නම් රටේ ආරක්ෂාවට විශාල මුදල් සම්භාරයක් වෙන් කිරීමට සිදුවීමය කියා එතුමා සිය කථාවේ සඳහන් කර තිබුණා. ආරක්ෂාවට මුදල් වෙන් කිරීමට සිදු වුණේ උතුරේ ඇති වුණ ත්‍රස්තවාදය නිසයි. ත්‍රස්තවාදය ඇතිවීමට එක් මූලික හේතුවක් වුණේ දේශපාලනඥයන් විසින් වැරදි පොරොන්දු දී ඒ තරුණ පිරිස දීර්ඝ කාලයක් තිස්සේ නොමඟ යැවීම නිසාය කියන එක අපි මතක තබා ගත යුතුයි. තව හේතු තිබෙනවා. නමුත් ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරුන් විවිධ පොරොන්දු දී, එක රැයකින් නැත්නම් දෙකකින්, ඉතා තිමේෂයකින්, ඉතා කෙටි කාලයකින්, ද්‍රවිඩ ස්වරාජ්‍යයක් ලබා දෙනවා කියා බොරුව කළ එකේ විපාකයක් වශයෙන් තමයි, අද එතුමන්ලාට තමන්ගේ රටේ ඉන්නවත් බැරි තත්ත්වයක් ඇතිවී තිබෙන්නෙ. එම නිසා තමයි මම කියන්නෙ පක්ෂ දේශපාලනය මේ රටේ ආර්ථික තත්ත්වය පමණක් නොව සමාජ තත්ත්වයද විනාශ කර ඔඩු ගිය වනයක් බවට පත් කර තිබෙනවායි කියා. සියලුම දේශපාලන පක්ෂ මේ වර්තමාන තත්ත්වය උඩ මේ ප්‍රශ්නය ගැන කල්පනා කළ යුතුය කියන එකයි. මගේ හැඟීම.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අයවැය ලේඛනයෙන් ඉදිරිපත් කළ සාර්ථක යෝජනා ක්‍රියාත්මක වීමට නම් රටේ දේශපාලන වාතාවරණය පිරිසිදු විය යුතුය කියන එකයි, මම කියන්න අදහස් කළේ. මීට වඩා දීර්ඝ වේලාවක් කථා කළ යුතුය කියා මා කල්පනා කරන්නෙ නැහැ. මම නැවතත් වතාවක් ගරු මුදල් ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා, ජනතාව ගැන හිතලා, කල්පනා කර සාර්ථක අයවැයක් සකස් කිරීම ගැන. දහවැනි අයවැය ලේඛනයත් මේ පාර්ලිමේන්තුව තුළදී රටේ ජනතාවගේ සුභසිද්ධිය සඳහා ඉදිරිපත් කිරීමට එතුමාට වාසනාව ලැබේවායි කියා මම ප්‍රාර්ථනය කරමින් මම නිහඬ වෙනවා.

පූ. භා. 11.56

එම්. අයි. උදුමාලෙබ්බේ මහතා (පොතුවිල්)
(ஜனாப் எம். ஐ. உதுமாலெப்பை — பொத்துவில்)
(Mr. M. I. Uthumalebe – Pottuvil)

கௌரவ பிரதிச் சபாநாயகரவர்களே, இன்று நடைபெறுகின்ற வரவு செலவுத் திட்ட விவாதத்திலே கலந்துகொள்வதையிட்டு நான் மிகவும் சந்தோஷமடைகின்றேன். ஒன்பதாவது வரவு செலவுத் திட்டத்தை எமது அன்புக்கும் மதிப்பிற்குமுரிய நிதி அமைச்சரவர்கள் தொடர்ந்து சமர்ப்பித் திருப்பது உண்மையிலேயே நமக்கு மிகவும் மனத் திருப்தியையும் மகிழ்ச்சியையும் தருகின்றது. இந்த அரசாங்கத்தின் நிலையான கொள்கை யின் காரணமாக, தொடர்ந்து இவ்வாறான ஒரு வரவு செலவுத் திட்டத்தை எமது திறமை மிக்க அமைச்சரவர்கள் தருவது இலங்கையின் வரவு செலவுத்திட்டச் சமர்ப்பணத்திலே ஒரு சாதனை என்பது மாத்திரமன்றி, சில சமயம் ஒரு ஜனநாயக நாட்டிலே இது ஓர் உலக சாதனையாகக்கூட இருக்கலாம் என நான் நம்புகின்றேன். எனவேதான் இவ்வாறான ஒரு கஷ்ட காலத்திலே — ஒரு பிரச்சனை மிகுந்த காலத்திலே — சிறந்த திறமை மிக்க ஒரு வரவு செலவுத் திட்டத்தைக் கொண்டுவந்து வெற்றிகாண்பதையிட்டு நாம் உண்மையிலேயே அவருக்குப் பாராட்டுத் தெரிவிக்கக் கடமைப்பட்டிருக்கின்றோம்.

பிரதிச் சபாநாயகரவர்களே, அமைச்சரவர்களின் சிறந்த பொருளா தாரத்திட்டம், நிதியைப் பேணுகின்ற விசேஷட அணுகுமுறைகள், சர்வ தேச நிலையிலே மதிப்பையும் சிறப்பையும் பெற்றுப் போதுமான நிதியைப் பெறுகின்ற வல்லமை ஆகிய மூன்று காரணங்களுக்காக நாம் நிதி அமைச்சரவர்களைப் பாராட்டுகின்ற இவ்வேளையில், இலங்கையின் தேசிய வருமானமும் வளர்ச்சி வீதமும் அதிகரித்துக்கொண்டு வருவது எமக்கு மன நிறைவைக் கொடுக்கின்றது. இன்றைய கால கட்டத்திலே — இந்நாடு ஒரு சிக்கலான பிரச்சனையை எதிர்நோக்கி இருககின்ற வேளையிலே — நாம் இவ்வாறான ஒரு வளர்ச்சி வீதத்தைக் காண்பது மிகவும் கஷ்டமான இக்காலகட்டத்தில் திறமை மிக்க ஒரு வரவு செலவுத் திட்டத்தைக் கொண்டுவந்தது மாத்திரமன்றி, 1977 ஆம் ஆண்டிலிருந்து இன்று வரையும் தொடர்ச்சியாக இந்நாட்டின் பொருளாதார நிலையை ஸ்திரப் படுத்தியதையிட்டும் நாம் பெருமைப்படவேண்டும்.

உண்மையிலேயே இந்த வரவு செலவுத் திட்டத்தை நோக்குமிடத்து அமைச்சரவர்கள் மூன்று முக்கிய பிரச்சனைகளை எதிர்நோக்கியிருப்பதைக் காணக்கூடியதாக இருக்கிறது. ஒன்று, பாதுகாப்புக்கான செலவினம் சுமார் 600 கோடி ரூபா என்பதாகும். இது இந்நாட்டின் வரவு செலவுத் திட்டத்திலே கணிசமான ஒரு தொகையாகும் அதுமட்டுமன்றி, கூட்டுத்தா பனங்களும் தொடர்ச்சியாக 4,000 கோடி ரூபாவைக் கடந்த காலத்திலே நஷ்டமாகப் பெற்று வந்திருக்கின்றன. இவ்வாறான பெரிய நஷ்ட மொன்றை இந்நாடு ஈடுசெய்யமுடியாது எனினும், தொடர்ந்தும் இந் நஷ்டத்தை ஈடு செய்ய வேண்டியது அமைச்சரவர்களின் பெரும்பொறுப் பாகவும் இருந்துவந்திருக்கிறது. இந்த நாட்டின் வருமானத்தைத் தரு கின்ற விவசாயப் பொருள்களுக்கும் போதுமான விலைகளை அந்நிய நாட்டுச் சந்தையில் பெறுவதில் நாம் பெரும் கஷ்டத்தை எதிர்நோக்கியிருக் கின்றோம். இந்த மூன்று பிரச்சனைகளும் காரணமாக இந்த வரவு செலவுத் திட்டத்தை ஆக்குவதிலே ஏற்படுகின்ற பற்றுக்குறையை ஈடுசெய்வதில் நிதியமைச்சரவர்கள் ஒரு பெரும் கஷ்டத்தை எதிர்நோக்கியிருந்தார்.

இந்தச் சந்தர்ப்பத்திலே ஒரு முக்கியமான விடயத்தை நான் கூறவிரும்புகிறேன். எமது நாட்டின் பாதுகாப்புச் செலவினம் சில சமயங்களில் கூடவேண்டியது நியாயமானதே. அதைக் குறைக்கும் வல்லமை எமக்கு இல்லை. இருந்தாலும் இந்நாட்டின் கூட்டுத் தாபனங்கள் — இங்கே பல கௌரவ அங்கத்தவர்கள் குறிப்பிட்டது போன்று — சுமார் 4,000 கோடி ரூபா நஷ்டத்திலே இயங்கி வருகின்றன. அத்தொகை கடந்த காலத்திலே ஈடுசெய்யப்பட்டிருந்தால், இன்றைய வரவு செலவுத் திட்டத்தின் பற்றுக்குறை முழுமையையுமே வெளிநாட்டுக் கடன்களோ, உள்நாட்டுக் கடன்களோ இல்லாமல் ஈடுசெய்யக்கூடியதாக இருந்திருக்கும்.

பிரதிச் சபாநாயகரவர்களே, கூட்டுத்தாபனங்கள் பற்றிப் பலரும் பலவிதமாக ஆலோசனைகள் கூறினர்கள். இந்தக் கூட்டுத்தாபனங்களைப் பரிபாலிக்கும் இயக்குநர் சபையுடன், நடப்பு ஆண்டிலே பாராளுமன்ற அங்கத்தினர் இருவர் — அதாவது எதிர்க்கட்சியில் இருந்து ஒருவரும் அரசாங்கக் கட்சியிலிருந்து ஒருவருமாக இருவர் — அவற்றைப் பரி சீலனை செய்வதற்கு —

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

Order, please ! hon. Member we will adjourn now. You can continue your speech after lunch. The Sitting is suspended till 1.30 p.m.

*රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ. භා. 1.30 ට නැවත පවත්වන ලදී.*

*அதன்படி, அமர்வு பி. ப. 1.30 மணிவரை இடைநிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று.*

*Sitting accordingly suspended till 1.30 p.m. and then resumed.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එම්. අයි. උදුමාලෙබ්බෙ මහතා
**(ஜனுப் எம். ஐ. உதுமாலெப்பை)**
**(Mr. M. I. Uthumalebe)**

பிரதிச் சபாநாயகர் அவர்களே, நான் என்னுடைய உரையிலே கூட்டுத்தாபனங்கள் நட்டத்திலே இயங்குவதைப் பற்றிக் கூறிக்கொண்டிருந்தேன். இவ்வாறு நட்டத்திலே இயங்கும் கூட்டுத்தாபனங்களே இந்த நடப்பு ஆண்டிலே சில பாராளுமன்ற அங்கத்தினர் மேற்பார்வை செய்ய ஒழுங்கு செய்தால் ஓரளவு நட்டத்தினைக் குறைக்கும் வழிவகைகளே ஆராயக்கூடியதாக இருக்கும். அதுமாத்திரமன்றி, தேவைப்படும்போது அவற்றை அரச — தனியார் கம்பனிகளாகவும் மாற்ற முடியும். ஒவ்வொரு கூட்டுத்தாபனத்திலும் 49 வீத பங்குகளேத் தனியாருக்கு விற்பதன் மூலம் அரசாங்கம் ஓரளவு நிதியைப் பெற முடியும். அரசாங்கம் வழங்கிய நிதியில் இந்த அரசுக்குத் தேவையான ஒரு குறிப்பிட்ட அளவு நிதியைப் பெற்று அதன் மூலம் எங்களுடைய கடன்களேக் குறைக்க முடியும். அதிலும் தொடர்ந்து நட்டம் ஏற்படுமாக இருந்தால் அவற்றைத் தனியார் கம்பனிகளாகவும் மாற்ற முடியும். அதற்குப் பதிலாக இவ்வாருன கூட்டுத்தாபனங்களே மூடிவிடுவதால் பெரிய கஷ்டங்கள் ஏற்பட இடமுண்டு. குறிப்பாக, தொழிலாளர் பலர் தொழில் இழக்க வேண்டிய ஆபத்தான சூழ்நிலே ஏற்படும் என்பதால் அதனேத் தவிர்ப்பதற்காக இவ்வாருன முயற்சி ஒன்றை மேற்கொள்ளலாம்.

பிரதிச் சபாநாயகர் அவர்களே, இங்கு சமர்ப்பிக்கப்பட்டிருக்கும் இந்த வரவு செலவுத் திட்டம் இலங்கையின் நெல் உற்பத்திப் பிரதேசங்களில் வாழ்கின்ற விவசாயப் பெருமக்களுக்குப் பெரியதோர் உதவி வழங்கி இருக்கிறது. குறிப்பாக நெல்லின் உத்தரவாத விலேயை உயர்த்தியதனுல் விவசாயிகள் தங்கள் வருமானத்தை உயர்த்திக் கொள்ளக் கூடியதாக இருக்கின்றது. விவசாயிகளுக்கு ஓய்வூதியம் ஊதியம் கொடுக்கின்ற இந்த வரவு செலவுத் திட்டம் மிக நல்ல ஒரு வரவு செலவுத் திட்டம் என்பதை விவசாயப் பிரதேசங்களேச் சேர்ந்தவர்கள் அனேவரும் ஏற்றுக்கொண்டுள்ளனர். இருந்தாலும் ஒரு கசப்பான அனுபவத்தையும் இந்தச் சந்தர்ப்பத்தில் நான் சொல்ல வேண்டி இருக்கிறது. விவசாயக் காப்புறுதி வழங்குவதில் எமது பகுதி விவசாயிகள் கவர்ச்சி காணுதவர்களாயிருக்கின்ருர்கள் ஏனெனில் விவசாயக் காப்புறுதியானது/விவசாயிகளுக்கு நட்டம் ஏற்படும்பொழுது அவர்களது நட்டத்தை ஈடுசெய்வதில்லே. அவர்களது நட்டத்தை ஈடு செய்யக்கூடிய முறையில் அவர்களுக்கு நிதி வழங்கப்படுவதில்லே. ஒரு ஏக்கருக்த 2,000 ரூபா செலவிட்டு விவசாயம் செய்து இறுதியாக அறுவடை செய்யும் நேரத்திலே நட்டம் ஏற்படுமாக இருந்தால் விவசாயிகளுக்கு வழங்கப்படும் நட்டஈடு 500 ரூபாவுக்குக் குறைந்த தொகையாகவும் அமைந்துவிடுகிறது. அது மாத்திரமன்றி, விவசாயிகள் பல கஷ்டங்களுக்கு மத்தியில் நீண்ட காலத்தின் பின்னரே அந்த நட்டஈட்டைப் பெறக்கூடியதாக இருக்கிறது. இவ்வாருன ஒரு நிலே காப்புறுதிக்கு ஏற்படுமாக இருந்தால் அந்தக் காப்புறுதித் திட்டம் ஒரு தோல்வி கண்ட திட்டமாக மாறிவிடக்கூடும். எனவேதான் இதற்கான சட்டதிட்டங்களே உருவாக்கும்போது மிக எச்சரிக்கையாக இருந்துகொள்ள வேண்டும். அரசின் உண்மையான எண்ணத்தைப் பிரதிபலிக்கக் கூடியதான, விவசாயிகள் உண்மையான பலனேப் பெறக்கூடியதான திட்டத்தை ஆக்க வேண்டும்.

1977 ஆம் ஆண்டிலிருந்து விவசாயிகள் பலவிதமான சலுகைகளேயும் உதவிகளேயும் பெற்றிருக்கின்ருர்கள். இதற்கு முந்திய அரசாங்க காலத்தில் விவசாயிகள் புறக்கணிக்கப்பட்ட காரணத்தால் இந்த நாட்டுக்குக் கூடுதலான அரிசியை இறக்குமதி செய்யவேண்டிய நிலே ஏற்பட்டது மாத்திரமன்றி உள்நாட்டில் உற்பத்தியான நெல்லேக்கூட நாட்டின் பல பகுதிகளுக்கும் கொண்டு செல்லக்கூடிய ஒரு நிலே இருக்கவில்லே. பல இடங்களிலே தடை முகாம்கள் உருவாக்கப்பட்டன. இரண்டு கொத்து அரிசிக்கு மேற்கொண்டு செல்லமுடியாத நிலே ஏற்பட்டது. இதனுல் தீவின் பல பகுதிகளில் உணவில் பற்ருக்குறை ஏற்பட்டது மாத்திரமன்றி குப்பைத் தொட்டிகளிற்கூட உணவைத் தேடுகின்ற ஓர் அவல நிலே ஏற்பட்டதை நாம் மறந்துவிட முடியாது. இப்படியான ஒரு நிலேயில் இருந்து இந்த நாட்டை விவசாயத் துறையிலே இந்த அரசு மீட்டெடுத்தது மாத்திரமன்றி, விரைவிலே உணவு உற்பத்தியில் தன்னிறைவு காணக்கூடிய ஒரு பாரிய வளர்ச்சியைக் கண்டிருப்பதையிட்டும் நாம் உண்மையிலே இந்த அரசாங்கத்துக்கும் அதற்கான திட்டங்களே வகுத்த நிதி அமைச்சருக்கும் விவசாய அமைச்சருக்கும் பாராட்டுத் தெரிவிக்க வேண்டியவர்களாக இருக்கின்ரேம்.

இன்று நமக்கு உணவு போதுமான அளவு கிடைப்பது போன்று புடைவையும் கிடைக்கக்கூடிய வழிகள் இப்பொழுது வகுக்கப்பட்டிருக்கின்றன. நாம் விரும்புகின்ற புடைவையைத் தாராளமாக இறக்குமதி செய்கின்ற அனுமதி இன்று கிடைத்திருக்கிறது. தவருன வழிகளிலே புடைவை வகைகளே இறக்குமதி செய்து விற்பனே செய்வதைவிட சட்டபூர்வமான வழிகளிலும் பயன்தரக்கூடிய வழிகளிலும் இறக்குமதி செய்யக்கூடியதான ஒரு திட்டம் இந்த வரவு செலவுத் திட்டத்திலே அறிமுகம் செய்யப்பட்டிருக்கின்றது. ஆனுல், அமைச்சர் அவர்கள் இதில் சற்றுக் கவனம் செலுத்தி விலேகளே உயர்த்தி விற்காத நிலேமையை உருவாக்கவேண்டும். இறக்குமதி செய்யும்பொழுது போட்டி ஏற்பட்டு அந்தப் போட்டியினுல் விலேகள் குறைவதுதான் வழக்கமாக இருப்பினும் ஒரு சிலர் குறிப்பிட்ட ஜவுளி வகைகளே இறக்குமதி செய்து அதன் காரணத்தால் அத்தகை ஜவுளி வகைகளின் விலேயை உயர்த்திவிடாமல் பாதுகாக்கவேண்டிய ஒரு கடமையும் இங்கே இருக்கின்றது.

இந்த வரவு செலவுத் திட்டத்திலே சீனி உற்பத்தியைப் பொறுத்த வரையில் நாம் வெற்றி காணவில்லே என்று நிதி அமைச்சர் தமது உரையிலே குறிப்பிட்டிருந்தார். 1,400 கோடி ரூபா பெறுமதியான சீனியை நாம் வருடாந்தம் இறக்குமதி செய்கிரேம் என்றும் அவர் தெரிவித்தார். அதற்காகச் சீனி உற்பத்தியிற் பல புதிய நுட்பங்கள் கையாளப்படுவது மாத்திரமன்றி மொனருகலே மாவட்டத்திலே சீனித் தொழிற்சாலேயை நிறுவி அங்கே நிலங்கள் அபிவிருத்தி செய்யப்படுகின்றன எனவும் அவர் கூறினுர். சீனி உற்பத்தியைப் பெருக்குவதிலே சீனித் தொழிற்சாலேகள் — குறிப்பாக இங்கிரான, கந்தளாய் போன்ற இடங்களிலே இருக்கின்ற கூட்டுத்தாபன ஆலேகள் — நிலங்களேத் தனியாருக்குக் குத்தகைக்குக் கொடுத்து இருக்கிற ஒரு முறை மிகவும் வரவேற்கத் தக்கது. அரச உற்பத்தியை விட தனியார் உற்பத்தியில் மிகக் கூடுதலாகக் கவனம் செலுத்துவர் என்பதனுல் நாம் அடுத்துவரும் ஆண்டுகளிலே சீனி உற்பத்தியை கூட்டிக்கொள்ள முடியும்.

அமைச்சரவர்கள் தமது திட்டத்தைத் தயாரித்த பொழுது, இந்த ஆண்டு கைத்தொழில் திட்டங்களில் அதிக கவனம் எடுத்திருப்பது வரவேற்கத் தக்கதாகும். 1956 ஆம் ஆண்டு விவசாயம் அபிவிருத்தியடையாத ஒரு கால கட்டத்திலே, கடந்த கால அரசாங்கம் சில கைத்தொழில்களே உருவாக்க முயன்று அதில் தோல்வி கண்டதை நாம் அறிவோம். இங்கிலாந்து, ஜப்பான் போன்ற நாடுகளிலே விவசாயம் அபிவிருத்தியடைந்த பின்னரே கைத்தொழில்களே ஆரம்பித்திருப்பது ஒரு மிகச் சிறந்த முறை. அதுவே அபிவிருத்திக்கான, திட்டமான ஒரு முறை என்ற ரீதியிலே, விவசாயத்திலே நாம் தன்னிறைவை ஓரளவு அடைந்து கொண்டு வருகின்ற இந்த நேரத்திலே கைத்தொழிலில் அக்கறை எடுப்பதும், கைத்தொழிலே அதிகரிக்கச் செய்வதும் நாட்டின் வருமானத்தைச் சுமார் ஆறு வீதத்துக்கு மேல், 10, 15 வீதத்தாற் கூட உயர்த்தக்கூடிய நிலேயை ஏற்படுத்தும்.

எந்த ஒரு நாடும் கைத்தொழிலில் அபிவிருத்தி அடையும் பொழுது தான் அபிவிருத்தி அடைந்த நாடாக அது கருதப்பட்டிருக்கின்றது. கைத்தொழில் நாடுகள் தான் இன்று உலகில் தலா வீத வருமானத்தை உயர்த்தி நாட்டு மக்களின் வாழ்க்கை வசதிகளே அதிகரித்திருக்கின்றன என்பதை நாமறிவோம். விவசாய நாடுகள் போதுமான வருவாயைக் கொண்டிராத காரணத்தால் அவை இன்றும் அபிவிருத்தி குன்றிய நாடுகளாகவோ அல்லது அபிவிருத்தியடைந்துவரும் நாடுகளாகவோ விளங்குவதைக் காண்கின்ரேம். இந்நிலேயில் இந்நாட்டில் கைத்தொழிலே அபிவிருத்தி செய்வதற்காக அமைச்சரவர்கள் எடுத்துவரும் நடவடிக்கைகளே நான் பாராட்டுகிறேன்.

இச்சந்தர்ப்பத்தஉல் இன்னுமொரு விஷயத்தை ஞாபகப்படுத்த விரும்புகின்றேன். அரசாங்கம், மாவட்ட நிதியையும் கௌரவ பிரதமர் அவர்களின் மாவட்ட அபிவிருத்திச் சபை விருத்தி நிதியையும் தொகுதி ரீதியாக வழங்குவதன் மூலம் தொகுதிகளிற் பல அபிவிருத்தி வேலேகள் மேற்கொள்ளப்படுகின்றன. அவ்வாருன அபிவிருத்தி வேலேகள் போதிய ஆக்கம் நிறைந்தனவாக அமையாவிடினும் — அதிக அளவில் உற்பத்திப் பெருக்கத்தை அளிகைத்தக்கனவாக அமையாவிடினும் —அந்தந்தத் தொகுதிகளிற் இந்நிதி ஒதுக்கீடுகளின் மூலம் பற்பல விடயங்களில் கவனம் செலுத்தப்படுகின்றது. ஆகவே பிரதேச அபிவிருத்தியெனும் கருத்துணர்வை மையமாகவைத்து, தொகுதிகள் தோறும், அல்லது மாவட்டங்கள் தோறும் தனியார் துறை மூலமாகவோ,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. අයි. උදුමා ලෙබ්බෙ මහතා]

அரசதுறை மூலமாகவோ தொழில்களை ஆக்க முயன்றால் இலங்கையின் நாலாபக்கங்களிலும் எல்லாத் தொகுதிகளிலும் கைத்தொழில் அபிவிருத்தியைக் காணக்கூடியதாக இருப்பதுடன் தொழிலில்லாப் பிரச்சினையையும் தீர்க்க அது வழி வகுக்கும் என நான் நம்புகின்றேன்.

இந்த அரசாங்கம் 1977 ஆம் ஆண்டிலிருந்து ஏராளமான தொழில் வாய்ப்புக்களை வழங்கியிருக்கின்றது. இளைஞர்களுக்கு தொழில் வாய்ப்பு வழங்கியது மாத்திரமன்றி இந்நாட்டில் பல துறைகளிலும் வேலையில்லாத் திண்டாட்டத்தைக் குறைக்க வழிவகை செய்திருக்கின்றது. சுதந்திர வர்த்தக வலயத்தை நிறுவி அங்கே பல்லாயிரக் கணக்கானோர்க்குத் தொழில் பெற்றுக்கொடுத்தது மாத்திரமன்றி, இந் நாட்டின் சர்வகலாசாலைகளிலிருந்து பட்டம் பெற்று வெளியேறும் அனைவருக்கும் அரசாங்கம் தொழில் வழங்கியிருக்கின்றது. 1984 ஆம் ஆண்டுவரை சர்வகலாசாலையிலிருந்து பட்டம் பெற்று வெளியேறிய பட்டதாரிகளுக்கும் தொழில் வழங்கக்கூடிய நிலையில் இருப்பதை காணச் சந்தோஷப்படுகின்றேன். அதேவேளை, 1986 ஆம் ஆண்டிலிருந்து அரச நிறுவனங்களில் தொழில் வாய்ப்பு வழங்குவதில்லை என்ற அறிவிப்பு, இளைஞர் மத்தியில் பெரியதோர் அதிர்ச்சியை ஏற்படுத்தியிருக்கின்றது. கல்வி கற்று நீண்ட நாள்களாக வேலைவாய்ப்பு இல்லாதிருக்கும் வாலிபர்கள் மத்தியில் இவ்வாறு தொழில் வாய்ப்பு இல்லை என்ற கருத்து தெரிவிக்கப்படும்பொழுது அவர்கள் மனதில் ஒரு விரக்தி ஏற்படுகின்றது. 1971 ஆம் ஆண்டு இவ்வாறான ஒரு விரக்தி மனப்பான்மை இந்நாட்டை அழிவுக்கு இட்டுச் சென்றது என்பதை நாம் ஞாபகத்தில் வைத்திருக்க வேண்டும்.

எனவே இவ்வாறான எண்ணத்தை கல்வி கற்கும் மாணவர்கள் மத்தியிலும் இளைஞர்கள் மத்தியிலும் பரப்புவது உகந்தது அல்ல. எனவே இந்தத் திட்டத்தை அரசாங்கமும் அமைச்சர் அவர்களும் மீண்டும் பரிசீலனை செய்வது நன்மை பயப்பதாக இருக்கும். தொழில் வாய்ப்புக்களை வழங்கி மக்கள் மனதில் நல்லெண்ணெத்தை பெற்றிருக்கும் அரசு, இவ்வாறு ஒரு சிறப்பற்ற தீர்மானத்தை அறிவிப்பது தொகுதிகள் தோறும் வேலையில்லாதிருக்கும் படித்த வாலிபர்கள் மத்தியில் பிரச்சனைகளை ஏற்படுத்தும் ; அவர்களது பெற்றோர்களும் பெரிதும் கஷ்டங்களுக்குள்ளாக வேண்டியிருக்கும். ஆகவே, அமைச்சரவர்கள் இதனைக் கருத்திற் கொண்டு அரச நிறுவனங்களில் தொழில்வாய்ப்பு இல்லை என்ற தீர்மானத்தை மறுபரிசீலனை செய்யவேண்டும் என்ற கோரிக்கையை நான் விடுக்க விரும்புகின்றேன்.

இந்நாட்டிலே, நான் முன்னர் கூறியது போன்ற அச்சுறுத்தல்கள் நிரம்பிய ஒரு காலகட்டத்தில் ஒரு சிறந்த வரவு செலவுத் திட்டத்தை பல கஷ்டங்கள் மத்தியிலும் ஆக்கியது பற்றி நாம் நிதி அமைச்சரவர்களைப் பாராட்ட வேண்டும். அதே போன்று 1986 இல் மாத்திமன்றி 1987 இலும் அதைத் தொடர்ந்துவரும் காலங்களிலும் சிறந்த வரவு செலவுத் திட்டங்களை ஆக்குவதற்கு அமைச்சரவர்களுக்கு வசதிகள் ஏற்பட வேண்டும் என்று இந்நாட்டு மக்கள் பிரார்த்திக்கின்றார்கள். அவர்களுடன் நாமும் அவ்வாறே பிரார்த்திக்கின்றோம்.

கடந்த வாரம் இந்தக் கண்ணியமிக்க சபையிலே கௌரவ அங்கத்தவர் ஒருவர் ஆற்றிய கூற்று, இந்நாட்டிலே வாழுகின்ற ஒரு பகுதி மக்களுடைய மனதிலே மிகவும் சந்தேகத்தையும் மனக்கிலேசத்தையும் ஏற்படுத்தியிருக்கின்றது. இதையிட்டு நாம் மிகவும் வருந்துகின்றோம். ஐக்கிய தேசியக் கட்சி இந்த நாட்டிலே வாழுகின்ற எல்லாச் சமூகங்களையும் சேர்த்து; ஒருமித்து உருவாக்கப்பட்ட ஒரு கட்சியாகும். இந்தக் கட்சி இந்நாட்டிலே வாழுகின்ற சிங்களவர், தமிழர், முஸ்லிம்கள், பறங்கியர் ஆகிய பல இன மக்களைக் கொண்டு உருவாக்கப்பட்ட ஒரு கட்சியாகும். இக்கட்சியின் ஆட்சியிலே, மேன்மைதங்கிய ஜனாதிபதி அவர்களும் பிரதமர் கௌரவ ஆர். பிரேமதாச அவர்களும் கூறுவதுபோல, இந்நாடு எல்லோருக்கும் சொந்தமான நாடாகும். இங்கே சில சந்தர்ப்பங்களில் குறிப்பிடப்பட்டது போன்று அதாவது " இந்த நாடு ஒரு சிலருக்குத் தான் சொந்தம், மற்றவர்கள் வேறெங்காவது இடம் தேடிக்கொள்ளலாம் " என்ற கருத்து முற்றாக நீக்கப்பட வேண்டும். அத்தகைய கூற்றுக்கள் மக்களின் மனதில் மிகவும் வேதனையையும் அவநம்பிக்கையையும் ஏற்படுத்துவனவாகும். இச்சபையிலே ஆற்றுகின்ற உரைகள் மாத்திரமன்றி, தலைவர்கள் கூறுவதும் செய்வதும் பல சந்தர்ப்பங்களிலே மக்களுக்கு நன்மை பயக்கக்கூடியதாக இருக்க வேண்டும்.

கடந்த வாரம் இச்சபையிற் கூறப்பட்ட ஒரு கூற்று, 1986 ஆம் ஆண்டை ஒரு யுத்த ஆண்டாகப் பிரகடனப்படுத்திப் பயங்கரவாதத்தை வெற்றிகொள்ள வேண்டும் என்ற ஒரு கருத்தும், சென்ற மகாயுத்தத்தின் போது அமெரிக்காவில் வாழ்ந்த ஜப்பானியர் தனித்துவப்படுத்தப்பட்டது போன்று, அல்லது கவனிக்கப்பட்டது போன்று இந்நாட்டிலே வாழுகின்ற தமிழ் மக்களும் கவனிக்கப்படவேண்டும் என்ற ஒரு கருத்தும் தொனிக்கும் வகையில் அமைந்திருந்தது. உண்மையிலேயே இந்த அச்சுறுத்தலும் பயங்கரவாதமும் ஒழிய வேண்டும் என்று இந்நாட்டிலேயுள்ள எல்லா மக்களுமே விரும்புகிறார்கள். அதிலே பேதம் இல்லை. அவர்கள் சாதி, இன, மத பேதத்தைக் கடந்து அவ்வாறு மனமார விரும்புகிறார்கள். இது இப்படியிருக்க, இந்நாட்டின் நன்மைக்காக — இந்நாட்டின் வளர்ச்சிக்காக — வரலாற்று ரீதியாக அவர்கள் வாழ்ந்து வருகின்ற காலந்தொட்டு உதவிய ஓர் இன மக்களைச் சந்தேகக் கண்கொண்டு பார்ப்பது இந்நாட்டின் நலனுக்கு உகந்த ஒரு செயலுமல்ல, பொருத்தமான ஒரு செயலுமல்ல. இது ஐக்கிய தேசியக் கட்சியின் கொள்கையும் அல்ல.

எனவே பிரதிச் சாபநாயகரவர்களே, அத்தகைய கூற்றினால் வருத்த மடைந்துள்ள மக்களுக்கு நாம் ஆறுதல் கூற விரும்புகிறோம். ஆகவே இந்த நாட்டிலே வாழும் எல்லா மக்களும் அவர்களின் இன, மத, கலாச்சார பேதங்களை நீக்கி, இந்நாட்டில் ஒற்றுமை நிலவ வேண்டும் ; சமாதானம் தழைக்கவேண்டும் ; நாடு வளர்ச்சியடைய வேண்டும் என்று விரும்புகின்றார்கள், பிரார்த்திக்கின்றார்கள். அதற்காக எல்லாத் தியாகங்களையும் செய்வதற்கு அவர்கள் ஆயத்தமாக இருக்கிறார்கள்.

இந்நாட்டிலே நடைபெற்ற இன்னுமொரு நிகழ்ச்சியைப் பற்றியும் இங்கே கூறப்பட்டது. சென்ற சில வாரங்களுக்கு முன்னர் பாகிஸ்தானுக்கும் இலங்கைக்குமிடையே நடைபெற்ற விளையாட்டின்போது சில விஷமிகளால் இந்த நாட்டிலே சில நிகழ்ச்சிகள் நடத்தப்பட்டன. அவை உண்மையிலேயே எவர் செய்திருந்தாலும் கண்டிக்கப்பட வேண்டியவையாகும். உண்மையிலேயே இலங்கையிலே வாழ்ந்தால் என்ன, அல்லது உலகின் வேறு எப்பகுதியில் வாழ்ந்தாலென்ன எல்லா இஸ்லாமியர்களுக்கும் தேச விசுவாசம் என்பது ஈமானின் பாதி என்று சொல்லப்பட்டிருக்கின்றது. ஒவ்வொரு முஸ்லிமும் தமது தேச பக்தியை ஈமானின் பாதியாகக் கொண்டு, தான் வாழுகின்ற தேசத்தின் மீது விசுவாசம் வைக்க வேண்டியது அவனது கடமையாகும். இந்த இக்கட்டான காலகட்டத்திலே இந்நாட்டில் வாழுகின்ற சிங்கள, தமிழ், முஸ்லிம், பறங்கியின மக்கள் எல்லோரும் தேச விசுவாசத்துடன் வாழ்ந்து இந்நாட்டில் நிலவும் நிலைமையைக் கட்டுப்படுத்த விரும்புகிறார்கள். இலங்கையில் வாழுகின்ற முஸ்லிம் மக்களைப் பொறுத்த வரையிலே அவர்கள் இன்று நேற்று அல்ல, என்றென்றும் இந்த நாட்டிலே வாழ்ந்த சாலம் தொட்டு இந்நாட்டுக்கு விசுவாசமாக இருந்து வந்திருக்கிறார்கள். இது வரலாறு காட்டும் உண்மையாகும். அன்று அந்நியர்கள் போர்த்துக்கேயர் வந்து இந்நாட்டை வெல்ல முயன்ற பொழுது, இந்நாட்டின் மக்களுடன் சேர்ந்து — இந்நாட்டின்அரசுடன் சேர்ந்து அன்று எதிரிகளை — அந்நியர்களை விரட்டி ஒட்டுவதற்குப் பெரும் பிரயத்தனம் செய்தவர்கள் முஸ்லிம் மக்கள். அன்று மன்னனாக இருந்த மாயாதுன்னை அரசனுடன் சேர்ந்து ஒரு போரிலே 5,000 உயிர்களைப் பலிகொடுத்த பெருமையும் அந்த இனத்துக்குரியதாகும். அவ்வாறு இந்த நாட்டிலே வாழ்கின்ற இஸ்லாமிய சகோதரர்கள் தங்கள் நாட்டைத் தங்கள் தாயகமாகக் கொள்கிறார்கள். இந்த நாடு துண்டாடப்படுவதை எல்லா வகையிலும் விடுத்து இந்த நாட்டின் ஒருமைப்பாட்டுடன் வாழ்ந்து கிழக்கிலும் சரி, வடக்கிலும் சரி, இலங்கையின் ஏனைய பகுதிகளிலும் சரி இந்த நாட்டிலே வாழ்கின்ற இஸ்லாமிய மக்கள் இந்த நாட்டிலே வாழ்கின்ற சிங்கள மக்களுடனும் தமிழ் மக்களுடனும் இணைந்து வாழவே விரும்புகிறார்கள். அவ்வாறான ஒரு வாழ்க்கையை உருவாக்குகின்ற ஐக்கிய தேசியக் கட்சி அதற்குத் திட்டமிடுகின்ற வகையிலே இந்த வரவு வெலுவுத் திட்டத்தை உருவாக்கியதையிட்டு நான் அமைச்சரவர்களை வெகுவாகப் பாராட்ட விரும்புகிறேன்.

எனது உரையை நீட்டிக்கொண்டு போக நான் விரும்பவில்லை. எங்களுடைய அரசாங்கமும் அமைச்சரவையும் நிதி அமைச்சரும் மிகச் சிறந்த முறையில், மிக நேர்த்தியான முறையில் ஒரு வரவு செலவுத் திட்டத்தை தயாரித்து இருக்கிறார்கள் என்று நான் மீண்டும் பாராட்ட விரும்புகிறேன். மேன்மை தங்கிய ஜனாதிபதி அவர்கள் கூறிய ஒரு கூற்றை நான் இந்தச் சந்தர்ப்பத்திலே தெளிவுபடுத்த விரும்புகின்றேன்.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

His Excellency the President J. R. Jayewardene once said, "No one can demand success. All one can do is to deserve it". And I say, the Hon. Finance Minister deserves it.

Thank you very much, Sir.

අ. භා. 1.50

**රංගනායකී පත්මනාදන් මහත්මිය (මඩකලපුව දිසා ඇමතිතුමිය)**
**(திருமதி ரங்கநாயகி பத்மநாதன் — மட்டக்களப்பு மாவட்ட அமைச்சர்)**
**(Mrs. Ranganayaki Pathmanathan – District Minister, Batticaloa)**

Mr. Deputy Speaker, thank you for giving me this opportunity to speak on the Budget. This Government has presented nine Budgets, but the foundation for all the nine Budgets has been the same, namely, a sound economic policy and development strategy. That has been adopted since 1977.

Sir, in the year 1976 people clamoured against the burdens of the closed economy and voted the government out of power. The austerity measures that prevailed then denied the people material happiness. Exchange control regulations, import controls, shortages and queues made the government very unpopular. The earlier government failed to realise that costing human happiness should be the first and the last step in an economic programme. Therefore, Sir, our Government had to deviate and devise an entirely new strategy and a new economic order to promote economic prosperity.

During the past years the heavy dependence of the economy on the revenue of the three major commodities, tea, rubber and coconut, gradually and steadily weakened the economic prospects of the country. The diversification of revenue sources was not attempted. In the year 1950 the external resources of the country were able to meet 92 per cent of the country's annual import requirements. But in 1960 the external assets dwindled to a low ebb and were able to meet only 21 per cent of the requirements. This situation could have averted if there was planned development. There was no attempt at broad basing or diversifying the economy. Therefore, Sir, the economy became vulnerable to the fluctuations in the prices for tea, rubber and coconut. Therefore, the country had to face a foreign exchange crisis during this period.

It was in the year 1965 that the Sri Lanka Aid Group was formed to mobilize foreign resources to meet the crisis. I must mention at this juncture that this Government is trying to unlearn the practice of borrowing learnt from the earlier governments. I mentioned earlier that in 1977 we introduced a new economic order. The control system was relaxed. There was free, liberalized trade. In short, an export oriented open economy has come to stay.

The GCEC has played a major role in this sphere, particularly to promote export oriented foreign investment. Two hundred and six projects have been approved by June this year. The Katunayake Investment Promotion Zone has 63 within and 15 outside the Zone. The creation of employment opportunities was another objective that has been realised in a big way. For example, the Free Trade Zone has given 34,091 jobs up to June 1985.

We must congratulate our Minister of Finance for the dignified role he has played in obtaining loans for our economic programmes. In a fast developing world, foreign aid is considered a form of development assistance given by industrialized countries to the Third World nations. The World Bank and the IMF are the main financial agencies international in character. They help all the Third World economies. We do not beg or borrow from them in the narrow sense interpreted by critics. We have justified our claim for development assistance by sound economic performance. This is just what has impressed the foreign donors. Our Budgets are not prepared as the World Bank wants as criticized by the Opposition Members if that was so, the World Bank will have to have too many Third World Budgets on its hands. Our economy has shown promise of growth. Therefore, we are rather in a position to bargain for more assistance. This has been proved by the stand taken by the Hon. Minister of Finance at the recent Conference he attended in the Maldives. He dared to be forthright in his observations on the premier institutions, namely, the World Bank and the IMF. He commented on the poor remunerative prices for tea and pointed out that the surpluss of developing countries was siphoned off through unequal trade.

We must congratulate the Hon. Minister of Finance for obtaining foreign aid on the best possible terms. Some are grants and others concessionary loans with a long repayment period of 40 to 50 years with interest as low as 1/2 to 1 per cent. Such a rosy picture is bound to fail as time goes on. It is not only the duty of the Government but the responsibility of the people as well to participate in our development programme. The people also have a role to play. In no country in the world is everything left to the Government. It has been pointed out, Sir, that the rate of utilization of the project loans is 55 per cent which is a rather low rate. We cannot afford to dilly dally. We must introduce a mor efficient work culture to accelerate the utilization of loans. All projects must have a time frame and should be concluded within the stipulated period and, most important, within the approved budget.

Sir, some eye-brows have been raised –

**ආර්. ජේ. ජී.ද මෙල් මහතා**
**(திரு. ஆர். ஜே. ஜீ. த மெல்)**
**(Mr. R. J. G. de Mel)**

May I interrupt the hon. Member for a minute. There has been a great deal of misunderstanding on this question of utilization of loans. When you say 55 per cent what it means is only this –



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රංගනායකි පත්මනාදන් මහත්මිය
(திருமதி ரங்கநாயகி பத்மநாதன்)
**(Mrs. Ranganayaki Pathmanathan)**
Not major projects ?

ආර්. ජේ. ජී. ද මැල් මහතා
(திரு. ஆர். ஜே. ஜீ. த மெல்)
**(Mr. R. J. G. de Mel)**
No, all projects go over several years. I do not think that there is a single foreign aided project that can be completed within one year. Everything, including Integrated Rural Development, as you know, goes over several years. So what happens is, shall we say you get 100 million dollars for a project, it is spread over three years and sometimes over four years. So the rate of utilization in the first year is only 25 per cent or 30 per cent. So that is how it works. The Central Bank should evolve a better system of formulating the statistics. I think the Central Bank is remiss in this matter. If you read the Central Bank statistics you will get a wrong picture of the utilization. I think the Central Bank at least should have a foot note whhch says that this is how it happens.

රංගනායකි පත්මනාදන් මහත්මිය
(திருமதி ரங்கநாயகி பத்மநாதன்)
**(Mrs. Ranganayaki Pathmanathan)**
I hope, Sir, the Central Bank take note of this.

As I said, Sir, some eyebrows have been raised at the positive attitude taken by this Government towards privatisation. This has been the trend in some advanced countries as well. The Finance Secretary in the United Kingdom had been nicknamed "Mr. Privatisation". This is because the British Prime Minister has thought it progressive to privatize some of the public sector enterprises.

Back at home in Sri Lanka the prospects for some of our public corporations are bleak. They are virtually a drain on the government purse. The tax-paying public has to support the costly experiments of these corporations. The words of the Hon. Finance Minister become relevant in this context. He said, "I do not believe in the magic of public sector management; I only believe in the magic of sound management." The criterion of sound management seems to have been observed more in the breach.

When did the cracks in the management appear ? Why was it not detected and arrested at the outset ? The Committee on Public Enterprises has had monthly meetings to evaluate the progress of Corporations. How effective has this committee been ? Was action taken on the evaluation reports or have reports gone into cold storage ? Sir, the Government has laid emphasis on the fact that rural development is a corner-stone of our development strategy. Nearly 75 per cent of the population live and work in the rural areas. The agricultural sector contributes on average 28 per cent of the gross domestic product and 50 per cent of employment. The National Agriculture, Food and Nutrition strategy when implemented will make a qualitative improvement to rural development efforts.

Prior to 1977 the plantation sector which was the chief source of revenue suffered reverses. The threat of nationalisation as early as 1958 was hanging like the sword of Damocles and discouraged the estate proprietors from effecting improvements. In the year 1970 the nationalisation of the plantation sector further dislocated the management. Therefore, Sir, the rehabilitation of the plantation setor is one of our major programmes. The 5-year medium term investment programme will take care of plantations. The MPIT is considered the centre-piece of the Government Investment strategy. There are in addition 6 of these rehabilitation projects for small-holders, about 55 to 60 per cent of these costs are funded by donor agencies. Sir, I am very much interested in some of the projects that are to be started in the district. The Swiss aid of Rs. 12 million is for the development of dairy industries. It assists the economic and social upliftment of the small farmer. This development aid is for the districts of Amparai, Batticaloa, Polonnaruwa and Trincomalee. In these areas the cattle breeders have an unsolved problem of finding grazing land. The Government has not intervened to solve the problem of pasture land, particularly in the Amparai district for the last 7 years. Will the Swiss aid of Rs. 12 million be taken to grass root levels to give the cattle breeder a better livelihood ? Anyway, Sir, the new thinking of privatising of the collection, processing and marketing of milk is progressing. The creation of the first VMPC or the Village Milk Producing Company consisting of the members of the milk producers' families will absorb local production into business. Membership in the local MPC Will enable the producer to share in the parent body which is called Milk Industries of Lanka Company. 49 per cent of shares of this Company will be owned by milk producers and 51 by public investors.

Sir, the re-structuring of the rural credit system will make the horizon brighter for the small farmer. I pray, Sir, that the Regional Rural Development Banks already established in 7 districts will proliferate and benefit other areas too. When the Rural Development Bank was set up in India the Government of India directed the bank to restrict its lending to weaker sections of the community and so this bank came to be called the small man's bank. Sir, deposits mobilised in rural areas should be re-invested in activities in rural areas.

To conclude, Sir, I must commend the Hon. Minister of Finance for having steered the economy through difficult times. More commendable is the fact that our growth rate has been better than in most Third World countries. We have missed our place in the top flight of fast developing countries, may I stress, for reasons other

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

than economic non-performance. This is a great pity. Non economic factors have applied the brake on our pace of acceleration. All the same, we have achieved most of our targeted goals.

අ. භා. 2.6

**එන්. ඒ. සෙනෙවිරත්න මහතා (කැගල්ල දිසා ඇමතිතුමා)**
**(திரு. என். ஏ. செனெவிரத்ன — கேகாலை மாவட்ட அமைச்சர்)**
**(Mr. N. A. Seneviratne – District Minister, Kegalle)**

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මුදල් ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන ලද 9 වෙනි අයවැය ලේඛනය පිළිබඳව මගේද අදහස් දැක්වීමට තමුන්නාන්සේ අවස්ථාව සලසා දීම ගැන මම පළමුකොටම තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා. ගරු මුදල් ඇමතිතුමා 9 වෙනි අයවැය ලේඛනය ඉදිරිපත් කිරීමේදී කියන්න යෙදුණා "නවය නපුරුය, 13 වෙනිද නරක දිනයක්ය" කියා, මතයක් තිබෙනවාය කියා. නමුත් මම කියන්න කැමතියි, 13 ශ්‍රී අංකය ආරම්භ වුණාට පස්සෙ 13 ඉලක්කම හොඳ වී තිබෙන බව. මම හිතනවා 9ත් හොඳ අතට කැරකී තිබෙනවාය කියා. කෙසේ වෙතත් මේ ඉලක්කම් ගැන දිනයන් ගැන අපි ඒ තරම් භය වෙන්න වුවමනා නැහැ. ඊට හේතුව මේ දිනයන් ඒ කාලෙ යොදා තිබෙන්නේ අපට වඩා හොඳ දැනීමක් ඇති පුද්ගලයන් නිසයි. ඒ අය හොඳ දින පමණයි, තෝරාගෙන තිබෙන්නේ.

මෙම අයවැය ලේඛන ඉදිරිපත් කරන අවස්ථාවේදී ඒ ඉදිරිපත් කරන කාලය පිළිබඳවත් ඒ කාලය අතරතුර පැන නැඟී ඇති ප්‍රශ්න පිළිබඳවත් අපට විශේෂයෙන් සලකන්න වෙනවා. සාමාන්‍ය වශයෙන් විරුද්ධ පක්ෂයක් නිතරම බලාපොරොත්තුවන්නේ අයවැය ලේඛනය හොඳ වුණත් එය විවේචනය කිරීමටයි. අවාසනාවට වාගේ ඒ විවේචනය කරන පුද්ගලයන් අයවැය ලේඛනය ඉදිරිපත් කරන කාලය පිළිබඳව මීට වඩා හිත යොදවනවා නම් මේ විවේචන හුඟාක් දුරට අඩු වෙන්න පුළුවන්. මෙවර අයවැය ලේඛනය ඉදිරිපත් කිරීමට පෙර පත්‍රවල පළ වී තිබුණා සහනාධාර කපා දමා ජනතාවට හුඟාක් බර දෙන අයවැය ලේඛනයක් මුදල් ඇමතිතුමා ඉදිරිපත් කරයි කියා. මම හිතනවා එය එක්තරා විරුද්ධ පක්ෂයේ නායකයෙකුගේ ප්‍රකාශයනක්ය කියා. හැබැයි මම ස්තුති කරන්න ඕනැ ගරු මුදල් ඇමතිතුමාට, ඉතාමත් කල්පනාකාරීව, අවස්ථාවට උචිතව කාලෝචිත අයවැය ලේඛනයක් ඉදිරිපත් කර තිබීම ගැන. අපට පෙනෙනවා මෙවර අයවැය ලේඛනයෙන් දස ලක්ෂ 6,196ක් පමණ ආරක්ෂක අංශයට වෙන් කර තිබෙන බව. නමුත් විරුද්ධ පක්ෂය කියනවා මෙසේ මුදල් වැය කිරීම වෙනුවට සාමකාමීව සාකච්ඡා මාර්ගයෙන් මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන් කියා. නමුත් අතිගරු ජනාධිපතිතුමා එසේ සාමකාමී සාකච්ඡා මාර්ගයෙන් විසඳන්න කතා කරනවිට මේ පුද්ගලයන් සියලු දෙනාම ඒ සාකච්ඡාවලට සහභාගි නොවී ඉවත් වී සිටිනවා.

ගරු මුදල් ඇමතිතුමා විසින් ආරක්ෂක අංශයට මුදල් වෙන් කලාම මේ සැම කෙනෙක්ම ඇවිත් කියනවා, මෙසේ යුද්ධ කිරීමට මුදල් වෙන් නොකර සාමකාමීව මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන්ය කියා. මම අහන්න කැමතියි තමුන්නාන්සේගෙන්, මේක සාධාරණ කියමනක්ද කියලා.

තවත් පුදුම කියමනක් මම දැක්කා. එනම් 1982 ජනමත විචාරණය නිසාලු උතුරේ මේ අරගලය පටන්ගත්තේ. අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමාගෙන් (ලක්ෂ්මන් ජයකොඩි මහතා) මම අහන්න කැමතියි, 1982 දී ජනමත විචාරණය නිසා මේ අරගලය ඇති වුණානම් 1971 අරගලය ඇති වුණේ මොකක් නිසාද කියලා. 1982 ජනමත විචාරණයෙන් පස්සෙ උතුරේ අයට අවබෝධයක් ඇති වුණාලු, හිටපු මන්ත්‍රීන්ට පමණයි උතුරු නැගෙනහිර ප්‍රදේශවල මන්ත්‍රීන් වශයෙන් ඉන්න ලැබෙන්නේ, අලුත් අයට නියෝජනය කරන්න ඉඩක් ලැබෙන්නෙ නැහැ කියා. ඊට විරුද්ධ නිසයිලු, මේ අරගලය පටන්ගත්තේ. එසේනම් 1970 මැතිවරණයෙන් පස්සෙ 1971දී ලංකාවේ ඇති වුණ ත්‍රස්තවාදී කැරැල්ල ගැන මම අහන්න කැමතියි. මැතිවරණය අවසන් වී අවුරුද්දක් යන්නත් කලින් 1971 දී ත්‍රස්තවාදීන් කැරැල්ලක් ගැසුවේත් ඒ නියෝජනයට විරුද්ධ නිසාද ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ත්‍රස්තවාදීන්ට වෙලාවක දිනයක අවශ්‍යතාවක් නැහැ. ත්‍රස්තවාදී වැඩවලට නැකැත් බලන්නෙ නැහැ. හොඳ නරක බලන්නෙ නැහැ. ත්‍රස්තවාදීන් කියන පුද්ගලයන් ලැබෙන ඕනෑම අවස්ථාවකදී ඕනෑම විධියකට අයුතු ප්‍රයෝජන ගන්නයි බලන්නෙ. ඒ නිසා මම කනගාටු වෙනවා, මේ විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන් නොයෙක් අවස්ථාවලදී නොයෙක් තර්ක ඉදිරිපත් කිරීම ගැන.

අද ගරු මුදල් ඇමතිතුමාට මේ විධියේ අයවැයක් ඉදිරිපත් කරන්න හැකි වී තිබෙන්නේ 1977 සිට එතුමා මෙතෙක් ඉදිරිපත් කළ අයවැය ලේඛන අටේ හොඳකම නිසා බව මම තමුන්නාන්සේට කියන්න කැමතියි. එතුමා මේ රටේ හොඳ මුදල් පාලනයක් ඇති කිරීමටත් හොඳ ආර්ථික පසුබිමක් තහවුරු කිරීමටත් 1977 සිට උත්සාහ කර තිබෙනවා.

එතුමා කළ වැදගත් දේවල් රාශියක් තිබෙනවා. අවුරුදු හතක් තුළ මේ රටේ විනාශයට ගිය ප්‍රධාන වැවිලි වන තේ, පොල් හා රබර් වගාවන් සඳහා සාහනාධාර වැඩි කර, මම හිතන හැටියට අක්කර ලක්ෂ ගණනක් වගා කිරීමට එතුමා උදවු කර තිබෙනවා. 1977 සිට 1984 දක්වා වගා කරන ලද රබර් හෙක්ටෙයාර් ප්‍රමාණය මම කියන්නම්. 1977 දී 2,616 යි. 1978 දී 3,225 යි. 1979 දී 4,166 යි. 1980 දී 5,434 යි. 1981 දී 6,442 යි. 1982 දී 6,791 යි. 1983 දී 4,862 යි. 1984 දී 5,530 යි. 1983 දීත් 1984 දීත් අඩු වීමක් තිබෙනවා, නියඟය නිසා. මේ අනුව බලන විට අක්කරවලින් ගන්නවා නම් 1977 සිට 1984 වන තුරු අවුරුදු හත තුළ රබර් සඳහා පමණක් අක්කර 99,125 කට සහනාධාර දී වගාකර තිබෙන බව පෙනෙනවා. ඊළඟට 1970 සිට 1976 දක්වා වවා තිබෙන රබර් ප්‍රමාණයත් මම තමුන්නාන්සේට පෙන්වන්නම්. 1970 දී 4,144 යි. 1971 දී 3,431 යි. 1972 දී 3,538 යි. 1973 දී 2,945 යි. 1974 දී 2,864 යි. 1975 දී 3,229 යි. 1976 දී 2,549 යි. මෙයින් අප කාටත් පේනවා, මේ ගරු මුදල් ඇමතිතුමාගේ අයවැය ලේඛනවලින් ලැබුණු ආධාරයෙන් රබර් වගාවේ වර්ධනයක් ඉතා සීග්‍ර ලෙස සිදු වී තිබෙන බව.

ඒ සමගම පොල් ගැන සලකා බලමු. පොල් වගාව සඳහා එතුමා විශාල වශයෙන් උදවු කර තිබෙනවා. අදත් එතුමා උදවු කරනවා. අති ගරු ජනාධිපතිතුමා පොල් කටයුතු සම්බන්ධයෙන් පොල් සංවර්ධන අමාත්‍යාංශයක් ඇති කළා. මොකද ? මේ රටේ පොල් වගාව වැටුණොත් එය මේ රටේ ආර්ථිකයට බලපාන ප්‍රශ්නයක් වන බව එතුමාට පෙනුණා. ඒ නිසා අමාත්‍යාංශයක් ඇතිකර පොල් සංවර්ධනය සඳහා උත්සාහ ගත්තා. දැන් ඒ උත්සාහයේ සාර්ථක ප්‍රතිඵල ලැබී තිබෙනවා. පොල් නිෂ්පාදනය විශාල ලෙස වැඩි වී තිබෙන බව දැන් බය නැතිව කියන්න පුළුවන්.

මම තමුන්නාන්සේගෙන් එක් ප්‍රශ්නයක් අහනවා. අද පමණක් නොවෙයි, දිගටම මේ රටේ පැවතීගෙන එන ආර්ථික ප්‍රශ්න පිළිබඳ සම්පූර්ණ වගකීම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට බාර ගන්න වෙනවා. 1956 සිට ඒ පක්ෂය ගත් අදූරදර්ශී පිළිවෙත් නිසා. අපි වතු ජනසතුව ගැන බලමු. 1972 දී කරන ලද වතු ජනසතුව කිසිම සැලැස්මක් නැතිව කළ දෙයක්. එය හොඳ චේතනාවෙන් කළ දෙයක් නොවූ නිසා පළිගැනීමේ චේතනාවෙන් කළ දෙයක් නිසා එය පළිගැනීමෙන්ම කෙළවර වුණා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව මහජන එක්සත් පෙරමුණේ ආණ්ඩුව මේ රටේ ජනසතු ව්‍යාපාර ඇති කලේ ජනතාව පිළිබඳව තිබෙන ආදරය නිසාද නැත්නම් ඒ ව්‍යාපාර පිළිබඳව තිබෙන කැක්කුම නිසාදැයි මම අහනවා. අපි බස් ජනසතුව ගෙන බලමු. 1956 දී එක්සත් ජාතික පක්ෂයට පක්ෂ බස් ව්‍යාපාරිකයෝ හුඟ දෙනෙක් හිටියා. 1956 දී මහජන එක්සත් පෙරමුණ බලයට ඇවිත් බස් ජනසතු කලේ මේ රටේ ජනතාවට තිබුණු ආදරය නිසා නොවෙයි. බස් මුදලාලිලාට පහර ගසා එක්සත් ජාතික පක්ෂය නැති කිරීමේ චේතනාව පිටයි. නරක චේතනාවෙන් යමක් කලොත් බුද්ධාගම අනුව එය නරකින්ම කෙළවර වන බව සත්‍යයක්.

ලේක් හවුස් ආයතනය ජනසතු කලේ මේ රටේ ජනතාවට තිබෙන ආදරය නිසාද ? ලේක් හවුස් ආයතනයෙන් මේ රටේ ජනතාවට කිසිම පාඩුවක් වුණේ නැහැ. කිසිම පහරක් වැදුණේ නැහැ. ඒ පත්‍ර ඇත්ත ඇති හැටියට ප්‍රකාශ කලා ; ප්‍රසිද්ධ කලා ; ආණ්ඩුව හොඳ වැඩ කලා නම් ප්‍රශංසා කලා. නරක වැඩ කලා නම් විවේචනය කලා. පත්තරවල රාජකාරිය ඒකයි. එහෙම නම් පසුගිය රජය "ලේක් හවුස්" ආයතනය ජනසතු කරන්න රජයට පවරා ගන්න කටයුතු කලේ ඇයි ? "ලේක් හවුස්" ආයතනය එක්සත් ජාතික පක්ෂයට හිතවත්ය කියා හැඟුණු නිසයි. එහෙම නම් ඒ කටයුත්තත් කර තිබෙන්නේ නරක චේතනාවෙනුයි.

ගරු මුදල් ඇමතිතුමා කීවා, රජයේ සංස්ථා හුඟක් පාඩු ලබනවාය කියා. ඒ විධියට පාඩු සිදුවීම පුදුමයක් නොවෙයි. පසුගිය රජය අලුතින් සංස්ථා පිහිටෙව්වා නම්, පෞද්ගලික ආයතන රජයට පවරා ගත්තා නම් ඒවා කලේ සැලැස්මක් ඇතිව, යම්කිසි පදනමක් මත නොවෙයි ; හිතුනු - හිතුණු වෙලාවට හිතුවක්කාර විධියටයි. එවකට තිබුණු රජය එද ඒවා සැලැස්මක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එන්. ඊ. සෙනෙවිරත්න මහතා]

ඇතිව පිහිටෙව්වා නම්, රජයට පවරා ගත්තා නම් අද ඒ ආයතන මේ විධියට පාඩු ලබන තත්ත්වයකට මුහුණ පාන්නේ නැති බව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමතියි.

මේ රටේ ආර්ථික සංවර්ධනයට ඉවහල් වන කටයුතු සඳහා ගරු මුදල් ඇමතිතුමා හුඟක් වැඩ කර තිබෙනවා. එවැනි කටයුතු සඳහා මුදල් ඕනෑ වුණු ඕනෑම අවස්ථාවක පිරටකට ගිහින් හෝ ඒ මුදල් හොයාගෙන අවශ්‍ය තරම් මුදල් සැපයීම මඟින් එතුමා මේ රටේ ආර්ථික සංවර්ධනයට කර තිබෙන්නේ විශාල උපකාරයක්.

අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) සිය කථාවේදී සඳහන් කර තිබුණා, මහවැලි ව්‍යාපාරය අවසන් කළාය කීවත් ඒ ව්‍යාපාරයෙන් තවම කිසිම ප්‍රයෝජනයක් ලැබී නැහැ කියා. හොඳයි, ඒක ඇත්තක් හැටියට පිළිගනිමු. නමුත් අපි මේ දේත් කල්පනා කරන්න ඕනෑ නේද ? මහවැලි ව්‍යාපාරය අවසන් කරන්න කලින් සැලසුම්කර තිබුණේ අවුරුදු 30 කිනුයි. නමුත් මේ රජය ඒ ව්‍යාපාරය අවුරුදු 6 ක් වැනි සුළු කාලයකින් නිම කරන්න කටයුතු කළා. අවුරුදු 30 කින් කළ යුතුව තිබූ මහවැලි ව්‍යාපාරය අවුරුදු 6 කින් කළත් එය විශාල ව්‍යාපාරයක්, යෝධ ව්‍යාපාරයක්. මම හිතන හැටියට ලංකාවේ තිබෙන විශාලතම ව්‍යාපාරය තමයි, මහවැලි ව්‍යාපාරය. ඒ තරම් විශාල සංවර්ධන ව්‍යාපාරයක් අවුරුදු 6 කින් නිම කොට ඊළඟ අවුරුද්දේ සිටම සම්පූර්ණ ඵලප්‍රයෝජන ගන්න පුළුවන්ය කියා එතුමන්ලා හිතනවාද ? දැන් අපේ ඉඩම් හා ඉඩම් සංවර්ධන ඇමතිතුමා මහවැලි සංවර්ධන ඇමතිතුමා ක්‍රමයෙන් ඒ ප්‍රදේශවල ජනතාව පදිංචි කරවාගෙන යනවා ; ඒ තුළින් ඒ ප්‍රදේශ දියුණු කොට නොයෙකුත් නිෂ්පාදන ඇති කරන්න බලාපොරොත්තු වෙනවා. 1956 බලයට පත් වූ රජය පැය 24 න් සිංහලය රජයේ භාෂාව කළා වගේ වැඩක් නොවෙයි, මේ වැඩය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂ හා මහජන එක්සත් පෙරමුණු ආණ්ඩු කළ ඒ වැඩවලින් සිදු වුණේ රට සම්පූර්ණයෙන්ම අවුලෙන් - අවුලට වැටී විනාශ වීම පමණයි. ඒ නිසා මේ වැඩ එකවර කරන්න බැරි බව ඒ අය දැන්වත් තේරුම් ගන්න ඕනෑ. එක්සත් ජාතික පක්ෂය වැඩ කරන්නේ සැලසුමක් ඇතිවයි, මහජන මුදල් නාස්ති නොකර ඒවා ක්‍රමානුකූලව නියම විධියට පාවිච්චි කිරීම මඟින් ඒ මුදල්වලින් උපරිම ප්‍රයෝජන ලැබෙන විධියටයි. ඒ බව මේ අවස්ථාවේදී විශේෂයෙන් සඳහන් කරන්න කැමතියි.

නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟට ආහාර මුද්දර ගැන බලමු. අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා කියා තිබෙනවා, ඒ ආහාර මුද්දරවල වටිනාකම අද තිබෙන ජීවන වියදමට සරිලන ආකාරයට වැඩි කර නැත කියා. කවුද, ඒ විධියට කථා කරන්නේ ? එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවෙන් තොම්ලයේ දූන් හාල් සේරුව හුණ්ඩු දෙකට බස්සවපු ආණ්ඩුවක හිටපු ප්‍රබල නායකයෙක්. එද ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුවට කල්පනා වුණේ නැද්ද, හාල් හුණ්ඩු දෙකක් මදිය කියන එක ? අපි ආහාර මුද්දර දෙන්නේ සහනාධාරයක් වශයෙන් බව පළමුවෙන්ම අපි මතක තබා ගන්න ඕනෑ. මේ රටේ ජීවත්වන ඉතාම දුගී-දුප්පත්, දිළිඳු කොටසකට සහනයක් වශයෙනුයි, ඒ ආහාර මුද්දර ලබා දෙන්නේ. අතිගරු ජනාධිපතිතුමාගේ බලාපොරොත්තුවක් තිබෙනවා, මේ ආහාර මුද්දරවල වටිනාකම තවදුරට වැඩි කරන්නත්. මේ ආහාර මුද්දර ක්‍රමය, සහල් සලාක ක්‍රමය එහෙමත් නැත්නම් සහනාධාර ක්‍රමය පටන්ගෙන දැනට අවුරුදු ගණනාවක් වෙනවා. නමුත් මෙතෙක් කල් අපි සොයා බැලුවේ නැහැ, මේ ආහාර මුද්ර ක්‍රමය, සහනාධාර ක්‍රමය ලබන පවුල්වල හැකියාවන් මොනවාද කියා. සමහර විට මේ පවුල්වල සාමාජිකයන්ට නොයෙකුත් විධියේ හැකියාවන්, දක්ෂතාවන් තිබෙන්න පුළුවනි. මේ ආහාර මුද්දර ක්‍රමය හෙවත් ආහාර සහනාධාර ක්‍රමය ආර්ථික නිෂ්පාදන සහනාධාර ක්‍රමයක් බවට පරිවර්තනය කරනවා නම් ඒ සහනාධාර ලබන ජනතාවත් මේ රටේ ආර්ථික සංවර්ධනයට සහභාගි කරවා ගන්න පුළුවන් බව මේ අවස්ථාවේදී පෙන්වා දෙන්න කැමතියි. ඒ විධියේ ක්‍රමයක් ඇති කොට අඩු ගණනේ එවැනි සහනාධාර ලබන පවුල්වලින් සියයට 10ක් වත් ආර්ථික වශයෙන් පුනරුත්ථාපනය කරනවා නම් ඒ තුළිනුත් එකී පවුල්වලට විශාල සේවයක් සිදු කරන්න අපට පුළුවන්කම ලැබෙනවා. සමහර පවුල්වල ඉන්නවා, දක්ෂ වඩුවෝ, තවත් නොයෙකුත් අංශවල ශිල්පීය දක්ෂතා තිබෙන අය. නමුත් ඒ අයගේ අයහපත් ආර්ථික තත්ත්වය නිසා තමන්ගේ ශිල්පීය දක්ෂතාවන් ප්‍රදර්ශනය කිරීමට ඒ අයට අවස්ථාව, හැකියාව ලැබී නැහැ. ඒ හැකියාව ලබා දෙනවා නම් කවදාහරි ඒ අයට පුළුවන් වෙනවා, ස්වශක්තියෙන් නැඟී සිටින පවුලක් වෙන්න. එමනිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආහාර සහනාධාර ක්‍රමය නිෂ්පාදන සහනාධාර ක්‍රමයකට ක්‍රමයෙන් පරිවර්ථනය කරන්නය කියා මා ගරු මුදල් ඇමතිතුමාට යෝජනා කරන්න කැමතියි.

අද අපි යෝධ මහවැලි සංවර්ධන ව්‍යාපාරයක් ආරම්භ කර තිබෙනවා. අපි මෙතෙක් උත්සාහයක් ගත්තේ නැහැ ආර්ථික අතින් සහනාධාර ලබා ගන්නා අයව ඒ ප්‍රදේශවලට යොමු කරන්න. ඒ අයට මුදලින් හෝ ආධාර දී ඒ අයව ඒ ප්‍රදේශවල පදිංචි කරවනවා නම් එය මීට වඩා සුදුසුයි කියා මා හිතනවා. එසේ කළොත් එයින් කාර්යයන් දෙකක් ඉෂ්ට වෙනවා. එනම් එක අතකින් මේ රටේ සාමාන්‍ය කොටසට තොම්ලයේ කන්න දීම නතර වෙන අතර, අනෙක් අතින් ඒ අයගේ දක්ෂතාවයත් මේ රටේ නිෂ්පාදනය සඳහා ඉතාමත් පහසුවෙන් ලබා ගැනීමට හැකිවීමයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟ වැදගත් කාරණය නම් අපේ ගරු මුදල් ඇමතිතුමා ඇති කළ ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයයි. හුඟක් දෙනා කියනවා, මේ ක්‍රමය ඇති කිරීම සම්බන්ධයෙන් හැමදාම කියනවා, නමුත් මෙතෙක් ඇති කළේ නැහැ කියා. නමුත් ගරු මුදල් ඇමතිතුමා එතුමාගේ මෙවර වාර්තාවේදී ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ කරුණු ඉදිරිපත් කළේ එය ආරම්භ කිරීමේ අධිෂ්ඨාන පූර්වක හැඟීමෙන් යයි මා විශ්වාස කරනවා. අපි දන්නවා, මෙම ක්‍රමය ඇති කිරීම ඉතාමත් සාධාරණ බව. අපි දන්නවා, සමහර ගොවීන් වයස අවුරුදු 18, 20 ඉඳල ගොවිතැන් කරල, වයස අවුරුදු 80, 90 වන විට කාගෙවත් පිහිටක් නැතිව මැරිලා යන බව. මේ ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය ඇති කිරීමෙන් ගම්බද ගොවීන්ට, විශේෂයෙන් අමතක කර සිටි කොටසකට අනාගතයේදී විශාල සේවයක් ඇති වෙනවා. ගම්බද ගොවි ජනතාවට මෙවැනි වැදගත් විශ්‍රාම වැටුප් ක්‍රමයක් ඇති කිරීමට ගරු මුදල් ඇමතිතුමා උත්සාහ ගැනීම ගැනත්, ඒ සම්බන්ධයෙන් අපේ ගරු කෘෂිකර්ම ඇමතිතුමා යෝජනා ඉදිරිපත් කිරීම ගැනත් මා විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟ වැදගත් දෙය නම් මරාල බද්ද සහ තෑගි බද්ද අහෝසි කිරීමට අපේ ගරු මුදල් ඇමතිතුමා යෝජනා කර තිබීමයි. මේ පිළිබඳවත් සමහර අය විවේචන කරනවා, තෑගි බද්ද අහෝසි කිරීම නිසා කපටිකමින් මුදල් සෙවූ අය තෑගි බද්දෙන් නිදහස්ව ඒ අයගේ දූ දරුවන්ට තෑගි ලබා දෙයි කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකාවේ මිනිස්සු ඒ තරම් මෝඩ නැහැ කියා මම කියන්න කැමතියි. තමන්ගේ දූ දරුවන්ට තෑගි ඔප්පුවලින් තෑගි ලබා දෙන විට ඒ සියල්ලම ආදායම් බදු දෙපාර්තමේන්තුවට අහුවෙන බව මා කියන්න කැමතියි. එහෙම අහුවුණාම ආදායම් බදු දෙපාර්තමේන්තුවට පුළුවන් බදු අය කර ගන්න.

ආදායම් බදු දෙපාර්තමේන්තුවේත් එක වරදක් තිබෙන බව මා ගරු මුදල් ඇමතිතුමාට කියන්න කැමතියි. එනම්, යම් පුද්ගලයෙක් රුපියල් ලක්ෂ 2 ක් 3 ක් සොයාගෙන එයින් ඉඩමක් ගත්තොත් ඊළඟට මේ අය ප්‍රශ්න කරනවා ඒ ඉඩම කොහොමද ගත්තේ කියා, ඒ සල්ලි කොහෙන්ද කියා. මේ අය අලි යන කැලෑ පාරවල් ඇරලා තිබෙද්දී කුඹින් යන ගුල් වහන්න හදනවා. සමහරවිට රජයේ සේවකයෙක් රුපියල් 1,50,000 කට රුපියල් 2,00,000 කට ඉඩමක් ගත්තොත් ඒ සඳහා මුදල් සෙව්වේ කොහොමද කියල සොයන්න හුඟක් ප්‍රශ්න කරනවා. සමහරවිට ඒ පුද්ගලයා මාස්පතා තමන්ගේ පඩිය එකතු කරලා එය ගන්නා වෙන්න පුළුවන්. එහෙම නැත්නම් භාර්යාව හා ස්වාමිපුරුෂයා තමන්ගේ මුදල් එකතු කරලා ඒ ඉඩම ගන්නා වෙන්න පුළුවන්. එමනිසා මගේ හැඟීම මේ වාගේ දෙයක් ගැන ප්‍රශ්න කිරීම සාධාරණ නොවන බවයි. යම් පුද්ගලයෙක් එවැනි ඉඩමක් ගන්න විට එතැන් සිට එයින් බදු අය කිරීමට අපට අයිතියක් තිබෙන බව මා ගරු මුදල් ඇමතිතුමාට කියන්න කැමතියි. අද තිබෙන නීති හුඟක්දුරට සොරකම් කිරීමට උදව් කරනවා. සාමාන්‍ය පුද්ගලයෙක් රුපියල් ලක්ෂ 10 කට 15 කට ඉඩමක් ගත්තොත් එතැන් සිට ඒ පුද්ගලයාගෙන් ආදායම් බදු අය කරනවා. එය ඒ පුද්ගලයාට හංගන්න බැහැ. නමුත් අද තිබෙන නීති නිසා සමහර පුද්ගලයන් ලක්ෂ ගණන් මුදල් ගෙවල්වල තියාගෙන ඉන්නවා, බැංකුවල දමන්නේ නැහැ. එය අපට නතර කරන්න අමාරුයි. සමහර අය මැණික්වලින් ඒ වටිනාකම් ගෙදර තියා ගන්න පුළුවන්. තවත් සමහර අය රත්‍රංවලින් තියා ගන්න පුළුවන්. සමහරවිට වෙනත් වටිනා වර්ගවලින් තියා ගන්න පුළුවන්. මේ විධියේ සහනයක් ලබා දුන්නොත් මම හිතනවා, කිසිම භයක් නැතිව මිනිස්සු ඉඩකඩම් ගන්න ඉදිරිපත් වෙන්න පුළුවන් කියා. ඒ වාගේම ඉඩම්වල නියම මිල ඔප්පුවල පෙන්වන්න ඉදිරිපත් වෙන්න පුළුවන්. කර්මාන්ත ආරම්භ කරන්න පුළුවනි. මම දන්නවා සමහරවිට ඔප්පු ලියන මිනිස්සු රුපියල් ලක්ෂ 10, 15 වටිනා ඉඩම් ගැණුම්කාරයාත් විකුණුම්කාරයාත් එකතුවෙලා ලක්ෂ 3, 4 ට බස්සන බව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තමුන්නාන්සෙ ගිය වතාවෙ මුද්දර බද්ද අඩුකර කිව්වා, ඔප්පුවලට ගහන මුද්දරවල වටිනාකම අඩු කරන්නෙ ජනතාවට නියම වටිනාකම හෙළි කරන්නට අවස්ථාව දෙන්නටය කියා. නමුත් ඒ අය නියම වටිනාකම හංගන්නෙ මුද්දර ගසන්නට බය නිසා නොවෙයි. ඒ මුදල සොයාගන්නෙ කොහොමද කියන එක ගැන ප්‍රශ්න නගන නිසයි.

විරුද්ධ පාර්ශ්වය කිව්වාට, තෑගි බදු නැති කිරීමෙන්, තමා විසින් සෙවූ සල්ලි, කෙරාටික කමින් සෙවූ සල්ලි, භය නැතිව තමන්ගේ දූ දරුවන්ට තෑගි දෙයි කියා, ඒ පුද්ගලයොම දන්නවා ඊළඟට ආදායම් බදු දෙපාර්තමේන්තුව නිදගන්නෙ නැති බව. ඒ ලියන හැම ඔප්පුවකම විස්තර ආදායම් බදු දෙපාර්තමේන්තුවට ලැබෙනවා. තමුන්නාන්සේ කළේ හොඳ දෙයක්. සුළු ධනයක් තිබෙන සමහර අහිංසක පවුල් ඉන්නවා. උසාවියේ වැඩ කළ නිසා මම දන්නවා, සමහර අවස්ථාවලදී සමහරු ඉඩම් විකුණලයි මරාල බද්ද ගෙවන්නෙ. ඒකවත් ගෙවන්න බැරි තත්ත්වයේ අය ලෝකයේ ජීවත් වෙනවා. ඒ අයට ලොකු සහනයක් තමුන්නාන්සේ සැලසුවා. මම ඒ ගැන ස්තුති කරනවා. සාමාන්‍ය බැරි ජනතාවටත් තමුන්නාන්සේගේ අයවැයෙන් හොඳ අවස්ථාවක් ලබා දී තිබෙනවා.

ඊළඟට " මේ අයවැය ලේඛනයෙන් වැටුප් වැඩිවෙලා නැහැ " කියනවා. කව්ද එහෙම කියන්නෙ? අවුරුදු හතක් තුළ මේ රටේ පාලනයක් කර රජයේ සේවකයින්ට රුපියල් 90 ක්ද, 100 ක්ද වැඩි කළ ආණ්ඩුවක් නියෝජනය කළ නියෝජ්‍ය ඇමතිවරයෙක් වන අපේ අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමායි (ලක්ෂ්මන් ජයකොඩි මහතා). එතුමා කියනවා මේ අයවැය ලේඛනයෙන් රජයේ සේවකයින්ට වැටුප් වැඩිකර නැත කියා. මුදල් ඇමතිතුමා ඉදිරිපත් කළ අයවැය ලේඛන හුඟකින්ම රජයේ සේවකයින්ට වැටුප් වැඩි කලා. මේ අයවැය ලේඛනයෙන් එතුමා කියනවා, මේ රටේ අද තිබෙන තත්ත්වය අනුව, තිබෙන දුෂ්කරතා උඩ එය කිරීමට බැරිවීම ගැන එතුමා කණගාටු වන බව. අද තිබෙන මේ අවුල් වියවුල් නැතිව මේ රට සාමකාමීව තිබුණා නම් ගරු මුදල් ඇමතිතුමා රුපියල් සියයකින් නොවෙයි, දෙතුන් සියයකින් පඩි වැඩි කිරීමට ඉඩ තිබුණා. මේ රටේ තිබෙන ප්‍රශ්න නිසයි එතුමාට මෙවර ඒක කරන්න බැරිවුනේ.

ඊළඟට ගොවියාට ලොකු සහනයක් ලබා දුන්නා, ගරු මුදල් ඇමතිතුමා, වී බුසලේ මිල රුපියල් 7.50කින් වැඩි කිරීමෙන්. කව්පි සාමාන්‍ය හේන් ගොවියාට ඉතාමත්ම වැදගත් දෙයක්. මම හිතනවා අවුරුද්දේ එක යුගයක පමණයි හේන් ගොවිතැන් කරන්නෙ, වත්තිකරයේ ගොවියා. ඒ අය වගා කරන්නේ කව්පි, මුං, උඳු, බඩ ඉරිඟු, සෝයා වාගේ දේවල්. ඒවායේ මිලත් වැඩි කිරීමට ගරු මුදල් ඇමතිතුමා කටයුතු සලසා තිබෙනවා. ඒක ගම්බද හේන් ගොවියාට කළ ඉතා වැදගත් සේවාවක් වශයෙන් මේ අවස්ථාවේදී හඳුන්වා දෙන්නට අපට පුළුවන්. ගම්බද ප්‍රදේශ නියෝජනය කරන මන්ත්‍රීවරුන් සියලුදෙනාම ඒ ගැන විශේෂයෙන් එතුමාට ස්තුති කරනවා. ගම්බද ප්‍රදේශවල ගොවි ජනතාවගේ ප්‍රශ්න පිළිබඳව හොඳ අවබෝධයක් ඇතිව කටයුතු කරන මුදල් ඇමතිතුමෙක්, අපේ ගරු මුදල් ඇමතිතුමා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1977 මේ රජය ආරම්භ වුණු දින සිට 1985 දක්වා අවුරුදු අට තුළ මේ රටට පලදායී වැඩ රාශියක් මේ රජයෙන් කර තිබෙනවා. මම කලින්ම සඳහන් කලා මහවැලි ව්‍යාපාරය ගැන. කෝටි ගණන් මුදල් වැය කරලා මේ රටේ අනාගත ජනතාවගේ සංවර්ධනය සඳහාත්, අනාගත ජනතාවට සැපවත් ජීවිතයක් ගත කිරීමට අවස්ථාව ලබාදීම සඳහාත් ඒ ව්‍යාපාරය ආරම්භ කලා. ඊළඟට මහ කොළඹ ආර්ථික කොමිසම ආරම්භ කලා. ඒ මගින් ඉතා විශාල ප්‍රමාණයකට මේ රටේ රැකියා ලබා දීමට අවස්ථාව සැලසී තිබෙනවා. ඒ සමඟම වරාය සංවර්ධනය, ගුවන් තොටුපොළ සංවර්ධනය, නිවාස සංවර්ධනය ආදී වැදගත් කරුණු රාශියක් ඉටුකර තිබෙනවා.

නිවාස සංවර්ධනය ගැන කතා කරන විට මම මේ කාරණය කියන්න කැමතියි. ගරු මුදල් ඇමතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමාට ඉතා විශාල මුදලක් ලබා දෙනවා සෑම අවුරුද්දකම රජයේ නිවාස සංවර්ධනයට. ඒක බොහොම වැදගත් කාර්යයක්. අද ජාත්‍යන්තර වශයෙනුත් නිවාස තැනීමට මුල් තැනක් දෙන යුගයක්. ගෙවල් නැති පුද්ගලයින්ට ගෙවල් ලබාදීම සඳහා, ගෙවල් ඉදි කිරීමට එම අංශය භාර ගරු අගමැතිතුමාට ගරු මුදල් ඇමති තුමා විසින් අවුරුදු පතා විශාල මුදලක් ලබා දෙනවා. මෙය ඉතාම වැදගත් කාර්යයක්. නමුත් මේකත් විවේචනයට ලක් කරනවා. සමහරු කියනවා මේ මුදල් වැය කර නිවාස තැනුවාට ඒවා කඩා වැටෙනවා කියා. මේ කාර්‍ය්‍ය ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට පැවරුවොත් මීට වඩා හොඳට කරාවි කියාත් සමහරු කියනවා. ඒකයි පුදුමයට කාරණය. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වුණත් වැඩ බාර දෙන්නේ කොන්ත්‍රාත් කාරයින්ටයි. නමුත් අද ඒ ගෙවල් හදන්නේ කොන්ත්‍රාත්කාරයො නොවෙයි. මම තමුන්නාන්සේට කියන්න කැමතියි, ගෙයි පදිංචි වෙන පුද්ගලයාම තමයි තමන්ගේ ගෙය හදගන්නේ. ඒ කටයුත්තට කොන්ත්‍රාත්කාරයො සම්බන්ධ වෙන්නේ නැහැ. ගෙය හදන පුද්ගලයා බඩු ලබාගෙන, ඔහුගේ ශ්‍රමය යොදා ගෙන ඒ ගෙය සාදා ගන්නවා.

අපි ගිහිල්ලා තිබෙනවා උදගම් බොහොමයකට. අපේ දිස්ත්‍රික්කයේත් උදගම් රාශියක් තිබෙනවා. අපට පෙනෙන හැටියට මේවායේ නිවාස සියල්ල ඉතාමත් හොඳින් තනා නිමකර ඇති බව මම මේ අවස්ථාවේදී සඳහන් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අවසාන වශයෙන් කියන්න කැමතියි, අද මේ රටේ ප්‍රශ්න රාශියක් තිබෙන බව. විශේෂයෙන්ම මේ රටට තදින්ම බලපාන ප්‍රශ්නය තමයි ත්‍රස්තවාදී ප්‍රශ්නය. පසුගිය අවුරුදු පහ, හය තුළ මේ ප්‍රශ්නය ඉතා උග්‍රවී තිබෙනවා. ත්‍රස්තවාදය නිසා අපේ රටේ ධනයෙන් සැලකිය යුතු කොටසක් විනාශයට පත් වෙනවා. ගරු මුදල් ඇමතිතුමා දසලක්ෂ හයදස් එකසිය අනූහයක් ආරක්ෂක වැඩ කටයුතු සඳහා ලබාදී තිබෙනවා. ත්‍රස්තවාදී වැඩ වලින් වන විනාශ නිසා මේ රටේ කෝටි ගණන් මුදල් අපතේ යනවා. අපේ රටේ තිබෙන මේ ත්‍රස්තවාදී ප්‍රශ්නය සාමකාමී වාතාවරණයක් උඩ නිරාකරණය වේවායි අපි ප්‍රාර්ථනා කරනවා. එසේ වේවායි අපි ප්‍රාර්ථනා කළ යුතුයි. එවිට ජාති භේද වලින් තොරව සෑම ජාතියකටම නිදහසේ ජීවත්වීමට හැකියාවක් ලැබේවි. අතීතයේදී සිදුවූ නොයෙක් නොයෙක් සිද්ධීන් මත, නොයෙක් නොයෙක් ප්‍රශ්න මත ජනතාව බෙදී ඉන්නවා. ඒ සියල්ලම නැතිව ගොස් අනාගතයේදී සමාකාමී ශ්‍රී ලංකාවක් තුළ සහෝදරයන් වශයෙන් සෑම දෙනාටම ජීවත්වීමට හැකියාවක් ලැබේවායි කියා ප්‍රාර්ථනය කරමින්, මට කතා කිරීම සඳහා අවස්ථාව ලබාදීම ගැන ඔබතුමාට ස්තුතිය පුද කරමින් මගේ කතාව අවසන් කරනවා.

අ. භා. 2.33

**රූපසේන කරුණාතිලක මහතා (ගාල්ල දිසා ඇමතිතුමා)**
**(திரு. ரூபசேன கருணாதிலக்க — காலி மாவட்ட அமைச்சர்)**
**(Mr. Rupasena Karunatilleke – District Minister, Galle).**

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ,අයවැය ලේඛණ ඉදිරිපත් කර වාර්තාවක් තැබුවේ යූ. බී. වන්නිනායක මුදල් ඇමතිතුමායි. ඒ 1965 - 70 කාලය තුළයි. එතුමා තැබූ වාර්තාව අද අපේ වර්තමාන මුදල් ඇමතිතුමා බිඳහෙලා තිබෙනවා.

අවුරුදු අටක් තුළ අපටත් අවස්ථාව ලැබුණා එතුමා විසින් ඉදිරිපත් කළ අයවැය ලේඛන පිළිබඳව විවාදවලට සහභාගි වන්නට. එතුමා විසින් ඉදිරිපත් කර තිබෙන නව වැනි අයවැය ලේඛනය ගැන අද අපි සාකච්ඡා කරනවා.

මේ අයවැය ලේඛනය ගැන කතා කරන කොට, ඒ ගැන විවේචනය කරන කොට අපි හැම දෙනාම කල්පනා කළ යුතු වැදගත්ම දේ තමයි, මොන වගේ වාතාවරණයක් තිබෙන අවස්ථාවකද මේ අයවැය ලේඛනය එතුමාට ඉදිරිපත් කිරීමට සිදු වුනේ කියා. මේ රටේ ජාතික ධනයෙන් සැහෙන කොටසක් රටේ ආරක්ෂාව වෙනුවෙන් යොදවන වෙලාවක් මේ. ඒ වගේම බලාපොරොත්තු නොවූ අන්දමට ජාතික ආදායම පහළ වැටුණු වේලාවක්. දැන් රටේ ආදායම අඩුවෙලා තිබෙනවා. තමුන්නාන්සේ දන්නවා සංචාරක ව්‍යාපාරය ඉතාමත්ම පහත් තත්ත්වයකට වැටී තිබෙන බව. අද රජයට සිදුවී තිබෙනවා සංචාරක ව්‍යාපාරයේ නඩත්තුව වෙනුවෙනුත් මුදල් වැය කිරීමට. අන්න ඒ විදියට, බලාපොරොත්තු නොවූ අන්දමට මාර්ග අඩුවෙලා, වියදම් වැඩි වී ඇති වෙලාවක තමයි මේ අයවැය ලේඛනය ඉදිරිපත් කර තිබෙන්නේ. බොහෝ දෙනෙක් කල්පනා කලා, මේ රටේ සංවර්ධන වැඩපිළිවෙල අඩාල කර, රටේ ආරක්ෂක කටයුතු වෙනුවෙන්ම මුදල් යොදාවිය කියා. හුඟ දෙනෙක් බලාපොරොත්තු වුනා මේ වාරයේ අයවැය යෝජනා තුළින් විශාල කම්පනයක් ඇති වේවි කියා. බොහොම දෙනෙක් එසේ හිතුවා, කතා කලා. අපේ මුදල් ඇමතිතුමාගේ කතාවේදී සඳහන් කලා කම්පනය පසුවටයි තිබෙන්නේ කියා. "Shocks" තිබෙන්නේ පසුවටයි කිව්වා. නමුත් මේ අයවැය ලේඛනය ගැන කල්පනා කර බැලුවාම මට හිතෙන්නේ, මේ අයවැය ලේඛනයෙන් ලැබෙන ලොකුම කම්පනය තමයි මේ අයවැය ලේඛනයේ කම්පනයක් නැති එක. The biggest shock in this Budget is that there are no shocks in the Budget.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රූපසේන කරුණාතිලක මහතා]

ඒනිසා අපි මේ අවස්ථාවේදී මුදල් ඇමතිතුමාට විශේෂයෙන්ම ස්තුතිවන්ත විය යුතුයි. නොයෙක් විධියේ බාධක, කරදර රාශියක් මධ්‍යයේ, ආරක්ෂක කටයුතු වෙනුවෙන් උපරිම මුදල් ප්‍රමාණයක් යොදවද්දීත්, මේ රටේ මහා පරිමාණයෙන් කරගෙන යන සංවර්ධන ව්‍යාපාර එකකවත් වැඩ කටයුතු අඩපණ නොවන්නට මුදල් ලබා දෙමින් මෙවැනි අයවැය වාර්තාවක් ඉදිරිපත් කිරීම ගැන. මේ අවුරුදු නවය තුළම එතුමා ඉදිරිපත් කළ අයවැය වාර්තා තුළින් මේ රටේ උද්ධමනය කියන වචනය සම්පූර්ණයෙන්ම වාගේ නැති වන ආකාරයට එතුමා ඒවා ඉදිරිපත් කර තිබීම ගැනත් මා එතුමාට ස්තුතිවන්ත වෙනවා.

මා නියෝජනය කරන ගාළු දිස්ත්‍රික්කය දෙස බලන විට මම එතුමාට විශේෂයෙන්ම ප්‍රසංශා කරන්නට ඕනෑ, රුහුණට විශ්ව විද්‍යාලයක් ලබා දීමට කටයුතු කිරීම පිළිබඳව. සෑම රජයකින්ම දකුණේ අය කළ ලොකුම ඉල්ලීමක් තමයි, දකුණට විශ්ව විද්‍යාලයක් ලබා දෙන්නය කියන එක. රටේ නොයෙක් නොයෙක් ප්‍රදේශවල විශ්ව විද්‍යාල ඇති කළත් දකුණට විශ්ව විද්‍යාලයක් ලැබුණේ නැහැ. වර්තමාන ජනාධිපතිතුමාගේ සහයෝගය ඇතිව අපේ ගරු මුදල් ඇමතිතුමාගේ මැදිහත්වීම තුළින් අද රුහුණු විශ්ව විද්‍යාලය ආරම්භ වී තිබෙනවා. ඉතාමත්ම අලංකාර ගොඩනැගිලි රාශියක් රුහුණු විශ්ව විද්‍යාලයේ අද ඉදිවෙමින් යනවා. එහි වෛද්‍ය පීඨය ගාල්ලේ පිහිටුවා තිබෙනවා. ඒ වෛද්‍ය පීඨය මඟින් අද වෛද්‍යවරුන් සෑහෙන සංඛ්‍යාවක් පිටවෙනවා. මා හිතන විධියට පසුගිය අවුරුදු දෙකක කාලය තුළ වෛද්‍යවරු සෑහෙන සංඛ්‍යාවක් පිට වුණා. ඒ තුළින් විශාල සේවයක් ඉටු වෙනවා. ඒ ගැන මුළු දකුණේ ජනතාවගේම ප්‍රසංශාව තමුන්නාන්සේට හිමි වෙනවා. විශේෂයෙන් දකුණේ ජනතාවගේත් මුළු ලංකාවේ ජනතාවගේත් ප්‍රසංශාව තමුන්නාන්සේට හිමි වෙනවා.

ගාළු වෛද්‍ය පීඨයට අනුබද්ධ රෝහල අද කරාපිටියේ ඉදිවෙමින් පවතිනවා. තමුන්නාන්සේ ඒ ගැන විශේෂ උනන්දුවක් දක්වන බව මම දන්නවා. ඒ රෝහලේ වැඩ කටයුතු දැන් සෑහෙන ප්‍රමාණයක් අවසාන වී තිබෙනවා. අවුරුද්දකට රුපියල් දශ ලක්ෂ 25 ක මුදලක් වෙන් කර මේ කටයුත්ත කෙරීගෙන යනවා. මම විශේෂයෙන් මේ අවස්ථාවේ ගරු මුදල් ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේ රෝහල වෙනුවෙන් අවුරුද්දකට රුපියල් දශ ලක්ෂ 25 ක් නොවෙයි දශ ලක්ෂ 50 ක් ලබා දෙන්නට වැඩ කටයුතු කරන්න. මට දැනගන්නට ලැබුණු හැටියට ඉතිරි වැඩ කොටස නිම කරන්නට දශ ලක්ෂ 120 ක් අවශ්‍යයි. අවුරුද්දකට දශ ලක්ෂ 25 බැගින් දුන්නොත් මේ කටයුත්ත අවසාන වන්නට සෑහෙන කාලයක් යන නිසා අවුරුදු 2 1/2 කින් රෝහලේ කටයුතු අවසාන කර ගන්නට තමුන්නාන්සේගේ විශේෂ අවධානය යොමු කර අවුරුද්දකට දෙන මුදල් ප්‍රමාණය වැඩි කර දෙන්නට යම්කිසි ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස මම ඉල්ලා සිටිනවා.

ගරු මුදල් ඇමතිතුමාට හැම මන්ත්‍රීවරයෙක්ම ප්‍රසංශා කරනවා, මේ රටේ ගොවීන් වෙනුවෙන් ආරම්භ කර තිබෙන නව ක්‍රියා මාර්ගය පිළිබඳව. මමත් තමුන්නාන්සේට විශේෂයෙන්ම ඒ ගැන ස්තුතිවන්ත වෙනවා. ගාළු දිස්ත්‍රික්යේ වැඩිම ප්‍රමාණයක් භූමිය යටවී තිබෙන්නේ ගොවිතැන්වලිනුයි. ගාළු දිස්ත්‍රික්කයේ අක්කර 60,000 ක් ගොවිතැනින් යටවී තිබෙනවා. ගොවි මහත්වරු විශාල සංඛ්‍යාවක් අපේ දිස්ත්‍රික්කයේ ජීවත් වෙනවා. මේ ගොවි මහත්වරු වෙනුවෙන් තමුන්නාන්සේගේ අවධානය යොමුවීම ගැන ස්තුතිවන්ත වන අතර මෙවැනි කටයුත්තක් ආරම්භ කිරීම ගැන ගරු කෘෂිකර්ම ඇමතිතුමාටත් අපි ප්‍රශංසා කරනවා.

විශේෂයෙන්ම මේ රටේ කෘෂිකර්මාන්තය ගැන කල්පනා කරන විට සෑම අවස්ථාවකම කෘෂිකර්මාන්තයට විශේෂ තැනක් දෙන්නට කටයුතු කළේ එක්සත් ජාතික පක්ෂයේ රජයක්ය කියන එක අපි කියන්නට ඕනෑ. ඩී. එස්. සේනානායක මැතිතුමාගේ කාලයේ සිට මේ රටේ කෘෂිකර්මාන්තය නඟාසිටුවීමේ සහ මේ රට සහලින් හා නොයෙකුත් පාරිභෝගික ද්‍රව්‍යයන්ගෙන් ස්වයංපෝෂිත කිරීමේ ව්‍යාපාරය ඉතාමත්ම ක්‍රමවත්ව ඉදිරියට ගෙන ගියේ එක්සත් ජාතික පක්ෂයේ රජයෙනුයි. මේ රටින් පිටරට ඇදී ගිය විදේශ විනිමය ඉතිරි කර මේ රටේ සංවර්ධනය වෙනුවෙන් ඒ මුදල් යොදවන්නට අවස්ථාව ලැබුණේ මේ රටේ ගොවියා නිසයි. ඒ නිසා විශේෂයෙන්ම ගොවියා වෙනුවෙන් මෙවැනි ක්‍රියා මාර්ගයක් ආරම්භ කිරීම ගැන මුළු මහත් ජනතාවගේම ප්‍රසංශාව තමුන්නාන්සේටත් කෘෂිකර්ම ඇමතිතුමාටත් හිමි වන්නට ඕනෑ.

අපේ දිස්ත්‍රික්කය ගැන කල්පනා කරන විට ඊළඟට වැඩිම බිම් ප්‍රමාණයක් අයත් වන්නේ තේ වගාවටයි. තේ මිල පහත වැටී තිබෙන මේ අවස්ථාවේදී තමුන්නාන්සේ මේ අයවැයෙන් බදු සහන ලබාදී කුඩා තේ නිෂ්පාදකයා ආරක්ෂා කිරීමට ඉදිරිපත්වීම ඉතාමත්ම ප්‍රසංශනීය කරුණක් හැටියට මම මතක් කරන්න ඕනෑ. පසුගිය අවුරුදු දෙක තුන තුළදී සෑහෙන සංඛ්‍යාවක් තේ වගාව ආරම්භ කර තිබෙනවා, තමුන්නාන්සේ ලබාදී ඇති විශේෂ සහනාධාර නිසා. විශේෂ සහන ක්‍රමයක් තුළින් එය ආරම්භ වුණා වගේම ගාළු දිස්ත්‍රික්කයට ඉතාමත් විශාල තේ කර්මාන්ත ශාලා 4 ක් කුඩා තේවතු සංවර්ධන අධිකාරිය තුළින් ලබා දෙන්නටත් තමුන්නාන්සේ කටයුතු කර තිබෙනවා. එ නිසා ඒ ප්‍රදේශයේ අපේ කුඩා තේවතු හිමියන්ට විශාල සහනයක් සැලසී තිබෙනවා. ඒ ගැන විශේෂයෙන්ම තමුන්නාන්සේට අපි මේ අවස්ථාවේ ස්තුති කරනවා.

ඊළඟට රැකියා ප්‍රශ්නය ගැන සලකා බලමු. ගරු මුදල් ඇමතිතුමා අනුගමනය කළ විවෘත ආර්ථික ප්‍රතිපත්තිය නිසා, සියයට 26 ක්ව තිබුණු රැකියා විරහිත පිරිසගේ සංඛ්‍යාව සියයට 12 දක්වා අඩු කරගන්නට ලැබීම වාර්තාවක් හැටියට සලකන්නට ඕනෑ. සංඛ්‍යා ලේඛන අනුව මෙය සියයට 12 ක් බව කිව්වත්, මම කල්පනා කරන හැටියට මේ සංඛ්‍යාව මීටත් අඩු වෙන්නට ඕනෑ. මොකද ? වාර්තාවලට ඇතුළත් නොවන අන්දමේ රැකියා විශාල ප්‍රමාණයක් පසුගිය කාලය තුළ ලැබී ඇති නිසයි. විශේෂයෙන්ම සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ අධාරවලින්ද, විමධ්‍යගත අයවැයෙන් මුදල් උපයෝගී කර ගැනීම තුළින්ද අපේ ප්‍රදේශවල තරුණ - තරුණියන් විශාල සංඛ්‍යාවක් ස්වයං රැකියා මාර්ගවලට යොමු කර තිබෙනවා. දැන් සෑහෙන සංඛ්‍යාවකට ස්වයං රැකියා ලැබී තිබෙනවා. එපමණක් නොවෙයි, අලුතෙන් ලැබී ඇති ආධාරවලින්, විශේෂයෙන්ම ආසියානු සංවර්ධන බැංකුවෙන් ලැබුණු ආධාර තුළින්, අපේ ප්‍රදේශවල පශු සම්පත වර්ධනය කරන්නට විශාල ක්‍රියාමාර්ග ආරම්භ කර තිබෙනවා. එමනිසා මෙම සංඛ්‍යා ලේඛනවලට ඇතුළත් නොවුණු, ස්වයං මාර්ගවලින් රැකියා ලැබුණු අයගේ සංඛ්‍යාව ඉතා විශාල බව පැහැදිලියි.

දැන් පෞද්ගලික බස් රථවල වැඩ කරන සෑහෙන පිරිසක් සිටිනවා. එවැනි ක්‍රමවලින් රැකියා ලැබුණු පිරිසට බාහිරව, කිසිම කෙනෙකුට අත පාන්නේ නැතුව, නිදහස් පුරවැසියන් හැටියට ජීවත්වීම සඳහා තවත් විශාල පිරිසක් ස්වයං රැකියා මාර්ගවලට යොමු කරවන්නට ලැබීම විශාල භාග්‍යයක් හැටියට මතක් කරන අතර ලෝකයේ නොයෙක් රටවලට ගිහින්, විවිධ ආයතනවලින් ඉතාම අඩු පොලියට හෝ ප්‍රදාන වශයෙන් මුදල් ආධාර ලබා ගෙන, මෙම ප්‍රශ්න විසඳීමට අපේ ගරු මුදල් ඇමතිතුමා ගන්නා ක්‍රියා මාර්ග පිළිබඳව අප එතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන සැලැස්ම ගැනත් වචනයක් කියන්නට කැමතියි. මෙම සංවර්ධන සැලැස්ම යටතේ මෙරට දිස්ත්‍රික්ක ගණනාවකම සංවර්ධන කටයුතු කරගෙන යන බව අපි දන්නවා. මා දන්නා තරමින් දිස්ත්‍රික්ක 18 කට පමණ ආධාර ලබා ගන්නට පුළුවන්කම ලැබී තිබෙනවා. .ආධාර ලබා ගැනීමට තවමත් නොහැකි වුණු දිස්ත්‍රික්ක දෙකක් හැටියට මට පෙනෙන්නේ, කොළඹ හා ගාලු යන දිස්ත්‍රික්ක දෙක පමණයි. අනුරාධපුර, මහනුවර ආදී ප්‍රදේශවල ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන සැලැස්ම යටතේ සංවර්ධන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක නොවුණත්, මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය තුළින්—

**ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා (මහනුවර දිසා ඇමතිතුමා)**
**(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க — கண்டி மாவட்ட அமைச்சர்)**
**(Mr. W. P. B. Dissanayake – District Minister, Kandy)**

ඒක වැරදියි. මම ඒ අදහස නිවැරදි කරන්න කැමතියි. මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය තුළින් මහනුවර දිස්ත්‍රික්කයට ශත පහක ප්‍රයෝජනයක් නැහැ. තිබුණු ඉඩම් ටික වතුරට යට වුණා. ගෙවල් කඩා දැමුවා. ඒවායේ සිටි මිනිසුන් ඉවත් කළා. පවුල් හාර දහසක් තෙල්දෙනියෙන් ඉවත් කළා. පවුල් තුන් දහසක් කොත්මලෙන් ඉවත් කළා.

**නියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
(Mr. Deputy Speaker)

මොකක්ද නිවැරදි කරන්නට කියන්නේ ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා**
**(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க)**
**(Mr. W. P. B. Dissanayake)**

එතුමා කියනවා, මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමයෙන් මහනුවර දිස්ත්‍රික්කයට සේවයක් සිදු වුණාය කියා. නමුත් එයින් මහනුවර දිස්ත්‍රික්කයට ශත පහක තරම්වත් සේවයක් සිදු වී නැහැ. ඇත්ත ඒ කාරණය කරුණාකර පිළිගන්න. එතුමාගේ මතය වැරදියි. [බාධා කිරීමක්] බැංකුවල නම් තිබෙනවා කොන්ත්‍රාත්කාරයන්ගේ සල්ලි.

**රූපසේන කරුණාතිලක මහතා**
**(திரு. ரூபசேன கருணாதிலக்க)**
**(Mr. Rupasena Karunatilleke)**

කොයි ක්‍රමයකින් හෝ එම දිස්ත්‍රික්කයේ ඉඩම් උපයෝගී කරගෙන හෝ අනික් දිස්ත්‍රික්කවල සංවර්ධනයක් සිදු වී තිබෙනවා. කොහොම වුණත්, ගාල්ල දිස්ත්‍රික්කයටත් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන සැලැස්මක් ලබා දීමට කටයුතු කරන ලෙස ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. විශේෂයෙන්ම ගාල්ල දිස්ත්‍රික්කය ගැන සලකා බැලුවොත්, හිනිදුම් පත්තුව, බෙන්තර, වලල්ලාවිට කෝරළේ වැනි ඈත ප්‍රදේශ අද පවතින්නේ ඉතාමත්ම නොදියුණු තත්ත්වයක බව පෙනෙනවා. ඒ තත්ත්වය පිළිබඳව ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෑම දිස්ත්‍රික්කයකම ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන සැලැස්ම බැගින් ලබා දීමට ගරු මුදල් ඇමතිතුමා උත්සාහ කරන බව පසුගිය අයවැය විවාදවලදී ප්‍රකාශ කළා. එම නිසා, නැවත වරක් එතුමාගේ අවධානය ඒ සඳහා යොමු කරවන්න කැමතියි.

මෙයට වඩා දීර්ඝ ලෙස කථා කරන්නට මා බලාපොරොත්තු වෙන්නේ නැහැ. ඇත්තවශයෙන්ම මෙවර අයවැය යෝජනා ගැන සිත යොමු කරන විට අපට විවේචනය කරන්නට තරම් දෙයක් තිබෙනවායයි මම නම් සිතන්නේ නැහැ. දැනට පවතින වාතාවරණය තුළ, ජනතාව කිසිසේත් අපේක්ෂා නොකළ අන්දමට, ජනතාවට විශාල සහනයක් සැලසෙන අන්දමේ අයවැය යෝජනා ඉදිරිපත් කිරීම ගැන අපේ ගරු මුදල් ඇමතිතුමාට මගේ ස්තුතිය නැවත වරක් පුද කරන්න කැමතියි.

මගේ කථාව අවසන් කරන්නට පෙර, දැනට සිදු වන නාස්තිය පුළුවන් තරම් දුරට නවතා ගන්නට යම්කිසි ක්‍රියා මාර්ගයක් ගත යුතු බව නැවතත් මතක් කරන්න කැමතියි. බොහෝ ප්‍රදේශවල දැනට කෙරෙන කටයුතු දිහා බැලුවාම, කුඩා පරිමාණයෙන් වෙන් කරන මුදල් හරියාකාර ප්‍රයෝජනයට නොගන්නා බව පෙනෙන්නට තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ දවස්වල මගේ ආසනයේ සෑම ගමකටම යනවා. මා නියෝජනය කරන මැතිවරණ කොට්ඨාශයේ ග්‍රාමෝදය මණ්ඩල 35 ක් තිබෙනවා. විශේෂයෙන්ම ලබන අවුරුද්දේ අපේ සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා මේ සෑම ග්‍රාමෝදය මණ්ඩලයකටම ගිහින් මම පැය දෙක තුනක් ඒ උදවිය සමඟ සාකච්ඡා කරනවා. අපේ ගම්වල යම් යම් කර්මාන්ත වෙනුවෙන් මුදල් වෙන් කරන විට අපේ ග්‍රාමෝදය මණ්ඩලවලට ඒවා පිළිබඳව නිරීක්ෂණය කරන්නට පුළුවන් විධියේ මීට වඩා යම්කිසි බලතල දෙනවා නම්, එසේ නිරීක්ෂණ පවත්වා ඒවා පිළිබඳව හොයා බලා ඒ අවශ්‍ය නිලධාරීන්ට යම් කිසි වාර්තා කිරීමක් කරන්නට පුළුවන් විධියේ වාතාවරණයක් ඇති කරනවා නම් මේ නාස්තිය බොහෝදුරට වළක්වා ගන්නට පුළුවන් වෙයි කියා මම කල්පනා කරනවා. ඒ නිසා මේ විධියේ නාස්ති තිබෙනවා නම් ඒවා වළක්වා ගන්නට අපි සෑම කෙනෙක්ම කල්පනා කළ යුතුව තිබෙනවා. ඒ පිළිබඳව තමුන්නාන්සේගේ අවධානය යොමු කර මේ සඳහා ග්‍රාමෝදය මණ්ඩල තවදුරටත් සහභාගි කරගන්නා හැටියට ඉල්ලා සිටිමින්, මා මුලින් සඳහන් කළා වගේ කම්පනයෙන් තොර මෙවැනි අයවැය වාර්තාවක් ඉදිරිපත් කිරීම පමණක් අපට ඇති වූ කම්පනය බව ප්‍රකාශ කරමින් තමුන්නාන්සේට ලබන අවුරුද්දේත් මේවාගේ හොඳ අයවැය වාර්තාවක් ඉදිරිපත් කරන්නට අවස්ථාව ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

අ. භා. 2. 50

**අමරසිරි දොඩන්ගොඩ මහතා (බද්දේගම)**
**(திரு. அமரசிறி தொடங்கொட — பத்தேகம)**
**(Mr. Amarasiri Dodangoda – Baddegama)**

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම අපේ ගාල්ල දිස්ත්‍රික්කයේ දිසා ඇමතිතුමාගේ අදහස් ප්‍රකාශ කිරීමෙන් පසු ගාල්ල දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක් හැටියට මට කථා කරන්නට මේ අවස්ථාව ලබා දීම ගැන තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා. ගරු මුදල් ඇමතිතුමා ඉදිරිපත් කර තිබෙන්නේ එතුමා මුදල් ඇමති ධූරය භාර ගත්තාට පසුව ඉදිරිපත් කරන නව වන අයවැය ලේඛනයයි. මුදල් ඇමතිවරයෙකුට මෙවැනි අවස්ථාවක් ලැබෙන්නේ ඉතාමත් කලාතුරකිනුයි. ඒ අවස්ථාව තවත් දීර්ඝ කර ගැනීමට හැකි වේවායි කියා මම එතුමාට ශුභ පතනවා. නමුත් මේ අයවැය ලේඛනය පිළිබඳව නම් මගේ එකඟතාවයක් නැහැ.

විශේෂයෙන්ම අයවැය ලේඛනය නමින් වාර්ෂිකව ඉදිරිපත් කරන මේ ලේඛනය, ඒ වර්ෂයේ ඇස්තමේන්තු, ආදායම් සහ වියදම් පිළිබඳව රජයක ප්‍රතිපත්ති සහ වැඩ පිළිවෙළ පිළිබඳව මුදල් සම්පාදන ක්‍රියා මාර්ගය හැටියට අපට පෙනෙනවා. මෙය වැඩිය ඉතිහාසයේ තිබුණු ක්‍රමයක් නොවෙයි. එහෙම නැත්නම් ස්වයං ආර්ථිකයක් පැවති යුගවල තිබුණ ක්‍රමයක් නොවෙයි. අමාත්‍යාංශ ඇතිව් ශුභසාධන ආණ්ඩු ඇති වුණාට පසුව ව්‍යවස්ථානුකූල අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු වෙන් වුණාට පසුවයි මුදල් ඇමතිවරයෙක් පත් වී ඒ ඒ දෙපාර්තමේන්තුවලට සහ අමාත්‍යාංශවලට ආදායම් සහ වියදම් පිළිබඳ ප්‍රතිපත්ති ඉදිරිපත් වුණේ. ඉතිහාසයේ මේ විධියේ ක්‍රමයක් තිබුණේ නැහැ. බොහොමයක් අවශ්‍යතා ජනතාව විසින්මයි, සපයා ගනු ලැබුවේ. රජය මෙහෙයවූවේ, රජය සකස් කළේ ආරක්ෂක සංවිධාන විතරයි. ශුභසාධන කටයුතු රජය මෙහෙයවූවේ නැහැ. රජයේ කාර්යය වුණේ ආරක්ෂාව සම්පාදනය කිරීම විතරයි. සෞඛ්‍ය පහසුකම්, අධ්‍යාපන පහසුකම්, සමාජ සේවා පහසුකම් සහ වෙන යම් ආකාරයේ පහසුකම් ඉතිහාසයේ තිබුණා නම් ඒවා කළේ ගම් මට්ටමින් ගම්වල තිබුණු සංවිධානයි. වෙදකම් ලබා ගත්තේ ගමේ වෙද මහත්මයාගේ ගෙදරිනුයි. සෞඛ්‍ය අමාත්‍යාංශයක් තිබුණේ නැහැ. අධ්‍යාපනය ලබා ගත්තේ ගමේ පන්සලෙන්, නැත්නම් ආචාර්යවරයකුගේ ගෙදරින්. සුභසාධන රාජ්‍ය ක්‍රමය ඇති වුණාට පස්සේ, ව්‍යවස්ථානුකූලව මහජනයා විසින් තෝරා ගනු ලැබූ ආණ්ඩු ඇතිවුනාට පස්සේ මුදල් ඇමතිවරයෙක් ඇති වෙලා, අමාත්‍යාංශ ඇති වෙලා, දෙපාර්තමේන්තු ඇති වුණා. අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු වලින් වාර්ෂිකව ආදායම් ලැබීමෙන්, වාර්ෂිකව ඒවාට වියදම් කිරීමෙන් වැඩ පිළිවෙළ මුදල් ඇමතිවරයාට භාර වුණා. අපේ රටෙත් මෑත කාලීනව යටත් විජිතයෙන් පස්සේ මේ සුභසාධන ආණ්ඩු ක්‍රමය -ව්‍යවස්ථානුකූලව ජනතාව විසින් තෝරා ගන්නා ආණ්ඩු ක්‍රමය - ඇති වුණාට පස්සේ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු ක්‍රමය බිහි වුණා. ඉතිහාසයේ මෙහෙම ක්‍රමයක් තිබුණේ නැහැ.

ගරු මුදල් ඇමතිතුමා 1977 තෝරා ගත් ආණ්ඩුවේ නව වැනි අයවැය ලේඛනය - ආදායම් සහ වියදම් පිළිබඳ ඉදිරි වර්ෂයේ ඇස්තමේන්තු - ඉදිරිපත් කළා. මේ ඉදිරිපත් කිරීම්වල ප්‍රතිපත්තිමය සහ සංඛ්‍යාත්මක ක්‍රියාමාර්ග පෙන්නුම් කරනවා. රජය දේශපාලන පක්ෂයක් හැටියට ජනතාවගෙන් බලය ඉල්ලා සිටීම සඳහා විශේෂයෙන් එදිනෙද සිදුවන ක්‍රියා මාර්ගවල තත්ත්වය ප්‍රතිපත්තිමය වශයෙනුත්, සංඛ්‍යාත්මක වශයෙනුත් මේ මගින් ඇස්තමේන්තු ගත කර තිබෙනවා. ඇත්ත වශයෙන්ම ලංකාවේ ආර්ථිකයෙන් සියයට 72.2ක ග්‍රාමීය ආර්ථිකයක් පවතිනවාය කියා ගරු මුදල් ඇමතිතුමා, එතුමාගේ අයවැය ලේඛනයෙන් පිළිගෙන තිබෙනවා. එය ඉතාමත් වැදගත් අදහසක්. එහි තේරුම සංඛ්‍යාත්මක සහ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවලට විෂයානුබද්ධ නොවන, නොබැඳෙන, විෂය නොවන, සියයට 72.2ක් වන ග්‍රාමීය ආර්ථිකයක් රටේ පවතිනවාය යන්නයි.

ඒ අනුව සියයට 27.8ක් තමයි, අයවැය ලේඛනයෙන් මේ සංඛ්‍යාවලට, ලිපිලේඛනවලට, භාණ්ඩාගාරයට, මුදල් අමාත්‍යාංශයට, සියළු ක්ෂේත්‍රයන්ට විෂයානු අනුබද්ධ වෙන්නේ. ඒ අනුව අප මේ ගරු සභාවේ කථා කරන්නේ අයවැය ලේඛනයෙන් සියයට 27.8ක ප්‍රශ්න පිළිබඳවයි කියන එකයි, මගේ විශ්වාසයයි. අනෙක් සියලු දේවල් අප දළ වශයෙන් තමයි, නිගමනය කරන්නේ. ඒ නිසා තමයි මේ සංඛ්‍යාවල පෙන්නුම් කරනු ලබන සමහර ගණන් හිලව් ජනතාවගේ එදිනෙද ජන ජීවිතයට බල නොපාන්නේ. බුලත් වවලා, බුලත් මිටි බැඳලා වෙළඳපොලට ගෙනත් බුලත් විකුණා ආදායම් ලබන අයගේ විස්තර මෙහි නැහැ. කොළඹ වරායෙන් පාකිස්තානයට හෝ මැද පෙරදිගට බුලත් යවනවා නම් පමණයි, මෙහි සටහන් වෙන්නේ. ගමේ ගහක් කපලා, කරත්තයක් හදලා, වරායෙන් රටට ගෙනෙන යකඩ සහ ඇණ ඒ කරත්තයට පාවිච්චි නොකළොත්, ගමේ එළදෙනක් පැටවෙක් වදලා හරකෙක් වුණාට පස්සේ කරත්තෙ බැන්දට ඒක මෙහි සටහන් වෙන්නේ නැහැ. ඒ නිසා මෙය ග්‍රාමීය ආර්ථිකයක් පවතින රටක සමස්තයක් වශයෙන් ජනතාවට බලපාන ලේඛනයක් නොවෙයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අමරසිරි දොඩන්ගොඩ මහතා]

මේ ලේඛනයට බලපාන්නේ වරායෙන් රටට පිවිසෙන, අමාත්‍යාංශවල ලේඛනගත වන, ලේඛනවල සඳහන් වන කරුණුවලට පමණයි. ඒ නිසාම තමයි ගරු මුදල් ඇමතිතුමා කිව්වේ මේ සංඛ්‍යාවන් සමහර විටෙක අපට විෂයය වෙන්නේ නැත කියා. සමස්තයක් වශයෙන් මුළු රටටම බලපාන දේවල්. උදහරණයක් හැටියට ජීවන වියදම් දර්ශකය අංකය ගත්තොත් ඒක තියැදියක්. එහෙම නැතිනම් කිප පොලකින් ගනු ලැබූ සංඛ්‍යා ලේඛනවල සැසඳීමක්. ඒක මුළු රටටම බලපාන්නේ නැහැ. ගොවි ජනතාවගේ වගාවන්, ඔවුන් නිපදවා වෙළඳ පොළට ගෙනෙන ද මෙම ලේඛනයේ සටහන් නොවන නිසා කිසිම කෙනෙකුට බලපාන්නේ නැහැ.

එම නිසා අයවැය ලේඛනයට ඇතුලත් වන්නේ වරායෙන් රටට ගෙනෙන හා වරායෙන් පිට කරන දේ, කොළඹ නගරයේ දෙපාර්තමේන්තුවල සටහන් වන නිෂ්පාදනයන් හා අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට විකුණන දේ පිළිබඳව වෙළඳ කටයුතු සඳහා ලිඛිතව සටහන් වන ඒවා පමණයි. පරිභෝජන ක්ෂේත්‍රයේත් එහෙමයි. කොයි විධියකින් හෝ සටහනකට ඇතුලත් නොවී ස්වයං ආර්ථිකය තුළ ගැමි ආර්ථිකය තුළ ගැමියන් නිපදවලා ගමෙන් වෙළඳපොළෙට විකුණලා පාවිච්චි කරන දේවල් මෙහි සටහන් වෙන්නේ නැහැ. මෙන්න මේ නිසා මෙවැනි අයවැය ලේඛනයක් සභාගත කරලා සභාවේ සාකච්ඡා කරන විට එක කාරණයක් කිව හැකියි. එනම්, විශේෂයෙන්ම ගරු මුදල් ඇමතිතුමා කියන විධියට සියයට 72.2 ක් වූ ග්‍රාමීය ආර්ථිකයක් තිබෙන අපේ රටේ අයවැය ලේඛනය පිළිබඳව මේ ගරු සභාවේ සාකච්ඡා කරන දේවල් අපේ රටේ වැඩි පිරිසකට බලපාන්නේ නැති බවයි. ඒ වාගේම ඉලක්කම් සහ මිථ්‍යා විශ්වාසයන් පිළිබඳව විශ්වාසයක් නැත කියා ආරම්භයේදීම ගරු මුදල් ඇමතිතුමා සඳහන් කලා. නමුත් එතුමා උද්ධමනය පිළිබඳව ජීවන වියදම් අංක පිළිබඳව ඇති ඒ ඉලක්කම් ගැන සමහර අවස්ථාවල ප්‍රීතියෙන් ප්‍රකාශ කරනවා. සාමාන්‍යයෙන් මේ වගේ ලේඛනයක් පිළියෙල කළ යුත්තේ ඉලක්කම්වලින් ; සංඛ්‍යාවලින්. එමනිසා අපි ඒ ගැන කලබල වන්නට ඕනෑ නැහැ. නමුත් ඉලක්කම් පිළිබඳව විශ්වාසය ගැන බලන විට ග්‍රාමීය ආර්ථිකයක් තිබෙන සංඛ්‍යාත්මක සහ ප්‍රතිපත්තිමය වශයෙන් හැසිරෙන්නේ නැති ස්වයං ආර්ථිකයක් තිබෙන ජනතාවගේ ආර්ථිකයක් තිබෙන රටක ඒ තරම්ම ඒ ගැන කලබල වන්නට දෙයකුත් නැහැ. මේ වගේ අයවැය ලේඛනයක් තුළින් බලාපොරොත්තුවන ක්‍රියා මාර්ග ගැන ඉලක්කම් වශයෙන් නොව ප්‍රතිපත්තිමය වශයෙන් සඳහන් වන කරුණු ගැන ගරු මුදල් ඇමතිතුමා එතුමාගේ සටහන්වලින්ම බොහෝ අවස්ථාවල සතුටට පත්වෙන බව විශේෂයෙන් මතක් කරන්නට කැමතියි. වෙලාවක එතුමා කියනවා, අයවැය තත්ත්වය හැත්තෑ හතේ සිට මේ විධියට ගෙනා එක හොඳයි, මේ විධියට තත්ත්වය පවතින එක අපට ඉතාමත් සන්තෝෂයට කරුණක් කියා. නමුත් තවත් අවස්ථාවකදී මේ පිළිබඳව එතුමා ශෝකයට පත් වෙනවා. එතුමා කියනවා මේ තත්ත්වය යටතේ ජාතික අර්බුදයක් ඇවිත්, තේ මිල බැහැලා, පොල් මිල බැහැලා අපට අමාරු වන්නට ඉඩ තිබෙනවාය කියා. ඊළඟට එක අවස්ථාවක එතුමා බියට පත් වෙනවා. මේ තත්ත්වයට ගියොත් ජාත්‍යන්තර ඇඟලුම් කර්මාන්තය මොන මට්ටමකට ඒවිද, තේ මිල තැවතත් ඉහළ මට්ටමකට ඒවිද, පොල් මිල තැවතත් ඉහළ මට්ටමකට ඒවිද, රබර් මිල ස්ථාවර වේවිද, මේ තත්ත්වය යටතේ අපිට විවිධාංගීකරණයක් කරන්නට පුළුවන් වේවිද කියලා එතුමා බියට පත් වෙනවා. එතුමා පෙන්නුම් කරනවා, 1984 දී අප ප්‍රගතියට තැබූ පියවරට 1985 දී භයානක තත්ත්වයක් ඇති වී තිබෙන බව. ජාතික ප්‍රශ්නය එකක්. ජාත්‍යන්තර තත්ත්වය තව එකක්. වෙළඳ නිර්යාත පිළිබඳ තත්ත්වය තවත් එකක්.මේවා පිළිබඳව එතුමා බියක් පල කරනවා. ඒකේ තේරුම තුන්වන ලෝකයේ රටක් හැටියට මේ ප්‍රශ්න පිළිබඳව එතුමා සඳහන් කරන අදහස මුදල්මය වශයෙන්, ආර්ථිකමය වශයෙන් හා ප්‍රතිපත්තිමය වශයෙන් මුදල් ඇමතිවරයෙක් හැටියට ක්‍රියාවේ යෙදවුවත් එතුමා වසර නවයක් මුදල් ප්‍රතිපත්තිය, ආර්ථික ප්‍රතිපත්තිය, නිර්යාත ආයාත ප්‍රතිපත්තිය හරියට මෙහෙයූවත් ජාත්‍යන්තර තත්ත්වය කෙරෙහි යම් සැලැස්මක් විශ්වාසයක් තිබුණත් ජාතික ප්‍රශ්නයේදී රජය යෙදවූ රාජ්‍යෝපායය අසාර්ථක වීම නිසා එතුමා කියනවා, 1979 දසලක්ෂ පන්සිය හැටක් ව තිබූ ජාතික ආරක්ෂක වියදම 1985 වර්ෂය තුළ දසලක්ෂ හය දහස් එකසිය අනූ හයක් වූ බව. රජයේම මූල්‍ය ආර්ථික ප්‍රතිපත්තියේ සාර්ථකත්වයක් පෙන්නුම් කරන එතුමා රාජ්‍යෝපාය පිළිබඳ ප්‍රතිපත්තියේ දුර්වලකමක් පෙන්නුම් කරනවා. ඒ නිසා රටේ අයවැය සැකසීමේදී මුදල් ඇමතිවරයා හැටියටත් එතුමා අමාරු තැනක ඉන්නවා කියන එක එතුමා ප්‍රකාශ කරනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
(Mr. Deputy Speaker)

Order, please ! The Deputy Chairman of Committees will now take the Chair.

***අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [එඩ්මන්ඩ් සමරවික්‍රම මහතා] මූලාසනාරූඪ විය.***

***அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுப் பிரதித் தலைவர் அவர்கள் [திரு. எட்மண் சமரவிக்ரம] தலைமை வகித்தார்கள்.***

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [MR. EDMUND SAMARAWICKREMA] *in the Chair.*

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු මුදල් ඇමතිතුමා එතුමාගේ නව වැනි අයවැය ලේඛනය ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර තිබෙන අදහස් පිළිබඳව මගේ අදහස් දක්වීමයි මම කලේ. මම විශේෂයෙන්ම සඳහන් කරන්න කැමතියි, අයවැය ලේඛනයක් ඉදිරිපත් කරන මුදල් ඇමතිවරයෙක් හැටියට එතුමා ස්ථාවර පැහැදිලි තැනක තවම පවතින්නේ නැතැයි කියන එකයි මගේ විශ්වාසය. 1977 දී මේ ආණ්ඩුව බලයට පත් වුණාට පසුව ප්‍රතිපත්තිමය වශයෙන් ප්‍රකාශ කළ ඒ ආර්ථික අදහස් ක්‍රියාත්මක කිරීමේදී රජයේ යම් ක්‍රියාමාර්ගවල අඩපනවීම් මත හෝ ජාත්‍යන්තර ක්ෂේත්‍රයේ භාණ්ඩවල වෙළඳ මිල තත්ත්වයන් වෙනස්වීම නිසා හෝ එතුමා අපහසු තත්ත්වයකට පත්වෙලා තිබෙන්න පුළුවන්.

මම විශේෂයෙන්ම මතක් කරන්න කැමතියි, 1984 නිර්යාත හා ආයාත පිළිබඳව එතුමා ප්‍රීතියට පත් වෙන බව. තේවල මිල බොහොම ඉහළ නැග්ගා. අපේ ප්‍රදේශවලටත් බොහොම වාසිදායක තත්ත්වයක් උද වුණා. ඇඟලුම් කර්මාන්තශාලාවල නිපැයුම් නිර්යාත කිරීමෙන් ආදයම ලැබුණා. නමුත් මම කියන්නෙ නැහැ විදේශ රැකියාවලින් ලැබුණු ආදයම අපට ප්‍රයෝජනවත් වුණාය කියා. විදේශ රැකියාවල නියුතු තිස් දහසක් පමණ පිරිස ඒ උපයන සල්ලි ගෙනැවිත් ඒ සල්ලිවලින් ජපානයේ, හොංකොංවල, අමෙරිකාවේ නැත්නම් වෙනත් රටක නිෂ්පාදනය කළ භාණ්ඩ මිළදී ගන්නවා. ඒ නිසා ඒ රටවලට විශාල මුදලක් යැවෙනවා. විදේශවලින් මුදල් උපයන අපේ පිරිස් ලංකාවේ වෙළඳ පොළට ඇවිත් විදේශීය භාණ්ඩ මිළදී ගත්තොත් ඒ සල්ලි ආපසු යනවා ජපානයට, එහෙම නැත්නම් හොංකොංවලට, නැත්නම් වෙනත් රටකට මේ රටේ ඉතිරි වන්නෙ සියයට 35ක පමණ මුදලක්. සියයට 65ක පමණ මුදලක් භාණ්ඩ මිළදී ගැනීම් නිසා නැවතත් විදේශ ගත වෙනවා. ඒවා අපේ රටේ ඉතිරි වෙන්නෙ නැහැ.

මම විශේෂයෙන්ම සඳහන් කරන්න කැමතියි, ඉන්ධන ක්ෂේත්‍රයේ ඉන්ධන නිෂ්පාදන අපට අඩු මිලකට ආයාත කරන්න පුළුවන් වුණු බව. ඒ වගේම සීනි අඩු මිලකට ගෙන එන්න පුළුවන් වුණා. එමෙන්ම 1984 දී තේවලිනුත් නිදහස් වෙළඳ කලාපයේ ඇඟලුම් කර්මාන්ත ශාලාවලින් ජාත්‍යන්තර වෙළඳ පොලට යැවෙන නිපැයුම්වලිනුත් අපට වාසියක් ලැබුණා. නමුත් ඒවායේ දීර්ඝ කාලීන පැවැත්මක් නැහැ.

"ආරක්ෂණ වාදය" කියල එකක් ගැන ගරු මුදල් ඇමතිතුමා සඳහන් කර තිබෙනවා. බොහෝ රටවල් තමන්ගේ රටට විදේශ නිෂ්පාදන පිවිසීමේ බිය නිසා ආරක්ෂණ වාදය කියා එකක් ඇති කරගෙන තිබෙනවා. තම රටේ නිෂ්පාදන තම රටේ කර්මාන්ත පිටරටවලින් පැමිණෙන වෙළඳභාණ්ඩවලින් ආරක්ෂා කර ගැනීම සඳහා ආරක්ෂණ වාදය ඇති කරගන්නවා. අද එක්සත් ජනපදය අපේ ඇඟලුම් කර්මාන්ත ශාලාවලින් මිළදී ගත් නිපැයුම් ප්‍රමාණය අඩු කරගෙන යන බවක් පේන්න තිබෙනවා. ඒ අඩුවීම ඇතිවී තිබෙන්නේ ඒ රටවල් ආරක්ෂණ වාදී ප්‍රතිපත්තිය අනුගමනය කිරීම නිසා විය හැකියි. ලෝකයේ රටවල් ආර්ථික ආරක්ෂණ වාදී ප්‍රතිපත්තිය අනුගමනය කරන්න ගියොත් මේ රටට විදේශීය සමාගම් ගෙන්වා ඔවුන් ලවා යම් යම් නිෂ්පාදනයන් කරවා ඒවා විදේශගත කිරීම, නිර්යාත කිරීම පිළිබඳව,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඉදිරියේදී අපට ලොකු තර්ජනයක් ඇතිවෙන්න පුළුවන්. ඒ කරුණු මුදල් ඇමතිතුමා එතුමාගේ ලේඛනවලත් සඳහන් කර තිබෙනවා. එතුමාගේ කථාවේ එක් තැනක මෙසේ සඳහන් කර තිබෙනවා :

"ආසියාවෙන් පිටත රටවල වුනත් මේ අවුරුද්දේ ආර්ථික වෘද්ධිය ඉතාමත් අසමාන බවක් පෙනෙන්නට තිබෙනවා. අප්‍රිකාවේ සහ ලතින් අමෙරිකාවේ ඇතැම් රටවල සෘණ වෘද්ධියක් බලාපොරොත්තු වෙනවා."

අපේ රටේ ආර්ථික වෘද්ධිය පිළිබඳව කරුණු දක්වන එතුමා අපේ රටේ ආර්ථික වෘද්ධිය හොඳ වීමට කරුණු කීපයක් හේතු වුණාය කියා මෙහි පෙන්වා දී තිබෙනවා. ආර්ථික වෘද්ධිය පිළිබඳව එතුමා ජාත්‍යන්තර නිදර්ශන කීපයක් රටවල් කීපයකින් අරගෙන තිබෙනවා. ඒ රටවල් නම් සිංගප්පූරුව, පිලිපීනය, ඉන්දුනීසියාව, තායිලන්තය, දකුණු කොරියාව, මැලේසියාව, ජපානය, ඉන්දියාව, හොංකොං සහ මහජන චීන ජනරජයයි. මෙයින් ඉන්දියාවත් මහජන චීන ජනරජයත් හැර අනික් සියලුම රටවල් අද ලංකාව අනුගමනය කරන්න ලැහැස්ති වන වැඩ පිළිවෙළ අනුගමනය කරන රටවල්. එතුමා සඳහන් කරනවා, ඉන්දියාව, හොංකොං සහ මහජන චීන ජනරජය යන රවටල් තුනේ ආර්ථික වෘද්ධිය සියයට 5.2ට වැඩියෙන් පෙන්නුම් කර තිබෙනවාය, අනික් රටවල හොඳ තත්ත්වයක් පෙන්නුම් කර නැහැ කියා.

පසුගිය දිනක ගරු මුදල් ඇමතිතුමා ප්‍රකාශ කළා සිංගප්පූරුව වැටී සිටින තත්ත්වය ගැන. ඇත්ත වශයෙන්ම සිංගප්පූරුවේ ආර්ථික වෘද්ධිය සියයට සෘණ 0.8යි. ඒ වාගේම පිලිපීනයත්, පෙන්වා තිබෙන්නෙ සෘණ වෘද්ධියක්. ඉන්දුනීසියාව, තායිලන්තය, දකුණු කොරියාව, මැලේසියාව, ජපානය යන රටවලත් ආර්ථික වෘද්ධිය සියයට 5ට වඩා අඩුයි. මේ ඉන්දියාවත් මහජන චීන ජනරජයත් කියන රටවල් දෙක අපේ ආර්ථික පිළිවෙතේ අප වාගේ දැඩිව රැඳිච්ච රටවල් දෙකක් නොවෙයි. අනික් රටවල් සියල්ලම අප පසුගිය කාලයේ අනුගමනය කරන්න උත්සාහ කළ රටවල්. අද ඒ රටවල් වැටී තිබෙන තත්ත්වය එතුමා තෝරාගෙන තිබෙන ඒ නිදර්ශනවලින්ම පේනවා.

ඇත්ත වශයෙන්ම මම පිලිපීනය ගැන විශේෂයෙන් විස්තර කරන්න යන්නෙ නැහැ. හෙට අනිද්දම එහි ලොකු දේශපාලන වෙනසක් ඇති වේවි. මට පුදුම මෙතන පකිස්තානය සඳහන් නොවීම ගැනයි. එහෙත් අප අනුගමනය කරන්න ලැහැස්ති වන රටවල අලුත් අර්ථික වැඩපිළිවෙළ යටතේ සැහෙන දුරට ලොකු වෙනස්කම් සිද්ධ වේවි.

1985 වර්ෂයේ තේ, පොල්, රබර්, රට රැකියා, මැසූ ඇඳුම් පිළිබඳ ආදයම සම්බන්ධයෙන් ගරු මුදල් ඇමතිතුමා බියක් දක්වනවා. 1984 මේ තත්ත්වය හොඳට තිබුණා. 1985 භීතියක් දක්වනවා. දැනටම පෙනෙන විධියට 1985ත් අඳුරු වර්ෂයක්. මම මීට තවත් හේතුවක් ඉදිරිපත් කරනවා. උද්ධමනය පිළිබඳව මුදල් ඇමතිතුමා බිංදුවක සංඛ්‍යාවක් සඳහන් කර තිබුණා. උද්ධමනය පිළිබඳ ප්‍රශ්නයක් ඇති නොවන විධියට අයවැය පරතරය පියවීම සඳහා දේශීය රුපියල් ණය, කෝටි එක්දස් දෙසිය ගණනක් ලබා ගන්න එතුමා බලාපොරොත්තු වෙනවා. නමුත් දේශීය රුපියල්වලින් ණය ගන්නා විට උද්ධමනය ඉබේම වැඩි වෙනවා. ඒ නිසා උද්ධමනය සම්බන්ධයෙන් අද තිබෙන තත්ත්වය ඉදිරි වර්ෂයේදී අනිවාර්යයෙන්ම අවාසිදායක ලෙස වෙනස් වෙනවා. එබැවින් උද්ධමනය සම්බන්ධයෙන් සැනසීමට කිසිම කරුණක් මේ අයවැය ලේඛනයෙන් ඉදිරිපත් කර නැති බව පෙන්වා දෙන්න කැමතියි.

එතුමාම කියන විධියට මොකක්ද, වෙන්නේ ? එක්කෝ සංවර්ධන වැඩ කපා හරින්න ඕනෑ. එහෙම නැත්නම් රැකියා දෙන්න බැහැ. එහෙමත් නැත්නම් දළ දේශීය නිෂ්පාදනය පහත වැටන්න ඉඩ හරින්න ඕනෑ. එහෙමත් නැත්නම් ආරක්ෂක කටයුතු අඩාල වන්න ඉඩ හරින්න ඕනෑ. එහෙම නම් අපි දැන් ඉන්නේ දේශපාලන වශයෙනුත්, ආර්ථික වශයෙනුත් තීරණාත්මක අවස්ථාවකි. එබැවින් මෙය නිසංසල පැවතුමක තිබෙන පැහැදිලි අයවැය ලේඛනයක් නොවෙයි. 1985, නොවැම්බර් 13 වනද ඒ වාර්තාවේ 7 වන තීරුවේ එතුමාගේ කථාවේ සඳහන් කර තිබෙනවා, නිවැරදි මුදල් කළමනාකරණය පිළිබඳව. නිවැරදි මුදල් කළමනාකරණය ගැන එතුමා සතුටු වෙනවා. නමුත් මම සඳහන් කරන්න කැමැතියි, මූල්‍ය සහ ආර්ථික ප්‍රතිපත්තිවල බැඳියාවකින් තොරව මුදල් කළමනාකරණය කළොත්, —රාජ්‍ය ප්‍රතිපත්තියත් ඒකට බැඳුණේ නැත්නම් — භයානක තත්ත්වය ඇති වන බව. අද ඒ බව මුදල් අමැතිතුමාගේ ප්‍රකාශවලින් පෙන්නුම් කර තිබෙනවා. නිවැරදි රාජ්‍ය මූල්‍ය කළමනාකරණය අසාර්ථක වීම නිසා අද ගොඩනැගී ඇති තත්ත්වයට වගකිය යුත්තේ මූල්‍ය සහ ආර්ථික කළමනාකරණයේදී ඊට රාජ්‍ය පරිපාලන ප්‍රතිපත්තිවල සබැඳියාවක් නොතිබීම වෙන්න පුළුවනි. එතුමා මුදල් ඇමතිවරයා වුණත් කැබිනට් මණ්ඩලයේ සාමාජිකයෙක්, ආරක්ෂක අමාත්‍යවරයාත් වාඩි වන සභාවේ සාමාජිකයෙක් ; රටේ රාජ්‍ය ප්‍රතිපත්තිය හසුරුවන ආයතනයේ සාමාජිකයෙක්. එවැනි සාමාජිකයකු හැටියට එතුමාගේ වගකීමක් තිබෙනවා, රටේ මූල්‍ය සහ ආර්ථික පිළිවෙත රාජ්‍ය ප්‍රතිපත්තියේ තිබෙන ප්‍රශ්නත් සමඟ බැඳී පවතින බවත් තේරුම් ගන්න. නමුත් මේ අවස්ථාවේදී මම ඒ ගැන වැඩිදුර විස්තර කරන්න යන්නේ නැහැ. නමුත් කළමාකරණය නිවැරදිව හැසිරවිය යුත්තේ රටේ ආර්ථික සහ මූල්‍ය අවශ්‍යතාවත් පිළිබඳව අවබෝධයක් ඇතිවයි.

ඒ වාගේම මුදල් ඇමතිතුමා සිය අයවැය කථාවේදී සඳහන් කර තිබෙනවා, විදේශීය ණය පිළිබඳවත්. 1977 මේ ආණ්ඩුව බලයට ආවාට පස්සේ ණය ලබා ගැනීමෙහිලා විශාල බලාපොරොත්තුවක් තැබුවේ, විදේශීය ආධාර කෙරෙහියි. එතුමා 5 වැනි පිටුවේ මෙසේ කියා තිබෙනවා :

"1980 - 81 දී වගේ අයවැය හිඟය පියවීමට පිටරටවලින් වාණිජ ණය ලබා ගැනීමට දැන් ලෙහෙසි නැහැ. පිටරටවලින් වාණිජ ණය ලබා ගැනීම තවදුරටත් ඥානාන්විත නොවන තරම් මට්ටමක. අපේ ණය ආපසු ගෙවීමේ තත්ත්වයද උත්සන්න වී තිබෙනවා."

දැන් හිර වෙලා ! කල් තබා තේරුම් ගත යුතුව තිබුණු දෙයක් දැනුයි, තේරුම් අරගෙන තිබෙන්නේ.

" ...ඒ විතරක් නොවෙයි; තුන්වන ලෝකයේ ණය පිළිබඳව දැන් පැනනැඟී ඇති තත්ත්වයත් අපේ රටේ දැන් ඇති අවිනිශ්චිතතාවත් වාණිජ ණය ලබා ගැනීමේදී වැදගත් වෙනවා. වර්තමාන තත්ත්වය අනුව කලින් වාගේ වාසිදායක කොන්දේසි යටතේ වාණිජ වෙළෙඳ පළෙන් ණය ලබා ගැනීමට නොහැකි තත්ත්වයකට දැන් ශ්‍රී ලංකාව මුහුණ පා තිබෙනවා.

මගේ කථාවේ ආරම්භයේදීම මා මේ කරුණු ගැන සඳහන් කළේ විශේෂ හේතුවක් නිසා. මෑත කාලයේ මේ රටේ පැවති තත්ත්වය තවදුරටත් පැවතුණහොත් අපට මුහුණ පාන්න සිදු වන්නේ ඉතා දරුණු තත්ත්වයකටයි."

මුදල් ඇමතිතුමා අයවැය ලේඛනයෙන් කරන ප්‍රකාශ අනුව එතුමා එක් අවස්ථාවක දර්ශක අංකය පිළිබඳව සතුටු වෙනවා. තවත් අවස්ථාවක එතුමා උද්ධමනය අඩු කළාය කියා උදන් අනනවා. තවත් අවස්ථාවක එතුමා අනාගතය පිළිබඳව භීතිය පළ කරනවා. ඉදිරියේදී විදේශ ණයවලින් ආර්ථික සහනයත් සලසා ගැනීමත් අයවැය හිඟය පියවීමත් ගැන මුදල් ඇමතිතුමා තවදුරටත් විශ්වාසය තබා නැති බව විදේශ ණය පිළිබඳව මුදල් ඇමතිතුමා මේ අයවැය ලේඛනයෙන් දක්වන කරුණුවලින් පෙනෙනවා. උද්ධමනය පිළිබඳව එතුමා දැරූ අදහස් මම නැවතත් සඳහන් කරන්න කැමතියි. අයවැය හිඟය පියවීමට දේශීය මූල්‍ය ණය, රුපියල් ණය ලබා ගැනීමට කරන ලද කැඳවීම අනුව — බැංකු සහ දේශීය සුරැකුම් පත් — අද පත්තරයේත් ඒවා විකිණීමට ලැස්ති කර තිබෙන බව කියන දැන්වීමක් මම දැක්කා — උද්ධමනය අඩු වේය කියන එක අපට විශ්වාස කරන්න බැහැ. එම නිසා 1985 - 86 වර්ෂයේ ඇස්තමේන්තුගත කරුණු අනුව එම වර්ෂය අප රටට හොඳ ආර්ථික මට්ටමක් ගොඩනැගෙන වර්ෂයක් නොවෙයි.

ඒවාගේම ජාතික ප්‍රශ්නයක් මත අප අමාරුවට පත් වී තිබෙන බව මුදල් ඇමතිතුමා තම අයවැය ලේඛනයේ කියා තිබෙන බවත් මම සඳහන් කරන්න කැමතියි. තේ මිල පහත වැටීම මත, නිර්යාත මිල පහත වැටීම් මත, ජාත්‍යන්තරව අපේ නිෂ්පාදනවල මිල පහත වැටීම මත අප අමාරුවට පත් වී සිටිනවායයි කියමින් මුදල් ඇමතිතුමා 1985 වර්ෂය ගැන කනගාටු වෙනවා. ඒවාගේම අප අපගේ නිර්යාත ප්‍රතිපත්තියේ නිෂ්පාදන පිළිවෙත වෙනස් කළොත් පාරම්පරික නිර්යාතවලින් ඈත් වුණොත් මේ තත්ත්වය වෙනස් කරගන්න පුළුවන්යයිද එතුමා සඳහන් කරනවා. කෘෂිකර්ම හා කර්මාන්ත ක්ෂේත්‍රයේ ඒ දෙවර්ගයේම පාරම්පරික නිර්යාතවලින් අප ඈත් වුණොත් මෙය කරගන්න පුළුවන්යයි එතුමා කියනවා. නමුත් ඒවායේ සංවර්ධනයක් ඒවා පිළිබඳ යොමු වීමක් — ඇතැම් අංශවල සංවර්ධනයක් — මුදල් ඇමතිතුමා තම සංඛ්‍යා ලේඛනවලින් පෙන්නුම් කරනවා. නමුත් පාරම්පරික නිර්යාත ප්‍රතිපත්තියෙන් ඈත් වීම ක්‍රියාමාර්ගයක් වශයෙන් තවම සාර්ථක වී නැහැ. ඒ අනුව ගරු මුදල් ඇමතිතුමා මේ අයවැය ලේඛනයෙන් එක අවස්ථාවක් හැටියට යථාර්ථය ඉදිරිපත් කරනවා.

"1984 දී අපි හොඳට හිටියා, අපේ තේ මිල හොඳට තිබුණා. ඇඟළුම් නිෂ්පාදන හොඳට වික්කා, විදේශීය රැකියාවලින් ආදයම් ලැබුණා, තෙල් මිල අඩු නිසා අපි අඩු මිලට තෙල් ගෙනාවා, සීනි මිල අඩු නිසා අපි අඩු මිලට සීනි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අමරසිරි දොඩන්ගොඩ මහතා]

ගෙනාවා. නමුත් දැන් ඒවා වෙනස් වෙලා. ඒ නිසා අපට අමාරු තත්ත්වයක් ඇති වෙනවා. ඒ නිසා අපි කර්මාන්ත හා අනෙක් ක්ෂේත්‍රවල පාරම්පරික නිර්යාතවලින් විවිධාංගකරණයට පිවිසිය යුතුයි" කියා එතුමා කියනවා. එතුමාගේ අවංකභාවය පිළිබඳව අපි එතුමාට ස්තුතිවන්ත වෙනවා. නමුත් අයවැය ලේඛනයක් හැටියට රටේ රජයේ ප්‍රතිපත්ති පිළිබිඹු කැරෙන ලේඛනයක් හැටියට මෙය අසාර්ථකයි. අවුරුදු නමයක් සිටි රජයක ක්‍රියාමාර්ගය ආර්ථිකමය වශයෙන් සංඛ්‍යාත්මක වුණත් ප්‍රතිපත්තිමය වුණත් කැබිනට් මණ්ඩලය සාමූහිකව ගනු ලැබූ තීරණ තුළින් මුදල් ඇමතිවරයා ඉදිරිපත් කරන ලේඛනය අසාර්ථකයි.

මේ ගරු සභාවට මම තවත් කරුණු කීපයක් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම අයවැය කතාවේ නමවැනි පිටුවේ එතුමා රටවල් කීපයක් සැසඳීමට ලක් කරනවා. මම මෙය මීට ඉහතදීත් සඳහන් කළා. මේ රටවල් ආර්ථික වශයෙන් දිගු කාලීන පිළිගැනීමක් තැබිය යුතු රටවල් නොවෙයි. අද මුදල් ඇමතිතුමා සිංගප්පූරුව කපා හැර තිබෙනවා. පිලිපීනය ආර්ථික හෝ දේශපාලන ස්ථාවරභාවයක් ඇති රටක් නොවෙයි. ඉන්දුනීසියාව, තායිලන්තය, දකුණු කොරියාව, මැලේසියාව, ජපානය ආදී රටවල් කීපයක් විදේශීය ආයෝජන හරයෙන් . . . . . .

**ආර්. ජේ. ජී. ද මෙල් මහතා**
**(திரு. ஆர். ஜே. ஜீ. த மெல்)**
**(Mr. R. J. G. de Mel)**

මම පැහැදිලි කිරීමක් කරන්න කැමතියි. ඒ රටවල් මා ගත්තේ ආසියාකරයේ රටවල් හැටියට පමණයි. එසේ නොමැතිව වෙනත් ප්‍රශ්නයක් නිසා නොවෙයි. ඒ අයගේ ස්ථාවරත්වය ගැනවත්, වෙනත් මොකක්වත් නිසාවත් නොවෙයි, ආසියාවේ රටවල් හැටියට පමණයි මා ඒ රටවල් ගත්තේ. පාකිස්ථානයේ මේ අවුරුද්දේ බලාපොරොත්තුවන වෘද්ධිය පිළිබඳ සංඛ්‍යාලේඛන මට ලැබුණේ නැහැ. එහෙත් පාකිස්ථානයේ මේ අවුරුද්දේ වෘද්ධිය ඉන්දියාවටත් වඩා හොඳයි. එහි සියයට දශම හයකටත්, හතකටත් අතර වෘද්ධියක් තිබෙනවා.

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**

ඒ පැහැදිලි කිරීම ගැන ගරු මුදල් අමැතිතුමාට මා ස්තුතිවන්ත වෙනවා. එතුමා කියත්තේ මේ රටවල් ආසියාකරයේ රටවල් බවයි. විශේෂයෙන්ම ආසියාකරයෙනුයි අපි උදාහරණ ගත යුත්තේ. මොකද, මෑත අවධියක ආසියාකරයේ රටවල් ගැන තමයි බටහිර රටවලුත් උනන්දුවෙන්නේ. ඒ රටවලිනුත් ඇවිත් මේ රටවල්වල සෑහෙන ආයෝජන කරනවා ; සාමූහික ආයෝජන කරනවා. ජපානය තමයි මෙයට මූලික වෙන්නේ. ජපානයේ මූලිකත්වයෙන් ඇමරිකාව සහ බටහිර ජර්මනිය ත්‍රෛයි පාක්ෂික සංවිධාන මඟින් මේ රටවල ආර්ථිකය කෙරෙහි සෑහෙන බලපෑමක් කර තිබෙනවා. මේ රටවල බලපෑම අපේ රටටත් තිබෙනවා. ඇත්ත වශයෙන්ම මේ විවාදයට සහභාගිවෙමින් මා සඳහන් කරන්නේ ඒ රටවල සංඛ්‍යා ලේඛන අපේ රටේ සංඛ්‍යා ලේඛනවලට බොහෝ දුරට සමාන බවයි. මේ රටවලුත් ග්‍රාමීය සහ ආර්ථිකය පිළිබඳ සමානතාවයක් තිබෙන රටවල්. අනික් පැත්තෙන් බලනවිට මේ රටවල් බොහොමයක්ම, ආදායමේ සහ රටේ තිබෙන සංවර්ධනය පිළිබඳ වෘද්ධියේ බෙදීයාමේ සමානතාවයක් නැති රටවල්.

අපේ මහා භාණ්ඩාගාරයට ආදායම පිළිබඳ, කර්මාන්ත පිළිබඳ, පරිභෝජනය පිළිබඳ සංඛ්‍යා ලේඛන ලැබෙනවා. ඒ ලේඛන අනුව බලනවිට, රටේ පරිභෝජනය වැඩිවෙලා තිබෙනවා. නිෂ්පාදනය වැඩිවෙලා තිබෙනවා. මූල්‍ය ආදායම වැඩිවෙලා තිබෙනවා. නමුත් මේවා බෙදීයාම පිළිබඳව සළකා බලනවිට, ගම් මට්ටමින් පැතිරීයාම බොහොම අඩුයි. මම උදාහරණයක් කියන්නම්. රුපියල් කෝටි 40ක් අධ්‍යාපනය සඳහා වැය කරනවා නම්, ඉන් කෝටි 30ක් වැය කරන්නේ සියයට පහළොවක් පමණ ළමයින් වෙනුවෙන්. අනික් සියයට අසූපහක් පමණ වන ළමයින් වෙනුවෙන් වෙන් කරන්නේ කෝටි දහයක් පමණයි. කොළඹ නගරයේ පාසල්වල පිහිණුම් තටාක හදන්න පුළුවන්, ක්‍රීඩාගාර හදන්නත පුළුවන්, ඒ දිස්ත්‍රික්කවල පාසල් කීහිපයකට කෝටි දෙකක් වියදම් කරන්න පුළුවන්. නමුත් මුළු මොනරාගල දිස්ත්‍රික්කයටම සමහරවිට වැය කරන්නේ රුපියල් කෝටි 2ක් පමණයි. මේ අනුව බලනවිට, රටේ රජය විසින් සුභසාධනය සඳහා වෙන් කරනු ලබන මුදල්, ගම්වල ජීවත්වන දෙමව්පියන්ගේ දරුවන්ටත් ලැබෙන හැටියට මුළු රටම සමානව බෙද හරිනවාද කියන ප්‍රශ්නය මතු වෙනවා. පිලිපීනයෙන්, තායිලන්තයෙන්, ඉන්දුනීසියාවෙන්, මැලේසියාවෙන් මුඩුක්කුවල ජීවත්වන මිනිසුන්ටත් මේ තත්ත්වය ලැබෙන්නේ නැත කියන එකයි අපට පෙනෙන්නේ. ආර්ථික වෘද්ධිය පිළිබඳව ගෙවුම් ශේෂ තුලනය පිළිබඳව, මූල්‍ය තත්ත්වය පිළිබඳව, අනුපාතිකයන් පිළිබඳව, දර්ශක අංක පිළිබඳව ගොඩනැගෙන සියළුම ප්‍රගතීන් ගම් මට්ටමෙන් සකලවිධ සියළුම ජනකොටස්වලට සමානව නොලැබෙනවාය කියන එකයි අපට පෙනේනේ. ඒ නිසා තමයි, මිනිසුන් කියන්නේ, " අයවැය ලේඛනය කොළඹ හදනවා, පාර්ලිමේන්තුවේදී කථා කරල සම්මත කරනවා. නමුත් අපට පෙනෙන්නේ බඩු මිල ඉහළ යාම පමණයි " කියල. නමුන්නාන්සේ සමහරවිට දන්නේ නැතිව ඇති බීට්ට් – ව්‍යාපාර පිරිවැටුම් බද්ද වැඩි නොකළ බඩුවලත් මිල වැඩි කරල හමාර බව. දැනට ගැසට් එකක් ගම්වලට ගිහින් නැහැ. – [බාධාකිරීමක්] විශේෂයෙන් සඳහන් කරන්න කැමතියි, මේ උදාහරණයට ගත් රටවල ආර්ථික වෘද්ධිය පිළිබඳ සංඛ්‍යාලේඛනවල සියයට ගණන් අපේ රටේ යථාර්ථයට පැහෙන්නේ නැති බව. සාමාන්‍ය මිනිසුන්ගේ ජීවිතයට මෙය කිට්ටුවෙන්නේ නැහැ. මෙය සංඛ්‍යාලේඛනවලටත්, එක පැළැත්තියකටත් කිට්ටුවෙන දෙයක් පමණයි. විශේෂයෙන්ම, වැඩිවෙන ආදායම, සපයනු ලබන සුභසාධන පහසුකම් බෙදීයාම සාධාරණව සිදුවන්නේ නැහැ.

අධ්‍යාපනය ගැන වෙන්න පුළුවන්, සෞඛ්‍යය ගැන වෙන්න පුළුවන්, දිස්ත්‍රික්ක මට්ටමෙන් වෙන්න පුළුවන්, අසමානතාවයක් තිබෙනවා. ඇත්තවශයෙන්ම මේ රටවල සිදුවෙන මූලික දේ මේකයි : ප්‍රාග් ධන මූලධන අයිතීන් තිබෙන, සම්පත් අයිතිකාර පිරිස්වලට මේ වාසිය ලැබෙනවා. නමුත් ශ්‍රමය අයිති පිරිස්වලට මේ වාසිය ලැබෙන්නෙ නැහැ. රජයේ ආර්ථික පිළිවෙතේ තිබෙන මේ වෘද්ධීන් පිළබඳව, සියලුම වැඩිවීම්, ප්‍රගතීන් පිළිබඳව තිබෙන සියලුම වාසිය දේපොළ හිමියන්ට හා සාධක අයිතිකාරයින්ට ලැබෙනවා. ශ්‍රමය හා තමන්ගේ ඩහදිය පමණක් තිබෙන මිනිසුන්ට ඒක ලැබෙන්නෙ නැහැ. ඒක ලංකාවෙත් අද පෙනෙන්නට තිබෙන දෙයක්. ඒ නිසා තමයි රජයේ ප්‍රතිපත්තිවලින් සල්ලිකාරයින්ට, ලොකු සල්ලිකාරයින් වෙන්නට පුළුවන් වී තිබෙන්නේ. ලොකු සල්ලිකාරයින්ට ජාත්‍යන්තර සල්ලිකාරයින් වෙන්න පුළුවන් වී තිබෙන්නේ. නමුත් සල්ලි නැති, ඉඩම් නැති, යන්ත්‍ර නැති, දේපොළ නැති මිනිස්සු ඒ තැනම ඉන්නවා. ඒ මිනිසුන්ට අර වැඩිවෙන බඩු බලපානවා. ඒ මිනිසුන්ගේ වේතනයට වැඩිපුර දෙසිය ගණනක් ගෙවුවත් බඩු මිල තුන්සිය ගණනකින් වැඩිවෙන කොට ඒ මිනිස්සු අමාරුවට පත්වෙනවා. එමනිසා පිලිපීනය, සිංගප්පූරුව, ඉන්දුනීසියාව ආදී රටවල ආර්ථික පිළිවෙත අපට සමාන කිරීම පිළිබඳව නම් අපට කිසිසේත්ම සෑහෙන්නට පුළුවන්කමක් නැහැ. ආර්ථික වෘද්ධිය පිළිබඳව මේ දක්වන සංඛ්‍යා ලේඛන යථාර්ථයට පටහැනියි කියන එකයි අපේ විශ්වාසය.

විශේෂයෙන්ම 1977 සිට මේ දක්වා වැඩි කරනු ලැබූ වැටුප් අනුව ශ්‍රමයට ගෙවීමක් තිබුණේ නැහැ. සාධක සම්පත් අහිමි පිරිස්වලට ඒ අනුව වාසිදායක තත්ත්වයක් උදාවුණේ නැත කියා අපි කියනවා. ඇයි වතු කම්කරුවන්ට වැටුප් වැඩි නොකළේ ? දෙසීයක් වැඩි කළා. සියයක් වැඩි කළා. නමුත් බඩු මිල පිළිබඳව සිදුවූ දේ මොකක්ද ? මේ අයවැය පිළිබඳවත් මම නමුන්නාන්සේලාට මතක් කරන්නට කැමතියි. මේ අයවැය ලේඛනයෙන් සාමාන්‍ය පංතියට කර තිබෙන හිරිහැර කොතෙක්ද ? මෙන්න මේක ටිකක් කල්පනා කර බලන්න ඕනෑ දෙයක්. නමුන්නාන්සේ අපට දුන් ලේඛනයේ 122 වැනි පිටුවේ සඳහන් පරිදි නමුන්නාන්සේ අපට මෙහෙම කියනවා : " දුම්කොළ බද්ද නිසා අපට ලැබෙන වැඩි ආදායම දස ලක්ෂ 290යි. බීඩි ඔතන කොළ නිසා අපට ලැබෙන වැඩි ආදායම දස ලක්ෂ 80යි. මත්පැන් නිසා අපට ලැබෙන වැඩි ආදායම දස ලක්ෂ 180යි. පිරිවැටුම් බද්ද නිසා අපට ලැබෙන වැඩි ආදායම දස ලක්ෂ 255යි. දුම්රිය ගාස්තු වැඩි කිරීම නිසා අපට ලැබෙන වැඩි ආදායම දස ලක්ෂ 100යි. තැපැල් ගාස්තු වැඩි කිරීමෙන් අපට ලැබෙන වැඩි ආදායම දස ලක්ෂ 115යි. ඒ අනුව දස ලක්ෂ 1020ක් වාසි ලබනවා. මේ කියනු ලැබූ දේවලින් සියයට 90ක් පාවිච්චි කරන්නේ සාමාන්‍ය මිනිස්සුය " කියනවා. ඊළඟට ලොකු මිනිසුන්ට දුන් සහනයන් ගැන 123 වැනි පිටුවේ තිබෙනවා.

පෞද්ගලික ආදායම් බදු අඩු කිරීමෙන් පාඩුවක් සිද්ධවෙනවා දස ලක්ෂ 150ක. ප්‍රාග්ධන බදු අහෝසි කිරීමෙන් පාඩුවක් සිදුවෙනවා දස ලක්ෂ 15ක. ආදායම් ධන බදු සීමාවෙන් පාඩුවක් සිදුවෙනවා දස ලක්ෂ 5ක. මුදල් බදු, තෑගි බදු පිළිබඳවත් සංශෝධනයක් කර තිබෙනවා. ඒ ක්ෂේත්‍රයෙන් උදව් කරන්නේ සල්ලි තිබෙන පංතියටයි. බීඩි බොන්නෙ නැහැ දුප්පත් මිනිස්සු. [බාධා කිරීමක්] මම නම් හිතන්නෙ නැහැ දුම්රියේ යනවා කියා ලොකු මිනිස්සු. ඉඳහිට දෙන්නෙක් තුන්දෙනෙක් යාවි. බොහොම හදිසියේ. ඒකටත් අර සැලූන් එක ඕනෑ. ලියුම් තැපැල් කරන්නෙත් නැහැ ලොකු මිනිස්සු. ටෙලිෆෝන් කරන්නෙ. එහෙත් මන්ත්‍රීවරුන්ට වැඩිවෙලා නැහැ ඒ බද්ද.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දස ලක්ෂ 1,020න් සියයට 80ක් ලබාගත්තේ සාමාන්‍ය මිනිසුන්ට රිද්දවලා. සුළු මිනිසුන්ට බදුවලින් රිද්දලා ලොකු මිනිසුන්ට ආදයම් බදුවලින් සහන දෙනවා. තමුන්නාන්සේ දන්නේ නැහැ. සතයයි වැඩි කරලා තිබෙන්නේ. තමුන් සතේ, දෙකේ කාසි දූන් නැහැ. ඒ නිසා සියළුම බඩුවලට සත පහක් වැඩි වෙනවා. සත පහ තමයි, දූන් තිබෙන අඩුම ගණන. ඒ නිසා මේවා සතෙත්, දෙකෙත් වැඩි වෙන්නේ නැහැ. මේ තත්ත්වය අනුව මේ අයවැය ලේඛනයෙන් සාමාන්‍ය මිනිසුන්ට තමයි, වැඩියෙන් රිද්දවලා තිබෙන්නේ. [බාධා කිරීම්] ගිහින් හිටපු හැටි අහගන්න. මම හිටපු කොටසෙම තමයි හිටියෙ. [බාධා කිරීම්] ඡන්දෙ වෙන එකක්. මේ වෙන එකක්.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
**(குழுப் பிரதித் தலைவர் அவர்கள்)**
(The Deputy Chairman of Committees)

ඡන්දය ගැන කතා කරන්න වුවමනාවක් නැහැ. අයවැය ලේඛනය ගැන කතා කරන්න. ඡන්දෙට තව කල් තිබෙනවා.

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මුදල් ඇමතිතුමා මේ අයවැය ලේඛනයෙන් ඇති වන සියළුම රිදවීම් නැති කරන්න ක්‍රමයක් යෝජනා කර තිබෙනවා. ඒක තමයි, ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය. දූන් රටම බලාගෙන ඉන්නවා, මොකක්ද මේ ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය කියන්නේ කියා.

**මන්ත්‍රීවරයෙක්**
**(அங்கத்தவர் ஒருவர்)**
(A Member)

හොඳ නැද්ද?

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**

නරක නෑ. ගොවි විශ්‍රාම වැටුප් දෙන්නේ කොහොමද කියන එකයි, අපේ ප්‍රශ්නය.

**ආරියරත්න ජයතිලක මහතා (ගම්පහ දිසා ඇමතිතුමා)**
**(திரு. ஆரியரத்ன ஜயதிலக்க — கம்பஹ மாவட்ட அமைச்சர்)**
**(Mr. Ariyaratne Jayatillake – District Minister, Gampaha)**

ඒක ඔහේට තේරෙන්නේ නැහැ.

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**

කවුද ගොවියා කියන්නේ. අද ගොවියාට දෙනවාද? ඉඩම් නැති කුලියට වැඩ කරන ගොවියාට දෙනවාද? ඉඩම් හිමි ගොවියාට දෙනවාද? [බාධා කිරීමක්] ඔක්කොටම දෙනවා? රක්ෂණ ක්‍රමයක් මේකෙ තිබෙන්නේ. රජයේ සේවකයින්ට විශ්‍රාම වැටුප් දෙන විට කොහොමද? ඒ ගොල්ලන්ගෙ වැටුපෙන් විශ්‍රාම වැටුප්වලට වෙන් කරන්නේ නැහැ. විශ්‍රාම ගියාම දෙනවා. නමුත් ගොවියා? එයා මාසෙකට ගණනක් ගෙවන්න ඕන. මේක අර "ජල බද්ද", "තඩත්තු බද්ද" වගේ වචන දෙකක්. ජල බද්දද කියල ඇහුවාම "නැහැ, නැහැ, මේක තඩත්තු බද්ද" කියනවා. මේක ගොවි විශ්‍රාම වැටුපක් නොවෙයි. ගොවි රක්ෂණ ක්‍රමයක්.

**ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා**
**(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க)**
**(Mr. W. P. B. Dissanayake)**

ගොවි අර්ථ සාධක අරමුදලක්. එහෙම කියන්න බැරිද?

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**

තමුන්නාන්සේ ඊයේ ඉඳලා කියන ඒවා ටිකක් අපි පිළිගන්නවා.

**ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා**
**(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க)**
**(Mr. W. P. B. Dissanayake)**

ඊයේ පාර්ලිමේන්තුව තිබුණේ නැහැනේ.

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**

අද "ඇත්ත" පත්‍රයේ තිබෙනවා මෙන්න මෙහෙම : "මහා භාණ්ඩාගාරය රෝගී වෙලා. මුදල් පාලනය අන්තයටම පිරිහිලා. සංස්ථා වැනැසුවන් ගාළු මුවදෙරට දක්කිය යුතු බව මහනුවර දිසා ඇමති කියයි".

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා (කොළඹ දිසා ඇමතිතුමා)**
**(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி — கொழும்பு மாவட்ட அமைச்சர்)**
**(Mr. Weerasinghe Mallimaratchi – District Minister, Colombo)**

"ඇත්ත" පත්‍රයේ එහෙම තිබෙන එක ඇත්ත. මෙන්න මේකෙ නම් තිබෙන්නේ පව. මේ සමාව ඉල්ලා තිබෙන්නේ ඊයෙත් අගමැතිතුමාගෙන්. [බාධා කිරීමක්] ඒ ගැන කතා කරන්නකො.

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**

මේක "ඇත්ත" පත්‍රයේ තිබෙන්නේ. දිසා ඇමතිතුමා ඒ කියන දේවල් ඉතාම වැදගත්. ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව මේ ප්‍රකාශනයේ 120 වැනි පිටුවේ සඳහන් වෙනවා. මම ඒ සම්බන්ධයෙන් සඳහන් කිරීමට වැඩිවෙලා ගන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. ගොවියා තෝරා ගන්නේ කොහොමද? අක්කර පහක් තිබෙන ගොවියා වැඩියෙන් සල්ලි දුන්නාම එයාට ගෙවන විශ්‍රාම වැටුප වැඩිද? ඉඩම් නැතිව කුලියට වැඩ කරන ගොවියා තමයි, අන්තිමට අමාරුවේ වැටෙන්නේ. ඒ මිනිහාට කොහොමද විශ්‍රාම වැටුප ගෙවන්නේ ? අද ගොවියාට කොහොමද විශ්‍රාම වැටුප දෙන්නේ ? මෙන්න මේවා පැහැදිලි කළ යුතු දේවල්.

විශ්‍රාම වැටුප කියන එක හැම රජයේ සේවකයෙකුටම දෙනවා. නමුත් ගොවීන් පිළිබඳව තෝරා ගැනීමේ ක්‍රමයේදී ප්‍රශ්න මතු වෙනවා. ගොවි හැඳුනුම් පතක් දුන්නාම, අක්කර 10 ක් තිබෙන ගොවියා ඉන්න පුළුවන්. නමුත් කුලියට වැඩ කරන ගොවියා ඒකට ගණන් ගන්නේ නැහැ. ඒ මිනිහා කුලියට ගොවිතැන් කරන්නේ. බිම් අඟලක් නැති මිනිහා ගැනත් අපි කල්පනා කළ යුතු වෙනවා.

විශේෂයෙන්ම මම මේ අවස්ථාවේදී යෝජනා කරනවා – නමුත් යෝජනාව පිළිගන්න එකක් නැහැ, විරුද්ධ පක්ෂයෙන් නිසා. – බීඩි කොලේට, දුම්රිය ගාස්තුවට, තැපැල් ගාස්තුවට වැඩිකර රිද්දලා සල්ලි ගන්නෙ නැතුව වෙනත් ක්‍රමවලින් බැරිද ? මේකෙ ඉන්නවා සල්ලි ගන්න පුළුවන් මිනිස්සු. ඒ මිනිස්සු අල්ලා ගෙන සල්ලි ගන්න. රේස් කාරයො ඉන්නවා. හැම තැනම රේස් බුකි. ඒ අයට කිසිම නීතියක් නැහැ. පලාතක් නැතිව රේස් කාරයො. ඔවුන් කරන සේරම පවු ගෙවෙන්න තොරණක් ගහනවා, වෙසක් එක අල්ලලා. විදේශීය බැංකු තිබෙනවා. බදු අරගෙන ඇති. නමුත් ගෙන යන ලාභාංශ ප්‍රමාණය පිළිබඳව පැහැදිලි නැහැ. කොන්ත්‍රාත්කාරයින් සිටිනවා. රිජිස්ටර්වූ කොන්ත්‍රාත් ප්‍රමාණය කොපමණද කියා නැහැ. [බාධා කිරීමක්] ඒ අයගෙන් බදු ගන්න.

**මන්ත්‍රීවරයෙක්**
**(அங்கத்தவர் ஒருவர்)**
(A Member)

තමුන්නාන්සේලාගේ සංවිධායකයෝ.

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**

ඒ මිනිසුන්ගෙන් බදු ගන්න. මොන පක්ෂයේ වුණත් බදු ගන්න කියන එකයි, අපි කියන්නේ. අද පෞද්ගලික රෝහල් හැම තැනම ඉදි කරගෙන යනවා. ඒවායිත් බදු ගන්න. කොළඹ නගරයේ ටෙනිස් පිටි තිබෙනවා. 6 දෙනයි ක්‍රීඩා කරන්නේ. අක්කර 3 ක් පමණ ටෙනිස් පිටි තිබෙනවා. ඒවායිත් ගන්න. ඇයි, මේ බීඩි බොන අයගෙන් බදු ගන්නේ ? බදු ගන්නට ඕනෑ තරම් මිනිස්සු ඉන්නවා. ධන උල්පත් පැදුණු අයගෙන් බදු ගන්න. බීඩි කොළයේ බද්ද වැඩි කර, දුම්රිය ගාස්තුව වැඩි කර, තැපැල් ගාස්තුව වැඩි කර, සාමාන්‍ය මිනිහා තමන්ගේ එපිට සිටින දරුවාට යවන ලියමනේ ගාස්තුව වැඩි කර මුදල් ලබා ගන්නේ නැතිව සල්ලිකාරයින්ගෙන් බදු ගන්න. ඇයි ඒක කරන්නට බැරි ? මම මේ පිළිබඳව වැඩිදුර කථා කරන්නේ නැහැ. තවත් කරුණක් ගැන මගේ අදහස් ප්‍රකාශ කරන්නට බලාපොරොත්තු වෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අමරසිරි දොඩන්ගොඩ මහතා]

මේ කථාව ආරම්භයේදීම ගරු මුදල් ඇමතිතුමා කියා තිබෙනවා, "මගේ මංගල අයවැයෙන් මේ රටේ ආර්ථිකය සම්පූර්ණයෙන් නිදහස් කළා." කියා. ඕක තමයි, පදනම. ආර්ථික නිදහස. මම සඳහන් කරන්නට කැමතියි. විවෘත වෙළෙඳපොළ සහ නිදහස් ආර්ථිකය දේශීය නිෂ්පාදනයේ සහ කර්මාන්ත ක්ෂේත්‍රයේ මරලතෝතියයි කියා. එදා සිට අද වන තුරු තමුන්නාන්සේලා විදේශ භාණ්ඩ ආයාත කළා. ගෙන්වූ භාණ්ඩවලට මුහුණ දෙන්නට සමත්වූ එකම නිෂ්පාදකයා මැලිබන් මුදලාලි පමණයි. බිස්කට්ස් ගෙන්නුවා. නමුත් අපේ රටේ බිස්කට්ස් කර්මාන්තය යම්කිසි මට්ටමක තිබුණා. ඒ නිසා අර ගෙන්වූ බිස්කට්ස් පුස්කකා විසි කළා, ලංකාවේ බිස්කට්ස් අලෙවි වුණා. [බාධා කිරීමක්] ඒ වෙලාව වන විට බයිසිකල් හැදුවා. බයිසිකල් ටයර් හැදුවා. රේඩියෝ හැදුවා. සියළුම දේශීය නිෂ්පාදන දනගාමින් නැගිසිටින්නට හැදුවා. ඒ අවස්ථාවේ තමුන්නාන්සේලා නිදහස් වෙළඳ පිළිවෙත පටන්ගත්තා.එවිට ඒ සියල්ලක්ම සමතලා වුණා. මේක, අවුරුදු පහක් තිබුණා නම් ? මා කණගාටු වෙනවා ඉන්දියාව මෙතැනට ලංකර ගැනීම ගැන, මේ ආර්ථික වෘධිය ගැන සඳහන් කරන්නට. ඉන්දියාව මේ කර්මාන්තවල විදේශීය ආයාතනයන් නැවැත්වීම නිසා තමයි, ඉන්දියාව ඒ මට්ටමට ආවේ. එහෙත් ලංකාව විදේශීය භාණ්ඩ ආයාත කිරීම නිසා හැම ක්ෂේත්‍රයකම කර්මාන්ත දනගැසුවා. එය අවිවාදයෙන් පිළිගත යුතුයි. ඊක සමහර විට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමන්ලා අපට කියන දෙයක්. ඇයි මේ විදේශීය බඩු ගෙනාවේ ? මැලිබන් කර්මාන්තය එයට මුහුණ දුන්නා. මොන බිස්කට්ස් ආවත් ඒ අය නැගිටලා සිටියා. මොණරා බයිසිකල් හැදුවා. බයිසිකල් ටයර් හැදුවා. රේඩියෝ හැදුවා. නොයෙක් ආකාරයේ නිෂ්පාදනයන් කළා.

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා**
**(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி)**
**(Mr. Weerasinghe Mallimaratchi)**

හැදුවේ නැහැ. එකට ඇමුණුවා.

**අමරසිරි දෙඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**

කොහොම හෝ ලංකාවේ නමින් හැදුවානේ. මේවා සියල්ලක්ම බිම දැම්මේ මේ ආරම්භක අයවැයයි.

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා**
**(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி)**
**(Mr. Weerasinghe Mallimaratchi)**

ටකරන් බාල්දි.

**අමරසිරි දෙඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**

දැන් අළුත් එකක් තිබෙනවා, රෙදිපිළි. " දිවයින " පත්‍රයේ ඒ ගැන කියනවා.

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා**
**(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி)**
**(Mr. Weerasinghe Mallimaratchi)**

ආර්. එස්. පෙරේරා බාල්දි පෙරළනවා.

**අමරසිරි දෙඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**

" දිවයින " පත්‍රයේ මෙන්න මෙහෙම කියනවා. මේ කියන්නේ රෙදිපිළි සංගමයේ සභාපති.

" අයවැය යෝජනාවක් නිසා දෙලක්ෂ පනස් දහක් අනතුරේ. "

" දිවයින " පත්‍රයේ මේ තිබෙන්නේ. මෙයින් කියන්නේ මේකයි. රෙදිපිළි ගෙන්වන්නට පුළුවන්. බද්ද වැඩි කළා. නමුත් ගෙන්වනවා. දේශීය විදේශීය කතාවක් නැහැ. හැම එකකම දැන් මිල වැඩියි. රෙදිපිළි ගෙන්වන විට ලංකාවේ තිබෙන 2,50,000ක් දෙනා රක්ෂාව කරන රෙදිපිළි කම්හලුත් වැහෙනවා කියන එකයි, මේ අය කියන්නේ. ඒ සංගමයේ සභාපතියි, මේක කියන්නේ.

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා**
**(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி)**
**(Mr. Weerasinghe Mallimaratchi)**

එදා රෙදි තිබුණාද ? අමුඩ ගහගෙනයි ඉන්න වුණේ.

**අමරසිරි දෙඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**

එම සංගමයේ සභාපති, කොළඹ දිසා ඇමතිතුමා නම් හඳුනනවා ඇති. එස්. කුමාරතුංග මහත්මිය තමයි, එම සංගමයේ ලේකම්. සාමාජිකයන් දෙලක්ෂ පනස් දහසක් සිටින රෙදි නිපදවන සේවකයන්ගේ සංගමයේ ලේකම්. [*Interruption*] කුමාරතුංග කියන කොට තමුන්නාන්සේ දන්නවා ඇති. යටින් මෙහෙයවන්නේ තමුන්නාන්සෙනෙ.

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා**
**(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி)**
**(Mr. Weerasinghe Mallimaratchi)**

කුමාරතුංගව ? මගෙ අම්මා ! මෙපමණ කල් ඕක ගැන මම දැනගෙන සිටියේ නැහැ නේ. [බාධා කිරීම්]

**අමරසිරි දෙඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**

මා ප්‍රකාශ කරමින් සිටියේ, රෙදි නිපදවීමේ යෙදී සිටින දෙලක්ෂ පනස් දහසකගේ රැකියා නැතිවන තත්ත්වයේ යෝජනාවක් ඉදිරිපත් කර ඇති බවයි. මේ සම්බන්ධයෙන් එහි ලේකම්වරිය " දිවයින " පත්‍රයට ප්‍රකාශයක් නිකුත් කර තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රෙදිපිළි ආනයනය සම්බන්ධ නීති සංශෝධනය කර, දැන් නිදහසේ ආනයනය කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ, හොරෙන් ගෙනෙන, කන්ටේනර්වල පටවා ගෙනෙන, හරස් විදියට එන රෙදිපිළිවලට අමතරවයි. ඒවාත් එලෙසින්ම ගෙන එද්දී, දැන් මෙම යෝජනාවෙන් පස්සේ නිදහසේ රෙදි ආනයනය කරන්න පුළුවනි. හැබැයි, බද්ද ටිකක් වැඩියි. නමුත් මේ නිසා ලංකාවේ රෙදි කර්මාන්තය විනාශ වෙනවා.

**ආර්. පී. විජේසිරි මහතා (කුණ්ඩසාලේ)**
**(திரு. ஆர். பீ. விஜேசிறி — குண்டசாலே)**
**(Mr. R. P. Wijesiri – Kundasale)**

ඊක අතීත් අවුරුද්දේදී බලමු. [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
**(குழுப் பிரதித் தலைவர் அவர்கள்)**
**(The Deputy Chairman of Committees)**

ගරු මන්ත්‍රීතුමාට කථා කරන්න ඉඩ දෙන්න. නිදහස තිබෙන්නට ඕනෑ කථා කරන්නට. කථා කරන්නට ඕනෑ නම් පසුව කථා කරන්නට ඉඩ දෙන්න පුළුවනි.

**අමරසිරි දෙඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**

ඊළඟට සංස්ථා ගැනත් අදහස් ටිකක් ප්‍රකාශ කරන්නට කැමතියි. 35 වන පිටුවේ මෙන්න මෙහෙම තිබෙනවා :

රාජ්‍ය අංශයෙහි ඇතැම් කර්මාන්ත සංස්ථාවල දියුණුවක් සහ හොඳ මූල්‍ය කළමණාකරණයක් පැවතුණා. එහෙත්, රජයේ සමහර සංස්ථා රජයේ අයවැයටත්, ඒ නිසා රටේ ජනතාවටත්, තවමත් ඉසිලිය නොහැකි බරක් වී තිබෙනවා. රජයේ අංශයේ සංස්ථාවලින් 1984 අයවැය මත පැටවුණු මුළු බර රුපියල් දස ලක්ෂ 6,923 ක් වුණා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සංස්ථාවලින් අයවැයට බරක් පැටවුණාලු. එම නිසාලු මේ සංස්ථා වසා දමන්නේ. එසේ වසා දමන ලද සංස්ථා කීයක් දැන් තිබෙනවාද ? පිටි සංස්ථාව වසා දමා ඊක " ප්‍රීමා " සමාගමට දුන්නා. මේ අන්දමට දිගටම වහගෙන යනවා. මේ අන්දමට සංස්ථා වසා දමන්නේ ඒවා පාඩු පිටද ? ලාභ පිටද ? ලංකාවේ පිටි නිෂ්පාදනය කර ගෙන ආවේ මෝදර පිහිටි පිටි සංස්ථාවයි. දැන් ඊක වසා දමා " ප්‍රීමා " සමාගමට භාර දීලා.

**මන්ත්‍රීවරයෙක්**
**(அங்கத்தவர் ஒருவர்)**
**(A Member)**

දැන් ඊක සම්පූර්ණයෙන්ම ඇරලා [බාධා කිරීම්]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අමරසිරි දොඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)

කොහොම වුණත් මුදල් ඇමතිතුමා සංස්ථා පදිළිබද ප්‍රතිපත්තියේ වෙනසක් කරන්න ඕනෑ. මෙම සංස්ථා කොටස් හතරකට බෙදන්න පුළුවනි. එකක් දනටමත් වසන ලද සංස්ථා. ඊළඟට වැසෙමින් පවතින සංස්ථා. තුන්වෙනුව වැසීමට යෝජනා කරන ලද සංස්ථා සහ හතරවැනිව විදේශීය කොම්පැනි සමග හවුල් කරගෙන පවත්වා ගෙන යන්නට අදහස් කරන සංස්ථා. සංස්ථාවල තත්ත්වය මේකයි. සියලුම සංස්ථා 'අනිත්‍යයි' කියලා තමයි කියන්නට තිබෙන්නේ. සියලුම සංස්කාරයෝ නොවෙයි, සියලුම සංස්ථා අනිත්‍යයි කියන්නට වෙන්නේ. ඇත්තවශයෙන්ම "ප්‍රීමා" සමාගමට පිටි සංස්ථාව භාර දුන්නේ ඇයි? ලංකාවේ පිටි නිෂ්පාදනය පිළිබඳව ඒකාධිකාරයක් තිබුණේ පිටි සංස්ථාවටයි. කිරි මණ්ඩලය "නෙස්ලේ" සමාගමට දුන්නේ ඇයි? මේවා මේ සමාගම්වලට දෙන්න කලින් ගරු මුදල් ඇමතිතුමා අපට නොඇහෙන්න වුණත් මේ ගරු සභාවට යම් යම් යෝජනා ගෙනා බව මම ගරු මුදල් ඇමතිතුමාට මතක් කරන්න කැමතියි. ඒ මගින් අර සංස්ථාවල නිෂ්පාදනවලට රැකවරණ ලබා දුන්නා. මත් ද්‍රව්‍ය නිෂ්පාදනවල මිල වැඩි කරලා රාජගෝපාල් සමාගමට නැත්නම් ගිල්බිස් සමාගමට මෙය භාර දෙයි කියා දන් මට බයක් තිබෙනවා. ඩෙනිස් තැචර් මහත්මයා මාග්‍රට් තැචර් අගමැතිතුමියත් සමග ලංකාවට ආවා. ඩෙනිස් තැචර් කියන්නේ රාජගෝපාල් සමාගමේ වැඩියෙන්ම "ෂෙයාර්ස්" තිබෙන පුද්ගලයායි. එයා ලංකාවට ඇවිදින් තිබෙන්නේ හොදකට නොවෙයි. එයා ඇවිත් කථා කර තිබෙන්නේ ලංකාවේ මද්‍යසාර නිෂ්පාදනය එයාගේ කොම්පැනියට ගන්නයි.

ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා (මහනුවර දිසා ඇමතිතුමා)
(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க — கண்டி மாவட்ட அமைச்சர்)
(Mr. W. P. B. Dissanayake – District Minister, Kandy)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අපි කථා කරන්නේ එංගලන්තයේ ගරු අගමැතිතුමිය ගැනයි. මේ ගරු සභාවේ ඒ අගමැතිතුමිය ගැන ඒ ප්‍රකාශය කිරීම ඉතාමත් වැරදියි. අසාධාරණයි.

අමරසිරි දොඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)
ඒක මේකට බලපාන්නේ නැහැ.

ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා
(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க)
(Mr. W. P. B. Dissanayake)

He is referring to Mr. Thatcher who came with Mrs. Thatcher. It is wrong. We do not do this. We never make such references.

අමරසිරි දොඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)
අගමැතිතුමිය නොවෙයි, අගමැතිතුමියගේ ස්වාමිපුරුෂයා.

ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා
(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க)
(Mr. W. P. B. Dissanayake)

It is a friendly country. She is the head of that Government.

අමරසිරි දොඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)
ඩෙනිස් තැචර් අගමැතිවරයෙක් නොවෙයි.

ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා
(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க)
(Mr. W. P. B. Dissanayake)

Mr. Dennis Thatcher is the husband of Mrs. Thatcher. He did mention it.

අමරසිරි දොඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)
ඩෙනිස් තැචර් මත් ද්‍රව්‍ය සමාගමක කොටස්කාරයෙක්.

ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා
(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க)
(Mr. W. P. B. Dissanayake)

No, you should not do that.

අමරසිරි දොඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)

How can you say that ? He is the main shareholder of Rajagopal.

ආර්. පී. විජේසිරි මහතා
(திரு. ஆர். பீ. விஜேசிறி)
(Mr. R. P. Wijesiri)
ඒ සාකච්ඡාව කරනවිට මෙතුමා යටද සිටියේ කියා අහන්නට කැමතියි.

ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා
(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க)
(Mr. W. P. B. Dissanayake)

You should not make references to people like that.

අමරසිරි දොඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කිව්වේ අපේ සංස්ථාවලට සිදුවන්න යන දේ.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுப் பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman of Committees)

Order, please ! Anybody can own shares in a company. But you cannot blame a shareholder.

අමරසිරි දොඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)

We are blaming that Prime Minister. Mr. Dennis Thatcher is the main shareholder of Rajagopal and Gilbeys. – (*Interruption*). I will prove that. He is a businessman.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுப் பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman of Committees)

I do not have shares in a singal company. You can be a shareholder in a company. You can have Rs. 10 or Rs. 100 ; then you get your dividend. Any of the Members of this House can buy shares in a company. You can get your dividend. That does not mean you can go on blaming shareholders. Forget about Mr. Dennis Thatcher. Think about our country. You can go ahead now.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**අමරසිරි දෙඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කියන්නේ ඉස්කාගාර සංස්ථාවට සිදු වෙන්න යන දේ. මේක තමයි, ඒ භයානක දේ. ඔය වික්ටෝරියා ජලාශය විවෘත කිරීම වෙන එකක්. ඉස්කාගාර සංස්ථාවට සිදු වෙන්න යන එක වෙන එකක්. ඉස්කාගාර සංස්ථාව කියන්නේ කෝටි 112ක් සුරා බදු ගන්න සංස්ථාවක්. කෝටි 12ක වාර්ෂික ආදායමක් තිබෙන සංස්ථාවක්. මම ගරු මුදල් ඇමතිතුමාට අවස්ථා කීපයකදී කිව්වා.

**හරීන්ද්‍ර කොරයා මහතා (වැඩබලන අධිකරණ ඇමතිතුමා සහ නියෝජ්‍ය රාජ්‍ය පරිපාලන ඇමතිතුමා)**
**(திரு. ஹரீந்திர கொறயா — பதில் நீதி அமைச்சரும் பொது நிர்வாகப் பிரதி அமைச்சரும்)**
**(Mr. Harendra Corea – Acting Minister of Justice and Deputy Minister of Public Administration)**

On a point of Order, Sir. Rajagopal is the gentleman who helped Mrs. Bandaranaike over the Kandy water supply scheme

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

I do not think he can say that. This is what he feels.

**හරීන්ද්‍ර කොරයා මහතා**
**(திரு. ஹரிந்திர கொறயா)**
**(Mr. Harindra Corea)**

Was there not something about a car ?

**අමරසිරි දෙඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**

This is a separate matter.

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා**
**(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி)**
**(Mr. Weerasinghe Mallimaratchi)**

How do you know ?

**හරීන්ද්‍ර කොරයා මහතා**
**(திரு. ஹரிந்திர கொறயா)**
**(Mr. Harindra Corea)**

Was there not a commission of inquiry ?

**අමරසිරි දෙඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**

ගිල්බීස් සමාගම ලංකාවට කැඳෙව්වේ ඇයි ? ඒ අය කැඳෙව්වේ මොන කොන්දේසි උඩද කියා අපට කියන්න යයි මම ගරු මුදල් ඇමතිතුමාට අවස්ථා කීපයකදී කිව්වා. නමුත් අද වන තුරු ගිල්බීස් සමාගම කැඳවූවේ මොන කොන්දේසි මතද කියන එක කිව්වේ නැහැ. මම ඒ ප්‍රශ්නය මතු කරන්නේ අපේ ප්‍රදේශයේ ගොවීන් දහස් ගණනක් අමාරුවේ දමූ ගිල්බීස් සමාගම වගේ සමාගමකට ඉස්කාගාර සංස්ථාව වගේ ලාභදායක සංස්ථාවක් භාර දෙන්න සූදානම් වන නිසයි. ගරු නියෝජ්‍ය මුදල් ඇමතිතුමා එද වැඩබලන මුදල් ඇමතිතුමා වශයෙන් මගේ ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් මොකක්ද කිව්වේ ? රජය ධර්මිෂ්ටයි. සුරා පෙරීමේ වැඩවලට ලැස්ති නැහැ. ඒ නිසා මේක දෙනවාය කිව්වා. සුරාමේරය කියන්නේ පස් වන සිල් පදය. පළමුවන සිල් පදය තමයි, ප්‍රාණඝාතය. ඒ නිසා පන්සිල් පිළිපදිනවා නම් ධීවර සංස්ථාවත් දෙන්න.

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා**
**(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி)**
**(Mr. Weerasinghe Mallimaratchi)**

නමුත්නාන්සේලා මෙතන දී තමයි පන්සිල් පිළිපදින්නේ.

**අමරසිරි දෙඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**

ධර්මිෂ්ට ප්‍රතිපත්තිය යටතේ සුරා පෙරීමට බැරි නිසා ආණ්ඩුව සුරා නිෂ්පාදනය කිරීම කොම්පැණිවලට දෙනවා. ඔක තමයි එද ගරු නියෝජ්‍ය ඇමතිතුමා දුන්න උත්තරය. [බාධා කිරීමක්] ඇයි ධීවර සංස්ථාව — ඒක පළමුවැනි සිල්පදය. ඒකත් විසුරුවන්න.

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා**
**(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி)**
**(Mr. Weerasinghe Mallimaratchi)**

මොකක්ද ?

**අමරසිරි දෙඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**

ධීවර සංස්ථාව, මැලේරියා මර්ධන ව්‍යාපාරය—

**මන්ත්‍රීවරයෙක්**
**(அங்கத்தவர் ஒருவர்)**
**(A Member)**

බරවා රෝගය.

**අමරසිරි දෙඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**

සේරම ප්‍රාණඝාත.

**ආර්. පී. විජේසිරි මහතා**
**(திரு. ஆர். பீ. விஜேசிறி)**
**(Mr. R. P. Wijesiri)**

ඝාත නැහැ.

**අමරසිරි දෙඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සංස්ථා පිළිබඳ රජය දරන ප්‍රතිපත්තිය ගැන, විශේෂයෙන්ම මේ සුරාබදු නිෂ්පාදනය ගැන ගරු මුදල් ඇමතිතුමාට අවස්ථා දෙකකදී කිව්වා. රජයේ විශාල ආදායම් මාර්ගයක් අද වෙනත් නමකින් — ඒ ගිල්බීස් නම වෙනස් කර වෙනත් නමකින් — බ්‍රසීලයේ ස්ප්‍රිතු ගෙනල්ලා මධ්‍යසාරය පුරවනවා.

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා**
**(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி)**
**(Mr. Weerasinghe Mallimaratchi)**

මොකක්ද නම ?

**අමරසිරි දෙඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**

මෙන්න මේ කඩුවෙල පැත්තේ ගහගෙන තිබෙනවා ෆැක්ටරියක්. මොකක්ද නම කියා මම දන්නේ නැහැ. අන්න බෝතල්වල තිබෙනවා. ඇයි අහන්න. මේ අපේ ගරු කුණ්ඩසාලේ මන්ත්‍රීතුමා (ආර්. පී. විජේසිරි මහතා) දන්නවා ඇති. අහලා බලන්න.

මේ සංස්ථාවට විදේශීය කොම්පැණි ගේන කොට අපි කිව්වා. එතකොට කිව්වා මේවා විදේශීය කොම්පැණිවලට දෙන්නේ නැහැ, දෙන්නේ දේශීය කොම්පැණිවලට කියා. මොනවාද මේ ? මොණරාගල කිව්වාම විදේශීය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කොම්පැණි නොවෙයිනේ. පැල්වත්ත කිව්වාම විදේශීය කොම්පැණි නොවෙයිනේ. ඒක තමයි දැන් අලුත්ම තුරුම්පුව. ගොවීන් ගිහිල්ලා කෘෂිකර්ම අමාත්‍යාංශයේදී සාකච්ඡා කළා. ලෝක වෙළෙඳ පොළේ සීනි මිල රුපියල් හයයි ශත හතලිහයි. පැල්වත්ත සීනි සමාගමෙන් රජය සීනි මිල දී ගැනීමට බැඳුනු මිල රුපියල් දහසයයි. මම හිතන්නේ ගරු මුදල් ඇමතිතුමා මේ ගැන දන්නවා ඇති. මේ සීනි ගැන වැඩිය කථා කරන එක හොඳ නැහැ. ලෝක වෙළෙඳ පොළේ සීනි මිල අඩු එකෙන් ආණ්ඩුවට ගණනක් හොයා ගන්න එක ඇත්ත. නමුත් පැල්වත්ත සීනි සමාගමෙන් රුපියල් දහසයට සීනි ගන්න බැඳුණේ ඇයි ? රුපියල් දහසය වෙන්න සීනි ගන්න ඒ ගිවිසුමෙන් ආහාර කොමසාරිස් බැඳිලා ඉන්නවා.

දැන් මොණරාගල වැඩ පටන් ගැනීමට ගොවීන් ඉඩම්වලින් එළවනවා ; පන්නනවා. රුපියල් හයයි ශත හතලිහකට—රුපියල් හයයි ශත හතලිහ නොවෙයි, ස්ථිර මිල ලෝක වෙළඳපොළේ හයකුත් ගණනක්— [බාධාකිරීමක්] රුපියල් හයයි ශත පහට ලෝක වෙළඳ පොළේ සීනි අරන් දැන් ලංකාවේ පාරිභෝගිකයාට එවනවා රුපියල් දහ හතරකට. ඒ සීනි. හේ වෙන ගණනක් එහෙම සපයලා ආණ්ඩුව බද්දකුත් ගන්නවා. තීරු බද්දක් ගෙන්වන කොට ගන්නවා. මේ සේරම තිබෙද්දිත් මොණරාගල, පැල්වත්ත සීනි සමාගම්වලින් එෆ්. අයි. ඒ. සී. ගිවිසුමෙන් ආහාර කොමසාරිස් රුපියල් දහසයට සීනි ගන්න පෙළඹුණේ ඇයි ? එතකොට බදුත් කොම්පැණියට. එතැන මිල රුපියල් දහසයයි. මොණරාගලින් කොළඹට ගේන්න කිලෝ එකකට රුපියල් එකයි ශත පනහක් වැය වෙනවා. රුපියල් ලක්ෂයක් වැටුප් ගන්න නිලධාරීන් ඉන්නවා ඒ සමාගමේ. කොළඹට එනවට රුපියල් දහක් ට්‍රැවලින් ගන්න නිලධාරීන් ඉන්නවා. ඒ සියලු දෙනාම විදේශීය නිලධාරීන්. අපි මේ ගොල්ලෝ කෘෂිකර්ම අමාත්‍යාංශයට ගෙන්වලා, ගොවීන්ගේ ඉඩම් ප්‍රශ්නය සාකච්ඡා කළා. අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිත්වය දරන්නේ කෘෂිකර්ම ලේකම්තුමා. එතුමා මොනවාද කිව්වෙ ? " මේ ගැන මොකුත් වෙනසක් කරන්න බැහැ ; මෙය රටේ සංවර්ධනයට ආව සමාගමක් " ය කියායි.

රුපියල් හයයි හතලිහට ලෝක වෙළඳ පොළේ තිබෙන සීනි රුපියල් දහසයට අපට විකුණන්න ආ සමාගමක් මෙය. ඇයි මේවාට ඉඩ දෙන්නේ ? ඇයි මේ සීනි සංස්ථාවට දෙන්නේ නැත්තේ. ඇයි විදේශීය කොම්පැණි ගෙනල්ලා දෙන්නේ. මේ කොම්පැණිවලට තීරුබදුවල ආදායමත් එකතු වෙනවා. ඒ ගොල්ලෝ දහසයට දුන්නාම. ආණ්ඩුවට රුපියල් හයකුත් ගණනේ සීනි ගෙනැවිත් විකුණන නිසා තීරු බදු වලින් එකතු වන ආදායමත් කොම්පැණියට එනවා. මේ ගොල්ලො ලාභ පිටරට යවන්නේ නැත්ද ? මෙන්න මේකයි—

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
**(குழுப் பிரதித் தலைவர் அவர்கள்)**
(The Deputy Chairman of Committees)

Order please ! දැන් ගරු මන්ත්‍රීතුමාට තව කොපමණ වේලාවක් කථා කරන්න ඕනැද ? පස්වරු හතර වන කොට පැයක් කථා කර තිබෙනවා.

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**

පැයයි විනාඩි 10 ක්—විනාඩි 70ක්—මට දී තිබෙනවා.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

Sir, we have given him 70 minutes.

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**

මම වැඩිය කියන්නෙ නැහැ. මම අහන්නේ මේ සීනි සංස්ථාවට ඇයි මෙහෙම කළේ කියලයි. දැන් සිමෙන්ති සංස්ථාව [බාධා කිරීම්] සිමෙන්ති සංස්ථාව ඥනම්—

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
**(குழுப் பிரதித் தலைவர் அவர்கள்)**
(The Deputy Chairman of Committees)

විරුද්ධ පක්ෂය කැමති නම් ගරු මන්ත්‍රීතුමාට තව කථා කරන්න පුළුවන්.

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**

ගරු සභාපතිතුමනි, මේ සිමෙන්ති සංස්ථාව ඥනම් කියන කෙනෙකුට දීලා මිට්සුයි ' කියන සිමෙන්ති ගෙන්වන්න.

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා**
**(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி)**
**(Mr. Weerasinghe Mallimaratchi)**

කවුද ඒ ඥනම් කියන්නේ. ?

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**

තමුන්නාන්සේ දන්නවා ඇති. ලොරි කාරයෝ තමයි ඒවා දන්නේ. අපි දන්නෙ නැහැ.

**ආර්. පී. විජේසිරි මහතා**
**(திரு. ஆர். பீ. விஜேசிறி)**
**(Mr. R. P. Wijesiri)**

අර ක්ලිපර්ඩ් රත්වත්තේ මහතා අධ්‍යක්ෂකම දරන ආයතනය. [බාධාකිරීම්] මැතිනියගෙ මල්ලී ඒකෙ අධ්‍යක්ෂ කෙනෙක් කියලා හිතා ගන්න.

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**

සිමෙන්ති පටවන ලොරි තිබෙනවා නම් ඔව දන්නවා.අපි දන්නෙ නැහැ, ඥනම්—

**ආර්. පී. විජේසිරි මහතා**
**(திரு. ஆர். பீ. விஜேசிறி)**
**(Mr. R. P. Wijesiri)**

රුපියල් විසිදහක පඩියට ඥනම්ගේ යටතේ වැඩ කරන්නේ.

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**

මිට්සුයි සිමෙන්ති ගෙන්වන්නට අවසර දීලා. සහනත් දීලා තිබෙනවා. ඇයි ? සිමෙන්ති සංස්ථාව සිමෙන්ති නිපදවනවා. සිමෙන්ති සංස්ථාව කරන්නෙත් ඒ අයට අයිති වැඩ නොවෙයි. කන්කසන්තුරේ ගහලා තිබෙනවා හෝටලයක්. ඒ හෝටලයත් නැහැ. මිනිස්සුත් නැහැ. ඉතින් සිමෙන්ති සංස්ථාවෙත් පාඩුයි කියනවා. ඒ පාර කියනවා මේක දෙන්න ඕනෑලු, ජපන් කාරයින්ට.

**ආර්. ජේ. ජී. ද මැල් මහතා**
**(திரு. ஆர். ஜே. ஜீ. த மெல்)**
**(Mr. R. J. G. de Mel)**

Clifford Ratwatte has been employed there from the date of the last elections, from 1977.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

Is he a shareholder or an employee ?

**ආර්. ජේ. ජී. ද මැල් මහතා**
**(திரு. ஆர். ஜே. ஜீ. த மெல்)**
**(Mr. R. J. G. de Mel)**

[බාධාකිරීමක්]

He is an employee.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**

දුම්කොළ සංස්ථාව ගැන මම කියන්නේම නැහැ. දුම්කොළ සංස්ථාව බීඩි කොළ ගෙන්වන්නට ගිහිල්ලා කරපු ලොකු මගඩියක් තිබෙනවා. ඒක කියන්න දෙයක් නැහැ. නමුත් මම කියන්නේ මේකයි.

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා**
**(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி)**
**(Mr. Weerasinghe Mallimaratchi)**

විසිදහයි, පඩිය.— එයා බීඩි බොන්නේ නැහැ. [බාධා කිරීම්]

**ආර්. පී. විජේසිරි මහතා**
**(திரு. ஆர். பீ. விஜேசிறி)**
**(Mr. R. P. Wijesiri)**

He is a director—[බාධා කිරීම්]

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා**
**(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி)**
**(Mr. Weerasinghe Mallimaratchi)**

නිකම් බොරු කථා කරන්න එපා. " ෂෙයා හෝල්ඩර් " වුණත් වැඩකාරයා වුණත් පඩි ගන්නවා රුපියල් විසිදහක්.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

The Hon. Minister must look into the shareholdings of Gnanams, the ownership, everything.

**ආර්. ජේ. ජී. ද මැල් මහතා**
**(திரு. ஆர். ஜே. ஜீ. த மெல்)**
**(Mr. R. J. G. de Mel)**

Why ?

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

I will let you know why. You must let us know whether he is an employee, a shareholder or a director. Some say he is a director. We would like to know about this. Please look into all the shareholdings of Gnanam, where he owns shares and also the shareholdings of others in Gnanams'. Then you will come across the names of others whom we cannot talk about here.

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**

සංස්ථාව වැනසීම ගැනයි මම කියන්නේ. නමුත්නාන්සේලාගේ ඩිරෙක්ටර් ගැන නොවෙයි.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

We normally do not talk ill of anyone.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

You must keep your word and look into this.

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා**
**(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி)**
**(Mr. Weerasinghe Mallimaratchi)**

ඔක්කොම එක වගේ ධනපතියො තමයි.

**ආර්. ජේ. ජී. ද මැල් මහතා**
**(திரு. ஆர். ஜே. ஜீ. த மெல்)**
**(Mr. R. J. G. de Mel)**

Sir, I only want to respond to what the hon. Member for Attanagalla (Mr. Lakshman Jayakody) said just now. I do not think it is my job, as Minister of Finance, to look into the shareholdings of private companies and to disclose them in this House. But I can tell you one thing. If I do so, I am convinced, there will be nobody, either in the top management or in the shareholdings of any of Gnanam' companies, who has either been a Member of Parliament of the UNP or a prospective Member of Parliament belonging to the UNP or a brother of the leader of the UNP.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

We are not talking of the UNP. The name of Clifford Ratwatte came up. This is something I did not know about. Please let us know whether he is a shareholder, a director or an employee. In the course of all this, please see who the other shareholders are. This is very important because we want to clear the air and any doubt that may have arisen in the minds of hon. Members. I hope you will do that.

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ කථාව අවසන් කිරීමටයි මම අදහස් කරන්නෙ. [බාධා කිරීමක්]

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

I gave all that up when I came to this House.

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා**
**(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி)**
**(Mr. Weerasinghe Mallimaratchi)**

You are a very good baby.

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා විශේෂයෙන්ම මතක් කරන්න ඕනැ සංස්ථා කොම්පැනිවලට දීම ගැන. මේක තමයි අළුත් විජිත ක්‍රමය. පැරණි කාලයේ කොම්පැනි ඇවිත් තිබෙන්නෙ හමුදා එක්ක. එංගලන්ත වෙළඳ සමාගම, පෘතුගීසි වෙළඳ සමාගම, ලන්දේසි වෙළඳ සමාගම හමුදා සමග ගොඩ බැහැලා තමයි රටවල් අල්ලාගෙන තිබෙන්නෙ. ලොරෙන්සෝ ද අල්මේද ආවෙ හුළඟකට ගසාගෙනලු. නමුත් දැන්, ගිහිල්ලා එක්ක එනවා. දැන් විදේශ කොම්පැනි කැඳවනවා. හුළඟට ආව කොම්පැනි, බලෙන් ආව කොම්පැනි දැන් කැඳවනවා. ගරු මුදල් ඇමතිතුමා කිරි මණ්ඩලය තිබෙන තාක් කල් තීරු සහන දුන්නෙ නැහැ. නමුත් නෙස්ලේ ව්‍යාපාරය පටන් ගත්තාට පසුව තීරු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සහන දුන්නා. දැනටමත් මද්‍යසාර මිල වැඩි කර දී තිබෙනවා. මා අනතුරු හැඟවීමක් කරනවා මේ විධියට. කොම්පැනිවල ආරක්ෂාව සඳහා මේ විධියට පියවර ගත්තත් මේ රටේ වැඩි වැටුප් ඉල්ලන පිරිස්වලට වැටුප් වැඩි කරන්නය කියා ඉල්ලා සිටින පිරිස්වලට තවම කන් දී නැහැ. අද ඒ මිනිසුන්ගේ අයවැය හැදුවොත් රුපියල් 1,500ක් මාසයකට ගන්න දරුවන් තුන් දෙනෙක් ඉන්න මිනිහෙකුට ජීවත්වෙන්න බැහැ. කොම්පැනිවලට තීරු බදු රැකවරණ දෙනවා. බදු රැකවරණ දෙනවා. ශ්‍රමය පමණක් හිමි වැඩ කරන මිනිසුන්ට සහනයක් දෙන්නේ නැහැ. මෙතැන තිබෙන ප්‍රශ්නය එයයි. මුදල් ඇමතිතුමා අයවැය ලේඛන නවයක් ඉදිරිපත් කොට තිබෙන අතර ලැයිස්තුගතව බැලුවොත් රේගු හොරකම් වර්ෂයක් පාසා වැඩිවී තිබෙන බව පෙනෙනවා. රේගුවෙන් එන හොරකම්, වංචා, විනිමය වංචා එන්න එන්නම වැඩිවී ගෙන එනවා. කන්තෝරුවලින් හොර බඩු ගෙන ඒම එන්න එන්නම වැඩිවී ගෙන එනවා. මේ විධියට දූෂණ බහුල වන්නේ මුදල් ක්‍රමයේත් ආර්ථික ක්‍රමයේත් දුර්වල ප්‍රතිපත්තිවල හේතුවෙනුයි. රටේ වරායෙන් රේගුවෙන් පාලනයකින් තොරව යම් භාණ්ඩ පිටවෙනවා නම්, බඩු පිටවෙනවා නම්, රේගු නිලධාරීන් සුළු සේවක පිරිස් ජීවත් වෙන්න බැරුව හැම කෙනෙකුගෙන්ම සල්ලි ඉල්ලමින් ආදායම් සොයන්න වෙහෙසෙනවා නම් මුළු රටම දූෂණයට පෙළඹීගෙන යනවා. එය මුළු ආර්ථික ක්‍රමයේම අසාර්ථකභාවයක් හැටියටයි අපට පෙනෙන්නෙ.

තවත් අළුත් ආදායම් ක්‍රමයක් තිබෙනවා. මම පසුගිය සුමානයේ පත්‍රයක දැක්කා ලොතරැයියක් ගැන පල කර තිබුණු ලිපියක්. " හඳහන " කියල එකක් හෙටත් එනවලු. එළියට බැස්ස ගමන් සූරල සූරල සල්ලි ඉවරලු. ඔය දේ එක රටක කරල මුළු රටේම අඩු ආදායම් ලබන මිනිසුන් ඉතාම අමාරු තත්ත්වයකට වැටුනාලු.

**මන්ත්‍රීවරයෙක්**
**(அங்கத்தவர் ஒருவர்)**
**(A Member)**

කොයි රටේද ?

**අමරසිරි දොඩන්ගොඩ මහතා**
**(திரு. அமரசிறி தொடங்கொட)**
**(Mr. Amarasiri Dodangoda)**

මැක්සිකෝවෙ. ඒ රටේ එක දක්වල තිබෙන්නෙ සූරන ලොතරැයි ක්‍රමය කියල. [බාධාකිරීමක්] මැක්සිකෝවෙ. දත් සුමාන දෙකකට, උඩදී ඒ ගැන පත්‍රයක ලිපියක් තිබුණා. "නිව්ස් වීක්" එකේ තිබුණ ලිපියක් පරිවර්තනය කර පත්‍රයක දමා තිබුණා. සූරන ලොතරැයියෙන් අමාරුවේ වැටුණ රටක් තමයි මෙක්සිකෝ රට.

අනික් කාරණය, තමුන්නාන්සේලා දන්නවා සියලුම ප්‍රශ්න ගෙන අයවැය ලේඛනයක් සකස් කරන විට එහි තිබෙන සහන ආදිය මුළු රටටම බලපාන බව. ඒ නිසා කුමන හෝ ආදායම් මාර්ගවල -- අය ප්‍රතිපත්තියේත්, වැය ප්‍රතිපත්තියේත් -- පෙලගැස්ම බහුජන අවශ්‍යතාවයට රටේ වැඩි ජන කොටසකගේ ප්‍රයෝජනයට අනුව වෙන්න ඕනෑ. අපේ අයවැය යෝජනාවලින් අතලොස්සකගේ ප්‍රයෝජනයට වැඩි මුදලක් යෙදුවොත් ඒක වැරදියි.

මුදල් ඇමතිතුමා ඉදිරිපත් කර තිබෙන අයවැය ලේඛන නවයෙහිම, වැය පෙලගැස්වීම පිළිබඳව ජනතාවගේ අවශ්‍යතාවට ප්‍රමුඛත්වය නොදුන් බව සහේතුකව ඔප්පු කරන්න අපට පුළුවනි. මොන පදනමක් මතද, වැය පෙලගැස්විය යුත්තේ ? බහුජන අවශ්‍යතාව මතයි. උදාහරණයක් වශයෙන් රජයේ සංස්ථාවක් -- ලංගම -- අරගෙන බලමු. ලංගමයේ සේවකයන් 60,000 ක් ඉන්නවායයි හිතමු. සාමාන්‍යයෙන් ලංගම සේවකයෙක් මාසයකට රු. 1,000ක වේතනයක් ලබනවායයි කල්පනා කරමු. ගමකට එවැනි සේවකයන් 10 ක් බැගින් ඉන්නවා නම් ඒ හැම ගමකටම මාසයකට රු. 1,000 ඒවා 10ක් ලැබෙනවා. නමුත් ලංගමය අහෝසි කොට එය සම්පූර්ණයෙන්ම පෞද්ගලික අංශයට පැවරුවොත් බස් මුදලාලිලා කීප දෙනෙකුට දුන්නොත් මොකක්ද, කරන්නේ ? සේවකයන් 100ක් සිටි තැනට 20 බැගින් යොදවා සේවකයන් සූරා කමින් පුළුවන් තරම් ලාභ එකතු කර ගැනීමයි. සංස්ථාවකත්, පෞද්ගලික ආයතනයකත් අතර ඇති වෙනස එකයි. සංස්ථාවේ සේවක පිරිස අවශ්‍ය ප්‍රමාණයට වැඩි වුණත් ඒ මඟින් වැඩි සේවක පිරිසක්, වැඩි පවුල් ගණනාවක් ජීවත් වෙනවා. ලංගමයේ සේවකයන් 60,000ක් ඉන්නවාය කියන්නේ ලක්ෂ 3 කට වඩා පිරිසක් ලංගමය මඟින් ජීවත් වන බවයි. මේ ආණ්ඩුව කියන්නේ, 'ලංගමය ඕනෑ නැහැ, සංස්ථා ඕනෑ නැහැ, ඒවා වසා දමා මුදලාලිලා කීප දෙනකුට දෙන්න ඕනෑ' කියායි. රාජ්‍ය සංස්ථා, ආයතන වසා දමා ඒවා පෞද්ගලික අංශයට දුන්නොත් සිදු වන්නේ පවුල් විශාල සංඛ්‍යාවකගේ ජීවත්වීමට බාධා පැමිණීමයි. ඒ සංස්ථා වසා දමා ඒවා මුදලාලිලාට දුන්නාම ඒ මඟින් ලාභ උපයන ඒ මිනිස්සු ඒ ලාභ රටේ අවශ්‍යතාවන් සඳහා පාවිච්චි කරනවාද ? නැහැ. ඒ මිනිසුන්ගේ පෞද්ගලික අවශ්‍යතා, සැප--විහරණ සඳහා තමයි, ඒ ලාභ පාවිච්චි කරන්නේ. ඒ මිනිස්සු ලොකු ගෙවල් හදයි ; පිටරට යයි ; තමන්ගේ ළමයින් පිටරට යවයි. තුන්වැනි ලෝකයේ රටක තිබෙන රාජ්‍ය සංස්ථාවකත් පෞද්ගලික සමාගමකත් අතර ඇති වෙනස එකයි. රාජ්‍ය සංස්ථාවකින් විශාල පිරිසක් ජීවත් වෙනවා, ඒ සංස්ථාවෙන් පාඩු සිදු වුණත්. එවැනි සංස්ථාවක් කොම්පැණි ක්‍රමයට පරිවර්තනය වන්න ඉඩ හැරිය ගමන් සිදු වන්නේ මොකක්ද ? කොම්පැණිකාරයා --තනි කෙනෙක් -- සුළු සේවක පිරිසක් පමණක් යොදවා ගෙන, අඩු වැටුපක් ගෙවා වැඩි ලාභයක් ගන්නවා. ඒ නිසයි අපි කියන්නේ රටේ ආර්ථිකයත් පෙලගැස්විය යුත්තේ වැඩි ජනතාවගේ ප්‍රයෝජනය සඳහාය කියා. නමුත් මේ ආණ්ඩුව කරන්නේ මොකක්ද ? රජයේ සම්පූර්ණ ආදායම රුපියල් කෝටි 2,500 නම් තමුන්නාන්සේලා, 25 කට ප්‍රයෝජනවත් වන විධියට ඒ ආදායමින් රුපියල් කෝටි 10 ක් යොදවන්න පුළුවනි. ඒ අතර 50,00,000 කට ප්‍රයෝජනවත් වන විධියට රුපියල් කෝටි 5 ක් පමණ යොදවන්න පුළුවනි. රටේ වැඩි ජනතාවගේ අවශ්‍යතාවන් මත, වැඩි දෙනකුගේ ප්‍රයෝජනය සඳහා අපේ ආර්ථිකය -- ආදායම හා වියදම -- පෙලගැස්විය යුතුයයි අප කියන්නේ ඒ නිසයි. නමුත් මේ අයවැය ලේඛනයෙන් එවැනි පෙලගැස්වීමක් කෙරී නැහැ. ඒ නිසා ඒ පිළිබඳව අපේ අදහස් ඉදිරිපත් කළ යුතුව තිබෙනවා.

රජය වියදම් කරන මුදලින් ප්‍රයෝජනය ගන්නා ප්‍රමාණය පිළිබඳ සැලැස්මක්, පෙලගැස්වීමක් තිබෙන්න ඕනෑ. රජය පාරක් හදන්න පුළුවනි ; පාලමක් හදන්න පුළුවනි ; නගරයක් හදන්න පුළුවනි ; සංවර්ධන යෝජනා ක්‍රමයක් ඇති කරන්න පුළුවනි. එවැනි සංවර්ධන යෝජනා ක්‍රමයකින් මිනිසුන් 25,00,000ක් ජීවත් වෙන්න පුළුවනි. ඒ යෝජනා ක්‍රමය හුවා දැක්වීම සඳහා රූපවාහිනීගත කිරීම්, ප්‍රචාරක පත්‍ර මඟින් ප්‍රසිද්ධ කිරීම් ආදී වශයෙන් නොයෙකුත් ප්‍රචාරයන් කරන අතර තවත් මිනිසුන් 40,00,000ක් ගැන කිසිම වියදමක් දරන්නේ නැත්නම් එතැන, අවශ්‍යතාවන් මත වැය ප්‍රතිපත්ති සකස් කිරීමක් හෙවත් වියදමේ සමතාවක් නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු මුදල් ඇමතිතුමා ඉදිරිපත් කළ මේ අයවැය ලේඛනය තුළින් විජිතවාදයේ නව මුහුණුවරක් පැහැදිලිව පෙනෙනවා. පෘතුගීසීන්, ලන්දේසීන්, ඉංග්‍රීසීන් මේ රටට ඇවිත් හමුදා බලයෙන් මේ රට අල්ලාගෙන බලහත්කාරයෙන් මේ රටේ ආර්ථිකය මෙහෙයවූ ක්‍රමය තමයි, මේ රජය නැවතත් කැඳවාගෙන ඇවිත් තිබෙන්නේ. අපේ රටේ ආර්ථිකය, මල් මාලා දමා කොම්පැණිකාරයන්ට භාර දීමක් තමයි. මේ අයවැයෙන් කර තිබෙන්නේ. එකයි, නව විජිතවාදය. ඒ නව විජිතවාදී පසුබිම තමයි, මේ අයවැය ලේඛනයේ පෙනෙන්නේ. මේක තුන්වැනි ලෝකයේ ජනතාවට, ස්වෛරී ජනතාවට ඉතාම අහිතකර තත්ත්වයක්. ඒ නිසා මේ අයවැය ක්‍රමය වෙනස් කොට අපේ කර්මාන්ත, අපේ වැඩ, අපේ කොම්පැණි, අපේ බැංකු යනාදී වශයෙන් අපේම ස්වයං ආර්ථික ක්‍රමයක් අපි හදගන්න ඕනෑ. ඒ නිසා විදේශීය මූල්‍ය ක්‍රමය, විදේශීය බැංකු ක්‍රමය, විදේශීය කොම්පැණි ක්‍රමය යනාදී වශයෙන් වූ විදේශීය පරිපාලනය ඇති හැසිරවීම් ක්‍රමයක් ගෙන ගියොත් අපට කිසිදක නිදහස්, ස්වෛරී ජාතියක් හැටියට නැඟී සිටින්න අපට පුළුවන් වන්නේ නැහැ. ඒ අදහස ප්‍රකාශ කරමින් මම වාඩි වෙනවා.

**චන්ද්‍ර රණතුංග මහතා (මාවනැල්ල)**
**(திரு சந்திர ரணதுங்க --மாவனெல்ல)**
**(Mr. Chandra Ranatunga -- Mawanella)**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙම අයවැය ලේඛනය පිළිබඳව වචන ස්වල්පයක් කථා කිරීමට මත්තෙන් මම පලමුවෙන්ම අවස්ථාව සලසා ගන්නවා අපේ ගරු මුදල් ඇමතිතුමා අපේ රජය බලයට පත් වුණාට පස්සෙ අයවැය ලේඛන 9ක්ම මේ සභාවේදී ඉදිරිපත් කරන්නට එතුමාට අවස්ථාව ලැබීම ගැන මගේ සන්තෝෂය ප්‍රකාශ කරන්න. ඒ වාගේම එතුමාට අපේ රට 1977ට කලින් තිබුණු ආර්ථික තත්ත්වයෙන් ගොඩගැනීමට පුළුවන් වුණ අයවැය ලේඛන 9ක්ම ඉදිරිපත් කරමින් මේ රට ඒ පිරිහුණු ආර්ථික තත්ත්වයෙන් ගොඩ ගැනීමට අවස්ථාව ලැබුණා වාගේම ඉදිරියටත් අයවැය ලේඛන ගණනාවක් ඉදිරිපත් කිරීමට එතුමාට වාසනාව ලැබේවා කියා මම ප්‍රාර්ථනා කරනවා.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[චන්ද්‍ර රණතුංග මහතා]

මගේ අදහස් ප්‍රකාශ කිරීමට මත්තෙන් මම සතුටුයි අපේ බද්දේගම ගරු මන්ත්‍රීතුමා (අමරසිරි දොඩන්ගොඩ මහතා) ඉදිරිපත් කළ කරුණු කීපයක් ගැන වචන ස්වල්පයක් ප්‍රකාශ කිරීමට. එතුමා දීර්ඝ කථාවක් කරන්න යෙදුණා. පැයකුත් මිනිත්තු 20ක් පමණ කාලයක් තුළ එතුමාගේ අදහස් ප්‍රකාශ කරන්න යෙදුණා. ඒ කරුණු සියල්ල ගැන මම කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මම හිතනවා මට ලැබී තිබෙන කාලසීමාව ඉතාමත් සීමිත හෙයින් මට ඒ තරම් දුරට කථා කරන්න අවස්ථාවක් නැති වේවි කියා. ඒ නිසා මම කරුණු කීපයක් ගැන පමණක් කියන්න කැමතියි.

බද්දේගම ගරු මන්ත්‍රීතුමා කිව්වා අපේ ගරු මුදල් ඇමතිතුමා ස්වකීය කථාවේදී එක්තරා භීතියක් පළ කළාය කියා. අපි කල්පනා කරන්න ඕනෑ. මොන කරුණක් නිසාද එතුමා භීතියක් පළ කෙළේ කියා. එතුමා භීතිය පළ කෙළේ එතුමාගේ අයවැය කථාවේදී ඉදිරිපත් කරන්න යෙදුණ අයවැය යෝජනා නිසා නොවෙයි. මේ රට අද පත් වී තිබෙන තත්ත්වය නිසායි. මේ රට අප කවුරුත් කවදාවත් බලාපොරොත්තු නොවූ විශාල යුද්ධයකට මුහුණ පා තිබෙනවා. අද එවැනි අර්බුදකාරී තත්ත්වයකට අපට මුහුණ දෙන්නට සිද්ධ වී තිබෙනවා. අප කල්පනා කළ යුතුව තිබෙනවා, අද උතුරු නැගෙනහිර ප්‍රදේශවල තිබෙන තත්ත්වය මොන අතට හැරේවිද, ඒ තත්ත්වය නිසා මේ රටේ මුදල් කොපමණ ප්‍රමාණයක් අපට ඒ සඳහා වියදම් කරන්න සිද්ධ වේවිද කියන අපැහැදිලි තත්ත්වය උඩ සහ පිටරටින් අපට ලැබෙන ආධාර ක්‍රම කුමන තත්ත්වයකට අඩු වේවිද කියන කාරණා උඩ එතුමා භීතිය පළ කරන්නට යෙදුණ බව. එසේ නැතිව එතුමාගේ අයවැය ප්‍රතිපත්ති නිසා ඇති වූ තත්ත්වයක් නොවෙයි එය. ඒ නිසා ගරු මුදල් ඇමතිතුමා අයවැය යෝජනා උඩ භීතිය පළ කළාය කියා බද්දේගම ගරු මන්ත්‍රීතුමා කියනවා නම් එය වැරදි බව මම මුලින්ම පෙන්වා දෙන්න කැමතියි.

ඊළඟට බද්දේගම මන්ත්‍රීතුමා කියන්න යෙදුණා ව්‍යාපාර පිරිවැටුම් බද්ද - බී. ටී. ටී. - වැඩි නොකළ බඩුවල මිලත් වැඩි වී තිබෙනවාය කියා. බී. ටී. ටී. වැඩි නොකළ බඩුවල මිල වැඩි වී තිබෙනවා නම් අපේ ගරු මුදල් ඇමතිතුමා හෝ අපේ රජය හෝ ඊට වගකිව යුතුද ? මම ඒ ගැන නිදර්ශනයක් පෙන්වන්නම්. ගරු මුදල් ඇමතිතුමා අය වැය ඉදිරිපත් කළේ මේ මාසෙ 13 වෙනිදායි. නමුත් 12 වෙනිද අය වැය ඉදිරිපත් කළ දිනට පෙර ද කෑගල්ලේ සිද්ධ වුණ දෙයක් මම කියන්නම්. එහි පොඩි කැන්ටිමක් කරගෙන යන කෙනෙක් දවසකට සීනි කිලෝ දෙක බැගින් කඩයකින් මිලට ගන්නවා. 12 වෙනිද සුපුරුදු පරිදි ඔහු කඩේට ගියා සීනි කිලෝ දෙකක් ගන්න. හැමදාම ඔහුට සීනි විකුණන ඒ වෙළෙන්ද ඔහුගෙන් කිලෝවට ශත 50 බැගින් වැඩියෙන් ගත්තා. ඒ ඇයි කියා අර නැනැත්තා ඇසුවාම වෙළෙන්ද කිව්වෙ සීනි මිල හෙට වැඩි වෙනවාය, ඒ නිසා දැන් තිබෙන ගණනට දෙන්න බැරිය, ඒ නිසා ශත 50ක් බැගින් වැඩියෙන් ගන්න ඕනෑය කියායි.

මෙන්න මේ අන්දමටයි අද මේ රටේ සමහර වෙළෙන්දෙ කටයුතු කරන්නෙ. අයවැය ලේඛනයෙන් වැඩි කළ බඩුවලට පමණක් නොවෙයි කුට වෙළෙන්ද මිල වැඩි කරන්නෙ. එම නිසා එවැනි කුට වෙළඳුන් මේ රටේ මහජනතාව සූරා කෑමේ ප්‍රතිපත්තියක් ගෙනයනවා නම් අන්න ඒක මගහැරවීමට මේ රජයත් විරුද්ධ පක්ෂයත් යන හැම කෙනෙක්ම කටයුතු කළ යුතු බව අපි තේරුම් ගන්න ඕනෑ. ඒ නිසා මේ කරුණු ගැන අපේ ගරු මුදල් ඇමතිතුමාටවත් රජයටවත් දෝෂාරෝපණය කරන්න අපට පුළුවන්යයි මම හිතන්නේ නැහැ. අයවැය ලේඛනයෙන් ගොවි විශ්‍රාම වැටුපක් යෝජනා කර තිබෙනවා. බද්දේගම ගරු මන්ත්‍රීතුමා (අමරසිරි දොඩන්ගොඩ මහතා) විමසුවා, මොන ආකාරයෙන්ද මේක ගෙවන්න යන්නේ කියා. ඒ විශ්‍රාම වැටුප ගැන සෑහෙන පැහැදිලි කිරීමක් ගරු මුදල් ඇමතිතුමා කළායයි මම හිතනවා. ඒ විශ්‍රාම වැටුප සෑම ගොවි මහත්මයකුටම ගෙවීමට කටයුතු කරන බව එතුමා කිව්වා. එපමණක් නොවෙයි, එතුමා යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. එය ක්‍රියාත්මක කරන්න වෙනවා. එය ක්‍රියාත්මක කරන විට ඒ සම්බන්ධයෙන් නවත් නීති රීති ගේන්න වෙනවා. එය අපි කවුරුත් දන්නා කරුණක්. ඒ නීති රීති ගේන අවස්ථාවේදී ඒවා මේ ගරු සභාවේදී සාකච්ඡා කර ඒවා ගැන හරි අවබෝධයක් ඇති කරගෙන එය කරන්නේ කොයි ආකාරයටද යන්න හරියාකාරව පිළිගෙන නීති රීති පනවන්න ඉඩ තිබෙනවා.

මෙයින් රටට ඉතාම විශාල සේවයක් සිදු වෙනවා. ගොවි ජනතාව සඳහා මෙවැනි අර්ථසාධක අරමුදලක් නැත්නම් විශ්‍රාම වැටපක් දීම ගැන කල්පනා කළ යුතුව තිබුණේ දැන් නොවෙයි. මීට අවුරුදු ගණනකට ඉහතදී. අවුරුදු තිහ හතළිහකට ඉහතදී. මේ කාරණය ගැන කිසිම රජයක් කල්පනා කළේ නැහැ. නමුත් අපේ ගරු මුදල් ඇමතිතුමා අපේ ගරු කෘෂිකර්ම ඇමතිතුමා සමග සාකච්ඡා කර මේ කාරණය ගැන නිසි පියවරක් ගෙන තිබෙනවා. ඒ ගැන අපි ස්තුතිවන්ත විය යුතුයි.

විරුද්ධ පක්ෂය මේ කාරණය සම්බන්ධයෙන් මොන අදහස් දරනවාද මම දන්නේ නැහැ. නමුත් ඒ අය මේකට විරුද්ධද කියා මම අහන්න සතුටුයි. අපි ගොවි ජනතාවට විශ්‍රාම වැටුපක් දෙනවාට විරුද්ධ පක්ෂයේ අය විරුද්ධද, එහෙම නැත්නම් මේ කරුණ ගැන එතුමන්ලා අනවශ්‍ය විවේචන ඉදිරිපත් කරන්නේ ඇයි ? කියන ප්‍රශ්න අපි මේ අවස්ථාවේදී අහන්න ඕනෑ.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

රක්ෂණයක්ද ? විශ්‍රාම වැටුපක්ද ?

**චන්ද්‍ර රණතුංග මහතා**
**(திரு சந்திர ரணதுங்க)**
**(Mr. Chandra Ranatunga)**

රක්ෂණයක්ද විශ්‍රාම වැටුපක්ද යන්න ගැන මේ පිළිබඳ නීති රීති සාකච්ඡා කරන විට හැම කෙනෙකුටම සාකච්ඡා කරන්න පුළුවනි. [බාධා කිරීමක්] මම හිතන්නේ නැහැ. මේ ගැන තීරණයක් තිබෙනවා. ගරු මුදල් ඇමතිතුමා ඉතා පිරිසිදුව කියා තිබෙනවා, සෑම ගොවියකුටම සහනයක් වශයෙන් මෙය ලබා දෙන බව. එහෙම නම් තමුන්නාන්සේලාට කල්පනා කරන්න තිබෙන්නේ [බාධා කිරීමක්]

**ආර්. ජේ. ජී. ද මැල් මහතා**
**(திரு. ஆர். ஜே. ஜீ. த மெல்)**
**(Mr. R. J. G. de Mel)**

All pension schemes are an insurance.

**චන්ද්‍ර රණතුංග මහතා**
**(திரு சந்திர ரணதுங்க)**
**(Mr. Chandra Ranatunga)**

ගරු මුදල් ඇමතිතුමා කියන හැටියට සෑම වැඩකරුවකුටම දෙන විශ්‍රාම වැටුප [බාධා කිරීමක්]

**ආර්. ජේ. ජී. ද මැල් මහතා**
**(திரு. ஆர். ஜே. ஜீ. த மெல்)**
**(Mr. R. J. G. de Mel)**

All pension schems are an insurance, nothing else. All pension schemes are an insurance against old age. There is no difference.

**චන්ද්‍ර රණතුංග මහතා**
**(திரு சந்திர ரணதுங்க)**
**(Mr. Chandra Ranatunga)**

මෙය විශ්‍රාම වැටුපක් වුණත් රක්ෂණ ක්‍රමයක් වුණත් කොයි දේ වුණත් අපි කල්පනා කළ යුතුව තිබෙන්නේ මෙය ඉතාම වැදගත් යෝජනාවක් බවයි. මෙය ඉතාම වැදගත් යෝජනාවක් බව අපි පිළිගත යුතුයි.

දේශීය නිෂ්පාදන ගැන කතා කරන්න යෙදුණා. දේශීය නිෂ්පාදන රාශියක් දැනටත් තිබෙනවා. ඒ කාලෙයේත් තිබුණා. නමුත් මොකක්ද වෙනස. ? 1970-1977 කාලයේ දියුණු වී තිබුණායයි කියමින් තමුන්නාන්සේලා මේ තරම් කතා කරන දේශීය නිෂ්පාදන ගැන කල්පනා කරනොත් ඒ කාලයේදී මිනිසුන්ට අඳින්න දේශීය රෙදි කෑල්ලක් තිබුණාද ? තමුන්නාන්සේලා දේශීය නිෂ්පාදන ගැන කතා කරනවා. ගරු මුදල් ඇමතිතුමාගේ යෝජනාවක් අනුව රෙදි පිළි ආනයනය කිරීමට ඉඩ දීම නිසා දේශීය නිෂ්පාදන නැති වෙයයි තමුන්නාන්සේලා කියනවා. තමුන්නාන්සේලාගේ කාලයේදී 1970 සිට 1977 වනතුරු තමුන්නාන්සේලා කියන තරමට දේශීය නිෂ්පාදන තිබුණා නම් යාර දෙකේ රෙදි කෑල්ලකට හැතැප්ම ගණන් දිග පෝලිම්වල ඉන්න මිනිසුන්ට සිදු වුණ අවස්ථා තමුන්නාන්සේලාට මතකද ? ඒකයි, අපට කල්පනා කරන්න තිබෙන්නේ. [බාධා කිරීමක්] තමුන්නාන්සේලා ගණන ගැන කතා කරනවා. ගණන වුවමනාවක් නැහැ. මිනිසුන්ට අවශ්‍ය රෙදිපිළි තියෙන්න ඕනෑ. ඒ කාලයේදී රෙදිපිළි තිබුණද ? ඒකයි අපිට කල්පනා කරන්න තිබෙන්නෙ. අපි දේශීය නිෂ්පාදන ආරක්ෂා කළ යුතුයි. එසේ කරනවා වාගේම අපේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මහජනතාවගේ අවශ්‍යතාවත් අපි ඉෂ්ට කළ යුතුයි. ජනතාවට අවශ්‍ය දේවල් ලබා දිය යුතුයි. අපි දේශීය නිෂ්පාදන කරන තරම්න්ම මහජනතාවට සැහීමකට පත් වෙන්න පුළුවන්කමක් නැහැ. අපි මෙන්න මේ කාරණය හොඳින් හිතේ තබා ගත යුතුයි. ඒ නිසා තමයි, අපි මේ කාරණය ගැන සැලකිලිමත් විය යුතුව තිබෙන්නේ.

ඇත්තවශයෙන්ම මේ රෙදිපිළි ආනයනය සම්බන්ධයෙන් මමත් එක කාරණයක් අපේ ගරු මුදල් ඇමතිතුමාට ඉදිරිපත් කරන්න සතුටුයි. රෙදිපිළි සම්බන්ධයෙන් ඔබතුමා දැනට ඉදිරිපත් කර තිබෙන යෝජනා අනුව ආනයනය කරන කපුරෙදි මීටරයකට ඒවායේ වටිනාකමින් සියයට සියයක් හෝ වර්ග මීටරයකට රු. 25ක් හෝ ඒ දෙකෙන් වැඩි ප්‍රමාණය අයකිරීමට යනවා. එහෙත් කපු රෙදි සම්බන්ධයෙන් මෙවැනි බද්දක් අය කිරීමේදී දුෂ්කරතාවලට මුහුණ පාන්නට සිදුවන කොටසක් ඉන්න පුළුවන්. විශේෂයෙන් කපු මිශ්‍ර රෙදි වර්ග අපේ පාසල් සිසුන් බොහෝදුරට පාවිච්චි කරනවා. ඒ අය පාවිච්චි කරන රෙදි වර්ග සමහරවිට අවශ්‍ය ප්‍රමාණයට අපේ කර්මාන්තශාලාවල නිෂ්පාදනය වෙන්නේ නැහැ. ඒ පාසල් සිසු සිසුවියන් පාවිච්චි කරන රෙදිපිළිවලටත් මේ තීරු බදු අය කිරීමට ගියහොත්, ඒ පාසල් සිසු සිසුවියන්ට විශාල මුදලක් වැය කිරීමට සිදුවෙන බව මා මේ අවස්ථාවේදී මතු කර පෙන්නවන්නට කැමතියි. ඔබතුමා මේ කාරණය ගැන සැලකිල්ල යොමු කරනවා නම් ඉතාමත්ම හොඳයි කියන එක මා මේ අවස්ථාවේදී කියන්න සතුටුයි.

විශේෂයෙන්ම අපේ බද්දේගම ගරු මන්ත්‍රීතුමා (අමරසිරි දොඩන්ගොඩ මහතා) දීර්ඝ වශයෙන් කථා කළ කාරණයක් තමයි, සංස්ථා පිළිබඳ තත්ත්වය. අපි සංස්ථා ගැන සැලකිලිමත් විය යුතුයි. සංස්ථා වැසීමේදී ඒ සේවකයින්ගේ රැකියාවල් නැතිවෙන නිසා ඒ අයට සැහෙන අපහසුවකට කරදරයකට මුහුණ පාන්නට සිදුවෙන බව කියන්නට යෙදුණා. මේ සංස්ථාවන් රැකීම නිසා මේ රටේ මහජනතාවට කොයිතරම් සුභසාධනයක් ඇතිවෙනවාද කියා අපි පළමුවෙන් කල්පනා කරන්න ඕනෑ. අපේ ගරු මුදල් ඇමතිතුමා එතුමාගේ අයවැය කථාව ඉදිරිපත් කරන අවස්ථාවේදී පෙන්වා දුන්නා, සංස්ථා නිසා රටට ඇතිවී තිබෙන පාඩුව කොතරම්ද කියා. සංස්ථා නිසාම 1984 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 6,923ක පාඩුවක් සිදු වී තිබෙනවා.

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
**(Mr. Richard Pathirana)**

"එයාර් ලංකා" කොහොමද ?

**චන්ද්‍ර රණතුංග මහතා**
**(திரு சந்திர ரணதுங்க)**
**(Mr. Chandra Ranatunga)**

"එයාර් ලංකා" හෝ ඕනෑ ලංකාවක් වේවා පොදුවේ අපට කියන්න තිබෙන්නේ සංස්ථා ගැන. ඒ සංස්ථාවලින් මෙතරම් අලාභයක් සිදුවෙනවා නම් අපි කල්පනා කළ යුතුව තිබෙනවා, මේ සංස්ථා පවත්වාගෙන යාමෙන් අපේ මහජනයාට සුභසිද්ධියක් වෙනවාද එසේ නොමැතිනම් මහජනයාට කරදරයක් හිරිහැරයක් පාඩුවක් වෙනවාද කියන එක ගැනත්. එයින් මහජනයාට කරදරයක් සිදු වෙනවා නම්, සේවක පිරිසකගේ පමණක් ජීවනෝපාය මාර්ගයක් වන නිසාම ඒ සංස්ථා නියාගන්න පුළුවන්කමක් නැහැ. එහෙම නම් ඒ සේවක පිරිසට යම් සැහෙන සහනයක් ලබා දී ඒවා වැසිය යුතුයි. අපේ මුදල් ඇමතිතුමා යෝජනා කර තිබෙනවා, ඒ වහන්න යන සංස්ථාවල සේවකයන්ට විශ්‍රාම වැටුපක් හෝ සේවයෙන් අස්වී යන අවස්ථාවේදී සැහෙන මුදලක් හෝ දීල ඒ සංස්ථා වහන්න වුණොත් වහනවාය කියා. අපි කල්පනා කර බැලිය යුතුව තිබෙන්නේ මෙවැනි සංස්ථා පාඩුවට ගෙන යන්නේ ඇයි කියලයි.

අනවශ්‍ය ලෙස සංස්ථා රාශියක් ඇති කර තිබීම නිසා ඒ සංස්ථාවලට මේ තත්ත්වය උදා වී ඇති බව අපි දන්නවා. ඒ ඒ කාලවලදී එක් එක් රජයන් ඒ ඒ සංස්ථා ඇති කරනවිට, ඒවායින් මේ රටට සෙතක් සැලසෙනවාද එහෙම නැත්නම් ඒවායේ නිෂ්පාදන ද්‍රව්‍යවලින් මේ රටේ මහජනතාවට කොයි තරම් වාසියක් සැලසෙනවාද කියා කල්පනා කර බැලුවා නම් අද ඒ සංස්ථාවල මෙවැනි තත්ත්වයක් ඇති වෙන්නේ නැහැ. සමහර සංස්ථාවල විශාල වශයෙන් තිබෙන අනවශ්‍ය වියදම් නිසාත් පාඩුවෙනවා. මා හිතන්නේ අපේ ගරු මුදල් ඇමතිතුමා යෝජනාවක් කර තිබෙනවා, මේ සංස්ථාවල් පරීක්ෂා කිරීම සඳහා කමිටුවක් පත් කරන්න. ඒ කමිටුවේ පරීක්ෂණයන් අනුව ඒ සංස්ථා නැවත වාසි ලබන තත්ත්වයෙන් එහෙම නැත්නම් පාඩු සිදුවන්නේ නැති තත්ත්වයෙන් ගෙන යන්න පුළුවන්කමක් තිබෙනවා නම් ඒ සංස්ථා තවදුරටත් ගෙන යන්න එතුමා බලාපොරොත්තු වෙනවා. අන්න ඒ විධියටයි, අපට කල්පනා කර බලන්න සිදු වී තිබෙන්නේ. එහෙම නැතිව මේ රටේ මහජනතාවගේ මුදල් රුපියල් කෝටි ගණනින් වියදම් කර සංස්ථා පවත්වාගෙන යාමෙන් කිසිම ප්‍රයෝජනයක් නැහැ. සමහරවිට පෞද්ගලික අංශයට ඒ සංස්ථා දුන්නොත් ඒ සංස්ථා හරියාකාර පවත්වාගෙන යන්න ඒ අයට පුළුවන් වෙයි. ඒ අය කවදාවත් මේ සංස්ථා පාඩුවට ගෙන යන්නෙ නැහැ. ඒ නිසා ඒ සේවය කරන පිරිස් සමගම පුද්ගලික අංශයට දී කටයුතු කිරීම හෝ එහෙමත් බැරිනම් ඒ සංස්ථා වසා දැමීමට කටයුතු කිරීම හෝ කළ යුතුයි. එසේ කිරීම මම හිතන්නේ අපේ මහජනතාවට අපි කරන විශාල සේවයක් වෙනවා ඇති.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
**(குழுப் பிரதித் தலைவர் அவர்கள்)**
**(The Deputy Chairman of Committees)**

දැන් කාල වේලාව හරි. තව කොපමණ වේලා කතා කරන්න බලාපොරොත්තු වෙනවාද ?

**චන්ද්‍ර රණතුංග මහතා**
**(திரு சந்திர ரணதுங்க)**
**(Mr. Chandra Ranatunga)**

නියෝජ්‍ය සභාපතිතුමනි, මම දැනගෙන සිටියෙ නැහැ, මට ඔබතුමා කොපමණ වේලා දෙනවාද කියා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
**(குழுப் பிரதித் தலைவர் அவர்கள்)**
**(The Deputy Chairman of Committees)**

මිනිත්තු 20 ඉවරයි. තව මිනිත්තු දෙකක් පමණ දෙන්න පුළුවන්.

**චන්ද්‍ර රණතුංග මහතා**
**(திரு சந்திர ரணதுங்க)**
**(Mr. Chandra Ranatunga)**

එහෙම නම් මට වැඩිවෙලා කතා කරන්න බැහැ. එනිසා තව මිනිත්තු 10 ක් වත් මම ඉල්ලා සිටිනවා.

**ආර්. ජේ. ජී. ද මැල් මහතා**
**(திரு. ஆர். ஜே. ஜீ. த மெல்)**
**(Mr. R. J. G. de Mel)**

Sir, he started speaking after 4.10 p.m.

**චන්ද්‍ර රණතුංග මහතා**
**(திரு சந்திர ரணதுங்க)**
**(Mr. Chandra Ranatunga)**

Sir, I want to say a lot of things, but I do not see much time being given to me. So I will merely state some of the suggestions that I want to make.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
**(குழுப் பிரதித் தலைவர் அவர்கள்)**
**(The Deputy Chairman of Committees)**

Yes, you may continue.

**චන්ද්‍ර රණතුංග මහතා**
**(திரு சந்திர ரணதுங்க)**
**(Mr. Chandra Ranatunga)**

අපේ ගරු මුදල් ඇමතිතුමාගේ අයවැය යෝජනා අනුව 1977 සිට මේ දක්වාම එතුමා ඉදිරිපත් කර තිබෙන්නේ එකම පිළිවෙළකට මේ රටේ සංවර්ධනයට අදාළ අයවැය ලේඛනයන්. මේ රට දියුණු කිරීමට තිබෙන එකම මාර්ගය හැටියට එතුමා පෙන්වා දී තිබෙන්නේ, මුදල් හරියාකාරව පාලනය කිරීමත් සමගම සංවර්ධන ක්‍රම ක්‍රියාවේ යෙදවීමය කියන එකයි. එනිසයි, මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[චන්ද්‍ර රණතුංග මහතා]
රටේ යෝධ සංවර්ධන ව්‍යාපාර ඇතිවී තිබෙන්නේ. මේ රටේ ඉතිහාසයේ මීට පෙර කවදාවත් ඇති නොවුණු අන්දමේ සංවර්ධන වැඩපිළිවෙළක් මේ රටේ ඇති කර තිබෙනවා, මේ රජයේත් අපේ මුදල් ඇමතිතුමාගේත් යෝජනා තුළින්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මහවැලි යෝජනා ක්‍රමය යටතේ පමණක් අපි දන්නවා, දැනට ජලාශ කිහිපයක වැඩ අවසන් කර තිබෙන බව. 1984 දී වික්ටෝරියා ජලාශයෙන් ජලය නිකුත් කරන්නට යෙදුණා. කොත්මලේ ජලාශය මඟින් 1985 අගෝස්තු මාසයේ ජලය නිකුත් කරන්නට පටන් ගත්තා. ඒ ජලාශ දෙකෙන් පමණක් මෙගවොට් 344ක විදුලි බලයක් නිෂ්පාදනය කරන්නට පුළුවන් වී තිබෙනවා. ඊළඟට මාදුරු ඔය ජලාශය 1983 දී ඉදිකර එයින් අක්කර 93,750ක ප්‍රමාණයකට වාරිමාර්ග පහසුකම් සපයා දී තිබෙනවා.

රන්දෙනිගල ගැන අපි කල්පනා කළොත්, මේ රටේ ඉදිවෙමින් තිබෙන විශාලම ජලාශය එය බව කියන්න පුළුවන්. එහි වැඩ කටයුතුත් ඉතාමත්ම ඉක්මනින් අවසන් කරන්නට කටයුතු යොදා තිබෙනවා. ඒ සමගම කිරිඳි ඔය, ඉඟිනිමිටිය, තිල්වලා ආදී විශාල යෝජනා ක්‍රම මේ රටේ ඇති කරන්නට පුළුවන් වී තිබෙන්නේ මේ අපේ එක්සත් ජාතික පක්ෂ රජය 1977 සිට ඇති කළ ආර්ථික ක්‍රමය නිසා බව අපි සිහි තබා ගන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේවා පමණක් නොවෙයි. අප ගරු අගමැතිතුමාගේ නිවාස යෝජනා ක්‍රමය අපේ රටේ මහජනතාවට ලොකු සහනයක් සලසාදී තිබෙන බව අපට ඉතාමත්ම සන්තෝෂයෙන් හා ආඩම්බරයෙන් ප්‍රකාශ කරන්නට පුළුවන්. පසුගිය රජයේ මුළු කාලය තුළදීම ගෙවල් 500ක් හෝ 600ක් පමණයි, ඉදිකර තිබෙන්නේ. එවැනි තත්ත්වයක් පවතිද්දී අපේ රජයට පුළුවන් වෙලා තිබෙනවා දැනට එක් ලක්ෂ පනස් දහකට වැඩි ගෙවල් ප්‍රමාණයක් ඉදිකර, ඉදිරි කාලය තුළදී ගෙවල් දස ලක්ෂයක් ඉදි කිරීමට කටයුතු යෙදීමට. මම එය මේ අවස්ථාවේදී ආඩම්බරයෙන් කියන්නට ඕනෑ. මේ විධියේ සංවර්ධන ව්‍යාපාර රාශියක් ඇතිකර කටයුතු කිරීමට පුළුවන් වී තිබෙන්නේ අපේ රජයේ, අපේ ගරු මුදල් ඇමතිතුමාගේ ආර්ථික ප්‍රතිපත්ති නිසා බව අපි මේ අවස්ථාවේදී ඉතාමත්ම සන්තෝෂයෙන් මතක් කරන්නට ඕනෑ.

සමහර විට අපට දෝෂාරෝපණය කරනවා, මේ රජයේ කටයුතුවලින් මහජනතාවට සුභසිද්ධියක් වෙලා නැත කියා. ඔය නිවාස යෝජනාක්‍රමත් මහවැලි යෝජනාක්‍රමය ආදී සංවර්ධන ව්‍යාපාරත් නිසා අද මහජනතාවට ඇතිවී තිබෙන සුභ සිද්ධිය අනුව අපට පුළුවන්කම තිබෙනවා, ඉතාමත්ම මෑත කාලයකදී අපේ ප්‍රධාන ආහාරය වන සහලින් මේ රට ස්වයංපෝෂිත කිරීමට.

1984 දී වී බුසල් දස ලක්ෂ 116ක් මේ රටේ නිපදවීමට පුළුවන් වෙලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් කිසිම සැකයක් නැතිව අපට ප්‍රකාශ කරන්නට පුළුවන් තත්ත්වයක් තිබෙනවා. අපේ මේ වැඩ පිළිවෙළ තවදුරටත් ක්‍රියාත්මක කරගෙන යන විට මහවැලි ව්‍යාපාරයෙන්ම පමණක් මේ රට ස්වයංපෝෂිත කිරීමට හැකි තත්ත්වයක් තිබෙනවා. ඒ අතරම අපි කල්පනා කළ යුතුව තිබෙනවා, මේ ව්‍යාපාරය මඟින් නිෂ්පාදනය කරන සහල්වලට මොකක්ද අපි කළ යුත්තේ කියා. මේ රට සහලින් ස්වයංපෝෂිත වුණොත් අන්න ඒ ප්‍රශ්නයට අප විසින් පිළිතුරු සෙවිය යුතුව තිබෙනවා. [බාධා කිරීම්]

සමහරවිට අපට මේ අවුරුද්දේදීත් පිටරටින් සහල් ආනයනය කරන්න වේවි. ඒක අපි දන්නවා. අපි පටන් ගෙන ඇති ජලාශවල වැඩ අවසන් කර තව අක්කර දහස් ගණනකට වාරිමාර්ග පහසුකම් සැලසුවාට පසුව, ඒ මඟින් වී වගාව සාර්ථක වී රට සහලින් ස්වයංපෝෂිත වෙනවාට කිසිම සැකයක් නැහැ. ඒ බව විරුද්ධ පක්ෂය දැනගත යුතුයි.

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)
කොත්මලේ නාය යනවලු.

චන්ද්‍ර රණතුංග මහතා
(திரு சந்திர ரணதுங்க)
(Mr. Chandra Ranatunga)
නාය යනවා කියා තමුන්නාන්සේලාගේ " ඇත්ත " පත්‍රයේ තිබුණේ. ඔය " ඇත්ත " පත්‍රයේ තිබෙන දේවල් තමයි තමුන්නාන්සේලා කියන්නේ.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)
නැහැ, නැහැ, නැහැ. අද " ඩේලි නිව්ස් " පත්‍රයේ තිබෙන්නේ.

චන්ද්‍ර රණතුංග මහතා
(திரு சந்திர ரணதுங்க)
(Mr. Chandra Ranatunga)
ඔක තමයි තමුන්නාන්සේලාට හීනෙන් පෙනෙන්නෙත්. තමුන්නාන්සේලා යම්කිසි අදහසක් හිතේ තියාගෙන ඉන්නවා. ඒ තුළින් සිහින බල බලා, ඒක හැමදාම [බාධාකිරීම්]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுப் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman of Committees)
Order please !

චන්ද්‍ර රණතුංග මහතා
(திரு சந்திர ரணதுங்க)
(Mr. Chandra Ranatunga)
නියෝජ්‍ය සභාපතිතුමනි, ඒක කොත්මලේ ඔයේ තිබෙන සුළු දෝෂයක්. අපට ඒක යථා තත්ත්වයට පත්කර ගන්න පුළුවන් බොහොම ලෙහෙසියෙන්. ඒක ප්‍රශ්නයක් නෙමෙයි. අපි ගෙනයන මේ නිෂ්පාදන වැඩපිළිවෙළ අනුව අපට පුළුවන් වෙනවා තව වර්ෂ කිහිපයකදී මේ රට සහලින් ස්වයංපෝෂිත කිරීමට. අපි කල්පනා කළ යුතුව තිබෙනවා, එසේ රට සහලින් ස්වයංපෝෂිත වූවාට පසුව අපි මේ නිපදවන සහල්වලට කරන්නේ මොකක්ද කියන එක ගැන. මේ සහල්වලින් අපි නිසි ප්‍රයෝජන ගන්නට නම්, ඒවා නියම අන්දමට සකස් කොට පිටරට යැවීමට කටයුතු කළ යුතුයි. මෙන්න මේ කාරණය ගැන අපේ රජය විශේෂයෙන්ම කල්පනාකර ඒ සම්බන්ධයෙන් සාර්ථක පිළියමක් යෙදීමට කටයුතු කරාවිය කියා මම බලාපොරොත්තු වෙනවා.

මම හිතනවා මට කතා කිරීමට නියමිත කාලය දැන් අවසන් වේගන යනවා කියා. නමුත් තව කරුණු රාශියක් මට ඉදිරිපත් කිරීමට තිබෙනවා. අද රට ඉතාමත්ම භයානක තත්ත්වයකට මුහුණ පා තිබෙනවා. රටේ ආරක්ෂාව සඳහාත් විශාල මුදලක් වැය කිරීමට සිදුවී තිබෙනවා. එවැනි අවස්ථාවක මීට වඩා මහජනතාවට විශාල කරදරකාරී අයවැය ලේඛනයක් ගරු මුදල් ඇමතිතුමා විසින් ඉදිරිපත් කරාවි යයි විරුද්ධ පක්ෂයේ අයත්, මේ රජයට විරුද්ධ ජනතාවත් බලාගෙන සිටියා. එසේ නොකර, මහජනතාවට ඒ තරම් කරදරකාරී තත්ත්වයක් ඇති නොවන අන්දමට, මේ රටේ ස්වෛරීභාවය සහ ස්වාධීනත්වය ආරක්ෂා කර ගැනීමට හැකිවන පරිද්දෙන්, මේ රටේ ආරක්ෂාවටත් මුදල් යොදවමින්, මෙවැනි අයවැය ලේඛනයක් ඉදිරිපත් කිරීම ගැන ගරු මුදල් ඇමතිතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිශ්ශබ්ද වෙනවා.

අ. භා. 4. 34

ආරියරත්න ජයතිලක මහතා (ගම්පහ දිසා ඇමතිතුමා)
(திரு. ஆரியரத்ன ஜயதிலக்க — கம்பஹ மாவட்ட அமைச்சர்)
(Mr. Ariyaratne Jayatillake – District Minister, Gampaha)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම පළමුවෙන්ම කැමතියි, ගරු බද්දේගම මන්ත්‍රීතුමා (අමරසිරි දොඩන්ගොඩ මහතා) ප්‍රකාශ කළ කරුණු කිහිපයක් ගැන අදහස් දැක්වීමට. මම ඒ කතාව අසාගෙන සිටියා. මට පෙනුනු විධියට ඒක අඩියක් නැති ළිඳින් එකකට වතුර වක් කරන්න ගත් උත්සාහයක් වාගෙයි. එහෙමයි මට සිතුනේ.

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)
අඩි ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආරියරත්න ජයතිලක මහතා**
**(திரு. ஆரியரத்ன ஜயதிலக்க)**
**(Mr. Ariyaratne Jayatillake)**

ඒ "අඩි" නෙමෙයි. "බොටම්" කියන එකයි. මම හිතන්නේ නමුන්නාන්සේට පුරුද්දට වෙන්න ඇති ඒකම මතක් වුනේ. මම අදහස් කලේ විත්වල තිබෙන අඩි ගැනයි.

එතුමා සදහන් කලා අයවැය ක්‍රමය ඈත අතීතයේ ක්‍රියාත්මක වූ ක්‍රමයක් නොවේය කියා. මේක ඊයේ පෙරේද හඳුන්වා දුන් ක්‍රමයක් ලෙසයි එතුමා කිව්වේ. මම අදහස් කරන්නේ අයවැය කියන එක, ඒ තුළින් රටට සේවයක් කරනවා කියන එක, මහජනයාට සේවයක් කරනවා කියන එක, රජවරුන් රජකම් කල කාලවලත් පැවතුණු බව පෙන්නුම් කිරීමටයි.

බුද්ධදාස රජතුමාගේ රාජ්‍ය කාලයේදී සෞඛ්‍ය සේවය ඉතාමත්ම හොඳ තත්ත්වයකින් පවත්වා ගෙන ගිය බව මහාවංශ කතාවෙන් අපි කියවලා තිබෙනවා. ඒ සඳහා මුදල් වියදම් කලේ රාජ්‍ය භාණ්ඩාගාරයෙන්. ලංකාවේ එහෙම තත්ත්වයකුයි තිබුණේ. එංගලන්ත ඉතිහාසය ගැන සළකා බලන විට අපට පෙනෙනවා 1 වැනි ජෝර්ජ් රජුගේ රාජ්‍ය කාලයේදී අයවැය ක්‍රමය මුලින්ම ඇති වූ බව. වෝල්පෝල් අගමැතිතුමාගේ කාලයේදී හොඳ අයවැය ක්‍රමයක් පැවතුණු බවත්, ඒ කාලයේ රාජ්‍ය සභාවේදි සාකච්ඡා කර රටේ දියුණුව සඳහා මුදල් වැය කළ බවත් පෙනී යනවා. ඒ නිසා පාර්ලිමේන්තු ක්‍රමය අනුව අයවැය ඉදිරිපත් කිරීම ඉතිහාසයේ තිබුණේ නැහැයි එතුමා කිව්වේ මොන අදහසක් ඇතිවදැයි මට නම් හිතා ගන්න බැහැ. එයින්ම මට වැටහෙනවා බද්දේගම ගරු මන්ත්‍රීතුමා (අමරසිරි දොඩන්ගොඩ මහතා) මොනවා හෝ කියන්නට ඕනෑ නිසා අදහසක් ප්‍රකාශ කලා මිස හරයක් ඇතිව තර්කානුකූල අදහසක් ප්‍රකාශ කලේ නැත කියා.

තවත් අන්‍යෝන්‍ය ප්‍රතිවිරුද්ධ අදහස් දෙකකුත් එතුමා ප්‍රකාශ කලා. මේ රජයේ ආර්ථික ප්‍රතිපත්ති හා රාජ්‍යෝපාය ප්‍රතිපත්ති සම්බන්ධව. ආර්ථික ප්‍රතිපත්ති සකස් කරගෙන ඇවිත් යම්කිසි වැඩ කොටසක් කරගෙන යන විට රාජ්‍යෝපාය ප්‍රතිපත්තිවල යම්කිසි දුර්වලකමක් නිසා අද රට බංකොලොත් තත්ත්වයට පත්වී තිබෙනවා යයි එතුමා ප්‍රකාශ කලා. නමුත් ආර්ථික ප්‍රතිපත්තිවල ක්‍රියාත්මකත්වයේදීත් රාජ්‍යෝපාය ප්‍රතිපත්තිවල ක්‍රියාත්මකත්වයේදීත් අන්‍යෝන්‍ය වශයෙන් මේ දෙක එකට ගැලපී බංකොලොත් භාවයක් ඇති වන්නේ කොහොමද ? රාජ්‍යෝපාය ප්‍රතිපත්තිවල වරද වශයෙන් එතුමා පෙන්නුම් කලේ මේ ත්‍රස්තවාදය වැනි බලාපොරොත්තු නොවූ යම් යම් කරදරකාරී තත්ත්වයන් මේ රටේ ඇතිවීමයි. නමුත් අපේ ආර්ථික ප්‍රතිපත්තිය ගරු මුදල් ඇමතිතුමා 1977 සිටම සකස් කරගෙන ගියේ මේ යුගයේදී මෙවැනි ත්‍රස්තවාදී කලබලයක් ඇතිවෙයි කියන බලාපොරොත්තුවෙන් නොවෙයි. ඒ නිසා එතුමා මොන එකක් හිතාගෙන රාජ්‍යෝපාය ප්‍රතිපත්තියේ බංකොලොත් භාවය නිසා යයි කියන අදහස අපට ඉදිරිපත් කලාද කියා මට නම් හිතාගන්න බැහැ. ඇත්ත වශයෙන්ම ඇතිවී තිබෙන්නේ රාජ්‍යෝපායවල බංකොලොත් භාවයක් නොවෙයි. ත්‍රස්තවාදී ව්‍යාපාරය ඇතිවූ අවස්ථාවේ මේ රටේ ඇතිවුණු කවුරුවත් බලාපොරොත්තු නොවූ තත්ත්වයයි. කොයි වැඩ පිළිවෙලක් කරගෙන යන විටත් බලාපොරොත්තු නොවූ යම් යම් බාධක ඇති වෙනවා. රාජ්‍ය තන්ත්‍රයක් කරගෙන යන විටත් බලාපොරොත්තු නොවූ දේවල් ඇති වෙනවා. ස්වාභාවික කරදර ඇති වෙනවා. ඊයේ පෙරේද දකුණු ඇමෙරිකාවේ එක්තරා රටක විශාල ගිනි කන්දක් පුපුරා බලාපොරොත්තු නොවූ කරදරයක් ඇති වුණා. එවැනි දෙයක් ඇතිවූ විට අපි අනුගමනය කළ ආර්ථික ප්‍රතිපත්තියේ වරදක් පෙන්වාදී එය ඒකට ගලපන්නට හදනවා නම් එය තර්කානුකූල දෙයක් නොවන බවයි, මට පෙනෙන්නේ. අපි අනුගමනය කළ ආර්ථික ප්‍රතිපත්තිය නිසා මේ ත්‍රස්තවාදය ඇති වුණා යයි එතුමා කියනවා නම් එහි තර්කානුකූල ස්වභාවයක් තිබෙනවා. නමුත් මේ කලේ කිසිම තර්කයක් නැති කථාවක් හැටියට මම එතුමාගේ කථාව හඳුන්වා දෙන්නට කැමතියි.

එතුමා තවත් අසාධාරණ කථාවක් කිව්වා. මේ රජය වැඩ කරගෙන යන අවස්ථාවේදී ජනතාව අතර සම්පත් සමානව බෙදී යන ආකාරයට, ජනතාවට බර පැටවීම සමානව බෙදී යන ආකාරයට, ක්‍රියා කර නැතැයි කිව්වා. ඒ සම්බන්ධයෙන් එතුමා අධ්‍යාපන ප්‍රතිපත්තිය පෙන්නුම් කලා. කොළඹ තිබෙන විද්‍යාලවලට විශාල මුදලක් වැය කරනවා යැයිද ගම්බද විද්‍යාලවලට ඒ තරම් මුදලක් වැය කරන්නේ නැතැයිද කිව්වා. නමුත් මේ රජයෙන් පොදු ජනතාවගේ යහපත සඳහා කරගෙන යන වැඩ කටයුතු පිළිබඳව පොට්ට ඇස යොමු කර එක පැත්තක් පමණක් ගැන එතුමා කථා කරන බවක් මට පෙනී ගියා. කෝටි ගණන් වියදම් කර නොයෙක් වාරිමාර්ග ක්‍රම, කෝටි ගණන් වියදම් කර විදුලිබල පහසුකම්, කෝටි ගණන් වියදම් කර මහාමාර්ග පහසුකම් ආදී දේවල් කරන්නේ කාගේ ප්‍රයෝජනයටද කියන එක එතුමා පෙන්නුම් කලේ නැහැ. ඇත්ත වශයෙන්ම මුළු මහවැලි ව්‍යාපාරයම යොමුවී තිබෙන්නේ සුළු ජනතාවගේ නැත්නම් පොදු ජනතාවගේ එහෙමත් නැත්නම් දුප්පත් ජනතාවගේ සුභසිද්ධිය පිණිසයි. ජනතාව දුප්පත්කමින් ගොඩගෙන නැතිබැරිකමින් තොර ජනතාවක් කරන්නයි, එසේ වියපැහැදම් කරන්නේ. අධ්‍යාපනය ගැන පමණක් කරුණු ඉදිරිපත් කර රජයට දොස් පවරන්නට නැත් කරනවා නම් එය වැරදියි ; ද්වේශසහගතයි. විවේචනය කිරීම පමණක්ම පදනම් කරගෙන කළ කථාවක් හැටියටයි, මට නම් එතුමාගේ කථාව පෙන්නුම් කරන්නට සිදු වී තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එතුමා කියන පිළිවෙලට පසුගිය රජය පැවති කාලයේ අධ්‍යාපන කටයුතු ගෙන ගියේ රටේ හැම තැනකම අධ්‍යාපනය අතින් සමාන තත්ත්වයක් ඇති කිරීමටයි. සමාන තත්ත්වයක් ඇති කිරීමටය කියන්නේ අධ්‍යාපන තත්ත්වය පහත මට්ටමකට හෙළීමෙන් මිස ඉහළ මට්ටමකට ගෙන ඒමෙන් නොවෙයි. නමුත් එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩු පැවති කාලයේදී මේ රටේ පිටිසරබද පළාත්වල දරුවන්ට පවා ඉංගිරිසි අධ්‍යාපනය සම සමව බෙදා දුන්නා. මා ගුරුවරයකු වශයෙන් සේවය කර ඇති නිසා ඒ තත්ත්වය ගැන හොඳින්ම දන්නවා. එසේ අධ්‍යාපනය ලැබූ දරුවෝ අද ඉතාම උසස් තැන්වල සේවය කරනවා. නමුත් පසුගිය රජයෙන් කලේ මොකක්ද ? ඉංගිරිසි අධ්‍යාපනය සම්පූර්ණයෙන්ම නතර කලා. ඉංගිරිසි අධ්‍යාපනය සීමා වුණේ කොළඹ වැනි ප්‍රදේශ කීපයකට පමණයි. ඉහළ පන්තියේ පවුල් කීපයකට පමණක් ඉංගිරිසි අධ්‍යාපනය ලබා ගන්නට පුළුවන් තත්ත්වයක් ඇති කලා. එහි විපාක අද මුළු රටටම විඳිමට සිදු වී තිබෙනවා. කෙසේ වුණත් අපේ රජයෙන් මේ රටේ සාමාන්‍ය ජනතාවට සේවයක් කරන්නේ නැත කියා අධ්‍යාපනය ගැන පමණක් කථා කර පෙන්වා දීමට උත්සාහ කරනවා නම් ඒක බලවත් වරදක්. ඇත්තෙන්ම, මා මුලින් කිව්වා වාගේ දැනට ක්‍රියාත්මක කර ගෙන යන වාරි මාර්ග යෝජනා ක්‍රම හැම දෙයක්ම ඇති කර තිබෙන්නේ පොදු ජනතාවගේ යහපත පිණිස බව අප අමතක කරන්නට නරකයි.

අපේ මැතිවරණ කොට්ඨාශයට මෙන්ම අනුරාධපුර, පොලොන්නරුව වැනි මැතිවරණ කොට්ඨාශවලටත් රුපියල් ලක්ෂ ගණන්, කෝටි ගණන් වියදම් කර විදුලි බලය ලබා දී තිබෙන්නේ ධනපතීන්ගේ ප්‍රයෝජනය පිණිස නොව, ඒ ගම්වල ජීවත්වන සාමාන්‍ය ජනතාවගේ ප්‍රයෝජනය පිණිසයි. එම නිසා, බද්දේගම ගරු මන්ත්‍රීතුමා (අමරසිරි දොඩන්ගොඩ මහතා) කළ කථාව, බුද්ධිමත් හෝ සාධාරණ හෝ කථාවක් නොව, පක්ෂග්‍රාහීව, මොනවාහරි විවේචනයක් කරන්න ඕනෑ නිසා විවේචනය ගැනම සලකා ගෙන කරන ලද කථාවක් හැටියට පෙන්වා දෙන්නට කැමතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රජයේ බදු සහනවලින් සෙත සැලසෙන්නේ දේපල ඇති අයට පමණයි. ශ්‍රමය කැප කරන අයට සෙතක් සැලසෙන්නේ නැත කියා එතුමා විවේචනයක යෙදුණා. ඇත්තවශයෙන්ම දේශපාලන න්‍යාය ධර්මය අනුව බලනවා නම්, ආණ්ඩුක්‍රම ප්‍රතිපත්ති අනුව බලනවා නම්, අවංකව කියනවා නම්, එතුමාගේ කීමට අප ගරු කරනවා. නමුත් එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්තිය වන්නේ මේ රටේ දුප්පත්කම බෙදා හැරීම නොව පොහොසත්කම බෙදා හැරීම බව කියන්න ඕනෑ. රොබින් හුඩ් කියන පුද්ගලයා පිළිබඳ කථාවල ඇති අන්දමට කිසියම් ක්‍රමයකින් ධනය නිපදවන්නන් නැති නොකර ධනය නිපදවන්නාගේ ධනය ලබා ගෙන සුළු මිනිහා නංවාලීමයි මේ රජයේ ප්‍රතිපත්තිය. එසේ කිරීම මිස හැම කෙනෙක්ම දුප්පත් තත්ත්වයට පත් කර දුප්පත්කම සමව බෙදා හැරීම නොවන බවත් මතක් කර දෙන්න ඕනෑ. තවදුරටත් පැහැදිලි කරනවා නම්, සුළු මිනිහාත් පොහොසත් මිනිසකු කර — ලක්ෂපතියකු නොකළත් — ඕනෑ එපාකම්වලින් දුක් විඳින්නේ නැති, පීඩා විඳින්නේ නැති, කන්නට-බොන්නට ඇති, ඇඳුම්-පැලඳුම් තිබෙන, නිවහනක් ඇති තත්ත්වයකට පත් කිරීම, පොහොසත්කම හැම දෙනා අතර බෙදා හැරීම එක්සත් ජාතික පක්ෂ රජයේ අරමුණයි. එම නිසා මුදල් ඇමතිතුමාගේ මේ බදු ප්‍රතිපත්තිවලින් ද අදහස් කර තිබෙන්නේ, ධනය නිපදවන්නට පුළුවන් පන්තියට පවා, පුළුවන් තරම් ධනය නිපදවන්නට අවකාශ සලසාදී එම පන්තිය කිසියම් තත්ත්වයකට පත් වුණාට පසු ඒ අනුසාරයෙන්, එම තත්ත්වය උපයෝගී කර ගෙන, ජනතාව තව තවත් උසස් මට්ටමකට නංවාලීමයි. ඒ සඳහායි යම් යම් බදු පහසුකම් සලසා දී තිබෙන්නේ.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**රිචඩ් පතිරණ මහතා**
(திரு. றிச்சட் பத்திரன)
**(Mr. Richard Pathirana)**

මට පෙනෙන හැටියට නම් ගරු මුදල් ඇමතිතුමා එහෙම දෙයක් කියා නැහැ.

**ආරියරත්න ජයතිලක මහතා**
(திரு. ஆரியரத்ன ஜயதிலக்க)
**(Mr. Ariyaratne Jayatillake)**

ඉදිරිපත් කර ඇති යෝජනා සැලකිල්ලෙන් විග්‍රහ කර බලනවා නම් ඒ අන්දමේ නිගමනවලට බැස ගන්නට පුළුවනි. අර අන්ධයන් අලියා දිහා බැලුවා වාගේ යමක් දිහා තමන් බලන ආකාරටයි පෙනෙන්නේ. මන්ත්‍රීතුමාට ඕනෑ නම් අලියාගේ කථාව පසුව කියා දෙන්නම්. කාලවේලා නැති නිසා දැන් නම් කියන්නට බැහැ.

**රිචඩ් පතිරණ මහතා**
(திரு. றிச்சட் பத்திரன)
**(Mr. Richard Pathirana)**

මුදල් ඇමතිතුමා ඔබතුමා කියන කථාව කියා ඇති බවක් මට නම් පෙනෙන්නේ නැහැ.

**ආරියරත්න ජයතිලක මහතා**
(திரு. ஆரியரத்ன ஜயதிலக்க)
**(Mr. Ariyaratne Jayatillake)**

ඒකත් අර කිරිවල පාට ඇසුවා වාගේ දෙයක්. මේවා ගැන විස්තර කර දෙන්නට මට කාලයක් නැහැ. ගරු මුදල් ඇමතිතුමා වචනයෙන් නොකීව්වාට, 1977 සිට එතුමාගේ ප්‍රතිපත්තිය වුණේ, සෑම කෙනෙක්ම යමක් ඇති පුද්ගලයකු කිරීම මිස යමක් නැති පුද්ගලයකු කිරීම නොවෙයි.

**රිචඩ් පතිරණ මහතා**
(திரு. றிச்சட் பத்திரன)
**(Mr. Richard Pathirana)**

කලින් නම් කිව්වේ ඔක නොවෙයි.

**ආරියරත්න ජයතිලක මහතා**
(திரு. ஆரியரத்ன ஜயதிலக்க)
**(Mr. Ariyaratne Jayatillake)**

ඒ තමුන්නාන්සේට තේරුම් ගිය හැටි වෙන්නට ඇති. ධනය රැස් කර ගන්නට පුළුවන් උදවියට ධනය රැස් කර ගැනීමට ඉඩ හැර, ඒ උදවියගෙන් බදු අරගෙන ඒ ධනය සුළු මිනිසුන් අතර බෙද හරින පිළිවෙලක් ඇති කිරීමයි මෙහි අරමුණ.

**අනිල් මූණසිංහ මහතා (මතුගම)**
(திரு. அனில் முனசிங்ஹ — மத்துகம)
**(Mr. Anil Moonesinghe – Matugama)**

ඒ අයගේ බදු අඩුවෙලා තිබෙනවා.

**ආරියරත්න ජයතිලක මහතා**
(திரு. ஆரியரத்ன ஜயதிலக்க)
**(Mr. Ariyaratne Jayatillake)**

පෞද්ගලික ව්‍යාපාරිකයන් වැඩි වැඩියෙන් ඇති කිරීම පිණිස මේ අවස්ථාවේ හැටියට බදු අඩු කිරීමේ අවශ්‍යතාවක් අප දකිනවා. පුද්ගලික ව්‍යාපාරයන් සාර්ථක අන්දමින් කෙරීගෙන ගියොත් මේ රට දියුණු කර ගැනීමට පුළුවන්ය කියන ප්‍රතිපත්තිය අපේ මේ රජය පිළිගෙන තිබෙනවා. එය නැහැයි කියන්නේ නැහැ.

**අනිල් මූණසිංහ මහතා**
(திரு. அனில் முனசிங்ஹ)
**(Mr. Anil Moonesinghe)**

සමාජවාදය නොවෙයි ?

**ආරියරත්න ජයතිලක මහතා**
(திரு. ஆரியரத்ன ஜயதிலக்க)
**(Mr. Ariyaratne Jayatillake)**

සමාජවාදී ප්‍රතිපත්ති අපි අහක දමා නැහැ. ගොවි කර්මාන්තය තුළින් පොදු ජනතාවට පුළුවන් තරම් සහනයන් ලබා දෙන්නටත්, ඒ පොදු ජනතාවගේ කර්මාන්ත කර ගෙන යන්නටත් මේ රජයෙන් උත්සාහයක් ගෙන යන්නේ සමාජවාදී අදහස් සාක්ෂාත් කර ගන්නට තමයි.

**අනිල් මූණසිංහ මහතා**
(திரு. அனில் முனசிங்ஹ)
**(Mr. Anil Moonesinghe)**

ගරු දිසා ඇමතිතුමනි, මගේ දැන ගැනීම සඳහා මම ප්‍රශ්නයක් අහන්නට කැමතියි. තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්තිය ධනපතියන් වැඩි වැඩියෙන් ඇති කිරීමෙන් සමාජවාදයට යාමද ?

**ආරියරත්න ජයතිලක මහතා**
(திரு. ஆரியரத்ன ஜயதிலக்க)
**(Mr. Ariyaratne Jayatillake)**

ධනපතියන් වැඩියෙන් ඇති කිරීමක් නොවෙයි. මේ රටේ සෑම පුරවැසියෙක්ම නැතිබැරිකමින් තොර පුරවැසියෙක් බිහි කිරීමයි මේ රජයේ ප්‍රතිපත්තිය. තිබෙන දේපොළ කඩාවඩාගෙන බෙදා දීමක් නොවෙයි, සෑම කෙනෙක්ම යම්කිසි දෙයක් තිබෙන කෙනෙක් බවට පත් කිරීමයි මේ රජයේ ප්‍රතිපත්තිය.

**රිචඩ් පතිරණ මහතා**
(திரு. றிச்சட் பத்திரன)
**(Mr. Richard Pathirana)**

තමුන්නාන්සේ කලින් කිව්වේ පළමුවෙන් කොටසක් ධනපතියන් කර, ඒ අනුසාරයෙන් අනික් අය නගා සිටුවනවාය කියලයි.

**ආරියරත්න ජයතිලක මහතා**
(திரு. ஆரியரத்ன ஜயதிலக்க)
**(Mr. Ariyaratne Jayatillake)**

ධනපතියන් නැති කිරීම මේ රජයේ ප්‍රතිපත්තිය නොවෙයි. ස්වාධීනව ස්වෛරීව යම්කිසි වෘත්තියක හෝ කර්මාන්තයක නියුක්ත වන පුද්ගලයෙකුට සෑම අන්දමකින්ම අනුහිත දීමයි මේ රජයේ ප්‍රතිපත්තිය.

**අනිල් මූණසිංහ මහතා**
(திரு. அனில் முனசிங்ஹ)
**(Mr. Anil Moonesinghe)**

පොහොසත් වෙන්න.

**ආරියරත්න ජයතිලක මහතා**
(திரு. ஆரியரத்ன ஜயதிலக்க)
**(Mr. Ariyaratne Jayatillake)**

ඒකට අපේ කිසිම තහනමක් නැහැ. බදු ක්‍රමය තුළින් මුදල් තිබෙන තැන්වලින් මුදල් හොයා ගන්නය කියා බද්දේගම ගරු මන්ත්‍රීතුමා (අමරසිරි දොඩන්ගොඩ මහතා) යම්කිසි චෝදනාවක් ඉදිරිපත් කළා. මීට ඉහත කාලයකදී තමුන්නාන්සේලාගේ පැත්තේ සිටි ඉතාම දක්ෂ මුදල් ඇමතිවරයෙක් " demonetization " ක්‍රමය යටතේ මුදල් තිබෙන තැන්වලින් මුදල් සොයන්නට ගොස් තිබුණු මුදල් ටිකත් නැති වූ අන්දම මතකද ? ආචාර්ය එන්. එම්. පෙරේරා ගරු මුදල් ඇමතිතුමාගේ කාලයේදී ඒක සිදු වූ බව පමණක් මම මේ අවස්ථාවේදී තමුන්නාන්සේලාට සිහි ගන්වන්නට කැමතියි.

**අනිල් මූණසිංහ මහතා**
(திரு. அனில் முனசிங்ஹ)
**(Mr. Anil Moonesinghe)**

එහෙම වුණේ නැහැ.

**ආරියරත්න ජයතිලක මහතා**
(திரு. ஆரியரத்ன ஜயதிலக்க)
**(Mr. Ariyaratne Jayatillake)**

ඒකෙන් අසාර්ථකත්වයක් ඇති වුණා මිස සාර්ථකත්වයක් ඇති වූ බවක් අපට පෙනෙන්නේ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**අනිල් මූණසිංහ මහතා**
**(திரு. அனில் முனசிங்ஹ)**
**(Mr. Anil Moonesinghe)**

නැහැ ! ඒක අසාර්ථක වුණේ නැහැ.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

" බ්ලැක් මනි " එළියට ආවා.

**ආරියරත්න ජයතිලක මහතා**
**(திரு. ஆரியரத்ன ஜயதிலக்க)**
**(Mr. Ariyaratne Jayatillake)**

" බ්ලැක් මනි " එළියට ආවේ නැහැ ගරු මන්ත්‍රීතුමනි. රටේ ආයෝජනය සම්පූර්ණයෙන්ම පිරිහෙන තත්ත්වයකට පත් වුණා.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

මේ සැරේ ෆිනෑන්ස් කොම්පැණිවලට අත තැබුවෙත් " බ්ලැක් මනි " එළියට ගන්නයි. බොහොම හරි.

**ආරියරත්න ජයතිලක මහතා**
**(திரு. ஆரியரத்ன ஜயதிலக்க)**
**(Mr. Ariyaratne Jayatillake)**

බද්දේගම ගරු මන්ත්‍රීතුමා (අමරසිරි දොඩන්ගොඩ මහතා) අවසාන වශයෙන් දේශී කර්මාන්ත ගැන සඳහන් කරමින් ආරක්ෂණය සම්බන්ධව තර්කයක් ඉදිරිපත් කලා. එතුමා සංස්ථා කීපයක් ගැන පමණක් කථා කර ඒ තර්කය සනාථ කරන්න උත්සාහ කලා. නමුත් සාර්ථක අන්දමින් මේ රටේ ව්‍යාපාර ගෙන යන කර්මාන්තවලට විදේශීය තර්ජන තිබුණත් ඒවා කරගෙන යන්නට පුළුවන් බව එතුමා පෙන්නුම් කලේ නැහැ. නිදර්ශනයක් වශයෙන් මම කඩදසි සංස්ථාවේ වැඩ කටයුතු පෙන්නුම් කරන්නට කැමතියි. අද මේ රටට කොයි තරම් විදේශීය කඩදසි ගෙන්වූවත් කඩදසි සංස්ථාවේ නිෂ්පාදන හරියාකාර බෙද හරින්නට පුළුවන් වී තිබෙනවා. ඒ නිෂ්පාදන සම්බන්ධයෙන් ලොකු ඉල්ලීමක් තිබෙනවා. ඒකේ රහස උසස් වර්ගයේ කඩදසි නිර්මාණය කර, නිෂ්පාදනය කර දේශීය කර්මාන්තය යථා තත්ත්වයට පත් කර පිටරටින් ගෙන්වන භාණ්ඩ සමඟ තරඟකාරී වෙළඳ පොළකට ඇතුලත් වෙන්න පුළුවන්කම තිබීමයි. ඒ විධියේ සංස්ථාත් තිබෙනවා. ඒ නිසා සංස්ථාවක් දෙකක් කරන වැරදි නිසා, ඒ සංස්ථාවල දුර්වලකම් නිසා මේ විධියේ තර්කයක් ඉදිරිපත් කිරීම සුදුසු නැහැයි කියන එක මගේ කල්පනාවයි. බද්දේගම ගරු මන්ත්‍රීතුමාගේ (අමරසිරි දොඩන්ගොඩ මහතා) තර්කවලට පිළිතුරු වශයෙන් මා කියන්නට යන්නේ එපමණයි. අපි බලාපොරොත්තු නොවූ විශාල ප්‍රශ්නයකට මුහුණ 'දෙමින්, ඉතා අමාරු තත්ත්වයක හිදගෙන ගරු මුදල් ඇමතිතුමා මේ වර්ෂයේදී සාර්ථක අයවැයක් ඉදිරිපත් කළ බව මේ අයවැය ලේඛනය දෙස බලන කල අපට පෙනී යනවා.

ඇත්ත වශයෙන්ම මේ රටේ මහජනතාව හැම කෙනෙක්ම — මේ රටට ආදරයක් ඇති හැම කෙනෙක්ම — පිළිගන්නවා, මේ ත්‍රස්තවාදී තර්ජනයෙන් මේ රට ගලවා ගැනීම ඉතාමත් අවශ්‍ය දෙයක් බව. ත්‍රස්තවාදී තර්ජනය මේ විධියට තිබෙද්දීත් මහජනයා තුළ පටවන බර පුළුවන් තරම් අඩු කොට —බර පැටවීවේ නැහැ කියා අපට කියන්න බැහැ — මහජනයාට වන හිරිහැර පුළුවන් තරම් දුරට අඩු කොට මේ අයවැය ලේඛනය සකස් කිරීම ගැන අප ගරු මුදල් ඇමතිතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑය කියා මා ප්‍රකාශ කරනවා.

අපට මතකයි මීට ඉහත, බණ්ඩාරනායක අගමැතිනියගේ ආණ්ඩුව තිබුණු කාලයේදී 1971 කාලයේදී ඇති වුණු තර්ජනය. එය මෙවැනි තර්ජනයක් නොවෙයි, ඉතාම සුළු තර්ජනයක්. ඒ තර්ජනයට මුහුණපෑම ඒ ආණ්ඩුවට ලොකු බරක් වුණා. අද තිබෙන තර්ජනය හා සංසන්දනය කර බලනවා නම් එය එතරම් ලොකු තර්ජනයක් නොවෙයි. නමුත් එහෙම අවස්ථාවකදීත් ඒ රජයට රටේ පාලනය ගෙන යන්න ඉතාම අමාරු තත්ත්වයක් ඇති වුණා. නමුත් ඒ වාගේ දහ දොළොස් ගුණයක් විශාල, අන්තර් ජාතික සහයෝගිතාවයකින් කරගෙන යන ත්‍රස්තවාදී ව්‍යාපාරයකට මුහුණ දෙන්න තරම් ශක්තියක් මේ ආණ්ඩුවට ගොඩ නඟා ගන්න පුළුවන් වුණේ මම හිතන හැටියට ගරු මුදල් ඇමතිතුමා මෙතෙක් කාලයක් කරගෙන ගිය මේ මුදල් ආයෝජනවල සාර්ථකත්වය නිසාය කියා කියන්න පුළුවන්.

එතුමා, මේ රටේ පිට කොන්ද හැටියට ගැනෙන ගොවි ජනතාවගේ යහපතට විශ්‍රාම වැටුපක් — එය විශ්‍රාම වැටුපක් කියා හැඳින් වුවත්, වෙනත් වචනයකින් හැඳින් වුවත් කමක් නැහැ — දීමට යෝජනා කලේ මේ රටේ ගොවි ජනතාවට සේවයක් කිරීමේ අදහසිනුයි. මේ අදහස අප බොහෝ කාලයක් තිස්සේ කරමින් සිටි ප්‍රාර්ථනයක් ඉෂ්ටවීමේ ලකුණක් හැටියට මට පෙනෙනවා. ගොවි ජනතාව පමණක් නොවෙයි ඊට අමතරව මේ රටේ සිටින දේපොළක් නැති, ස්ථිර වැටුපක් නොලබන, කුලී වැඩ කර ජීවත්වන ඉතාම අහිංසක ජනතාව ගැනත් මා යමක් කිව යුතුයි. මා හිතන හැටියට ගොවි ජනතාවටත් වඩා දිළිඳු තත්ත්වයකිනුයි කුලී වැඩකර ජීවත්වන ජනතාව අද ජීවත් වන්නේ. ඒ ජනතාවටත් මහළු වයසට පත් වුණාම —වැඩපළ කර ගන්න බැරි තත්ත්වයකට පත් වුණාම — යැපෙන ක්‍රමයක්, ආදායමක් ලැබෙන ක්‍රමයක් සලස්වා දීමට එතුමා කල්පනා කරනවා නම් එය මේ රටේ ජනතාවට කරන තවත් විශිෂ්ඨ සේවයක් වන බව මතක් කර දෙන්න කැමතියි.

පොල් නිපදවන පලාතක ජීවත්වන අපට පොල් සම්බන්ධයෙන් කථා නොකරම බැහැ. කපාපු පොල් හා ආහාරයට ගන්නා කොප්පරා මෙට්‍රික් ටොන් එකක අපනයන බද්ද රුපියල් 2,500කින් අඩු කිරීම ගැන මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. පොල් නිපදවන්නන් අද ඉතාම බැරෑරුම් අපහසු තත්ත්වයකටයි පත් වී ඉන්නේ. රුපියල් 1,500කට, 2,000කට පොල් දහක් විකුණා ගන්න තිබුණා නම් සුළු පොල් වතු හිමියන්ට යම්කිසි සහනයක් සලස්වා ගන්න ඉඩ තිබුණා. නමුත් අද තත්ත්වය අනුව පොල්දහක මිල රුපියල් හත්සියයට — අට සියයට පමණ බැස තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වැඩිපුර පොල් ඉඩම් තිබෙන පුද්ගලයන්ට මේ තත්ත්වය තරමක් දුරටවත් ඔරොත්තු දෙන්න පුළුවන් වුණත්, අක්කර දෙක, තුන, හතර, පහ ආදී වශයෙන් තිබෙන සුළු පොල් වතු හිමියන් අද ඉතාමත් බැරෑරුම් තත්ත්වයකටයි පත්වී තිබෙන්නේ. ගරලෑ මුදල් ඇමතිතුමා රුපියල් 2,500කින් අපනයන බද්ද අඩු කිරීමෙන් අදහස් කර තිබෙන්නේ එමගින් සුළු පොල්වතු හිමියන්ටත් යම් තරමක සහනයක් ලබාදීමටයි. ඒ ගැන අප එතුමාට ස්තුතිවන්ත වෙනවා. එතුමා මේ ගත් පියවරෙන් සුළු පොල්වතු හිමියන්ට සහනයක් ලැබේවි යයි අප බලාපොරොත්තු වෙනවා.

ඒවගේම පොල් ගෙඩි 1,000ක මිළ රු. 1,500ට යන තත්ත්වය ගැනත් විමසිලිමත්ව සිට සුළු පොල් වතු හිමියන්ට උපකාර කරන මෙන් මා නමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා. අවසාන වශයෙන් මා තවත් කාරණයක් කියන්නට ඕනෑ. අපි මේ කොයි වැඩය කළත්, මොන අන්දමින් සංවර්ධන වැඩපිළිවෙලවල් කරගෙන ගියත්, කොයි ආණ්ඩුවක් මේ රටේ බලයට පත් වුණත් මේ රටේ ත්‍රස්තවාදය තිබෙන තාක් කල් ඒ කිසි එකකින් ප්‍රයෝජනයක් අත්පත් වන්නේ නැහැ. එම නිසා අංක එකේ ප්‍රමුඛතාවය දී ත්‍රස්තවාදය මේ රටින් තුරන් කර ලීම අවශ්‍ය වී තිබෙනවා. ත්‍රස්තවාදය තුරන් කර ලීමට මේ රටේ ඒකීය භාවය ප්‍රාර්ථනා කරන, නිදහස අගය කරන සැම ජන කොටසක්ම සහයෝගය දිය යුතුයි. දේශපාලන මත භේද උඩ යම් යම් උදවිය පක්ෂ වශයෙන් හෝ පුද්ගලයින් වශයෙන් සලකා ත්‍රස්තවාදය දුරලීමට මේ රජය ගෙන යන උත්සාහයට සෑහෙන පමණ අත හිත දීමක් නොකිරීම ගැන අපි ඉතාම කණගාටු වෙනවා. ලංකාවේ සිංහල ජනතාව පමණක් නොවෙයි, ලංකාවේ ඒකීය භාවයට, ස්වෛරී භාවයට කැමැත්තක් තිබෙන අනෙකුත් වර්ගවල ජනයාගේත් යුතුකමක් තිබෙනවා, මේ තර්ජනයට එරෙහිව රජය ගෙන යන උත්සාහයට සහයෝගය දීමට. විශේෂයෙන් දකුණේ ජීවත්වන ද්‍රවිඩ සහෝදරයින්ගේ යුතුකමක් තිබෙනවා, මේ සඳහා සම්පූර්ණ සහයෝගය දීමට. මේ උදවියගෙන් සහයෝගයක් ලැබෙන්නේම නැහැ කියා මම කියන්නේ නැහැ. නමුත් අපිත් සමඟ ජීවත්වන දකුණේ දෙමළ ජනතාව මේ ගැන මීට වඩා උනන්දු වී මෙම ත්‍රස්තවාදය හෙලා දකින සංවිධාන ඇති කර ගෙන රජයට පක්ෂපාතීව කටයුතු කරන්නේ නම් එය විශිෂ්ට ජාතික සේවයක් හැටියට අපි කල්පනා කරනවා. දකුණේ අප සමඟ ජීවත්වන ද්‍රවිඩ ජනතාව හොඳ සහෝදරත්වයකින් අප සමඟ ජීවත් වන්නේ. ඒ ද්‍රවිඩ ජනතාවට සිංහල ජනතාවගෙන් අනවරයක්, වෙනස්කමක් ඇති වන්නේ නැහැ. ඒ උදවිය අප අතර ඉඳගෙන ඒ උදවියගේ ව්‍යාපාර ඉතා හොඳින් කරගෙන යනවා. රැකීරක්ෂාවන් කරගෙන යනවා. අපේ ආරක්ෂාව සහිතව ජීවත් වෙනවා. එසේ නම් ඒ ඇත්තන්ගේ යුතුකමක් තිබෙනවා, මේ රට බෙදීමට, මේ රටේ ත්‍රස්තවාදය ඇති කිරීමට තැත් කරන ඒ පිරිස අඩු ගණනේ හෙලා දැකීමක් හෝ කිරීමට. මේ රටේ ආර්ථික ජයග්‍රහණයක් ලබා ගන්නට ඕනෑ නම්, අප පළමුවෙන්ම මේ රටේ පවතින ත්‍රස්තවාදය පරදවා ජයග්‍රහණයක් ලබා ගත යුතුයි. ඒ සඳහා දෙමළ සහෝදර ජනතාවගේ සහයෝගය ලැබේවායි මම ප්‍රාර්ථනා කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආරියරත්න ජයතිලක මහතා]

එසේම ගරු මුදල් ඇමතතුමාට ඉදිරියටත් මෙවැනි සාර්ථක, තුලනාත්මක, අවස්ථාවේ හැටියට රටේ දියුණුව සලස්වන්නට පුළුවන් වටිනා අයවැය ඉදිරිපත් කිරීමට තව තවත් වාසනාව ලැබේවායි මම මේ අවස්ථාවේදී සුභ පතනවා.

අ. භා. 5

**සරත්චන්ද්‍ර රාජකරුණා මහතා (නියෝජ්‍ය ආහාර හා සමුපකාර ඇමතිතුමා)**
**(திரு. சரத்சந்திர ராஜகருணா — உணவு, கூட்டுறவுப் பிரதி அமைச்சர்)**
**(Mr. Sarathchandra Rajakaruna – Deputy Minister of Food & Co-operatives)**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රජයේ නව වැනි අයවැය ලේඛනය ඉදිරිපත් වී ඇති මේ අවස්ථාවේදී මටත් වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලබා දීම ගැන මම තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා.

අක්මීමන ගරු මන්ත්‍රීතුමාත් (රිචඩ් පතිරණ මහතා) අත්තනගල්ල ගරු මන්ත්‍රීතුමාත් (ලක්ෂ්මන් ජයකොඩි මහතා) අතර මෙම ගරු සභාවේදී ඇති වුණු සංවාදයක් අහගෙන ඉන්නට මට අවස්ථාව ලැබුණා. මොකක්ද මේ සංවාදය ? කොත්මලේ ව්‍යාපාරය නාය යනවාය කියා පත්‍රයක තිබුණා කියමින් ඒ දෙපොළ එය ප්‍රකාශ කළ ආකාරය ගැන මේ අවස්ථාවේදී මෙම ගරු සභාවට වචනයක් ප්‍රකාශ කිරීම වැදගත් කොට මම සලකනවා. කොත්මලේ ව්‍යාපාරය නාය යනවාය කියන ඒ ප්‍රවෘත්තිය ගැන ඒ ගරු මන්ත්‍රීවරුන් මේ සභාවේ කථා කළ ආකාරයෙන් මට වැටහුණේ එතුමන්ලා මේ ගැන ඉතාමත් සන්තෝෂ වන බවයි.

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
**(Mr. Richard Pathirana)**

කිසිම සන්තෝෂයක් නැහැ.

**සරත්චන්ද්‍ර රාජකරුණා මහතා**
**(திரு. சரத்சந்திர ராஜகருணா)**
**(Mr. Sarathchandra Rajakaruna)**

පොඩ්ඩක් ඉන්න.

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
**(Mr. Richard Pathirana)**

කිසිම සන්තෝෂයක් නැහැ. මේ " ඩේලිනිව්ස් " පත්‍රයේ ඒක තිබෙන්නේ. තමුන්නාන්සේලාගේ පත්‍රයක්. බර කර ගහන්න වෙන්නෙ අපටයි.

**සරත්චන්ද්‍ර රාජකරුණා මහතා**
**(திரு. சரத்சந்திர ராஜகருணா)**
**(Mr. Sarathchandra Rajakaruna)**

උඩ පැන පැන තමුන්නාන්සේලා කිව්වේ—

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

උඩ පනින්න ? අපට උඩ පනින්න දෙයක් නැහැ, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මේ තරම් භයානක විපතක් වෙලා මේ විධියට, වක්‍ර විධියට, හිතනවා නම් මෙතුමාගේ චේතනාව මොකක්ද කියල—

**සරත්චන්ද්‍ර රාජකරුණා මහතා**
**(திரு. சரத்சந்திர ராஜகருணா)**
**(Mr. Sarathchandra Rajakaruna)**

නැහැ, නැහැ, වක්‍ර විධියට නොවෙයි.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

කරුණාකරල එහෙම හිතන්න එපා. අපි සම්පූර්ණයෙන්ම මේකට විරුද්ධයි. අන්තිමට කරදර විඳින්න වෙන්නෙ මුළු රටටමයි.

**සරත්චන්ද්‍ර රාජකරුණා මහතා**
**(திரு. சரத்சந்திர ராஜகருணா)**
**(Mr. Sarathchandra Rajakaruna)**

මම කනගාටු වෙනවා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මේ තරම් පහල තත්ත්වයකට වැටුණ එක ගැන.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

තමුන්නාන්සේගේ හිතීම පහළයි. අපි එහෙම හිතුවය කියන්න.

**සරත්චන්ද්‍ර රාජකරුණා මහතා**
**(திரு. சரத்சந்திர ராஜகருணா)**
**(Mr. Sarathchandra Rajakaruna)**

තමුන්නාන්සේ දන්වත් හිතාගන්න කොත්මලේ ව්‍යාපාරය කියන එක පොදු ව්‍යාපාරයක් බව. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවෙන් මේ ව්‍යාපාරය කළත් මෙය ගරු මුදල් ඇමතිතුමාගේ, නැත්නම් ශ්‍රීමත් ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ පෞද්ගලික මුදල් වැය කරල කරන දෙයක් නොවෙයි. මේ රටේ අහිංසක ජනතාවගේ මුදල් යොදවලයි මේ කටයුත්ත කරල තියෙන්නෙ.

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட். பத்திரன)**
**(Mr. Richard Pathirana)**

රුපියල් දස ලක්ෂ 100ක් නැවත යනවයි කියල පත්තර හැම එකකම තියෙනවා. අපි තමුන්නාන්සේට ඒක පෙන්වන්න ඕනෑ.

**සරත්චන්ද්‍ර රාජකරුණා මහතා**
**(திரு. சரத்சந்திர ராஜகருணா)**
**(Mr. Sarathchandra Rajakaruna)**

තමුන්නාන්සේ වැඩිය හයියෙන් කථා කළාට අපි භය වෙන්නෙ නැහැ. මේ වගේ භයානක තත්ත්වයකට රට වැටිල ඉන්න අවස්ථාවේදී මේ රටේ අහිංසක ජනතාව නොයෙක් විධියෙන් මරණයට පත්වෙන විට, වෙඩි කන විට ඒ ඔක්කොම ගැන තමුන්නාන්සේලා සන්තෝෂ වෙන විත්තිය මට තමුන්නාන්සේලා හැසිරෙන හැටියෙන් ඔප්පු කරන්න පුළුවන්.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

ඒක සම්පූර්ණයෙන්ම වැරදියි. අපි ඉල්ලීමක් කරනවා එහෙම අදහසක් ඇති කරගෙන තිබෙනවා නම් ඒ අදහස හිතින් අස් කරගන්නය කියා.

**සරත්චන්ද්‍ර රාජකරුණා මහතා**
**(திரு. சரத்சந்திர ராஜகருணா)**
**(Mr. Sarathchandra Rajakaruna)**

එක්සත් ජාතික පක්ෂ රජයේ ප්‍රතිපත්තිය එහෙම නොවෙයි. තමුන්නාන්සේලාට මතක ඇති 1971දී තමුන්නාන්සේලා අමාරුවේ වැටුණු අවස්ථාවේදී අපේ පක්ෂය ගෙන ගිය වැඩපිළිවෙළ කොයි ආකාරයද කියන එක. එම නිසා මේ වගේ පොදු දේවල් ගැන කථා කරන විට ඉතාම කල්පනාකාරීව කථා කිරීම ඉතාම වැදගත් කොට සලකන්නය කියා මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලීමක් කරන්න කැමතියි.

ගරු මුදල් ඇමතිතුමා විසින් මේ අයවැය ලේඛනය ඉදිරිපත් කළේ අපේ රට ඉතාම අමාරු තත්ත්වයකට වැටිල තිබෙන අවස්ථාවකයි. මේ වගේ අයවැය ලේඛනයක් මේ වගේ අවස්ථාවක ඉදිරිපත් කරන විට ඕනෑම රටක ගෙනයන වැඩපිළිවෙළක් තිබෙනවා. මේ රටේ තිබෙන සියලුම සම්පත්, ඒ වගේම සියලුම ශක්තීන් යොදවල මේ සටනින් ජය ගන්න ඕනෑ විත්තිය තමුන්නාන්සේලා දන්නවා. ඒ විධියට ඒ සඳහා සම්පූර්ණ ශක්තිය යොදවන විට නොයෙකුත් දුක් ගැහැටවලට, ප්‍රශ්නවලට මුහුණ දෙන්නට වන අවස්ථා ගැන තමුන්නාන්සේලා දන්නවා ඇති. අපේ එදිනෙද වැඩපිළිවෙළ, දීර්ඝ කාලීන සංවර්ධන වැඩපිළිවෙළ සම්පූර්ණයෙන්ම හෝ කොටස් වශයෙන් හෝ අත්හිටවීමටත් සිදුවන අවස්ථාවකදීයි ගරු මුදල් ඇමතිතුමා මේ අයවැය ලේඛනය ඉදිරිපත් කළේ. නමුත් අපට සන්තෝෂ වෙන්න පුළුවන්, ආඩම්බර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වෙන්න පුළුවන් අපේ ගරු මුදල් ඇමතිතුමා ඒ කොටස් දෙකටම අවධානයක් නොවන පරිදි මේ අයවැය ලේඛනය ඉදිරිපත් කිරීම ගැන. දෙමළ ජනතාව වෙනුවෙන් මම ගරු මුදල් ඇමතිතුමාට ඒ ගැන ස්තුතිවන්ත වෙනවා.

මේ අවස්ථාවේදී තමුන්නාන්සේටත් මේ ගරු සභාවටත් කියන්න කැමතියි, මා නියෝජනය කරන්නේ වැඩිපුරම ගොවි ජනතාව සිටින මැතිවරණ කොට්ඨාශයක් බව. ඒ අයගේ අභිවෘද්ධිය තකා, ඒ අයගේ අනාගත දියුණුව තකා මේ අයවැය ලේඛනයෙන් ඉදිරිපත් කර ඇති වැඩ පිළිවෙළ ගැන ඔවුන්ට ඉතාමත් සන්තෝෂ වන්නට පුළුවන්. මෙම වැඩ පිළිවෙළ ඉදිරිපත් කිරීම සඳහා මගේ ඇමතිතුමා ගරු මුදල් ඇමතිතුමාට ඉදිරිපත් කර තිබෙන්නේ ඉතාම වැදගත් යෝජනාවක්.

මොන විධියේ හොඳ යෝජනා ඇතිව මොන විධියේ හොඳ අයවැය ලේඛනයක් ඉදිරිපත් කළත් විරුද්ධ පක්ෂයට ඕනෑ නම් එය නොයෙකුත් විධියට විවේචනය කරන්න පුළුවන්. අපේ ගම්බද ව්‍යවහාර වන කියමනක් තිබෙනවා, කන්න හිතුනාම කබරගොයාත් තලගොයා වෙනවාය කියා. අන්න ඒ විධියේ කැමක් තමයි විරුද්ධ පක්ෂය කන්නේ. අන්න ඒ විධියේ කථාවක් තමයි විරුද්ධ පක්ෂය කරන්නේ. නමුත් ගොවි ජනතාවට කොන්ද කෙළින් කරගෙන ඉන්න පුළුවන් වැඩ පිළිවෙළක් මගේ ගරු ඇමතිතුමා මුදල් ඇමතිතුමාට යෝජනා කිරීම ගැන මුළු ගොවි ජනතාවම ඒ දෙපොළට ණය ගැති විත්තිය මම මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

ගොවි ජනතාවට ඒ විධියේ විශ්‍රාම වැටුපක් ලබාදීමට යෝජනා කර තිබෙනවා පමණක් නොවෙයි, එතුමා වී බුසලක් සඳහා රු. 7.50ක් වැඩි කිරීමෙන් තවදුරටත් ගොවීන්ගේ දියුණුව සඳහා වැඩ කර තිබෙනවා. මේ යෝජනාවලටත් වඩා තවත් වැදගත් යෝජනාවක් මම ගරු මුදල් ඇමතිතුමාට කරන්න කැමතියි. මා ඉදිරිපත් කරන මේ යෝජනාවෙන් ගොවීයන්ට විශාල සේවයක් වෙනවා වාගේම එය නිෂ්පාදන වර්ධනයටද හේතුවක් වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තමුන්නාන්සේගේත් මේ ගරු මන්ත්‍රීවරුන් රටේ තොටේ යන එන අවස්ථාවලදී දකින්නට ලැබෙන්න ඇති වී ගොවිතැනේදී ගොයම් පැළ සිටුවීමේ වැඩ පිළිවෙළ සියයට 50කට වඩා ක්‍රියාත්මක වී නැති බව. එම නිසා මේ සඳහා යම් ප්‍රතිකර්මයක් කළ යුතුව තිබෙනවා. ගරු මුදල් ඇමතිතුමා මෙවර අයවැය යෝජනා ඉතාමත් අමාරු අවස්ථාවක ඉදිරිපත් කර තිබෙන බව අපි දන්නවා. ඒ අමාරුකම් යටතේ වුණත් මම මතක් කරන්න කැමතියි මේ කාරණය කල්පනාවට භාජන කර ගොයම් පැළ සිටුවන අයට සහනාධාර දීමේ වැඩපිළිවෙළක් ඇති කරන්නය කියා. [බාධා කිරීමක්] ඔව් මුදල් අවශ්‍යය. දෙන්න නම් පුළුවන්. මොකද, ගොයම් පැළ සිටුවීමට දෙන මුදල අතික් පැත්තෙන් ඉතුරු කරගන්න පුළුවන් නිසා. බිත්තර වී අඩක යන එක වළක්වන්න පුළුවනි. රසායනික ද්‍රව්‍යවලින් ඉතුරු වෙනවා. පොහොරවලින් ඉතුරු වෙනවා. එමනිසා මෙය රටේ වී අස්වැන්න වැඩි කරගන්න තිබෙන එකම ක්‍රමය වශයෙන් පෙන්වා දෙන්න පුළුවනි.

එපමණක් නොවෙයි මාවතැල්ලේ ගරු මන්ත්‍රීතුමා (චන්ද්‍ර රණතුංග මහතා) එතුමාගේ කථාවේදී කිව්වා තව ස්වල්ප කාලයක් යන විට අපේ රටට අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් වී නිෂ්පාදනය කෙරෙනවාය, එසේ නිෂ්පාදනය කෙරෙන වී වලට සහල් පිටරට යැවීමේ වැඩ පිළිවෙළක් ඇති කරන්නය, ඒ වගේම හොඳ හාල් නිෂ්පාදනය කරන වැඩපිළිවෙළක් ඇති කරන්නය කියා. ඒක ඉතා වැදගත් දෙයක්. අපට ඉදිරියේදී බලපාන ලොකුම ප්‍රශ්නය ඒකයි. හොඳ සහල් නිෂ්පාදනය කිරීමේ වැඩ පිළිවෙළක් ඇති කිරීම සඳහා අපි දැන් සිටම කටයුතු කරන්න ඕනෑ. තව ස්වල්ප කාලයක් යන විට අපේ මහවැලි යෝජනා ක්‍රමය යටතේ නිෂ්පාදනය වන වී වලට මොනවාද කරන්නේ කියන එක පිළිබඳව ලොකු ප්‍රශ්නයක් ඇති වෙනවා. ඒ නිසා ගරු මුදල් ඇමතිතුමාගේ නායකත්වයෙන් හා ගරු කෘෂිකර්ම ඇමතිතුමාගේ සහයෝගය ඇතිව හොඳ සහල් නිෂ්පාදනය කිරීමේ වැඩ පිළිවෙළක් ඇති කළොත් ඉතා වැදගත් විත්තිය මේ අවස්ථාවේදී මතක් කරන්න කැමතියි.

ඉදිරි කාලයේදී කළු ගඟ යෝජනාක්‍රමය ඇති කරන්න බලාපොරොත්තු වන විත්තියක් ගරු මුදල් ඇමතිතුමා අද සඳහන් කළා. ඒ නිසා මේ අවස්ථාවේදී මම කියන්න කැමතියි, කළු ගඟ යෝජනාක්‍රමය වගේම කැලණි ගඟ යෝජනාක්‍රමයත් වැදගත් විත්තිය. නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, යටියන්තොට මැතිවරණ කොට්ඨාශයේ සිට කොළඹට එනතුරු කැලණි ගඟ දෙපැත්තේ තිබෙන අක්කර දහස් ගණනක බිම් ප්‍රමාණය අවුරුද්දකට කී ගමනක් යට වෙනවාද කියා මා නොකිවාට තමුන්නාන්සේ දන්නවා. මගේ මැතිවරණ කොට්ඨාශයත් අඩු වශයෙන් අවුරුද්දකට හතර - පස් ගමනක්වත් යට වෙනවා. ඒ විධියට යටියන්තොට මැතිවරණ කොට්ඨාශයේ සිට දිගටම යට වෙනවා.

මේ දක්වා කිසිම යෝජනාක්‍රමයක් වයඹට දී නැති බවයි, මගේ විශ්වාසය. ඒ නිසා කැලණි ගඟ වයඹ ප්‍රදේශයට හැරෙව්වොත් යටියන්තොට මැතිවරණ කොට්ඨාශයේ සිට කොළඹට එනතුරු කැලණි ගඟ දෙපැත්තේ ඇති ප්‍රදේශවලට පමණක් නොව සම්පූර්ණ වයඹ ප්‍රදේශයටත් විශාල සේවයක් සැලසෙනවා. ඒ නිසා ගරු මුදල් ඇමතිතුමාගෙන් මම ඉල්ලීමක් කරන්න කැමතියි, කළු ගඟ මෙන්ම කැලණි ගඟ යෝජනාක්‍රමයත් යන දෙකම ගැන කල්පනා කොට ඒවා ක්‍රියාත්මක කර දෙන්නය කියා.

ඒ වාගේම ගරු මුදල් ඇමතිතුමාගෙන් තවත් ඉල්ලීමක් කරන්න කැමතියි. කවුරුවත් හිතුවේ නැහැ, එතුමා මේ විධියේ සාර්ථක අයවැය ලේඛනයක් ඉදිරිපත් කරයි කියා. මේ අයවැයෙන් අහිංසක ජනතාවට පහර වදීවිය කියා විරුද්ධ පාර්ශවය රතිඤ්ඤා පත්තු කරන්න බොහොම සන්තෝෂයෙන් බලාගෙන හිටියා. නමුත් සාමාන්‍ය ජනතාවට සැහැල්ලුවක් දෙන අයවැය ලේඛනයකුයි, එතුමා ඉදිරිපත් කළේ. ඒ නිසා ඒ සැහැල්ලුවට තවත් සැහැල්ලුවක් දෙන ලෙස මේ අවස්ථාවේදී එතුමාගෙන් ඉල්ලා සිටින්න කැමතියි. මේ රටේ දුප්පත් ජනතාව ගමන් කරන්නේ කෝච්චියේ 3 වැනි පන්තියේයි. ඒ නිසා, 3 වැනි පන්තිය සඳහා වැඩි කළ ගාස්තුව ඒ අහිංසක පොදු ජනතාව වෙනුවෙන් තැවතත් අඩුකර දෙන ලෙස මතක් කරන්න කැමතියි. 1 වැනි, 2 වැනි පන්ති සඳහා මුදල් ඇමතිතුමාට කැමති තරම් මිල වැඩි කරන්න. නමුත් 3 වැනි පන්තියේ යන්නේ අහිංසක මිනිසුන් බව, දුප්පත් රජයේ සේවකයන් බව කල්පනාවට ගෙන ඔවුන් කෙරෙහි අනුකම්පා කොට ඒ වැඩි කළ ගාස්තුව යළිත් අඩු කරන හැටියට මම තැවතත් මතක් කරන්න කැමතියි.

ඒ වාගේම පොදු ජනතාවට — අහිංසක දුප්පත් මිනිසුන්ට — ඉතාමත් වැදගත් වන වැඩපිළිවෙළක් අනාගතයේදී අපි ඇති කරන්න ඕනෑ. කොපමණ පඩි වැඩි කළත් බඩු මිලත් වැඩි වෙනවා. මුළු ලෝකයේම බඩු මිල වැඩිවීම නවත්වන්න අපට බැහැ. පඩිය වැඩි වන විට පසුවදාම කළු කඩේ බඩු මිල වැඩි කරනවා. ඒ නිසා මේ රටේ අහිංසක ජනතාව බුක්ති විඳින ආහාර ද්‍රව්‍ය පහක් හයක්වත් සහනදායක මිලකට දෙන ලෙස මම ඉල්ලීමක් කරනවා. උදාහරණයක් වශයෙන් පිටි, හාල්, මිරිස් වාගේ හයක පමණවත් අයවැයකින් තැත්නම් ගැසට් නිවේදනයකින් තැත්නම් වෙනත් නොයෙකුත් මාර්ගවලින් සැරින්සැරේ මිල වැඩිවීම වළක්වා ඒවාට ස්ථිර මිලක් ඇති කළොත් මම හිතන හැටියට පඩි වැඩි කරනවාට වඩා මේ රටේ හැම කෙනෙකුම සන්තෝෂ වන විත්තිය මට කියන්න පුළුවනි. එම නිසා මේ කරුණු දෙක තුන ගැන තමුන්නාන්සේ කල්පනා කර බලා මේ විධියේ වැඩපිළිවෙළක් ඇති කළොත් එය ඉතාම වටිනා එකක් වන බව මගේ ලොකුම විශ්වාසයයි.

මම මීට වඩා දීර්ඝ වශයෙන් කතා කරන්න බලාපොරොත්තු වන්නේ නැ. මට ලොකු විශ්වාසයක් තිබෙනවා මගේ අදහස් ගැන ගරු මුදල් ඇමතිතුමා කල්පනා කර බලා එතුමා ගොවි ජනතාවට අවශ්‍ය වැඩ පිළිවෙළක් ඇති කරයි කියා.

මුදල් ඇමතිතුමා ඉතාම වාසනාවන්ත පුද්ගලයෙක්. තව වරක් අය වැය හැදූ පුද්ගලයෙක්. එක දිගට අයවැය ලේඛන නවයක් හැදූ කිසිම මුදල් ඇමතිවරයෙක් ලංකා ඉතිහාසයේ කිසිම දවසක ඇති වුණේ නැහැ. ඒවාගේම ගොවීන් වෙනුවෙන් විශ්‍රාම වැටුප් ක්‍රමයක් ඇති කළ ලෝකයේ එකම මුදල් ඇමතිතුමා හැටියටත් රොනී ද මැල් මැතිතුමා ඉතිහාසගත වෙනවා.

ලබන වර්ෂය වන විට මේ රටේ දැන් තිබෙන සියලුම දුක් කම්කටොලු නැති වී ගොවි ජනතාවට අහිංසක දුප්පත් ජනතාවට සෞභාග්‍යයක් උදා වී දහ වැනි අයවැය ලේඛනයත් ඉදිරිපත් කිරීමට ගරු මුදල් ඇමතිතුමාට වාසනාව හා ශක්තියත් ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 5.20

**ඩී. වින්සන්ට් ඩයස් මහතා (නියෝජ්‍ය ප්‍රාදේශීය සංවර්ධන ඇමතිතුමා)**
(திரு. டீ. வின்சன்ற் டயஸ் — பிரதேச அபிவிருத்திப் பிரதி அமைச்சர்)
**(Mr. D. Vincent Dias – Deputy Minister of Regional Development)**

ගරු සභාපතිතුමනි, ශ්‍රීමත් ජනාධිපතිතුමාගේ රජයේ නව වැනි අයවැය ලේඛනය පිළිබඳ විවාදයට සහභාගී වන්නට ලැබීම ගැන මම ඉතාම සන්තෝෂ වෙනවා. ඒවාගේම, පිටපිටම නව වරක් අයවැය ලේඛන ඉදිරිපත් කිරීමට භාග්‍යය ලැබීම ගැන ගරු මුදල් ඇමතිතුමාට මම සුබ පතන්න කැමතියි. ආහාර හා සමුපකාර නියෝජ්‍ය ඇමතිතුමා සඳහන් කළා වාගේ ශ්‍රී ලංකාවේ වෙනත් කිසිම මුදල් ඇමතිවරයකුට, ශ්‍රී ලංකාවේ පමණක් නොව මුළු ලෝකයේම වෙනත් මුදල් ඇමතිවරයකුට මේ භාග්‍යය ලැබුණායයි මම හිතන්නේ නැහැ.

මේ රටේ දේශපාලන ස්ථාවර භාවය කොයි විධියට සකස් වී තිබෙනවාද යන වග එයින් පෙනෙනවා. 1977 දී මේ රජය බලයට පත් වුණාට පසු මේ රටේ ආර්ථිකයට මේ රටේ දේශපාලන ස්ථාවර භාවයට මේ රටේ දියුණුවට විශාල බාධක තර්ජන ඇති වුණු බව ඔබතුමා දන්නවා. මේවාට විසඳුම් සෙවීමට මේවාට ප්‍රතිකර්ම කිරීමට තමයි 1977 දී මේ රටේ ජනතාව අපගේ රජය බලයට පත් කළේ. 1977 දී අපේ රජය බලයට පත් වුණාට පසු ශ්‍රීමත් ජනාධිපතිතුමා මුලින්ම හෙව්වේ අප රටේ ආර්ථිකයට ඇති වී තිබෙන තර්ජනයට හේතුව කුමක්ද කියායි. පළමුවෙනි හේතුව වූයේ දේශපාලන ස්ථාවරභාවයක් නොතිබීමයි. ඒ හේතුව නිසා විටින්විට රජයවල් ඇති වුණා, නැති වුණා. ඒ වාගේම ඒ ඒ රජයවල් ඉදිරිපත් කරන සැලැස්මවල් හමස් පෙට්ටියට ගියා. ජනතාව ගන්න තීන්දු අනුව නොයෙක් විධියේ සැලැස්මවල් ක්‍රියාත්මක කරන්න අපහසු වුණා. මා හිතන්නේ 1977 වකවානුව වනවිට ජාතියට හිස ඔසවන්නට බැරි තරමට තර්ජන එල්ල වී තිබුණු බව ඔබතුමා දන්නවා. එමනිසා තමයි 1977 දී මේ ආණ්ඩුව බලයට පත් වූ පසුව දේශපාලන ස්ථාවරභාවයක් ඇති කරන්න අපේ ශ්‍රීමත් ජනාධිපතිතුමාට සිදු වූයේ. මේ රටේ ආර්ථිකයේ යම් ස්ථාවරභාවයක් ඇති කරන්න, යම් වෙනසක් ඇති කරන්න ඒ අඩිතාලම ඔස්සේ අපට පුළුවන් වුණා. එමනිසා තමයි, අපේ මුදල් ඇමතිතුමාට එක දිගටම නව වරක් අයවැය ලේඛන ඉදිරිපත් කරන්න පුළුවන්කම ලැබුණේ. දහ වැනි අයවැය ලේඛනයත් එතුමාට ඉදිරිපත් කරන්න පුළුවන් වෙන බවට මට කිසිම සැකයක් නැහැ. නව අවුරුදු ගණනක් ඒ භාග්‍ය එතුමාට ලැබෙනවාට කිසිම සැකයක් නැහැ.

මේ සැම දෙයක්ම කරන්න පුළුවන් වූයේ ශ්‍රීමත් ජනාධිපතිතුමා 1977 දී මේ රටේ ඇති කළ දේශපාලන ස්ථාවරභාවය නිසයි. අද මුළු ලෝකයේම රාජ්‍ය නායකයින් අතර ශ්‍රීමත් ජනාධිපතිතුමාට විශේෂ කීර්තිනාමයක් ඇති වී තිබෙන්නේ ඇයි ? අපේ රට දුප්පත් රටක් හැටියට, දියුණුවේගෙන එන රටක් හැටියට සලකා මේ රටේ ජනතාව යම් විධියකින් අවදි කරන මේ රටේ ජනතාව තුළ දේශපාලන ස්ථාවරභාවයක් ඇති කරන වැඩපිළිවෙළක් එතුමා මුලින් ඇති කළ නිසයි. 1977 අයවැය ඉදිරිපත් කරන අවස්ථාවේදී—මේ රජය බලයට පත් වූ මුල් අවස්ථාවේදී—අපට හොඳට මතකයි, මොනතරම් අමාරු, මොනතරම් කටුක අවස්ථාවකටද අප පත්වෙලා තිබුණේ කියා. දැන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරු මේවා ඔක්කොම අමතක කරලයි කථා කරන්නේ. ඒ අවස්ථාවේදී හිස් භාණ්ඩාගාරයක් භාර ගන්නයි අපේ රජයට සිදු වූයේ.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
**(Mr. Lakshman Jayakody)**

නැහැ, රුපියල් දශ ලක්ෂ 1483 ක් තිබුණා, ඒ කාලයේ. දැන් තිබෙන කඩිකබල් රුපියල්වලින් නොවෙයි, හොඳ ශක්තිසම්පන්න රුපියල්වලින්. රත්‍රන් වාගේ රුපියල් ඒ කාලයේ තිබුණේ.

**ඩී. වින්සන්ට් ඩයස් මහතා**
(திரு. டீ. வின்சன்ற் டயஸ்)
**(Mr. D. Vincent Dias)**

කොච්චරද ඒ ගණන ?

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
**(Mr. Lakshman Jayakody)**

දැන් තිබෙන කඩිකබල් රුපියල්වලින් ඒ ගණන වැඩියි.

**ඩී. වින්සන්ට් ඩයස් මහතා**
(திரு. டீ. வின்சன்ற் டயஸ்)
**(Mr. D. Vincent Dias)**

එහෙම නම් තමුන්නාන්සේලා භාණ්ඩාගාරයේ සල්ලි අඩුක් කළා මිසක් මේ රටේ ජනතාව අතර සල්ලි අඩුක් කළේ නැහැ. ජනතාව අතරට සල්ලි ලැබෙන මාර්ග සැලැස්සුවේ නැහැ.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
**(Mr. Lakshman Jayakody)**

ඒ කාලයේ රෙදි යාරය රුපියල් 2.12යි.

**ඩී. වින්සන්ට් ඩයස් මහතා**
(திரு. டீ. வின்சன்ற் டயஸ்)
**(Mr. D. Vincent Dias)**

රෙදි යාරය රුපියල් 2.12 වුණාට රෙදි යාර කීයක් මේ රටේ ජනතාවට ගන්න පුළුවන් වුණාද ? අන්න ඒකයි ප්‍රශ්නය. තමුන්නාන්සේලා එහෙම කියන එක ඇත්ත. නමුත් ඒ ගණනට රෙදි යාර කීයක් මේ රටේ කී දෙනෙකුට ගන්න පුළුවන් වුණාද ?

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
**(Mr. Lakshman Jayakody)**

හිඟයක් තියෙන්න ඇති. නමුත් මේ වාගේ තහුනෙට ගියේ නැහැ. මෙසැරේ මොනවද වෙලා තියෙන්නේ ? දැන් ඉතින් විනාශයි.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுப் பிரதித் தலைவர் அவர்கள்)
**(The Deputy Chairman of Committees)**

මම කුඩා කාලයේදී සත ගණනයි.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
**(Mr. Lakshman Jayakody)**

ඒ කාලයේ එහෙම තමයි. ආප්ප තුනයි, කෙසෙල් ගෙඩි දෙකයි, තේ බාගයයි, සිගරට් එකයි ශත පහයි. තෝර මාලු කුරියෙක් රුපියල් පහයි.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுப் பிரதித் தலைவர் அவர்கள்)
**(The Deputy Chairman of Committees)**

ඒ කාලය, මේ කාලය ගැන කථා කරන්න ඕනෑ නැහැ. මන්ත්‍රීතුමා දැන් කථාව කරන්න.

**ඩී. වින්සන්ට් ඩයස් මහතා**
(திரு. டீ. வின்சன்ற் டயஸ்)
**(Mr. D. Vincent Dias)**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 1977 දී මේ රටේ ආර්ථිකය වැටී තිබුණු තත්ත්වය ගැන කල්පනා කර බලන විට, රෙදි යාරය ගැන පමණක් නොව මේ රටේ ජාතික සම්පත වන තරුණ තරුණියන් ලක්ෂ කීයකට රැකීරක්ෂා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නැතිව අතරමං වෙලා හිටියාද කියා අපි කල්පනා කරන්න ඕනෑ. එද තමුන්නාන්සේලාට මොක වුණේ ? අද ජාත්‍යන්තර ත්‍රස්තවාදය අනුව අපි එක්තරා තත්ත්වයකට මුහුණ දී තිබෙනවා. නමුත් 1970 දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බලයට පත් කරන්නට පෙළපාළි ගිය, පෝස්ටර් අලවපු, මුන්නැහේලාගේ පිටවල් කහපු තරුණ තරුණියන් මෙගොල්ලන්ගෙන් තම බලාපොරොත්තු සුන් වූ වෙලාවෙ 1971 දී මේ රටේ පොලීසිවලට හා වෙනත් වෙනත් ආයතනවලට පහර දෙන විට — මට මතකයි, මමත් ඒ අවස්ථාවෙ ශ්‍රාවස්තිය පැත්තේ ඇවිත් සිටියා, ඒකට අල්ලපු භෝජනාගාරයත්, ක්ලබ් එකත් තිබුණා — හිටපු මන්ත්‍රීවරු ශ්‍රාවස්තියේ භෝජනාගාරයට ගිහිල්ලා ඇඳවල් අස්සෙයි සැඟවී සිටියෙ. පොලීසියෙත් ගිහිල්ලා තමයි, එක් එක්කෙනා එළියට ඇදලා ගත්තෙ. මේ අය හැංගෙන්න තැන් සොය සොයා සිටියෙ. හැංගෙන්න තැනුත් නැතුවයි, හිටියෙ. අවුරුද්දක් ගියේ නැහැ, මේ රටේ පාලන බලය අතට අරන්.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

අද අනාථයො කීදෙනෙක් ඉන්නවාද ? සිංහල අනාථයො, ද්‍රවිඩ අනාථයො, මුස්ලිම් අනාථයො කී දෙනෙක් අනාථ කඳවුරුවල ඉන්නවාද ?

**ඩී. වින්සන්ට් ඩයස් මහතා**
**(திரு. டீ. வின்சன்ற் டயஸ்)**
**(Mr. D. Vincent Dias)**

තමුන්නාන්සේ අවංකව කියන්න නැගිටලා, අනාථයො සංඛ්‍යාව වැඩිවී තිබීම තමුන්නාන්සේලාගේ ප්‍රීතියට හේතුවක්ද නැත්නම් කණගාටුවට හේතුවක්ද කියා.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

හැමදාමත් අපි ප්‍රශ්නයක් අහනකොට ඒක අපට ප්‍රීතියක්ලු. අපිට ප්‍රීතියක් නැහැ. අපි වාගේ දුක් වෙන්නෙ නැහැ කවුරුවත් මේ තත්ත්වය දිහා බැලුවාම. වෙන මොකවත් නොවෙයි, අකාර්යක්ෂමතාව. ඒක අවංකව පිළිගන්න ඕනෑ දැන්වත්.

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා**
**(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி)**
**(Mr. Weerasinghe Mallimaratchi)**

ඒ කාලේ කොහොමද ?

**ඩී. වින්සන්ට් ඩයස් මහතා**
**(திரு. டீ. வின்சன்ற் டயஸ்)**
**(Mr. D. Vincent Dias)**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ විදියේ භයානක තත්ත්වයක් මේ රටෙ ඇතිවෙලා තිබෙන අවස්ථාවක තමයි, 1977 මුලින්ම අපේ මුදල් ඇමතිවරයා අයවැය ඉදිරිපත් කළේ. එතුමා පසුබිම සකස් කලා, ක්‍රමානුකූලව මේ රටෙ ආර්ථිකය නගා සිටුවීම පිණිස. [බාධා කිරීමක්]

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

යාපනේ දිසා ඇමතිතුමා ඔය ඉන්නෙ. තමුන්නාන්සේලා ඇයි එයාගෙන් නියම වැඩ ගන්නෙ නැත්තෙ ? [බාධා කිරීමක්] පව් ! එයාට දෙස් කියන්න එපා. [බාධා කිරීම්]

**ඩී. වින්සන්ට් ඩයස් මහතා**
**(திரு. டீ. வின்சன்ற் டயஸ்)**
**(Mr. D. Vincent Dias)**

1977 ඉඳලා 1978, 1979, 1980, 1981, 1982 යන මේ වර්ෂවල අයවැය ලේඛන එක එක අරගෙන අපි විග්‍රහ කර බැලුවොත්, කල්පනා කර බැලුවොත්, අපට පේනවා ඒ හැම අයවැයක් තුළින්ම මේ රටේ ආර්ථිකයේ යම්කිසි ප්‍රගතියක් සිදුවී තිබෙන බව. මොකක්ද ඇතිවූ ප්‍රගතිය ? මුන්නැහෙලා අනාථ කළ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අනාථ කළ, ලක්ෂ ගණනක් තරුණ තරුණියන්ට මේ රටේ රැකීරක්ෂා සපයන්නට—

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

කව්ද අනාථ කළේ ? අපි අනාථ කළේ නැහැ. අනාථ මඩම් නොවෙයි, දැන් ඒවා අනාථ කඳවුරු.

**ඩී. වින්සන්ට් ඩයස් මහතා**
**(திரு. டீ. வின்சன்ற் டயஸ்)**
**(Mr. D. Vincent Dias)**

නමුත් මේ රටේ ආර්ථිකය නිසා කිසිම කෙනෙක් අනාථ වෙලා නැහැ.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

ආර්ථිකය නිසා නේන්නම් මෙහෙම වෙන්නෙ.

**ඩී. වින්සන්ට් ඩයස් මහතා**
**(திரு. டீ. வின்சன்ற் டயஸ்)**
**(Mr. D. Vincent Dias)**

අනාත වෙලා තිබෙන්නෙ ජාත්‍යන්තර ත්‍රස්තවාදය නිසයි.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

හොඳට විග්‍රහ කරලා බැලුවොත් සෑහෙන තරමකට තිබෙන්න පුළුවන් මේ ජන වාර්ගික ප්‍රශ්නය. නමුත් යටින් තිබෙනවා ආර්ථික ප්‍රශ්නයත්.

**ඩී. වින්සන්ට් ඩයස් මහතා**
**(திரு. டீ. வின்சன்ற் டயஸ்)**
**(Mr. D. Vincent Dias)**

තමුන්නාන්සේලා ඒක මවලා පෙන්වන්න හදනවා. තමුන්නාන්සේලා මවලා පෙන්වලා මේ රටේ ජනතාව ප්‍රකෝප කරවන්න හදනවා.

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා**
**(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி)**
**(Mr. Weerasinghe Mallimaratchi)**

ඒ ආණ්ඩුව මේක ආරම්භ කළේ, දෙරේඅප්පා මරලා. එතැනින් පටන් ගත්තෙ.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

ත්‍රස්තවාදය නැති කළෙත් අපේ ආණ්ඩුව කාලයේ.

**ඩී. වින්සන්ට් ඩයස් මහතා**
**(திரு. டீ. வின்சன்ற் டயஸ்)**
**(Mr. D. Vincent Dias)**

ත්‍රස්තවාදය මුලින්ම පටන් ගත්තෙ රොස්මිඩ් එක ඇතුළෙන්, රටේ හිටපු අගමැතිතුමාව ඝාතනය කරලා. එතැනින් පටන් ගත්තෙ ත්‍රස්තවාදය. ඊට පස්සෙ තමයි, ඇල්ෆ්‍රඩ් දෙරේඅප්පා මැරුවෙ.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

කව්ද ඝාතනය කළේ ?

**ඩී. වින්සන්ට් ඩයස් මහතා**
**(திரு. டீ. வின்சன்ற் டயஸ்)**
**(Mr. D. Vincent Dias)**

යන්න කණ්නාඩියක් ඉස්සරහට.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

කව්ද, කව්ද අල්ලාගෙන ගියේ ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඩී. වින්සන්ට් ඩයස් මහතා
(திரு. டீ. வின்சன்ற் டயஸ்)
(Mr. D. Vincent Dias)

යන්න, යන්න කණ්නාඩියක් ඉස්සරහට. තමුන්නාන්සේලාගෙ ම මිනිස්සුනේ ඕව කළේ ?

වීරසිංහ මල්ලිමාරච්චි මහතා
(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி)
(Mr. Weerasinghe Mallimaratchi)

බුද්ධරක්ඛිත අපේද ? සෝමාරාම අපේද ? ජයවර්ධන අපේද ?

ඩී. වින්සන්ට් ඩයස් මහතා
(திரு. டீ. வின்சன்ற் டயஸ்)
(Mr. D. Vincent Dias)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තමුන්නාන්සේට ජේනවා ඇති 1982 වනතුරු මේ රටේ ආර්ථිකයේ යම් ක්‍රමානුකූල, සීඝ්‍ර වර්ධනයක් ඇති වූ බව. ඒ සමගම අපේ අපනයනවලට හොඳ කාලයක් උදාවුණා. අපේ අපනයන ගැන කල්පනා කර බලන විට, අපේ දේශීය නිෂ්පාදන ගැන කල්පනා කර බලන විට, ඒ හැම දෙයක්ම පහළ වැටිලයි තිබුණේ. බද්දේගම ගරු මන්ත්‍රීතුමා (අමරසිරි දොඩන්ගොඩ මහතා) ලොකුවට කතා කළා රේඩියෝ හදන එක ගැන, බයිසිකල් ටයර් හදන එක ගැන. මම නම් දන්නෙ නැහැ එහෙම බයිසිකල් හැදූ කාලයක්. මට නම් මතක තිබෙන්නෙ උන්නැහෙලාගේ කාලයේ බයිසිකල් ටයර් එක ගන්න පරණ බයිසිකල් ටයර් එක අරගෙන ගිය බවයි. නැතුව, බයිසිකල් ටයර් හැදුව කාලයක් නම් මට මතක නැහැ. රේඩියෝ හදන්න දීලා තිබුණා උන්නැහෙලාගේ හෙන්චයියලාට.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

තමුන්නාන්සේ පොඩියි ඒ කාලෙ.

ඩී. වින්සන්ට් ඩයස් මහතා
(திரு. டீ. வின்சன்ற் டயஸ்)
(Mr. D. Vincent Dias)

පොඩි වුණත් ඒවා ගැන අවදියෙන් සිටියෙ. අත්තනගල්ලේ මන්ත්‍රීතුමා වැඩිය කලබල වෙන්න එපා. මේවා ඇහෙන කොට ඔහොම තමයි.

රේඩියෝ හැදුවෙ කවුද ? අද ඥනම්ලාට විරුද්ධව ඒගොල්ලන්ගේ සමාගම්වල අධ්‍යක්ෂවරුන් ගැන මේගොල්ලො කියන්න කියනවා. කවුද ඥනම් කියන්නෙ ? අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අයිතිකාරයා තමයි, ඥනම් නැහැයි කියන්නයි කියන්න, අත්තනගල්ලේ මන්ත්‍රීතුමාට, නැගිටලා. තමුන්නාන්සේට තිබෙනවාද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ බලයක් ? ඥනම්ට තිබෙන තරම්වත් බලයක් තිබෙනවාද ? පුළුවන් නම් නැගිටලා කියන්න.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

අපේ කිසිම බලයක් කිසිම කෙනකුට නැහැ. අපේ පක්ෂයේ බලය තිබෙන්නේ අපේ සාමාජිකයින්ටයි. ඥනම්ලාට තියා බ්‍රහ්මයාටවත් නැහැ.

ඩී. වින්සන්ට් ඩයස් මහතා
(திரு. டீ. வின்சன்ற் டயஸ்)
(Mr. D. Vincent Dias)

ඒනිසා ඥනම් ගැන කතා කරන කොට පොඩ්ඩක් ප්‍රවේශමෙන් කතා කරන්න. [බාධා කිරීම්] තමුන්නාන්සේ කොහෙන් විසි වෙයිද දන්නේ නැහැ, ඥනම් ගැන කතා කරන්න ගියොත්. ඒනිසා පොඩ්ඩක් ප්‍රවේශමෙන් කතා කරන්න.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

නැහැ, නැහැ. අර කෝටි තමසියය සොරකම් කළා කිව්වේ කවුද කියා අහන්න.

ඩී. වින්සන්ට් ඩයස් මහතා
(திரு. டீ. வின்சன்ற் டயஸ்)
(Mr. D. Vincent Dias)

ආර්ථිකයේ එවැනි සංවර්ධනයක් ඇති වී තිබුණු අවස්ථාවකදී විටින්විට ඇති වූ ස්වභාවික හේතූන් නිසා අපට යම් යම් බාධකවලට මුහුණ දීමට සිදු වූ බව ඇත්ත. තමුන්නාන්සේ දන්නවා මොනවද මේ ස්වභාවික හේතූන් කියන්නේ කියා. මේ රටේ ජාතිවාදී කෝලාහල ඇති වුනා, නොයෙක් නොයෙක් ප්‍රදේශවල. සුළිසුළං මගින් විපත් පැමුණුනා. ගං වතුරින් හානිවුනා. බලාපොරොත්තු නොවූ විධියේ ඉඩෝර ඇති වුනා. මේවා නිසා අපේ නිෂ්පාදනයට යම්යම් බාධා ඇති වෙනවා. මේ හේතූන් නිසා අපට පසුගිය වර්ෂ හතර පහ ඇතුළත යම්යම් තර්ජනවලට සුළු වශයෙන් හෝ මුහුණ දෙන්නට සිදු වුණා. නමුත් ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව බලන විට අපට පෙනී යනවා මේ රටේ ආර්ථිකයේ යම්කිසි ප්‍රගතියක් ඇති වී තිබෙන බව. විරුද්ධ පක්ෂයේ අය වුනත් එය අවිවාදයෙන් පිළිගන්නවාට කිසිම සැකයක් නැහැ.

ආර්. පී. විජේසිරි මහතා
(திரு. ஆர். பீ. விஜேசிறி)
(Mr. R. P. Wijesiri)

පිළිගන්නවාද ?

ඩී. වින්සන්ට් ඩයස් මහතා
(திரு. டீ. வின்சன்ற் டயஸ்)
(Mr. D. Vincent Dias)

අනිවාර්යයෙන්ම පිළිගන්න වෙනවා. මට මතකයි ඒ රජය බලයට පත්වෙලා අවුරුදු දෙකක් ගත වුනේ නැහැ, මේ රටේ මහජනතාව ඒ රජයට විරුද්ධව නැගී සිටියා. පුළුවන් නම් අද එහෙම තත්ත්වයක් ඇති කරන්න. අත්තනගල්ලේ මන්ත්‍රීතුමාට එතුමාගේ ආසනයෙන් දහදහක් පාරට ගන්න පුළුවන්ද මේ රජයට විරුද්ධව. අන්න එවැනි අවස්ථාවක අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමාට (ලක්ෂ්මන් ජයකොඩි මහතා) මහජනතාවගේ නියම තත්ත්වය අවබෝධ කර ගන්න පුළුවන් වේවි.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

මොකක්ද යෝජනාව ? මොකටද මිනිස්සු පාරට ගන්න කියා කියන්නේ ?

ඩී. වින්සන්ට් ඩයස් මහතා
(திரு. டீ. வின்சன்ற் டயஸ்)
(Mr. D. Vincent Dias)

ආණ්ඩුවට විරුද්ධව.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

මොකටද ?

ඩී. වින්සන්ට් ඩයස් මහතා
(திரு. டீ. வின்சன்ற் டயஸ்)
(Mr. D. Vincent Dias)

බලන්න ගන්න.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

බලන්න ? මොනවා බලන්නද ?

ඩී. වින්සන්ට් ඩයස් මහතා
(திரு. டீ. வின்சன்ற் டயஸ்)
(Mr. D. Vincent Dias)

තමුන්නාන්සේලා කියනවා මේ රජය හරි නැහැ කියා. අසාධාරණකම් කරනවා කියා. තමුන්නාන්සේලාට මැතිවරණයක් ඉල්ලනවා. අන්න ඒ නිසා පුළුවන් නම් මහජනයා ගන්න බලන්න පාරට.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

අපි ගැන අහන්න ඕන නැහැ. යාපනයේ තත්ත්වය මර්දනය කරන්න ඉස්සෙල්ලා.

ඩී. වින්සන්ට් ඩයස් මහතා
(திரு. டீ. வின்சன்ற் டயஸ்)
(Mr. D. Vincent Dias)

අත්තනගල්ලේ රැස්වීමක් තියන්න.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

තමුන්නාන්සේට පුළුවන්ද යාපනයට යන්න. එක්කෙනයි මේ ආණ්ඩුවෙන් එහේ යන්නේ. ඔහු හැර වෙන කවුරුවත් යන්නේ නැහැ යාපනේට.

**මන්ත්‍රීවරයෙක්**
(அங்கத்தவர் ஒருவர்)
(A Member)

තමුන්නාන්සේ යනවාද ?

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

අපිත් යන්නේ ඒගොල්ලන් එක්ක. මට යන්න කිව්වොත් මම යනවා. නමුත් මේ ප්‍රශ්නයට යන්නේ නැ.

**මන්ත්‍රීවරයෙක්**
(அங்கத்தவர் ஒருவர்)
(A Member)

අපි යාපනේ යනවානේ.

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා**
(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி)
(Mr. Weerasinghe Mallimaratchi)

පයින්ද ? [බාධාකිරීම්]

ඩී. වින්සන්ට් ඩයස් මහතා
(திரு. டீ. வின்சன்ற் டயஸ்)
(Mr. D. Vincent Dias)

අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමාගේ දැනගැනීම පිණිස මම කියන්න කැමතියි, මම ගිය සතියේ කිලිනොච්චියට ගිහිල්ලා ආපු බව.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

ගියා හීනෙන්.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுப் பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman of Committees)

අත්තනගල්ලේ මන්ත්‍රීතුමාට නොවෙයි. මූලාසනයට කථා කරන්න.

ඩී. වින්සන්ට් ඩයස් මහතා
(திரு. டீ. வின்சன்ற் டயஸ்)
(Mr D. Vincent Dias)

නියෝජ්‍ය සභාපතිතුමනි, අත්තනගල්ල මන්ත්‍රීතුමා කියනවා උතුරු, නැගෙනහිර ප්‍රදේශ ගැන කල්පනා කරන්න කියා. 1971 අවුරුද්දේදී ත්‍රස්තවාදීන් ආපු වෙලාවේ මුත්තැහේලා සිටියේ අරලියගහ මන්දිරයේ ඇඳන් යට. අල්ලපු භෝජනාගාරයේ ඇඳන් යට මන්ත්‍රීවරු හැංගිලා හිටියේ. දන් කතා කරනවා.

ගරු මුදල් ඇමතිතුමා ඉදිරිපත් කළ සෑම අයවැය ලේඛනයක් තුළින්ම මේ රටේ රැකීරක්ෂා ප්‍රශ්නය විසඳීමට, අධ්‍යාපනය දියුණු කිරීමට, වාරිමාර්ග පහසුකම් වැඩි වැඩියෙන් ඇති කිරීමට, ග්‍රාමීය විදුලිබල යෝජනා ක්‍රම තව තවත් පිහිටු වන්නට, නිවාස වැඩි වැඩියෙන් තනන්නට, ග්‍රාමීය මංමාවත්වල තත්ත්වය දියුණු කරන්නට, විශාල මුදල් ප්‍රමාණයක් යෙදවූ බව ඔබතුමා දන්නවා. එපමණක් නොවෙයි. මේ රටට නිදහස ලැබුණාට පසුව කිසිම දවසක අපේ ප්‍රදේශවලට අපේ ආසනවලට නොකළ සංවර්ධනයක් ඇති කරන්නටත් අපට පුළුවන් වුණා. මේ අවුරුදු හතර පහ ඇතුළත සෑම අයවැයක් තුළින්ම ග්‍රාම සංවර්ධන යෝජනාක්‍රම ඇතුළු විවිධ යෝජනාක්‍රම නඟාසිටුවීම පිණිස ඇති කළ වැඩ පිළිවෙළ නිසා තමයි, අපේ ගම්වල විරුද්ධ පාර්ශ්වයේ කිසිම කෙනෙකුට අද ඔළුව උස්සන්නට බැරිව තිබෙන්නේ. ඊට අමතරව සංවර්ධන සභාවෙන් හා විමධ්‍යගත අයවැයෙන් විදේශීය ආධාර තුළින්, ඒකාබද්ධ ග්‍රාමීය ව්‍යාපෘති තුළින්, අපේ කොට්ඨාශවල ජනතාව කවදාවත් බලාපොරොත්තු නොවූ තරමේ සංවර්ධනයක් ඇති කරන්නට අපට පුළුවන් වුණේ විශේෂයෙන්ම ගරු මුදල් ඇමතිතුමාගේ අයවැය ලේඛනවලින් අපට ඒ සඳහා ඉඩකඩ ලබාදුන් නිසයි. අදත් ඒ ජනතාව විසින් අප කෘතඥපූර්වකව සිහිපත් කරන්නේ අප කර තිබෙන ඒ වැඩ කොටස නිසයි. අන්න ඒ ගැන අපි විශේෂයෙන් ගරු මුදල් ඇමතිතුමාට ස්තුතිවන්ත වන්නට ඕනෑ. එවැනි ග්‍රාමීය සංවර්ධන යෝජනා ක්‍රම මගින් ගැමිජනතාව නඟාසිටුවීමට අපට ඉඩකඩ ලබාදීම ගැන අපි එතුමාට ප්‍රසංශා කරන්නට ඕනෑ.

ඇත්ත වශයෙන්ම අද කල්පනා කරන්නට ඕනෑ, අපේ අපනයනයන් ගැන හා අපේ නිෂ්පාදන ගැන. 1983ට කලින් අපට සාර්ථක ප්‍රතිඵල නෙලා ගන්නට පුළුවන් වුණා, අපේ අපනයනවලින්. අපේ තේවලින්, අපේ රබර්වලින්, අපේ පොල්වලින් හා විවිධ කර්මාන්තවලින් අපට සාර්ථක ප්‍රතිඵල නෙලා ගන්නට පුළුවන් වුණා. නමුත් අහේතුවකට වගේ දැන් අපේ අපනයන තුළින් තරමක් දුරට අපි පසුබැස තිබෙනවා.

1983 වර්ෂය තමයි මුළු ශ්‍රී ලංකාද්වීපයේ ජීවත්වන 1,60,00,000ක් පමණ වන මුළු මහත් ජනතාවගේම අඳුරු වර්ෂය හැටියට ගණන් ගන්නට පුළුවන් වන්නේ. මේ රටේ ජාත්‍යන්තර ත්‍රස්තවාදය ඉස්මතුවී ජාත්‍යන්තර ත්‍රස්තවාදය නිසාම මේ රටේ එක්තරා සුළු ජන කොටසක් මේ රට දෙකට කඩා වෙනම රාජ්‍යයක් පිහිටුවන්නට කැසකවන මෙවැනි අවස්ථාවකදී රටක් හැටියට හා ජාතියක් හැටියට අපට මොන තරම් විශාල තර්ජනයකට මුහුණ පාන්නට සිදුවී තිබෙනවාද ? නමුත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නොවෙයි, අඩුතරමින් අල්පමාත්‍රයකින්වත් මේ ජාත්‍යන්තර ත්‍රස්තවාදය මර්දනය කිරීමට රජයට සහයෝගය දෙන්නේ. එතුමන්ලා පාර්ලිමේන්තුවේදී කථා කරනවා, පත්‍රයේ පළකරවා ගන්නට. නමුත් අද වනතුරු විරුද්ධ පාර්ශ්වයේ එකම නායකයෙකුවත් ප්‍රසිද්ධ ප්‍රකාශයක් කර නැහැ, රජය ගෙන යන මේ ත්‍රස්තවාදී මර්දන ව්‍යාපාරවලට ඒ අයගේ සහයෝගය දෙනවාය කියා. දෙන්නට මාර්ග නම් ඕනෑ තරම් තිබුණා. ඒවාට ඉදිරියත් වුණා. නමුත් ඔවුන් කල්පනා කළා, ඒවායින් යම්කිසි විසඳුමක් ලැබුණොත් වාසි අත්පත් වන්නේ රජයටයි, ඒ මගින් ශ්‍රීමත් ජනාධිපතිතුමාට කීර්තිනාමයක් ලැබෙන්න පුළුවන්ය, කියා. ඒ අනුව දේශපාලන බල ලෝභය නිසා, බලයට එන්නට තිබෙන කෑදරකම නිසා ජාතිය පාවා දෙන්නට තරම් අද ඔවුන් දුර්ජනව් සිටින බව අපට පෙනෙනවා. [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තමුන්නාන්සේ දන්නවා අද අපේ ආර්ථිකය විනාශ කරන හතුරා කවුද කියා. අද අපේ ජාතිය විනාශ කරන හතුරා කවුද කියා. මේ ත්‍රස්තවාදීන් තමයි ඒ. එන්ගලන්ත රජය අවුරුදු 25ක් තිස්සේ මේ ත්‍රස්තවාදයට මුහුණ දෙනවා. මැද පෙරදිග රටවල් මුහුණ දෙනවා. බටහිර රටවල් මුහුණ දෙනවා. අද අපටත් සිදුවී තිබෙනවා, එයත් සමඟ ජීවත් වන්නට. මෙය ක්‍රමානුකූලව සංවිධානයවූ ත්‍රස්තවාදයක්.

විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා, " දිවයින " පත්‍රයේ වාර්තාකරුවකු සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවක් පිළිබඳ වාර්තාවක්, 17 වන ඉරිද " දිවයින " පත්‍රයේ පළ කර තිබුණා මා දැක්කා. මෙවර අයවැයෙන් විශාල මුදලක් ආරක්ෂක කටයුතුවලට වෙන් කර තිබෙනවාය, මෙතරම් විශාල බරක් ආරක්ෂක කටයුතු සඳහා පටවන්නට සිදු වුණේ රජයේ වරදින්ය කියා එතුමා ප්‍රකාශ කර තිබුණා. නමුත් නනු දන්නෝ දන්නවා, රටේ නියම තත්තවය ගැන. මෙම අයවැය යෝජනා ඉදිරිපත් කරන අවස්ථාවේදී අපේ ශාඛා සමිතිවලට ගිය විට අපේ ගමේගොඩේ සාමාන්‍ය ජනතාව මට මොනවාද කිව්වේ ? අප නිතර ශාඛා සමිතිවල කටයුතුවලට යන නිසා රටේ තත්ත්වය ගැන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. වින්සන්ට් ඩයස් මහතා]

හොඳාකාරවම දන්නවා. ඇත්තෙන්ම අපේ ඒ ජනතාවගේ අදහස් මොනවාද ? අපේ පොදු ජනතාව තේරුම් ගෙන තිබෙනවා, අද මේ රජයට මුහුණ පාන්නට සිදු වී ඇති තත්ත්වය. මෙතරම් විශාල මුදලක් වියදම් කරන්නේ මොනවාටද කියා. ජනතාව දන්නවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපට හමුද හිටියා. අපට අවිආයුධත් තිබුණා. නමුත් ඒ හැම දෙයක්ම යොදවා ගත්තේ අවුරුද්දකට එක් වතාවක් පමණ ගෝල්ෆේස් පිටියේ හෝ වෙනත් තැනක පැවැත්වෙන නිදහස සැමරීමේ උත්සවයකට එහෙමත් නැති නම් හදිසි අවස්ථාවක් උද්ගතවූ විට පමණයි. ඉඳහිට අර පුස්කාපු තුවක්කු ටික එළියට අරගෙන පොලිෂ් කිරීම පමණයි කළේ. එම නිසා, ජාත්‍යන්තර ත්‍රස්තවාදය තුළින් ලැබෙන ලෝකයේ නවීනතම අවි ආයුධත් ඇතුව නවීන තාක්ෂණයත් උපයෝගී කර ගෙන සටන් කරන ත්‍රස්තවාදීන්ට එරෙහිව සටන් කිරීමට ශ්‍රී ලංකා හමුදවටත්, වෙනත් හමුදවලටත් පුළුවන්කමක් ඇති වුණේ නැහැ. අන්න ඒ නිසයි අවුරුදු ගණනාවක් තිස්සේ මෙම ත්‍රස්තවාදය ඉස්මතුවෙමින් පැවතුණේ. අපි ඒ කාරණය පිළිගන්නට ඕනෑ. දැන් තමයි අපේ රජය ඒ සඳහා විවිධ ක්‍රියා මාර්ග අනුගමනය කර ගෙන එන්නේ. දැන් තමයි, හමුදවට තරුණයන් අලුතෙන් බඳවා ගෙන, ඒ අයට අවශ්‍ය ඇඳුම් පැළඳුම්, නවීන යුද උපකරණ, වාහන ආදිය ගෙන්වා ගත්තේ. මෙවැනි වැඩපිළිවෙළක් කලින් තිබුණේ නැහැ. එම නිසා තමයි, ආරක්ෂක කටයුතු සඳහා මෙතරම් විශාල මුදලක් වෙන් කරන්නට සිදු වුණේ. ඒ කාරණය අප කවුරුත් පිළිගන්න ඕනෑ. විශේෂයෙන්ම මගේ කොට්ඨාශයේ ජනතාව හමුවුණු අවස්ථාවලදී ඒ අය මේ කාරණය පිළිගත්තා. " මොනවා කරන්නද මන්ත්‍රීතුමනි, රටට මේ සා විශාල විපතක් සිදු වී තිබෙනවා, ත්‍රස්තවාදීන් ගෙන යන ව්‍යාපාරය අප දන්නවා " කියා ඒ ජනතාව කියනවා. 'අපේ ජනතාවට මේවා හංගන්න පුළුවන්කමක් නැහැ. කොටින්ම ජනතාවගේ ඇස්වලට වැලි ගහලා කටයුතු කරන්නට පුළුවන්කමක් නැහැ. අපේ ජනතාව රටේ සිදුවන හැම දෙයක් ගැනම දන්නවා. මෙම ත්‍රස්තවාදය තුළින් ඇති වන සිද්ධීන් පිළිබඳ සත්‍ය වාර්තා හැම දෙයක්ම ජනතාව අතරට නොයෙක් නොයෙක් මාධ්‍ය තුළින් යාම නිසා, ත්‍රස්තවාදය කියන්නේ මොකක්ද කියා ජනතාව හරිහැටි තේරුම් ගෙන තිබෙනවා. එපමණක් නොවෙයි, ත්‍රස්තවාදය නිසා තමන් පත් වී ඇති අසීරු තත්ත්වය ගැනත් ජනතාවට අවබෝධයක් තිබෙනවා.

විරුද්ධ පාර්ශ්වයේ උත්සාහය, රජයට පමණක් මේ බර පටවා, රජයට මඩ ගසා දේශපාලන වශයෙන් වාසි ලබා ගැනීමයි. නමුත් ජනතාව ඒ අය සිතන තරම් මෝඩ නැහැ. ජනතාව රැවටූ කාලය අවසානයි. හඳෙන් හෝ හාල් ගෙනැවිත් හාල් සේරු දෙකක් දෙනවා කියා බලයට ආ වකවානුවක් තිබුණා. නමුත් දැන් එවැනි තත්ත්වයක් නැහැ. ජනතාවට යමක්කමක් තේරෙනවා. ජනතාවට හොඳ අධ්‍යාපනයක් තිබෙනවා. ජනතාව දැන් පුවත්පත් කියවනවා. හැම ගමකම, අස්සක් මූලක් නැරම දැන් සිටින්නේ හොඳ අධ්‍යාපනයක් ලැබූ ජනතාවක්. ශ්‍රී ලංකාව ආසියාවේ අනිකුත් රටවල් අතර, අධ්‍යාපනය අතින් උසස් මට්ටමක පවතිනවා. එම නිසා විරුද්ධ පාර්ශ්වයට, අපේ ජනතාව රවට්ටන්න එතරම් ලෙහෙසි නැති නිසා විරුද්ධ පාර්ශ්වය අද අසීරු තත්ත්වයකට පත්ව සිටිනවා. කොටින්ම ඒ අය දේශපාලන වශයෙන් බංකොලොත් වී සිටින්නේ අන්න ඒ නිසයි. එසේ නැතිනම් රජය මෙතරම් අසීරු තත්ත්වයකට පත්ව සිටින අවස්ථාවකදී, ජනතාව තමන්ට නතු කරගෙන, ජනතාව මෙහෙය වන්නට විරුද්ධ පාර්ශ්වයට එතරම් අපහසුවක් ඇති වන්නේ නැහැ. නමුත් මේ රජය ගෙනයන දූරදර්ශී වැඩපිළිවෙළ නිසා, ත්‍රස්තවාදය මර්ධනය කරන්නට රජය ගෙනයන වැඩපිළිවෙළ නිසා, ජනතාව නියම තත්ත්වය තේරුම් කරගෙන තිබෙනවා. ඇත්තෙන්ම මම ජනතාවගෙන් ඒ ගැන ප්‍රශ්න කළා. " මොනවා කරන්නද සර්, රෙදි මිල ටිකක් වැඩි වුණත් කමක් නැහැ, අපි හැමදමත් ගිහින් රෙදිපිළි ගන්නේ නැහැනෙ, ඕනෑ නම් අවුරුද්දකට සූට් එකක් හෝ දෙකක් ගන්නවා. එදාට වැඩිය බඩු මිල ටිකක් වැඩි වී තිබෙන බව ඇත්ත. නමුත් එද වගේ නොවෙයි, බඩු ඕනෑ දෙයක් ගන්නට තිබෙනවා. ඒ වාගේම කුලී වැඩක් කර හෝ යම්කිසි ආදායමක් උපයාගෙන ජීවත්වන්නට පුළුවන් මාර්ගය තිබෙනවා " කියා අපේ ගමේ ගොඩේ ජනතාව මට කිව්වා.

අපි කියක් හෝ හම්බකර මොන තරම් බඩකට පිරෙන්නට කෑවත්, අපි කොයි විධියට ජීවත්වෙන්න උත්සාහ කළත් ජාතියක් හැටියට අපට හතුරෙක් ඉන්නවා නම්, අපේ ජීවත්වීමට බාධා කරන, මේ රටේ ඒකීයභාවයට තර්ජනයක් කරන හතුරෙක් සිටිනවා නම් අපි ජීවත්වෙලා මොකටද කියන ආකල්පයයි අද මේ රටේ ජනතාව තුළ තිබෙන්නේ. එය හොඳ ආකල්පයක්. හොඳ අදහසක්. ජනතාව මේ තත්ත්වය තේරුම් ගෙන තිබීම රජයේ වාසනාවක් හැටියට මට හිතන්නට පුළුවන්. නමුත් තත්ත්වය විකෘති කර, ජනතාව අතර බොරු ප්‍රචාර දී, මේ තත්ත්වය තුළින් ජනතාව අවුස්සා රජයට එරෙහිව පියවරක් ගන්න ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විටින්විට උත්සාහ කරනවා. නමුත් කවදවත් ඒ එක ව්‍යායාමක්වත් සාර්ථක කර ගන්නට ඒ උදවියට පුළුවන් වී නැහැ. මොකද ? ඒ තරමට ජනතාව අද මේ ප්‍රශ්නය ඒත්තු අරගෙන තිබෙනවා.

මම විශේෂයෙන් ගරු මුදල් ඇමතිතුමාට ප්‍රශංසා කරන්නේ අයවැය ලේඛනය ඉදිරිපත් කිරීමේදී එතුමා බොහොම කල්පනාකාරීව ඒ කාර්යය ඉටු කර තිබෙන නිසයි. විශේෂයෙන් රූපවාහිනී මාධ්‍යය උපයෝගී කරගෙන ගරු මුදල් ඇමතිතුමා අයවැය ලේඛනය ඉදිරිපත් කරන වෙලාවේදී ඒ තුළින් අයවැය සම්බන්ධයෙන් ජනතාවට හොඳ අධ්‍යයනයක් ලබා දුන්නා. ඒ ගැන මම විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. මොකද ? තරුණයන් කණ්ඩායමක් මා හමුවන්නට ඇවිදින් මට මේ විධියට කිව්වා. " හැමදම අපි අයවැය ලේඛනය ගැන ගුවන්විදුලියෙන් සහ ප්‍රවෘත්ති පත්‍රවලින් තමයි දැන ගත්තේ. අයවැය ගැන අපි දන්නේ සීගරට් මිල වැඩි වුණා, අරක්කු මිල වැඩි වුණා, එහෙම නැත්නම් රෙදි කැල්ලක මිල වැඩි වුණා කියන එක විතරයි. එපමණයි අපි දන්නෙ. වෙන මොකක්වත් දන්නේ නැහැ. අයවැය ලේඛනය මොන තරම් දුරට අපේ ජීවිතයට බලපානවාද ? අයවැය අනුව මේ රටේ ආර්ථිකය සකස් වෙන්නේ කොහොමද ? අයවැය පරතරය කියන්නේ මොකක්ද ? දළ දේශීය නිෂ්පාදනය කියන්නේ මොකක්ද ? ආනයන අපනයන මොනවාද ? ඒවාට අයවැයෙන් මොකක්ද සිදු වන්නේ ? මේ ආදී කරුණු පළමුවන වතාවටයි අප දැක ගත්තේ " කියා ඒ තරුණයන් මට කීවා. ඇත්තවශයෙන්ම ඒ ගැන සන්තෝෂ වෙන්න ඕනෑ. ඒ තුළින් අපේ තරුණ කොටස් අයවැය ගැන පුළුල් අධ්‍යයනයක් ලබා ගත්තා. ඒ තුළින් ගරු මුදල් ඇමතිතුමාට අයවැය ලේඛනය මහජන විවේචනවලින් තොර අයවැය ලේඛනයක් කරගත හැකි වූ අතර, විශේෂයෙන්ම විරුද්ධ පාර්ශ්වයේ විවේචනවලට, විරුද්ධ පාර්ශ්වයේ ග්‍රහණයට හසු වී අදහස් ප්‍රකාශ කරන ජන කොටසක් මේ වතාවේ ඇති වී නැති බව මම සන්තෝෂයෙන් මතක් කරන්න කැමතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රුපියල් දස ලක්ෂ තිස් දහසක අයවැය පරතරයක් පියවන එක ලෙහෙසි පහසු වැඩක් නොවෙයි. එය ඉතා අමාරු කාර්යයක්. ජනතාවගේ පිට බදු බර පටවන්නේ නැතිව, වෙනත් පොදු කාර්යයන් කඩාකප්පල් කරන්නේ නැතිව, ජනතාව අසහනයට පත් කරන්නේ නැතිව ඒ කාර්යය ඉෂ්ට කිරීම එතරම් ලෙහෙසි පහසු දෙයක් නොවෙයි. විශේෂයෙන්ම අද වගේ දවසක, රටේ ආරක්ෂාව සඳහා කෝටි ගණන් වියදම් කරන මේ වාගේ අවස්ථාවක එය ලෙහෙසි පහසු කාර්යයක් නොවෙයි. ඒ කාර්යය ඉතාමත් සාර්ථක අන්දමින් ගරු මුදල් ඇමතිතුමා ඉෂ්ට කළා. ඒ ගැන අපි සන්තෝෂ වෙනවා. මෙවර අයවැය ලේඛනය ඉදිරිපත් කරන්නට කලින් ප්‍රවෘත්ති පත්‍රවලින් සහ විරුද්ධ පාර්ශ්වයේ නොයෙකුත් මාධ්‍යයන් තුළින් ප්‍රචාරයන් ගෙන ගිය ආකාරයට මෙවර අයවැය ලේඛනය ඉදිරිපත් කළාට පසුව මන්ත්‍රීවරුන් හැටියට අපට පාරකවත් බැහැලා යන්නට පුළුවන් තත්ත්වයක් ඇතිවෙයි කියා අපි හිතුවේ නැහැ. ඒ තරම් අසීරු තත්ත්වයක් මේ රටේ පවතින බව, මේ රටේ ආර්ථිකයට මරු පහරක් වැදී තිබෙන බව අපි දන්නවා. නමුත් ගරු මුදල් ඇමතිතුමා මෙවර අයවැය ලේඛනය ඉදිරිපත් කළාට පසුව, විශේෂයෙන් එය ඉදිරිපත් කළ විලාශය අනුව මේ රටේ තත්ත්වය ජනතාව තේරුම් ගත්තා. අන්න ඒ නිසා අද විරුද්ධ පාර්ශ්වයට ජනතාව නොමඟ යවන්න පුළුවන්කමක් නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම රජයේ දෙපාර්තමේන්තුවලින්, සංස්ථාවලින් සියයට පහක් ඉතිරි කරන්නට ගරු මුදල් ඇමතිතුමා බලාපොරොත්තු වෙනවා. එය හොඳ අදහසක්.

මේ රජය යටතේ තිබෙන සංස්ථා පාඩු පිට පාඩු ලබනවා නම්, ඒ සංස්ථාවල සිදුවන පාඩු මේ රටේ ජනතාවට දරන්න සිදු වෙනවා නම් ඒක ඉතාමත් බරපතල අපරාධයක්. ඇතැම් සංස්ථාවක සේවකයෝ දහක් ඉන්න පුළුවන්. තවත් සංස්ථාවක සේවකයෝ දෙදහක් ඉන්න පුළුවන්. නමුත් පොදුවේ රජයක් හැටියට මේ රටේ ජීවත්වන එක්කෝටි හැට ලක්ෂයක් ජනතාව ජීවත් කරවීමේ මාර්ගය — ඒ භාරදූර කර්තව්‍යය — ගැන අප කල්පනා කර බලන්න ඕනෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සංස්ථා ගැන කියන කොට මේ විරුද්ධ පාර්ශ්වය අපට චෝදනා කරනවා, "මේ සංස්ථාවල ඉන්නේ කවුද ? එක්සත් ජාතික පක්ෂයේ අය නේද ? ඒ ගොල්ලොත් එක්ක නේද මේ අවුරුදු හත අටේ මේවා කළේ " කියා. ඇත්ත, ඒ ගොල්ලෝ අවුරුදු හත අටක් කර, සමහර සංස්ථා ලාභ ලබා තිබෙනවා. සමහර සංස්ථා පාඩු පිට පවත්වා ගෙන ගිහින් තිබෙනවා. නමුත් පාඩු ලබන සංස්ථා මහජනතාවට බරක් වෙන්නට නොදී වසා දමනවා නම් හොඳයි කියන ගරු මුදල් ඇමතිතුමාගේ අදහසට අපත් එකඟ වෙනවා. මොනවාටද ඒවා ? භාණ්ඩාගාරයේ ලක්ෂ ගණන්, කෝටි ගණන් මුදල්වලින් ඒවා ආරක්ෂා කරනවා නම් මේ රටේ ජනතාවගේ ජීවත්වීම පිණිස, ඔවුන්ගේ එදිනෙද සෞඛ්‍ය කටයුතු, අධ්‍යාපන කටයුතු සහ අනෙකුත් කටයුතු සඳහා වියදම් කරන්න තිබෙන අපේ දේශීය ආදායමට මොකද වෙන්නේ ?

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

තමුන්නාන්සේගේ අමාත්‍යාංශය යටතේ තිබෙන සංස්ථා ලාභ ලබා තිබෙනවාද ?

**ඩී. වින්සන්ට් ඩයස් මහතා**
**(திரு. டீ. வின்சன்ற் டயஸ்)**
**(Mr. D. Vincent Dias)**

එක සංස්ථාවක් තිබෙනවා, තල් සංවර්ධන මණ්ඩලය. ඇත්ත වශයෙන්ම ඒ සංස්ථාව ලාභ පිට පවත්වාගෙන යන්නේ. පාඩු නැහැ. තල් සංවර්ධන මණ්ඩලය ගෙන යන්නේ ඒ මණ්ඩලයේම ආදායමෙන්. හුඟක් සංස්ථාවලට අද මොකක්ද වෙලා තිබෙන්නේ ? ඒවාට පත්වන අය ඉස්සෙල්ලාම කල්පනා කර බලන්නේ තිබෙන හොඳම කාර් එක ගන්න. හැමතැනම රවුම් ගහලා බලනවා. මොකක්ද තිබෙන හොඳම "මොඩල්" එක කියල. කවුරු හරි ඇමතිතුමෙක් යම් වාහනයක් ගෙනැවිත් තිබෙනවා නම් ඊට වඩා හොඳ එකක් තමයි ගේන්න බලන්නේ.

**මන්ත්‍රීවරයෙක්**
**(அங்கத்தவர் ஒருவர்)**
**(A Member)**

සභාපති

**ඩී. වින්සන්ට් ඩයස් මහතා**
**(திரு. டீ. வின்சன்ற் டயஸ்)**
**(Mr. D. Vincent Dias)**

ඔව් සභාපති. මම මක්කොම සභාපතිවරුන්ට දොස් කියන්නෙ නැහැ. මෙය කියන කොට අපේ හබරාදුව ගරු මන්ත්‍රීතුමා (ජී. වී. එස්. ද සිල්වා මහතා) මගේ දිහා හොඳට බලනවා. මොකද, එතුමාත් සභාපති කෙනෙක් වෙලා හිටියා. නමුත් එතුමාට වාහනයක්වත් තිබුණේ නැහැ. එතුමා හොඳ සභාපතිවරයෙක්. [බාධා කිරීමක්]

සමහරු හොඳම කාර් එක ගන්න බලන්නේ. තවත් කට්ටිය මොකක්ද කරන්නේ ? අපිත් මේ සංස්ථාවලට යනවා. කාමරයට ගිහින් බැලුවාම අපට එළියට එන්නත් හිතෙන්නේ නැහැ.

**මන්ත්‍රීවරයෙක්**
**(அங்கத்தவர் ஒருவர்)**
**(A Member)**

දිව්‍යලෝකෙ වගේ.

**ඩී. වින්සන්ට් ඩයස් මහතා**
**(திரு. டீ. வின்சன்ற் டயஸ்)**
**(Mr. D. Vincent Dias)**

දිව්‍ය ලෝකෙ වගේ. මිලියන ගණනක් වියදම් කර තිබෙනවා. කාමරයට පමණක්. පුටුවට වියදම් කර තිබෙනවා ලක්ෂයක් පමණ. ඇයි ? මේක පොඩ්ඩක් එහාට කැරකෙන්න ඕනැ ; මෙහාට කැරකෙන්න ඕනැ. ටැලිෆෝන් එක ගන්න මෙහාට කැරකෙනවා ; සෙක්‍රටරිට කථා කරන්න අනික් පැත්තට කැරකෙනවා.

**මන්ත්‍රීවරයෙක්**
**(அங்கத்தவர் ஒருவர்)**
**(A Member)**

සෙක්‍රටරිලා නොවෙයි සුරංගනාවියෝ.

**ඩී. වින්සන්ට් ඩයස් මහතා**
**(திரு. டீ. வின்சன்ற் டயஸ்)**
**(Mr. D. Vincent Dias)**

ඒක ඇතුළට ගියාම අපටත් එළියට එන්න හිතෙන්නේ නැහැ. ඉන්න සුරංගනාවියෝ. රූප රාජිණී තරඟවලට ඉදිරිපත් වෙන්න ඕනැ, ඒකට යන්න සුදුසුකම් ලබන්න. මේවා නිසා තමයි අද අපි දුක් විඳින්නේ. අපි මේ ගැන තදින්ම කටයුතු කරන්න ඕනැ. මේවා ගැන ගරු මුදල් ඇමතිතුමා ගන්න සෑම පියවරකටම අපි සහයෝගය දෙන බව මතක් කරන්න කැමතියි. මේ තත්ත්වය අපි නැති කරන්නට ඕනැ. මේ තත්ත්වය නැති කරන්නටයි මහජනතාව අපේ රජය — අපව — බලයට පත් කළේ. මේ තමයි නාස්තිය. බලන්න, සති අන්තයේ මේ වාහන ඔක්කොම කොහේද තිබෙන්නෙ කියා. ඔක්කොම සර්කිට් ගිහින්. සර්කිට් යන්නේ ඔක්කොම සිකුරාද තමයි. හැම සර්කිට් එකක්ම සිකුරාදයින් පසුව තමයි ද ගන්නේ. හැම සති අන්තයකම මුහුදු තීරයේ තමයි රජයේ වාහන ඔක්කොම තිබෙන්නේ.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

සර්කිට් බංගලෝස් ?

**ඩී. වින්සන්ට් ඩයස් මහතා**
**(திரு. டீ. வின்சன்ற் டயஸ்)**
**(Mr. D. Vincent Dias)**

බංගලෝස් එහෙමත් කිසිම අඩුපාඩුවක් නැතිව හදගෙන තිබෙනවා, සමහර තැන්වල. මේවා අප කියන්න ඕනැ. මේ තමයි නාස්තිය. මේ තමයි දූෂණය. ලොකු ලොක්කෝ මේවා කරන කොට පොඩි එවුන් මොකද කරන්නේ ?

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බදුල්ලේ ඉන්දන ගබඩාවට ආණ්ඩුවේ පැට්‍රල් ඕඩර අරගෙන එනවා. පැට්‍රල් ගැලුම් 15 කට 20 කට " ෆුල් ටැන්ක් " ගහ ගන්න ඕඩරය අරගෙන එනවා. අරගෙන ඇවිල්ලා රියැදුරු මහත්මයා කළමනාකාර මහත්මයාට කථා කරලා කියනවා " ඔන්න ඕකට ගැලුම් 10 ක් විතර ගහන්න, ඉතිරි ගැලුම් 10 න් තමුන්නාන්සේ 5 ක් තියාගෙන මටත් 5 ක් දෙන්න " කියලා. අරහෙත් ඕඩරය දෙන්නේ ගැලුම් 20 කටයි. මේක අද සිදු වෙන්නේ නැද්ද කියලා තමුන්නාන්සේලා කල්පනා කර බලන්න. ගරු මන්ත්‍රීතුමන්ලා සියලු දෙනාගෙන්ම අහන්න මොන විදියට ඉන්ධන නාස්තියක් අද මේ ඇතැම් ආයතනවල සිද්ධ වෙනවාද කියා. විශේෂයෙන් බදුල්ලේ කච්චේරියේ මෙන්ම වෙනත් ආයතනවලත් අලුතෙන් පිහිටුවන ලද ආයතනවලත් මොන විධියටද මේවා කෙරෙන්නේ කියා මම දන්නවා. ඒක වළක්වන්නට බැහැ. හරි අමාරුයි. හොඳට සුපරීක්ෂාකාරීව හිටියොත් නම් වළක්වා ගන්නට පුළුවන්. හොඳ කළමනාකාරීත්වයක් නැතිකම නිසයි අද මේ ඇතැම් සංස්ථා විනාශයට පත්වෙලා තිබෙන්නේ. ලොකු එකාගේ ඉඳලා පොඩි එකා දක්වා හැම එකාම බලන්නේ කීයක් හරි හම්බ කර ගන්නයි. ඒකයි වෙලා තිබෙන්නේ. රටට ආදරයක් ඇතිව ජාතියට ආදරයක් ඇතිව කල්පනා කරන්නේ නැහැ. අද සංස්ථාවලට වෙලා තිබෙන්නේ ඒකයි. ඒ විධියේ සංස්ථා වහලා දන්න ඕනැ. ඒවායේ සේවකයන්ට යම්කිසි රැකියා මාර්ගයක් ඇති කරන්නට ඕනැ. ඇත්තවශයෙන්ම, අපි කණගාටු වන්න ඕනැ ඒ අහිංසක සේවකයන් ගැන. විරුද්ධ පාර්ශ්වයට තිබෙන කැක්කුමමයි ඒ සේවකයන් ගැන අපිටත් තිබෙන්නේ. අපිටත් තිබෙන ප්‍රශ්නය ඒකයි. අපිත් බලන්නේ කොයි වෙලාවේද එකෙක් හරි මේ සංස්ථාවකට තල්ලු කර ගන්නේ කියලයි. සමහර සංස්ථාවලට තවම අපිට එකෙක්වත් දාගන්න බැරි වුණා. ඒවාගේ තත්ත්වයක් තිබුණත් අපි කැමති නැහැ කිසිම සේවකයෙකු සංස්ථාවකින් එළියට දමනවාට. ඔවුන් අනාථ වෙනවාට අපි කැමති නැහැ. අපිත් බලන්නේ ඒ අයට මොකක් හරි රැකියා මාර්ගයක් සලසන්නටයි. නමුත් නාස්තිය වළක්වන්නට ගරු මුදල් ඇමතිතුමා ඉදිරිපත් කළ යෝජනාවට අපට දෙන්නට පුළුවන් සහයෝගය අපි එතුමාට ලබා දෙනවා. මන්ද, මේසා විශාල නාස්තියක් වන නිසයි. තමුන්නාන්සේ දන්නවා මහවැලි ව්‍යාපාරය ගැන. ඒ ජාතික ව්‍යාපාරය වෙනුවෙන් අපි මොනතරම් ආයෝජනයක් කරනවාද කියා කල්පනා කරන්න. නමුත්, කොහෙත් හරි එකෙක් බලන්නේ එයිනුත් කීයක් හරි හොයා ගන්නයි. එක්කෝ, ඒකේ තිබෙන බඩුවක් හරි ගෙන ගොස් විකුණා ගන්නවා. නැත්නම් පැට්‍රල් ඕඩරයකින් කීයක් හරි ගහ ගන්නවා. එහෙමත් නැත්නම් වාහනයක හෝ මොනවා හරි ගලවා ගෙන යනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට දැන ගන්නට ලැබුණා, මේ රටට ගෙන්වපු විශාල වාහන තොගයක් උතුරේ කිලිනොච්චියේ යුද හමුදා කඳවුර ඇතුළේ තිබෙනවාය කියා. ට්‍රැක්ටර්, ජීප් රථ ආදී පාවිච්චි නොකළ වාහන තොගයක් තිබෙනවාය කියනවා. හෙට අනිද්දා වෙන කොට මේ කෝටි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. වින්සන්ට් ඩයස් මහතා]

ගණනක වාහන දිරාපත් වෙනවා. අපි ඒවා මෙහාට ගෙන්වා ගන්න ඕනෑ. නැත්නම් පාවිච්චි කරන්න ඕනෑ. මේ විධියට විශාල නාස්තියක් මේ රටේ සිදු වෙනවා. මෙන්න මේවා ගැන තමයි අපි විශේෂ සුපරීක්ෂාකාරීත්වයකින් ඉන්න ඕනෑ.

රෙදි ආනයනය ගැන තමුන්නාන්සේ ඇති කළ බද්ද හොඳයි. නමුත් මම කියන්න කැමතියි රේගුවේ නිලධාරීන් තමන්ගේ රාජකාරී හරියට කළොත් පමණක් මේ රෙදි ආනයන බද්දෙන් සාර්ථක ප්‍රතිඵල ලබා ගන්නට පුළුවන් බව. නමුත් එතැන වෙන හොරකම් නිසා අපිට කිසිම දවසක සහනයක් ලබා ගන්නට පුළුවන් වන්නේ නැහැ.

*එකල්හි වේලාව අ. භා. 6 වූයෙන් කටයුතු අත්සිටුවා විවාදය කල් තබන ලදී.*

*එතැන් සිට විවාදය 1985 නොවැම්බර් 19 වන අඟහරුවාද පවත්වනු ලැබේ.*

*அப்போது, பி. ப. 6 மணியாகிவிடவே அலுவல்கள் இடைநிறுத்தப்பட்டு, விவாதம் ஒத்திப்போடப்பட்டது.*

*விவாதம் 1985 நொவம்பர் 19, செவ்வாய்க்கிழமை மீளத் தொடங்கும்.*

*It being 6 p.m. business was interrupted, and the Debate stood adjourned.*

*Debate to be resumed on Tuesday 19th November, 1985.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
**(Mr. M. Vincent Perera)**

I move,

"That the Parliament do now adjourn".

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
***Question proposed.***

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

Sir, I wanted to ask this question. from the Hon. Minister of Foreign Affairs. He mentioned to me on Friday that he wanted to ask me to postpone my question for today. Here he walks in! Exact to time. Very nice to have Ministers like him.

Sir, I wanted to ask this question about the delegation where the hon. Deputy Minister of foreign Affairs (Mr. Tyronne Fernando) wanted to go to Iran sometime ago but that scheduled visit did not take place. However, I am made to understand that – I came to know about this only this morning – after all he did go. I do not know whether that is correct or not but I was given the information that he did go.

What I wanted to know was this, Sir. Iran is having a very peculiar situation today because of the war that is existing between Iran and Iraq. I know that the Hon. Minister and the government are not taking any side. No sane person will take a side where the Iran-Iraq war is concerned. The only thing is, we would like to try to bring about a settlement. That is all we will try to do. But the information that went round the country is that it is because of a particular friendship that we have with Israel, the Iranians did not want the hon. Deputy Minister of Foreign Affairs to come on the occasion he wanted to go originally. What I want to know is whether that is true, and if he did go subsequently, whether we have got over that difficulty after that. I am sure we have to get over that difficulty. We have to explain as to what the situation is. Even a situation where a Member of this Government or rather a Minister says that he is not permitted to go to a country, just because we have friendship with another country is a very serious matter.

Therefore, it is high time that the Government considers whether we should really have this close alliance, close friendship, with Israel. I say this also for another reason. I think I am correct that His Excellency the President did meet Mr. Peres, the Prime Minister of Israel, in Paris and we were made to understand through the AFP, the Paris correspondent, that there were some negotiations between the two and that was on a very secret basis. What I mean is that they will not come out with it. When such propaganda is used against our country, linking our chief executive, His Excellency the President, I can just imagine how much the Muslim countries or the Islamic countries would react. I would like the Hon. Minister to,–because I know that he has gone subsequently and I am not interested in that–and I would be grateful if he can, explain or make a statement in this House about these difficulties that we face pertaining to the friendship that we are having with Israel. I do not want to add to this any more. I would like to ask that question from him.

**ඒ. සී. එස්. හමීඩ් මහතා (විදේශ කටයුතු ඇමතිතුමා)**
**(ஜனாப் ஏ. ஸி. எஸ். ஹமீத் — வெளிநாட்டலுவல்கள் அமைச்சர்)**
**(Mr. A. C. S. Hameed – Minister of Foreign Affairs)**

Sir, I think I will have to divide this question into a number of parts. First and foremost, I would like to tell the House that the Iranian Government invited a three-member delegation to visit Iran from the 10th of November to 17th of November this year. The members of the delegation invited were Mr. Tyronne Fernando, Deputy Minister of Foreign Affairs, Mr. Haleem Ishak, 3rd Member for Colombo Central and Mr. Harsha Abeywardena, Chairman of the United National Party. Then, on Monday the 4th of November, the Iranian Charge D'Affaires called at the Ministry of Foreign Affairs and indicated to the Director-General that the Iranian Government would like the visit of the friendship delegation to be postponed. This is the exact position.

To deal with some of the questions that the hon. Member had raised, the hon. Deputy Minister of Foreign Affairs has not gone to Iran.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
**(Mr. Lakshman Jayakody)**

Where has he gone ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඒ. සී. එස්. හමීඩ් මහතා**
**(ஜனாப் ஏ. ஸி. எஸ். ஹமீத்)**
**(Mr. A. C. S. Hameed)**
He has gone to Oman.

Then he mentioned about our not taking sides in the war. Our position has been made quite clear in all international forums and at home here. We have made it clear that we are sorry that this war between two non-aligned countries should continue and that we would be happy to see a settlement suitable to both parties arrived at as soon as possible. I would also like to remind the hon. Member that just now we have the Hon. Minister of Trade on a visit to Baghdad. So I think both countries accept our neutral position and there is no problem on that.

The next point I want to make clear is that we do not have any special alliance or any special friendship with Israel to which the hon. Member referred. This question has been raised over and over again on the Floor of this House and I have answered it and made clear what the Interest Section stands for.

With regard to the meeting of His Excellency the President with the Prime Minister of Israel, a question was raised on the Floor of this House and it had been answered. So I do not see any reason why I should go through those grounds once again.

In conclusion, I wish to say that Governments do invite delegations, and sometimes Governments do ask the delegations to postpone the visits. It is not something new or strange in the practice of exchanging visits. So that is the position and I hope that the hon. Member is now fully briefed of the whole situation.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 6.08 ට 1985 නොවැම්බර් 6 වන දින සභාසම්මතිය අනුව 1985 නොවැම්බර් 19 වන අඟහරුවාද පූ. භා. 9 වන තෙක් කල් ගියේය.*

*இதன்படி, பி. ப. 6.8 க்கு, பாராளுமன்றம் அதனது 1985 நொவம்பர் 6 ஆம் தேதிய தீர்மானத்திற்கிணங்க, 1985 நொவம்பர் 19, செவ்வாய்க்கிழமை மு. ப. 9 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Adjourned accordingly at 6.08 p.m. until 9 a.m. on Tuesday, 19th November 1985, pursuant to the Resolution of the Parliament of 6th November, 1985.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සැ. යු.

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන එහි ඒවා පැහැදිලිව දක්වා එම පිටපත හැන්සාඩ් සංස්කාරක වෙත

**1985 දෙසැම්බර් 2 වන සඳුද**

**නොඉක්මවා ලැබෙනසේ එවිය යුතුයි.**

குறிப்பு

**அங்கத்தவர்கள் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை அறிக்கையிற்றெளிவாகக் குறித்து பிழை திருத்தங்களைக் கொண்ட பிரதியை ஹன்சாட் பதிப்பாசிரியருக்கு**

**1985 டிசம்பர் 2, திங்கட்கிழமைக்குப் பிந்தாமற்**

**கிடைக்கக்கூடியதாக அனுப்புதல் வேண்டும்.**

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in this Report and the *copy containing the corrections must reach* the Editor of HANSARD

**not later than**

## Monday, 2nd December 1985

---

| | | |
|---|---|---|
| **Contents of Proceedings** | : | **From 9.00 a.m. to 6.08 p.m. on 18.11.1985** |
| **Final set of manuscripts received from Parliament** | : | **5.00 p.m. on 19.11.1985** |
| **Printed copies despatched** | : | **20.11.1985 morning** |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**දායක මුදල් :** පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 200/- කි. (අශෝධිත පිටපත් සඳහා නම් රු. 175/- කි). පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 2.50 කි. තැපැල් ගාස්තුව ශත 90 කි. කොළඹ 1, තැ. පෙ. 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබාගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

*சந்தா: ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 200/- (திருத்தப்படாத பிரதிகள் ரூபா 175/-) ஹன்சாட் தனிப்பிரதி ரூபா 2·50. தபாற் செலவு 90 சதம். வருடாந்த சந்தா முற்பணமாக அத்தியட்சர், அரசாங்க வெளியீட்டலுவலகம், த. பெ. இல. 500, கொழும்பு 1 என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவெம்பர் 30 ந் தேதிக்குமுன் சந்தாப் பணம் அனுப்பப்படவேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.*

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 200/- (For uncorrected copies Rs. 175/-). A single copy of Hansard is available for Rs. 2.50. (Postage 90 cts.) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box, 500 Colombo 1. The fee should reach him on or before November 30 each year. Late applications for subscription will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org